කොවිඩ් ව්‍යාප්තිය



දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின



කාලත්‍රයේ ඩිජිටල් දොරටුව අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බිනර අව දොළොස්වක ලත් සඳු දින | කාණ්ඩය 111 පත්‍රය 231 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 14 සඳුදා

මැදපෙරදිගින් බලපෑම් එයි කියා

මෛත්‍රී-රනිල්

අන්තවාදීන් අල්ලන්න එපා කිවුවා

නීතිය හා සාමය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ජනපති කොමිසමට කියයි

සුභාෂිණී සේනානායක

ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් කරුණු අනාවරණය වුව ද ඒ සම්බන්ධයෙන් මෙරට නැගෙනහිර පළාතේ වෙසෙන මුස්ලිම් ජාතිකයන් අත්අඩංගුවට ගත හොත් අන්තර්ජාතික වශයෙන් හා මැදපෙරදිග රටවල නායකයන්ගෙන් බලපෑම් විය හැකි බව කියමින් සුපරික්ෂාකාරීව (ඇලට්) පසු වන ලෙසට යහපාලන ආණ්ඩුවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ආරක්ෂක මණ්ඩල

පිට 06

වෙලේ සුදාගේ නංගී සහ අනියම් සැමියා

හක්මනදී අත්අඩංගුවට

දෙයියන්දර සමූහ සහ තිහගොඩ විශේෂ

හෙරොයින් මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් බන්ධනාගාරගත කර සිටින ජී. ඩබ්ලිව්. සමන්ත කුමාර නොහොත් වෙලේ සුදා යන ඇයගේ නැගණිය සහ ඇගේ අනියම් සැමියා පෙරේදා (12) හක්මනදී පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

පිට 06

රාජ්‍ය අංශයට බඳවාගන්නා උපාධිධාරීන්ට නායකත්ව වර්ධන පාඨමාලාවක්

බුද්ධි කරුණාරත්න

ජනාධිපතිවරයාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව රාජ්‍ය සේවයට බඳවාගන්නා උපාධිධාරීන් 50,000 පුහුණු කිරීමට යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා යුද හමුදාවේ සහාය ඇතිව ආරක්ෂක හමුදා

පිට 06

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගිය සිකුරාදා අනුරාධපුර රුවන්මැලි සෑය අභියසදී...

ඡායාරූපය - හිඳෝගම සමූහ - චිත්‍රාරත්න කලුආරච්චි

රත්නමාලි සෑ පාමුල සිරස	නමා
බුදුන්, දහම්, සඟ තෙරුවන සිතින්	පුදා
රටට, දැයට, සමයට නිසි සුවය	සදා
ඔබ යන ගමන සරු වේවා මතු-මතු	දා

- පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමි

සංචාරක පුරවල සියලු පිවිසුම් මාර්ග හදන්න

අගමැතිගෙන් උපදෙස්

බුද්ධිකා ඉඹුලාන

දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය වැඩි වශයෙන් දිනා ගත් සංචාරක පුරවර සඳහා පිවිසීමට ඇති මාර්ගයන් වැඩි දියුණු කිරීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අදාළ අමාත්‍යාංශවලට උපදෙස් ලබා දී තිබේ.

පිට 06

පක්ෂයේ මතයට පටහැණි ප්‍රකාශ එපා

පොහොට්ටුවේ ලේකම් මන්ත්‍රීන්ට ලියයි

ධනුෂ්ක ගොඩකුඹුර

පක්ෂයේ මතයට පටහැණිව ප්‍රකාශ නිකුත් කිරීමෙන් වළකින ලෙස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන ලේකම් නීතිඥ සාගර කාරියවසම් මහතා එම පක්ෂය නියෝජනය කරන සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලිඛිතව දැනුම් දී ඇත.

පිට 06

කංජිපානි ඉම්රාන් උපවාසය නවතා ඉදිආප්ප කයි

බුද්ධිකා ඉඹුලාන

බුස්ස බන්ධනාගාරයේ විශේෂ ගණයේ සිරකරුවන්ගේ ආහාර වර්ජනයට නායකත්වය දෙන කංජිපානි ඉම්රාන් ආහාර වර්ජනය අතරතුර ඉදිආප්ප ආහාරයට ගෙන ඇතැයි වාර්තා වේ.

පිට 06

20න් රාජ්‍ය සමාගම් විගණනය ඉවත් කරලා

පිට 06

බිමල් රත්නායක

මන්ත්‍රී ආරක්ෂාව තර කරන්න

කිරිඇල්ල සහ රංජිත්ගෙන් ඉල්ලීම්

පිට 06

ධනුෂ්ක ගොඩකුඹුර

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව ඉහළ දමන ලෙසට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල සහ සමඟි ජන බලවේගයේ ප්‍රධාන ලේකම්

මංතීරු නීතිය අද සිට යළි ක්‍රියාත්මකයි

කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි රථ වාහන තදබදය අවම කිරීමේ අරමුණෙන් හඳුන්වා දෙන ලද මංතීරු නීතිය අද සිට (14) නැවත ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලීසිය තීරණය කර තිබේ.

පිට 06

රටට යෝග්‍ය නව ව්‍යවස්ථාවක් හදන්න ජනපතිට බහුතරය ලැබිලා

මහ සඟරුවන පෙන්වා දෙති

රටට යෝග්‍ය නව ව්‍යවස්ථාවක් සැකසීමට ජනතාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට බහුතර බලයක් දී ඇතැයි මහා සංඝරත්නය පෙන්වා දෙති.

ජනතා අපේක්ෂාව පියවරින් පියවර ඉටු කරමින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැඟීමට ජනාධිපතිවරයා යන ගමන දෙස මහත් සතුටින් බලා සිටින බව ද උන්වහන්සේ පැවසූහ.

පිට 06

එජාප කෘත්‍යාධිකාරී මණ්ඩලය අද රැස් වෙයි

පිට 06

- යහපාලන ආණ්ඩුවේ දූෂණ හොයන්න පත්කරපු දූෂණ විරෝධී කමිටුවත් තුන්කෝටියකට වැඩි මහජන මුදල් ගිලලාලු බං ...
- ඒ කියන්නෙ පත්කරපු කමිටුවත් දූෂණය වෙලාද එතකොට ...

ලක්ෂ 10ක මත්ද්‍රව්‍ය සමඟ කාන්තාවෝ තිදෙනෙක් කොටු වෙති

මත්ද්‍රව්‍ය ජාවාරමකට සම්බන්ධ එකම පවුලේ දෙදෙනකු ඇතුළු කාන්තාවන් තිදෙනකු කොළඹ අපරාධ කොට්ඨාසය මගින් පෙරේදා (12) අත්අඩංගුවට ගෙන තිබේ.

ඔවුන් සතුව තිබී රුපියල් මිලියනයකට අධික වටිනාකමින් යුත් මත්ද්‍රව්‍ය සොයා ගෙන ඇත.

මින් එක් කාන්තාවක් මාලිගාවත්ත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇති අතර, ඇය සතුව තිබී හෙරොයින් ග්‍රෑම් 60ක් පොලිස් භාරයට ගෙන තිබේ.

37 හැවිරිදි මේ කාන්තාව කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකාරියක වන අතර, සිදු කළ

පිට 06

ආණ්ඩුවේ තුනෙන් දෙක රහස් ඡන්දයකදී වෙනස් වෙනවා

පිට 06

මාහීර් විසි වෙයි

සමන්තුරේ සභාපති ධුරය යළි නවුෂාඩ්ට

පිට 06

2020 ස්වර්ණ පුස්තක සම්මානය එරික් ඉලයප්ආරච්චිගේ 'පේත' නවකතාවට හිමි විය. සම්මාන ප්‍රදානෝත්සවය පසුගිය දා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති අතර, ඊට අදාළ සම්මානය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා අතින් කෘතියේ කර්තෘ වෙනුවට ප්‍රවීණ කිව්වර බුද්ධදාස ගලප්පත්ති මහතා ලබා ගන්නා අයුරු.

ඡායාරූපය - රංජිත් අසංක

රාජ්‍ය නාට්‍ය උලෙළ 2020 සම්මාන ප්‍රදානෝත්සවය නෙළුම් පොකුණ රඟහලේදී ඉකුත් දා (11) පැවැත්විණි. මෙවර රාජ්‍ය නාට්‍ය උලෙළේ හොඳම නළුවා සහ නිළිය ලෙස සම්මාන ලද තිලාන් වර්ණජිත් හා සිළිඳු රන්වල තම සම්මාන අතැතිව ඡායාරූපයකට මුහුණ දුන් අයුරු.

ඡායාරූපය- තුෂාර ප්‍රනාන්දු

Cargills food city
වාසි මල්ල
රු. 250ක් වටිනා නැවුම් එළවළු මිලදී ගෙන
සීනි 1kg හෝ පරිප්පු 1kg හෝ කීරි සම්බා 1kg සඳහා
50% ඉතිරියක්
ලබාගන්න
කොන්දේසි සහ නියමයන් සහිතයි.
• 2020 සැප්තැම්බර් 14 සිට 18 දක්වා පමණයි
• තොග අවසන් වන තුරු පමණයි
• 50%ක දීමනාව වලංගු වන්නේ එක් නිෂ්පාදනයක් සඳහා පමණයි
Cargills SINCE 1844

රට ආර්ථික වශයෙන් සවිමත් කිරීමට
ආසියාන් කලාපීය සංසදයේ සහාය ඕනෑ

රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය

මහින්ද අලුත්ගෙදර

නව කොරෝනා වසංගත තත්ත්වයෙන් පසුව ආර්ථික වශයෙන් ප්‍රකෘතිමත් වීමේ දුෂ්කර කාර්යයට මුහුණ දීමට සහ පුරවැසියන්ගේ ජීවනෝපාය නැවත ගොඩනැංවීම සඳහා ආසියාන් කලාපීය සංසදයෙහි සියළුම සාමාජිකයන්ගේ සාමූහික ප්‍රයත්නයන් අත්‍යවශ්‍ය බව කලාපීය සහයෝගිතා රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය මහතා ආසියාන් කලාපීය සංසදය හමුවේ ප්‍රකාශ කරයි.

මෙම සන්දර්භය තුළ සමෘද්ධිය ළඟාකර ගැනීම සහ ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධන සැලැස්මක් ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන වන බව පෙන්වාදෙන ඒ මහතා, සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ආරක්ෂක ගැටලු සහිත දුෂ්කර කාලවල දී, මෙම ගැටලු තවදුරටත් අදාළ රටක භූගෝලීය සීමාවන්ට සීමා නොවන බව මූර්තිමත් කෙරෙන බවද පෙන්වාදෙයි. අග්නිදිග ආසියාවේ සමෘද්ධිය උදෙසා සාමූහික ප්‍රයත්නයක ඇති වැදගත්කම සම්බන්ධයෙන් 27වැනි ආසියාන් කලාපීය සංසදයේ දී ශ්‍රී ලංකාව පෙන්වා දී තිබෙන අතර 27වැනි ආසියාන් කලාපීය සංසදය සාර්ථක ලෙස පෙරේදා (12) පැවැත්විණි.

2020-2025 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත හැනොයි ක්‍රියාකාරී සැලැස්ම II (HPOA) 27 වැනි ආසියාන් කලාපීය සංසදයේ දී සම්මත කරන ලද අතර 1997 දී සම්මත කරන ලද ආසියාන් දැක්ම 2020 හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන ක්‍රියාකාරී සැලසුම් මාලාවක පළමු වැන්න වූ හැනොයි ක්‍රියාකාරී සැලැස්ම I මඟින් 1999-2004 කාලපරිච්ඡේදය ආවරණය කර තිබේ. සාමාජික රටවල ආර්ථික මූලධර්ම වඩාත් ඒකාබද්ධ සහ ශක්තිමත් කරමින්, සමීප කලාපීය සංකලනයක් ගොඩනැගීම අරමුණු කරගත් හැනොයි ක්‍රියාකාරී සැලැස්ම II, එහි අනුගාමී වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මක කරයි.

මැලේසියාව, කැනඩාව, ඉන්දුනීසියාව, ඇමරිකා එක්සත් ජනපදය, පිලිපීනය, ජපානය, කාම්බෝජය, දකුණු කොරියාව, සිංගප්පූරුව, බ්‍රූනායි දරුස්සලාම්, ඕස්ට්‍රේලියාව, ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, නවසීලන්තය, තායිලන්තය, චීනය, යුරෝපා සංගමය, බංග්ලාදේශය, ටිමෝර් ලෙස්ටේ, මියන්මාරය, පාකිස්ථානය, මොන්ගෝලියාව, පැපුවා නිව්ගිනියාව, ඉන්දියාව, කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී ජනතා ජනරජය, රුසියාව සහ වියට්නාමය යන රටවල් විසින් 27 වැනි ආසියාන් කලාපීය සංසදය නියෝජනය කරයි.

තාප්පයට උඩින් විසි කළ දුරකතන පාර්සලය
බන්ධනාගාර නිලධාරීන් අතේ

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ, සූරියවැව විශේෂ- නුවන් ජයසේකර

අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ තාප්පයක් මතින් රැඳවූවන් සිටින ස්ථානයට දැමූ ජංගම දුරකතන 9ක් හා සිම්කාඩ් 16ක් සමඟ කේරළ ගංජා ග්‍රෑම් 18ක් එහි රාජකාරියේ නියැළී සිටි බන්ධනාගාර නිලධාරීන්ට හමු වී තිබේ.

මේ දුරකතන අතර ස්මාට් දුරකතනයක් වන අතර ඩේටා කේබල් එකක් ද වේ. මෙම දුරකතන කවුරුන් දැමුවා ද යන්න මෙතෙක් අනාවරණය වී නොමැති අතර, මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. ඔඅගුනුකොළපලැස්ස බන්ධනාගරය තුළ පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් ද ආරක්ෂාවට යොදවා ඇති අතර, යම් අයකුට ළඟාවීමට පහසු කටයුත්තක් නොවුණත් මේ ආකාරයෙන් බන්ධනාගාරයට දුරකතන හා සිම් කාඩ් පත් මෙන්ම මත්ද්‍රව්‍ය දැමීම ගැටලු සහගත කරුණක් බව නිලධාරීහු පවසති.

කාසල්රී - මාවුස්සාකැලේ පිටාර මට්ටමේ

අසේල කුරුළුවංශ

මධ්‍යම කඳුකරයේ බටහිර බැවුම්වල පිහිටි ජල පෝෂක ප්‍රදේශවලට කඩින් කඩ ඇද හැලෙන අධික වර්ෂාවත් සමඟ කාසල්රී සහ මාවුස්සාකැලේ ජලාශවල ජල මට්ටම පිටාර මට්ටමට ආසන්න වී තිබේ.

කාසල්රී ජලාශයේ ජල මට්ටම පිටාර මට්ටමට අඩි 2 ½ ක් ද මාවුස්සාකැලේ ජලාශයේ ජල මට්ටම පිටාර මට්ටමට අඩි 6 ක් ද වශයෙන් ද පවතින බව ජලාශ භාර ඉංජිනේරුවරයා පවසයි.

ජලාශවල ජල මට්ටම ඉහළ යාමත් සමඟ කැනියොන්, ලක්ෂපාන, නව ලක්ෂපාන, පොල්පිටිය සහ විමලසුරේන්ද්‍ර යන ජල විදුලි බලාගාරවල විදුලි උත්පාදනය මේ වන විට උපරිම ධාරිතාවෙන් සිදු කෙරෙයි.

මධ්‍යම කඳුකරයට ඇද හැලෙන අධික වර්ෂාවත් සමඟ වරින්වර ඝන මිදුම් තත්ත්වයක් හැටන් නුවරඑළිය සහ හැටන් කොළඹ ප්‍රධාන මාර්ගවල පවතින නිසා එම මාර්ගවල රිය ධාවනය කිරීමේදි සැලකිලිමත් ලෙස හැටන් පොලිසිය රියැදුරන්ගෙන් ඉල්ලා සිටියි.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍රසමාගම ප්‍රකාශයට පත්කරන විදුණැන පුවත්පත සංවිධාන කළ පහවසර ශිෂ්‍යත්ව විභාගය සඳහා වූ පෙරහුරු සම්මන්ත්‍රණය මරදගහමුලදී ඊයේ (13) පැවැති අතර, ඒ සඳහා එක්ව සිටි දරු දැරියෝ පිරිසක් මෙහි වෙති.

මත්තල ගුවන් තොටුපොළේ ගුවන් යානා ගොඩබැස්සවීමේ හා
නතර කිරීමේ ගාස්තු අය කිරීම වසරකට අත්හිටුවයි

මහින්ද අලුත්ගෙදර

මත්තල ගුවන් තොටුපොළේ ගුවන් යානා ගොඩබැස්සවීමේ හා ගුවන් යානා නතර කිරීමේ ගාස්තු අය කිරීම වසරක කාලයක් සඳහා සම්පූර්ණයෙන්ම අත්හිටුවීමට රජය තීරණය කරයි.

ඒ අනුව මත්තල ගුවන් තොටුපොළට අන්තර්ජාතික ගුවන් යානා ගෙන්වා ගැනීමේ අරමුණින් මෙම පියවර ගෙන තිබෙන අතර ඊට අදාළ නියෝග ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර තිබෙන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

අන්තර්ජාතික ගුවන් මෙහෙයුම්වලදී උපරිම පිටත්වීමේ බර මෙට්‍රික් ටොන් 1ක් සඳහා අය කෙරෙන ගොඩබැස්සවීමේ ගාස්තුව ඩොලර් 4ක් වන අතර ගුවන් යානා නතර කිරීමේ ගාස්තුව වන්නේ ගොඩබැස්සවීමේ ගාස්තුවෙන් සියයට 10කි. මීට අමතරව මත්තල ගුවන් තොටුපොළේ ගුවන් තොටුපොළ අපනයන බද්ද අය කිරීම වසර 02ක් සඳහා සම්පූර්ණයෙන් ම අත්හිටුවීමට ද රජය තීරණය කර තිබේ.

ඊට අදාළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද හිමිවී තිබෙන අතර මේ වනවිට මුදල් අමාත්‍යාංශය ඊට අදාළ ඉදිරි කටයුතු සිදුකරමින් සිටින බවද ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි. අමෙරිකානු ඩොලර් 60ක් වන ගුවන් තොටුපොළ අපගමන බද්ද අය කෙරෙනුයේ ගුවන් මඟීන්ගෙන් වන අතර ඒ ඔවුන්ගේ ප්‍රවේශ පත්‍ර මිලෙන් සැලකිය යුතු ප්‍රමාණයකි.

කලාපීය තරගකරුවන් හා සැසඳීමේ දී ගමනාන්තයක් ලෙස සංචාරකයන්ගේ ආකර්ෂණයට අහිතකර ලෙස බලපාන බවද අධ්‍යයන මඟින් හෙළි වී ඇතැයි පවසන ඇමැතිවරයා සහනාදායී ගුවන් සමාගම් ද මත්තල ගුවන් තොටුපොළ අපගමන බද්ද කිසියම් කාලයකට අතහැර දැමීමට හෝ අඩු කිරීමට සලකා බලන ලෙස ඉල්ලීම් කර තිබු බවද පෙන්වාදෙයි.

මීට අමතරව මත්තල ගුවන් තොටුපොළේ බිම් මෙහෙවර සේවා සඳහා වටිටම් අනුපාතයක් ලබාදීමට ද තීරණය කර තිබෙන අතර ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළ බිම් මෙහෙවර සේවා (Ground Handling) ගාස්තු සෙසු කළාපීය ගුවන් තොටුපොළට වඩා ඉහළ අගයක් ගනී. එය මත්තලට ජාත්‍යන්තර ගුවන් සමාගම් ආකර්ශනයට බාධාවක් බැවින් මෙම තීරණයට එළඹී බවද ඇමැතිවරයා කියයි. ශ්‍රී ලංකන් සමාගම මේ සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරමින් සිටී.

මත්තලට පැමිණෙන ගුවන් යානා සඳහා සහන මිලට ඉන්ධන ලබාදීමට ද රජය තීරණය කර තිබෙන අතර මේ සම්බන්ධයෙන් බණිජ තෙල් සංස්ථාව සමඟ දැනටමත් සාකච්ඡා කර ඇතැයි ද ඇමැතිවරයා කියයි. මෙම සහනය ලබාදීමට ද කැබිනට් මණ්ඩල අනුමැතිය හිමිවී ඇති අතර ඉදිරියේ දී මේ සම්බන්ධව බණිජ තෙල් සංස්ථාව සාධනීය ප්‍රතිචාරයක් දක්වනු ඇතැයි අපේක්ෂා කරන බවද හෙතෙම කීවේය.

මේ සියලු පියවර මත්තල ගුවන් තොටුපොළ සක්‍රීය ගුවන් තොටුපොළක් බවට පත්කිරීම සඳහා ගන්නා බව පවසන සංචාරක ඇමැතිවරයා ඉදිරි මාස 06 ක කාලය තුළ මෙරට දෙවන අන්තර්ජාතික ගුවන් තොටුපොළ ලෙස මත්තල දියුණු කිරීම සිය අපේක්ෂාව බවද පවසයි.

'සපිරි ගමක්' යටතේ ව්‍යාපෘති 33,600ක්

ජයසිරි මුණසිංහ

2019 වසරේ බලයට පැමිණි වහාම රජය ආරම්භ කළ "සපිරි ගමක්" ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙළ යටතේ මේ වන විට ව්‍යාපෘති 33600ක් ක්‍රියාත්මක කර තිබේ.

ඒ සඳහා රුපියල් මිලියන 27000කට අධික මුදලක් ගෙවා ඇතැයි සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන, රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කළේය.

එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකට රුපියල් ලක්ෂ 20 බැගින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රජය මුදල් වෙන්කරන ලදී. ඒ අනුව ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා මේ වනවිටත් මුදල් ලබාදී ඇතැයි ද සේමසිංහ මහතා කීය.

2019 නොවැම්බර් 17 අප රටේ 07 වැනි විධායක ජනාධිපතිවරයා ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා පත්වීමත් සමඟ ආරම්භ කළ "සපිරි ගමක්" ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කළ බව ද ෂෙහාන් සේමසිංහ මහතා සිහිපත් කළේය.

මෙම ව්‍යාපෘති යටතේ වතු, ග්‍රාමීය සහ අර්ධ නාගරික ජනතාවගේ එදිනෙදා වැඩ කටයුතු පහසු කිරීම සඳහා මාර්ග, විදුලිබල, ජලසම්පාදන, නිවාස, වාරිමාර්ග, අධ්‍යාපන, ක්‍රීඩා ඇතුළු අංශ ගණනාවක සංවර්ධන කටයුතු සිදුකර ඇත. මේ සඳහා රජය මේ වනවිට රුපියල් මිලියන 27000 ක් මුදලක් ගෙවා ඇතැයි රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කළේය.

පියා පිහියෙන් ඇන පුතා ඝාතනය කරලා

මල්වාන සමූහ මහානාම විතානගේ

මාකොළ - උතුර, ඤාණමෝලී මාවතේ නිවෙසක පියා (59) විසින් පුතාට (35) පිහියෙන් ඇන පෙරේදා (12) ඝාතනය කරනු ලැබ ඇත.

මෙසේ ඝාතනය කර ඇත්තේ මාකොළ - උතුර, ඤාණමෝලී මාවත ප්‍රදේශයේ පදිංචිව සිටි බී.එම්. නන්දික පෙරේරා නමැති 35 හැවිරිදි විවාහක තැනැත්තෙකි.

පෙරේදා (12) රාත්‍රී 11.15 ට පමණ නිවෙස පිටුපස බිමතින් පිය-පුතු අතර ඇති වූ බහින්බස් විමක් දුර දිග ගොස් මේ ඝාතනය සිදු කර තිබෙන බවට පොලිස් පරීක්ෂණවල දී හෙළි විය.

මෙම දෙදෙනා කුලී වැඩ කරන්නන් වන අතර, ඔවුන් අතර නිතරම ආරාවුල් තිබූ බව කියැවේ.

මෙම ඝාතනයට යොදා ගත් පිහිය මරණකරු වැටී සිටි ස්ථානයට ආසන්නයේ බිම තිබී සොයා ගෙන තිබේ.

මෙම සිද්ධිය ගැන සැකකාර පියා (59) අත් අඩංගුවට ගෙන ඇති අතර, සපුගස්කන්ද පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද කුලසේකර, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එල්. අමරසේකර, කොස්තාපල් දසනායක හා කුමාර යන නිලධාරීහු පරීක්ෂණ මෙහෙයවති.

මැදපෙරදිග සිටි 405ක් යළි මව් බිමට එති

මහින්ද අලුත්ගෙදර

කොරෝනා වයිරසයේ ව්‍යාප්තියත් සමඟ මෙරටට පැමිණීමේ අපේක්ෂාවෙන් මැදපෙරදිග රටවල රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 405දෙනකු යළි මෙරටට ගෙන්වාගෙන තිබේ.

ඊයේ (13) අලුයම ඔවුන් මෙරටට පැමිණි තිබෙන අතර, එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ සිට ශ්‍රී ලාංකිකයන් 341 දෙනෙකු සහ කටාර්හි සිට ශ්‍රී ලාංකිකයන් 64දෙනකු මෙලෙස පැමිණ ඇති බව ගුවන් තොටුපළ පවසයි.

ඔවුන් සියලුදෙනා ගුවන්තොටුපොළේ දී පීසීආර් පරීක්ෂණවලට ලක් කර නිරෝධායන කටයුතු සඳහා යොමු කර තිබේ.

කුඩු ග්‍රෑම් 10ක් සමඟ කාන්තාවක් හසු වෙයි

අසේල කුරුළුවංශ

හෙරෝයින් මත්කුඩු ග්‍රෑම් 10ක් සමඟ 56 හැවිරිදි කාන්තාවක් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් පෙරේදා (12) මැණික්හින්න පලිපාන ප්‍රදේශයේදී සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. හඟුරන්කෙත ප්‍රදේශයේ පදිංචි මෙම කාන්තාව කලක පටන් මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරතව සිටින බවට ලැබුණු තොරතුරු මත පොලීසිය මෙම වැටලීම සිදු කර ඇත.

සැකකාර කාන්තාව වැඩිදුර විමර්ශන කටයුතු සඳහා මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් මැණික්හින්න පොලීසියට බාර දී තිබේ.

යහපාලන වැරදි විස්සෙන් නිවැරදි කිරීමට ජනපති - අගමැති ගත් පියවර අගයනවා

පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග

අනුර ප්‍රේමලාල්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඉකුත් යහපාලනයේදී සිදු වූ අවලක්ෂණ ක්‍රියා පැත්තකට දමා ජනතාවට ඇහුම්කන් දී විසිවැනි සංශෝධනයේ ඇතැම් කරුණු නිවැරැදි කරන්න පියවර ගැනීම සම්බන්ධයෙන් යුතුකම ජාතික සංවිධානයේ කෘතඥතාව පළ කර සිටින බව එම සංවිධානයේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග මහතා ප්‍රකාශ කළේය.

රටේ තිබෙන ගැටලු සියල්ල විසිවෙනි සංශෝධනයෙන් විසඳන්න නොහැකි අතර එම සංශෝධනයෙන් බලාපොරොත්තු වන්නේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් රටේ ඇති වූ වියවුල් හා අර්බුදකාරී තත්ත්වයෙන් රට මුදා ගෙන නව ව්‍යවස්ථාවක් ගෙන එන තුරු රටේ නව සංවර්ධන ක්‍රියාමාර්ග බාධාවකින් තොරව ඉදිරියට ගෙන යෑම බව ද හෙතෙම කීය. ඒ මහතා මේ බව සඳහන් කළේ යුතුකම ජාතික සංවිධානයේ මාධ්‍ය හමුවක් ඊයේ (13) කොළඹ 7, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ පැවැති අවස්ථාවේ දීය. එහිදි වැඩිදුරටත් කතා කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මෙසේද කීය.

මේ වන විට විසිවැනි සංශෝධනය සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේ ඇතුළු ජාතික සංවිධාන හා විවිධ පාර්ශ්ව වලින් විවිධ මත හා චෝදනාද එල්ලවෙනවා. යුතුකම සංවිධානය ලෙසත් අප දැක්කේ විසිවෙනි සංශෝධනයේ නිවැරැදි විය යුතු කරුණු තියෙනවා කියායි. මේ වතාවරණය හමුවේ මේ සම්බන්ධයෙන් ඉකුත් සෙනසුරාදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ යුතුකම ජාතික සංවිධානය හා ජාතික ඒකාබද්ධ කමිටුව අතුළු තවත් නියෝජිතයන් සාකච්ඡාවක් පැවැත්වූවා. එහිදී දැනට ගැසට් කර තිබෙන විසිවෙනි සංශෝධන කෙටුම්පත වෙනුවට වැරදි නිවැරැදි කළ නව කෙටුම්පතක් සකස් කරන්න ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එකඟවුණා. ඊට සමාන්තරව විසිවෙනි සංශෝධනයේ නිවැරැදි විය යුතු කරුණු ගැන සංවේදීව ක්‍රියා කළ යුතු බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ආණ්ඩු පක්ෂ නායකයන්ගේ හා ආණ්ඩුපක්ෂ රැස්වීමේදීත් පවසා තිබුණා. එහිදී ආණ්ඩු පක්ෂ නායකයන් රැස්වීමේදී වෙනම කමිටුවක් පත් කර තිබුණා ඊළඟ කැබිනට් රැස්වීමට පෙර අවශ්‍ය කරුණු නිවැරැදි කොට ඒ ගැන තමාව දැනුවත් කරන්න කියා. අප දකින විට ප්‍රජාතන්ත්‍රවාදය හා රටේ අනාගතය පැත්තෙන් මෙම නායකයන් දෙදෙනාගේ ක්‍රියාකලාපය විශිෂ්ටයි කියන එක තමයි අපේ මතය. 2/3කබලය ලැබිතිබෙන අවස්ථාවක, ජනතා මතය උපරිමයෙන්ම ලැබී තිබෙන අවස්ථාවක ඒ ජනතාමතයට සංවේදී වී යම්වැරැද්දක් තිබෙනවා නම් එය නිවැරැදි කර ගැනීමට ඉදිරිපත්වීම ගැන සතුටු වෙනවා. මේ ලබාදුන්න ආදර්ශය සම්බන්ධයෙන් මෙම නායකයන් දෙන්නාටම අප කෘතඥ වෙනවා.

මෙහිදි මූලිකම වන්නේ විසිවැනි සංශෝධනය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කරුණු සම්බන්ධයෙන් සංවේදී වී එම විවේචනවල තිබෙන යම් කිසි සාධනීය කොටස් තියෙනවා නම් ඊට අනුරූප වන නව කෙටුම්පතක් ගෙන එමට රජය පියවර ගැනීමට කටයුතු කිරීමයි. මෙහිදි අප කරුණු දෙකක් පැහැදිලි කරගන්න ඕනෑ. විසිවෙනි සංශෝධනයේ අරමුණ කුමක් ද, නව ව්‍යවස්ථා කෙටුම්පතක් සඳහා විද්වත් කමිටුවක් ජනාධිපති නීතිඥ රමේෂ් ද සිල්වාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති නීතිඥ මනෝහර සිල්වා, ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස්, හිටපු තානාපති ලක්සිරි මෙන්ඩිස්, මහාචාර්ය රාජා ගුණරත්න, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී සී.ඒ. චන්ද්‍රප්මේ ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වෙති.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැකසුම
තානාපති සංසදයේ කථිකාව හෙට

ජනාධිපති නීතිඥ හිටපු තානාපති සරත් විජේසිංහ මහතා සංවිධාන කරන "නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසුම තානාපති සංසදයේ කථිකාව මහාචාර්ය ස්ටැන්ලි විජේසුරේන්ද්‍ර මාවතේ විද්වත් වාත්තියෙදීන්ගේ සංවිධාන පරිශ්‍රයේදී හෙට (15) සවස 6ට පැවැත්වේ.

මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි, රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමරතුංග, ජනාධිපති නීතිඥ මනෝහර සිල්වා, ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස්, හිටපු තානාපති ලක්සිරි මෙන්ඩිස්, මහාචාර්ය රාජා ගුණරත්න, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී සී.ඒ. චන්ද්‍රප්මේ ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වෙති.

හොරෙන් ගෙන්වූ
නිස්හය ලක්ෂයක් දුම්වැටි ගිනි තබයි

නීතිවිරෝධීව මෙරටට ආනයනය කළ රුපියල් දහතුන් කෝටි තිස්හය ලක්ෂයක් වටිනා දුම්වැටි 2,353780ක් විනාශ කිරීමට ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන අංශය මඟින් පියවර ගෙන තිබේ.

මෙම දුම්වැටි බහාලුම දුම්වැටි ආනයනය කිරීමේ බලපත්‍රයකින් තොරව Soft Tobacco ලෙස ප්‍රකාශ කරමින් නීති විරෝධී ලෙස ආනයනය කර තිබේ.

මේ දුම්වැටි විවිධ වර්ගයේ වන අතර, ඒවා කල් ඉකුත්වීමට ආසන්න තත්ත්වයේ දුම්වැටි වේ. විමර්ශන අවසානයේ අදාළ බහාලුම රාජසන්තක කර ලංකා දුම්කොළ සංස්ථාව වෙත විනාශ කිරීම සඳහා බාර දී ඇත.

මේවා යුරෝපීය රටක සිට ඩුබායි හරහා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති අතර මධ්‍යම විමර්ශන අංශයේ රේගු අධ්‍යක්ෂ ඒ. ජී. එන්. ඒ. අබේරත්න, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ ඩී. උදිත ජයසිංහ යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ රේගු අධිකාරි එච්. එම්. එන්. එස්. රාජගුරු, සහකාර රේගු අධිකාරිවරුන් වන අරුණ ශාන්ත අමරසිංහ, ඒ. ආර්. එච්. පොත්පිටිය, එස්. ඒ. ඩී. වී. දීමන්ත ර, ජී. ටී. ආර්. රාමචික්‍රම, ඩී. ඒ. ටී. ඩබ්. චන්ද්‍රලාල්, සහ ඩී. ටී. එස්. පෙරේරා යන නිලධාරීහු විමර්ශන කටයුතු සිදු කළහ.

මන්ද මානසික තරුණිය දූෂණය කළ චූදිතයාට වසර 58 1/2ක සිරදඬුවම්

අසේල කුරුළුවංශ

මන්ද මානසික තරුණියක් දූෂණය කිරීමේ චෝදනාවකට වරදකරු වූ පුද්ගලයකුට මහනුවර මහාධිකරණ විනිසුරු ආර්. එස්.එස් සපුවිද මහතා බරපතළ වැඩසහිත වසර 58 1/2 ක සිරදඬුවමක් පසුගිය (11) දා නියමකර තිබේ.

මෙසේ සිර දඬුවම් නියම වූයේ උඩුදුම්බර ප්‍රදේශයේ පදිංචි එන්.ජී ජයසේන නැමැති අයකුටය.

වසර 2012 දෙසැම්බර් 18 සිට 2013 පෙබරවාරි 18 දක්වා වූ කාලය තුළ අවස්ථා තුනකදී මෙම පුද්ගලයා මැදමහනුවර ප්‍රදේශයේදී අදාළ තරුණිය දූෂණයකර තිබෙන බව අධිකරණයේ දී හෙළි විය.

අදාළ වරද චූදිතයා පිළිගැනීමෙන් පසු මහාධිකරණ විනිසුරුවරයා තරුණිය දූෂණය කිරීම සම්බන්ධයෙන් වසර 18ක සිර දඬුවමක් ඔහුට නියම කළේය. තෙවරක් එම වරද ඔහු සිදුකර තිබෙන බැවින් වසර 18 බැගින් වසර 54ක සිරදඬුවමක් නියම කළ මහාධිකරණ විනිසුරුවරයා එම දඬුවම් වෙන් වෙන්ව ගෙවී යා යුතු බවට ද නියම කළේය.

තරුණිය තෙවරක් දූෂණය කිරීම නිසා එක් වරදකට රුපියල් 25000 බැගින් රුපියල් 750000ක දඩයක් ද මහාධිකරණ විනිසුරු සපුවිද මහතා නියමකර තිබේ. එම මුදල නොගෙවීම නිසා ඔහුට තවත් අවුරුදු 1 1/2 ක සිරදඬුවමක් නියමවී ඇත.

මෙයට අමතරව චින්දිත තැනැත්තියට රුපියල් ලක්ෂ 10 ක වන්දියක් ගෙවන ලෙස ද මහාධිකරණ විනිසුරුවරයා ඔහුට නියමකර තිබෙන අතර එය නොගෙවීම නිසා තවත් බරපතළ වැඩසහිත වසර දෙකක සිරදඬුවමක් නියම කර තිබේ.

චින්දිතයන් ආරක්ෂා කිරීමේ අරමුදලට තැන්පත් කරන ලෙස නියම කළ රුපියල් 15000ක මුදල තැන්පත් නොකිරීම නිසා තවත් වසරක සිරදඬුවමක් ඔහුට නියම කිරීමට මහාධිකරණ විනිසුරුවරයා පියවරගෙන ඇත.

රජය වෙනුවෙන් රජයේ අධිනීතිඥ ධනුෂ්ක රාහුබද්ද මහතා පෙනී සිටියේය.

ස්වර්ණ පුස්තක සම්මානය 2020

එරික් ඉලයප්පාරච්චිගේ 'පේත' නවකතාවට

සම්පත් දිප්පිටිගොඩ

ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය සංවිධාන කළ 2020 ස්වර්ණ පුස්තක සම්මානය මෙවර හිමි වූයේ එරික් ඉලයප්පාරච්චිගේ 'පේත' නවකතාවටය. සම්මාන උළෙල පෙරේදා පස්වරුවේ කොළඹ බණ්ඩාරණායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී අතිදැත්කර්ශවත් අයුරින් පැවැත්විණි. ප්‍රධාන ආරාධිතයා වූයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ය. කෙසේ වුවද සම්මානලාභී එරික් ඉලයප්පාරච්චි මහතා උත්සව සභාවට නොපැමිණි අතර, ඔහු වෙනුවෙන් සම්මානය ලබා ගනිමින් ප්‍රවීණ කිවිවර බුද්ධදාස ගලප්පත්ති මහතා පැවසුවේ නිසි ආරාධනාවක් නොලැබීම හේතුවෙන් ඉලයප්පාරච්චි මහතා මේ අවස්ථාවට සහභාගි නොවූ බවයි.

නවකතාකරුවන් සහ පොත් ප්‍රකාශකයන් ඇගයීම අරමුණුකරගත් ස්වර්ණ පුස්තක සම්මාන උළෙල මෙවර පැවැත්වූයේ 14වන වරටය. 2019 වසරේ රචනා කර, ප්‍රකාශයට පත්කෙරුණු නවකතා 108ක් මෙවර සම්මාන උළෙල සඳහා ඉදිරිපත් කොට තිබිණි. ඉන් ලියනගේ අමරකීර්තිගේ - රතු ඉර අඳින අත, එරික් ඉලයප්පාරච්චිගේ - පේත, සුරත් ද මෙල්ගේ - තී හා තා, ශමෙල් ජයකොඩිගේ - කුමර කොබෙයි, සුනේත්‍රා රාජකරුණානායකගේ නිෂ්ක්‍රාන්තිය යන නවකතා 5 අවසන් වටය නිර්දේශ විණි.

ආචාර්ය සරත් අමුණුගම මහතා ප්‍රමුඛ පස් දෙනකුගෙන් සමන්විත ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයකින් අවසන් නවකතා 5 විනිශ්චය කරනු ලැබිණි.

අනුර බී. සෙනෙවිරත්න විසින් රචිත නවතම ග්‍රන්ථ තුනක් දොරට වැඩුම 17දා

අනුර ප්‍රේමලාල්

ප්‍රවීණ ලේඛක අනුර බී. සෙනෙවිරත්න විසින් රචිත නවතම ග්‍රන්ථ තුනක් දොරට වැඩුම ලබන(17) බ්‍රහස්පතින්දා පස්වරු 3.00ට කොළඹ මහජන පුස්තකාලයේදී සිදු කෙරේ.

සෙනෙවිරත්න මහතා විසින් රචිත 'ගහකටත් වරිපනම් අංකයක්' කෙටිකතා සංග්‍රහය, 'භීෂණයේ කුරිරු මුහුණ'මෙය 87-89 භීෂණ සමය ගැන ඉංග්‍රීසි බසින් ලියැවුණු පොත් පිංචක සිංහල වියමනකි. අනෙක් ග්‍රන්ථය වනුයේ 2019 රාජ්‍ය සාහිත්‍ය සම්මාන අවසන් වටය නියෝජනය කළ 'අලුත් ගෙදර අබිරහස' යොවුන් නවකතාව යන ග්‍රන්ථ ත්‍රිත්වය මෙහිදි ජනගත කෙරේ.

මෙහිදි කෙටිකතාව යනු කෙටි කතාවක්ම නොවේ මැයෙන් සුජීවා නිරංජනී රත්නායක, ජ.වි.පෙ. දෙවන කැරැල්ලේ (87-89) ඇතුළාන්තය ප්‍රවීණ මාධ්‍යවේදී ධර්මන් වික්‍රමරත්න හා සාහිත්‍යයේ යොවුන් වසය මැයෙන් ප්‍රවීණ ලේඛක විපුල හේවා වලිමුනි යන අය දෙසුම් පැවැත්වීමට නියමිතයි.

මෙට්‍රික් ටොන් 25,000ක අමු කහ අස්වැන්නක් අපේක්ෂා කරනවා

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.පී හීන්කෙන්ද

අසේල කුරුළුවංශ

මෙරට අමුකහ වගාවෙන් මෙට්‍රික් ටොන් 25,000ක පමණ අස්වැන්නක් එළඹෙන ජනවාරි මාසයේදී ලබා ගැනීමට අපේක්ෂා කරන බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.පී හීන්කෙන්ද මහතා පවසයි.

හෙක්ටයාර් 1500ක භූමි ප්‍රමාණයක දේශීය වශයෙන් අමුකහ වගාකර තිබෙන බවත් එම අස්වැන්න වෙළෙඳ පොළට නිකුත් වීමෙන් පසු කහ හිඟය පහව යනු ඇති බවත් ඒ මහතා කීය.

මෙම අමුකහ මෙට්‍රික් ටොන් 25,000න් වියළි කහ මෙට්‍රික් ටොන් 8000ක් පමණ සකසා ගතහැකි බවද හීන්කෙන්ද මහතා පැවසුවේය.

වසරකට මෙරට පරිභෝජනය සඳහා වියළි කහ මෙට්‍රික් ටොන් 7000-7500ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය බවත් මෙම ප්‍රමාණයෙන් 2019 වසර තෙක්ම අපේ රටේ නිෂ්පාදනය කරගනු ලැබුවේ වියළි කහ මෙට්‍රික් ටොන් 1500ක් පමණක් බවත් කී ඒ මහතා ඉතිරි ප්‍රමාණය ආනයනය කළ බවද ප්‍රකාශ කළේය.

ඉතා අඩු මිලට කහ විදේශ රටවලින් ආනයනය කිරීම නිසා දේශීය වශයෙන් වගාකරන අමුකහ කිලෝවක මිල රුපියල් 20ක් පමණ දක්වා පහත බැස තිබූ බවත් මේ නිසා බොහෝ පිරිසක් කහ වගාවෙන් ඈත්වූ බවත් හෙතෙම පැවසුවේය.

පසුගිය දෙසැම්බර් මාසයේදී කුළුබඩු වර්ග 10ක් ආනයනය කිරීම තහනම් කිරීමට රජය පියවර ගත් බවත් ඒවන විට ප්‍රමාණවත් ලෙස කහ වගාකර නොතිබීම නිසා මෙම වසරේ ජනවාරි සිට දේශීය වෙළෙඳ පොළේ කහ හිඟයක් ඇතිවූ බවද හීන්කෙන්ද මහතා ප්‍රකාශ කළේය.

ඉඟුරු ආනයනය ද තහනම් කිරීමට රජය පියවර ගත්තත් ප්‍රමාණවත් ලෙස ඉඟුරු වගාකර තිබූ නිසා ඉඟුරු හිඟයක් ඇති නොවූ බවද ඒ මහතා කීවේය.

කහ බීජ සිටුවා අස්වැන්න ලබා ගැනීමට මාස 09ක පමණ කාලයක් ගතවන බවත් මෙම වසරේ මාර්තු සිට ජූනි දක්වා කහ වගාව ව්‍යාප්ත කිරීමට දෙපාර්තමේන්තුව විශේෂ වැඩපිළිවෙළක් දියත් කළ බවත් කී හීන්කෙන්ද මහතා 2019 වගකාර තිබූ හෙක්ටයාර් 900ක ප්‍රමාණය මෙම වසරේදී 1500ක් දක්වා වැඩිකර ගැනීමට හැකිවූ බවද අවධාරණය කළේය.

රටේ පැවැති කහ හිඟය නිසා රේගුවේ රඳවාගෙන සිටි කහ මෙට්‍රික් ටොන් 400ක් කැබිනට් තීරණයකට අනුව පසුගිය අප්‍රේල් මස මුදා හරිනු ලැබූ බවත් එම කහ නිසි ලෙස වෙළෙඳ පොළට නොපැමිණි බවත් ඒ මහතා පැවසුවේය.

වෙළෙඳ පොළේ පවත්වා කහ හිඟය ප්‍රයෝජනයට ගෙන කහවලට පිටි මිශ්‍රකර වර්ණ ගන්වා කූට වෙළෙඳුන් පාරිභෝගිකයන් ගසාකෑමේ ක්‍රියාවලියක නිරතව සිටින බව ද හෙතෙම ප්‍රකාශ කළේය.

ජනවාරි මස ලැබෙන අමුකහ අස්වැන්නෙන් බීජ මෙට්‍රික් ටොන් 3000-4000ක් සකස්කර ගැනීමට හැකි වුවහොත් රටට අවශ්‍ය සම්පූර්ණ වියළි කහ ප්‍රමාණය වසරක කාලයක් තුළ සපුරා ගැනීමට හැකිවනු ඇති බව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා පැවසුවේය.

එළඹෙන ජනවාරි මාසය දක්වා ඇති මාස තුනක කාලයට අවශ්‍ය කහ සපුරා ගන්නේ කෙසේද යන්න පිළිබඳ මේ වන විට සාකච්ඡා කරමින් තිබෙන බවද ඒ මහතා කීය.

නවීන තාක්ෂණයෙන් සපිරි

රටටම පොදු නව අංක තහඩුවක්

නිමල් රාජපක්ෂ

මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී පළාත් ක්‍රමයට අනුව අංක තහඩු නිකුත් කිරීමේ ක්‍රමය අහෝසි කොට නවීන තාක්ෂණයෙන් යුතු අංක තහඩුවක් ලබා දීමට රජය තීරණය කරයි.

ඒ අනුව මින් ඉදිරියට වාහන අලෙවි කිරීමේදී හා ලියාපදිංචි කිරීමේදී අංක තහඩුවේ කිසිම පළාතක් සඳහන් නොවන අතර නවීන තාක්ෂණයෙන් යුතුව නිකුත් කරන අංක තහඩුවේ වාහන හිමිකරුගේ තොරතුරු ඇතුළත් වන ආකාරයට සකස් කෙරේ. ඉන් අනතුරුව අදාළ වාහන පරික්ෂා කිරීමේදී වාහනයේ අනන්‍යතාව සොයා බැලීම සඳහා වූ උපකරණ ඉදිරියේදී පොලීසියට ලබා දීමට පියවර ගැණේ.

පැරණි ක්‍රමයට අනුව වාහනයක් අලෙවි කරන විට බස්නාහිර පළාතෙන් දකුණු පළාතට අලෙවි කළ හොත් ඩබ්ලිව් .පී සඳහන් අංක තහඩුව අනිවාර්යයෙන්ම වෙනස් කළ යුතුවෙයි.

නමුත් මින් ඉදිරියට එවැනි පළාතට අනුව කිසිදු අංක තහඩුවක් නිකුත් නොකරන අතර ලංකාවටම එක නීතියක් යටතේ මෝටර්රථවල අංක තහඩු නිකුත් කෙරේ. මෙම අංක තහඩු නිකුත් කිරීමේදී හා රියදුරු බලපත් නිකුත් කිරීමේදී මින් ඉදිරියට කච්චේරියට ගොස් ලබා ගත් යුගය අවසන් කොට තමන්ගේ රියදුරු බලපත්‍රය හෝ අංක තහඩුව කුරිය ක්‍රමය යටතේ තම අතටම ලැබෙන ක්‍රමවේදයක් මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුව විසින් ආරම්භ කෙරේ.

මෙම ක්‍රමවේදය තුළින් තැරැව්කරුවන්ට ජනාතාව මුදල් ලබාදීමේ ක්‍රමවේදය අහෝසි වනු ඇත. ඊට අමතරව වාහන හිමිකරුගේ අතටම අලුත් අංක තහඩුව හෝ රියදුරු බලපත්‍රය ලැබෙන අතර එහිදී පැරණි අංක තහඩුව හෝ දුර්වර්ණ වූ හෝ පැරණි රියදුරු බලපත්‍රය තමන් විසින්ම විනාශ කර දැමිය යුතුවෙයි. මේ ක්‍රමය තුළින් ජනතාවට හොඳ සේවාවක් ලබා දිය හැකි වන අතර මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවේ ඉවතලන අංක තහඩු හා රියදුරු බලපත් ගොඩ ගැසීමේ ක්‍රමවේදය තුරන් වන බවද රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

ව්‍යවස්ථා සංශෝධනය අධ්‍යයනයට කමිටුවක්

වාර්තාව හෙට අගමැතිට

බුද්ධිකා ඉඹුලාන

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අධ්‍යයනය කිරීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත.කැබිනට් ඇමැතිවරුන්, රාජ්‍ය ඇමැතිවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් මේ කමිටුවේ සභාපතිත්වය දරන්නේ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතායි.

මේ කමිටුවට බලශක්ති ඇමැති උදය ප්‍රභාත් ගම්මන්පිල, අධිකරණ ඇමැති අලි සබ්‍රි, කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා, කර්මාන්ත ඇමැති විමල් වීරවංශ, උසස් අධ්‍යාපන, විවෘත විශ්වවිද්‍යාල ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේම්ජයන්ත්, තැපැල් සේවා හා ජනමාධ්‍ය වෘත්තීය ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති එස්. වියලේන්ද්‍රන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඩිලාන් පෙරේරා, ප්‍රේමනාත් සී. දොළවත්ත මහත්වරු ඇතුළත් වෙති. මේ කමිටු වාර්තාව හෙට (15) අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා වෙත භාර දීමට නියමිතය.

බස්නාහිර කළ වැටලීමකින් මත් ද්‍රව්‍ය ළඟ තබාගත් 699ක් දැලේ

බස්නාහිර පළාත තුළ පෙරේදා (12) පෙරවරු 6 සිට ඊයේ (13) පෙරවරු 5 දක්වා කළ විශේෂ වැටලීම්වලින් හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි පුද්ගලයන් 699ක් අත්අඩංගුවට ගෙන තිබේ. හෙරොයින් ළඟ තබාගෙන සිටි පුද්ගලයෙන් 261 දෙනකු, ගංජා ළඟ තබාගෙන සිටි පුද්ගන් 184දෙකු, නීතිවිරෝධී මත්පැන් ළඟ තබාගෙන සිටි පුද්ගලයන් 166දෙනෙකු සහ ගෝඩා ළඟ තබාගෙන සිටි පුද්ගලයින් 10 දෙනකු එහිදී අත්අඩංගුවට ගෙන තිබේ.

එමෙන්ම අයිස් මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි පුද්ගලයන් 32ක් සහ වෙනත් මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි පුද්ගලයන් 46ක් ද අත්අඩංගුවට ගෙන තිබේ.

ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත

- කිරිඇල්ල කියනව බං, හන්තාන ඉඩම එළි කළේ වගා රැල්ලට සහයෝගය දෙන්න කියල !
- අපිනං හිතුවෙ ස්ර්, වන සංහාර රැල්ලට සහයෝගය දෙන්න කියල !

බුලුවිට ගල් ලෙනේ ඉදිරි ගවේෂණ මේ සතියේ සිට

උපාලි කරුණාරත්න

කළුතර වළල්ලාවිට බුලුවිට ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මානවයා සිටි බවට සැක කළ හැකි ගල් ලෙනෙහි ඉදිරි ගවේෂණ කටයුතු මේ සතියේ ආරම්භ කරන බව බස්නාහිර පළාත් පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ නයනා ද සිල්වා මහත්මිය ප්‍රකාශ කළාය.

කළුගල් ව්‍යාපෘතියක් ඒ සඳහා සුදුසු දැයි පරීක්ෂා කිරීමේදී මෙම ගල් ලෙන හමු වී තිබේ. එය පරීක්ෂා කිරීමේදී ගල් ආයුද කොටස් ද හමු වී ඇත.

ඒවා පරීක්ෂා කිරීමේදී ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බව හඳුනාගෙන තිබේ.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතාගේ උපදෙස් මත අදාළ ස්ථානයේ ගවේෂණ කටයුතු සිදු කරන අතර, ඒ සඳහා පුරාවිද්‍යා නිලධාරීන් කණ්ඩායමක් එම ස්ථානය කරා පිටත්ව යන බවට ද නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය කීවාය.

පළමුව අදාළ ස්ථානයේ භූමි ප්‍රමාණය සලකුණු කර එය ගැසට් කරන බව පැවසූ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව ද පැවසුවාය.

අමෙරිකාවේ ලැව් ගිනි

30ක් මරුට: පිරිසක් අතුරුදන්

බුද්ධි කරුණාරත්න

අමෙරිකාවේ බටහිර වෙරළ තීරයට සමගාමී ප්‍රාන්තවල ඇති වී තිබෙන ලැව්ගිනිවලින් මේ වන විට 30කට වැඩි පිරිසක් මියගොස් තවත් පිරිසක් අතුරුදන් වී ඇත. ඔරෙගන්වල පමණක් විශාල පිරිසක් අතුරුදහන් වී ඇත. මෙය මහා මාරාන්ක සිද්ධියක් යැයි ආපදා නිලධාරියකු උපුටා දක්වන බීබීසී පුවත් සේවය පවසයි. ඔරෙගන්, කැලිෆෝනියා සහ වොෂිංටන්වල සති තුනක් තිස්සේ ගිනි ඇවිලෙමින් පවතියි. මේ ගිනිවලින් අක්කර මිලියන ගණනක වනාන්තර විනාශ වී ගොස් ඇති අතර නිවාස දහස් ගණනක් ද ගින්නට හසු වී තිබේ.

දස දහස් ගණන් ජනතාවට උන්හිටිතැන් අහිමි වී තිබේ. පාරිසරික වෙනස්වීම් අද දවසේ රටවැසියන්ගේ ජීවිතවලට බලපා ඇතැයි ද ජනාධිපති ට්‍රම්ප් මේ ගැන සැලකිල්ලෙන් කටයුතු කරන්නේ නැතැයි ද ඩිමොක්‍රටික් ජනාධිපති ධූර අපේක්ෂක ජෝ බිඩන් සෙනසුරා කීවේය. ට්‍රම්ප් විපතට පත් කැලිෆෝනියා ප්‍රාන්තයේ සඳුදා (අද දින) සංචාරය කිරීමට නියමිතව තිබූ අතර, දුර්වල වන කළමනාකරණය ගින්නට හේතු වී යැයි ඔහු චෝදනා නඟා තිබේ.

අයිකිව්එයාර්ඩොට්කොම් වෙබ් අඩවිය පවසන පරිදි ඔරෙගන්හි විශාලම නගරය වන පෝර්ට්ලන්ඩ්හි සහ සැන්ෆ්‍රැන්සිස්කෝ හා සියැටල්හි වායු දූෂණය ලොව ඉහළම දූෂණ මට්ටමට පැමිණ ඇත. ඔරෙගන්හි විශාල ගිනිගැනීම් 16ක් නිවීම සඳහා ගිනිභටයින් සටන් කරමින් සිටින අතර 40,000ක් නිවැසියන් අනිවාර්යයෙන්ම ඉවත් කිරීමට නියමිත විය.

ප්‍රේක්ෂා නාට්‍ය උලෙළින් අද

ටවර් හෝල්හි - **හිනාවෙලා මිනිත්තුවක්**
එල්ෆින්ස්ටන්හි - **හස්තිරාජ මහත්තයා**

උපාලි කරුණාරත්න

ටවර් හෝල් රඟහල පදනම ඉදිරිපත් කරන ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ යටතේ අද (14) මරදාන ටවර් රඟහලේදී 'හිනාවෙලා මිනිත්තුවක්' නාට්‍ය සහ එල්ෆින්ස්ටන් රඟහලේදී 'හස්තිරාජ මහත්තයා'වේදිකා ගත වේ.

සචිත්‍ර රාහුබද්ධ නිර්මාණය කළ හස්තිරාජ මහත්තයා නාට්‍යයේ සංගීතය චම්දු විජේරත්නගෙනි. ප්‍රසන්නජිත් අබේසූරිය, ජයනාත් බණ්ඩාර, ප්‍රදීප් රාමවික්‍රම, හර්ෂිකා රත්නායක මේ සඳහා රංගනයෙන් දායක වෙති.

හිනාවෙලා මිනිත්තුවක් නාට්‍යය අඛිල සපුමල්ගෙනි. සංගීතය ලහිරු මාඩිවිල ගෙනි. නිලන්ත ගමගේ, තිලාන් වර්ණජිත්, කිත්මිණි හේමචන්ද්‍ර, ඉෂාර වික්‍රමසිංහ, නයෝමි තක්ෂිලා රංගනයෙන් දායක වෙති.

මේ සෑම නාට්‍යයක්ම පස්වරු 3.30ට හා 6.30ට වේදිකාගත වේ.

මෝටර් රථ ධාවන වැරදි දන්වන්න 'බෑඩ් බස්' මැයෙන් ඇප් එකක්

නිමල් රාජපක්ෂ

මෝටර් රථවල සිදු වන අක්‍රමිකතා පිළිබඳ පැමිණිලි කිරීමට ප්‍රවාහන අමාත්‍යංශයෙන් බෑඩ් බස් (Bad Bus) නමින් ඇප් එකක් හඳුන්වාදී ඇත.

මෙම ඇප් එක හරහා ලැබෙන පැමිණිලි ක්‍රියාමත්මක කිරීම සඳහා වෙනමම මෙහෙයුම් මැදිරියක් ආරම්භ කරන බව ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

මාර්ගයේ ධාවනය වන බොහෝ මෝටර් රථ රියැදුරන් සිදු කරන වැරදි, අපරික්ෂාකාරී රිය ධාවනය, ජංගම දුරකතන භාවිතා කරමින් රිය ධාවනය, මාර්ග සංඥා නොතකා රිය ධාවනය, පොදු ප්‍රවාහනයේදී වාහන අංකය ප්‍රදර්ශනය නොකිරීම, බුලත්විට සපමින් රාජකාරී කිරීම, නිල ඇඳුම නොමැතිව රිය ධාවනය, අපිරිසුදු බස්රථ ධාවනයට යෙදවීම, කාන්තා හිංසනය, ඇතුළු සියලු වැරදි සඳහා අදාළ ඇප්එක වෙත තම ජංගම දුරකතනයෙන් ලබා ගත් ඡායාරූපයක් හෝ වීඩියෝ පටයක් මඟින් එවීමට හැකිය.

සෙලවෙයි යළි කන්ද උඩ රට මහ	පොළොව
තවමත් කිසිවකුට නැත හේතුව	හසුව
"නායකකම අතැර යම්" යන අලි	බොරුව
කියනා තැනැත්තා ඇත වග කිව	යුතුව

නිදහස ලද දිනේ සිට නෙක අතට	ඇද
අප තවමත් සිටින්නේ යන අතර	මැද
එනිසා බේද අතහැර හරි තැනක	ඉඳ
හෙට ගැන හිතා රට කරවන එකය	හොඳ
පිල් දෙකකට බෙදී ඇද විස්සේ	කඹය
එලයක් වෙන්නෙ නෑ ඇති කර ගෙන	හබය
එය කළමනාකරණය කළ යුතු	ඔබය
නිවැරදි තැනට ගමු දෙස්පාලන	ලඹය

රටේමුල්ලේ මුදන්නායක

මිල ගණන් කැඳවීම

ලංකා සතොස ලිමිටඩ් වෙත සීසීටීවී නිරීක්ෂණ පද්ධති සැපයීම, සවි කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම

ලංකා සතොස ලිමිටඩ් (ලසලි) වෙත සීසීටීවී නිරීක්ෂණ පද්ධති සැපයීම, සවිකිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම (අලෙවිසැල්, බෙදාහැරීම් ගබඩා, ප්‍රධාන කාර්යාලය) සඳහා දේශීය සැපයුම්කරුවන්, දේශීය නියෝජිතයින්, ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගේ ආනයනකරුවන්, නිෂ්පාදකයින් වෙතින් සභාපති, ලංකා සතොස ලිමිටඩ් විසින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

පිරිවිතර : ලංසු ලේඛනයේ දැක්වෙන පරිදි

අවශ්‍යතාව : ලංසු ලේඛනයේ දැක්වෙන පරිදි

මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින්, අදාළ ලංසු ලේඛන, **රු. 5,000.00 ක** මුදලක් **(ආපසු නොගෙවන)** ගෙවා **2020.09.14** සිට **2020.10.06** දින අංක 27. සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටි ලංකා සතොස ප්‍රධාන කාර්යාලයේ, මිලදී ගැනීම් අංශයෙන් (3 වෙනි මහල) ලබාගත යුතුය.

ඉදිරිපත් කරන මිල ගණන්, **2020.10.06** දින ප.ව. **01.00** ට හෝ ඊට පෙර ලංකා සතොස ලිමිටඩ්, අංක 27. සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම ලිපිනයෙහි මිලදී ගැනීම් අංශයෙහි, (3 වන මහල) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. මුද්‍රා තබන ලද මිල ගණන් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "**ලංකා සතොස ලිමිටඩ් වෙත සීසීටීවී නිරීක්ෂණ පද්ධති සැපයීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

සියලුම ලංසුකරුවන් විසින් තක්සේරු වටිනාකමින් 2% මුදලක ලංසු සුරක්ෂණයක් (ආපසු ගෙවනු ලබන) ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

මිල ගණන් භාරගැනීම **2020.10.06** දින ප.ව. **01.00** ට අවසන් වන අතර, මිල ගණන් විවෘත කිරීම, මිල ගණන් භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේ සිදු කරනු ඇත. ජයග්‍රාහි ලංසුකරු විසින් (ලියාපදිංචි සැපයුම්කරුවන් හැර) ලියාපදිංචි ගාස්තු වශයෙන් **රු. 20,000.00 ක මුදලක් (ආපසු නොගෙවන)** සහ තක්සේරු කරන ලද වටිනාකමින් 10% ක මුදලක් කාර්යසාධන සුරක්ෂිතයක් (ආපසු ගෙවන) ලෙස ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා පහත නිලධාරියා අමතන්න.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මිලදී ගැනීම් ලසලි - 071-1506120, 077-2535354

ටෙන්ඩරය / කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවසන් තීරණය ලංකා සතොස ලිමිටඩ් සභාපති සතු වේ.

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්

වෙළෙඳ අමාත්‍යාංශය

අඩුම මිලට ඔබේම තැන

ලංකා සතොස LANKA SATHOSA லங்கா சதொச

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 14 සඳුදා

සෙල්ලමත් ව්‍යාපාරයක්!

අපේ ක්‍රීඩා වෘත්තිය මට්ටමට පරිවර්තනය කරන බවත්, එම ක්ෂේත්‍රයෙහි ව්‍යවසායකයන් බිහි කරන බවත් අමාත්‍ය නාමල් රාජපක්ෂ කියා සිටී. අමාත්‍යවරයාගේ සැලැසුමට අනුව ඉදිරි කාලයේදී ඩොලර් බිලියනයකට වැඩි මුදලක් මෙරට ක්‍රීඩා ආශ්‍රිතව ජාතික ආදායමට එක් කළ හැකි බව ද සඳහන්ය. දැනට රට තුළ වෘත්තිය මට්ටමේ ක්‍රීඩාවක් හැටියට පවතින්නේ ක්‍රිකට් පමණි. එහි ද නිසි නියාමනයක් නැති බව පවත්නා අවුල්වලින් පෙනී යයි. සෙසු ක්‍රීඩා පවතින්නේ ජාතියේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමට, සහජීවනය දියුණු කිරීමට හා රටේ කීර්තිනාමය රැකීමට පමණක්'යි කිව හැකිය. අපේ ක්‍රීඩාවෙන් ලබන ආර්ථික වාසි නැත. එහෙත් දියුණු රටවල් ජීවන මාර්ගයක් ලෙස ද ව්‍යාපාරයක් ලෙස ද ක්‍රීඩාව භාවිත කරයි.

අමෙරිකාවේ බේස් බෝල් ක්‍රීඩකයකු මාසිකව ලබන ආදායම අපට හිතා ගන්නටවත් බැරි තරම්ය. ප්‍රංශය, ඉතාලිය, පෘතුගාලය වැනි රටවල පාපන්දු ක්‍රීඩකයන් ලබන ආදායම ද එබඳුය. බොක්සිං, මල්ලව පොර වැනි ක්‍රීඩා පවා අන්තර්ජාතික වශයෙන් මුදල් උපයන සාර්ථක ව්‍යාපාර බවට පත් වී ඇත. අන්තර්ජාතික තරඟවලට සහභාගි වන පා-පැදි ශූරයෝ, මෝටර් රථ ධාවන ශූරයෝ විශාල වශයෙන් මුදල් උපයති. මේවා සංවිධානාත්මක තරග නිසා ලොව පුරා ප්‍රකටය. එම ක්‍රීඩා ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන තවත් ව්‍යාපාර පවතී. ඒවායින් විශාල පිරිසකගේ ජීවන මාර්ග සැලැසී ඇත. ක්‍රීඩාව වෘත්තියක් ලෙස ද ව්‍යාපාරයක් ලෙස ද පවත්වා ගැනීමෙන් ආර්ථික වාසි රාශියක් ලැබිය හැකිය.

ක්‍රීඩාව සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ඉතා හොඳින් භාවිත කළ හැකිය. නේපාලය දකුණු ආසියාවේ සංචාරක කර්මාන්තයට ප්‍රකට රාජ්‍යයකි. කඳු නැගීමේ ක්‍රීඩාව සඳහා විදේශිකයෝ සැලකිය යුතු පිරිසක් නේපාලයට එති. එවරස්ට් පිහිටා ඇත්තේ ද නේපාලයෙහිය. එවරස්ට් නැගීම සඳහා ක්‍රීඩකයෝ සමූහ පිටින් ඒ අවට ලැගුම් ගනිති. එය ධනෝපායන මාර්ගයක් ලෙස පවතී. සර්ෆින් නම් ජල ක්‍රීඩාව සඳහා ඇතැම් විදේශීය ක්‍රීඩකයෝ ශ්‍රී ලංකාවට එති. සංචාරක හෝටල් ආශ්‍රිතව සර්ෆින් ක්‍රීඩාවෙහි උපදේශකයන් සිටිනු අප දැක තිබේ. එහෙත් එය ව්‍යාපාරයක් ලෙස සංවිධානගත නැත. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට අදාළ කර ගත හැකි තවත් ක්‍රීඩා රැසක් පවතී.

කැලණි ගඟෙහි ඉහළ කොටස භාවිතයට ගනිමින් ත්‍රාසජනක ක්‍රීඩා ජනප්‍රිය කරවීමේ වැඩසටහනක් කලකට පෙර ක්‍රියාත්මක විය. එය විදේශීය ක්‍රීඩකයන් අතර ජනප්‍රිය වෙමින් පැවැති බව ද වාර්තා වී තිබිණි. එහෙත් කුමන හෝ හේතු - සාධක නිසා එම ක්‍රීඩා වැඩසටහන නැවැතිණි. කොරෝනා වසංගතයටත් පෙර එය සිදුවී තිබිණි. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය තුළ දිය ඇලි විශාල ප්‍රමාණයක් තිබේ. ඒවා ආශ්‍රිතව පවත්වාගත හැකි ක්‍රීඩා විශේෂ ගණනාවක් ඇත. කිසිවකුගේ අවධානය ඒ කෙරෙහි යොමු වී නැත. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා නිර්මාණශීලී ව හිතන මතන නිලධාරී පිරිසකගේ අවශ්‍යතාව ද මෙහි දී මතු වෙයි. ක්‍රීඩා අධ්‍යාපනයෙන් ඩිප්ලෝමා හා උපාධි ලබන පිරිසක් ද රටේ සිටිති.

අපේ ක්‍රීඩක - ක්‍රීඩිකාවන් සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීම දුෂ්කර කටයුත්තක් වී තිබේ. අනුග්‍රාහකයන් සොයා ගත යුත්තේ ව්‍යාපාරික ආයතන වෙතින්ය. එහෙත් මෙරට ව්‍යාපාරිකයන් ක්‍රීඩාව කෙරෙහි යොමු වන බවක් පෙනෙන්නට නැත. ක්‍රීඩාව ඔස්සේ ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ ගැන ඔවුන් දැනුම්වත් නැත. අන්තර්ජාතික බොක්සිං තරග ගණනාවකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්ති නාමයක් අත් කර දුන් එක්තරා ක්‍රීඩකයෙක් පුවත්පතකට ලිපියක් ලියමින් ඉල්ලා සිටියේ තමන්ට හා තම දරුවන්ට ජීවත්වීම සඳහා කිසියම් රැකියාවක් ලබා දෙන ලෙසය. ඔහුට ආරක්ෂක නිලධරයකු හැටියට හෝ රැකියාවක් ලබා දීමට ව්‍යාපාරික ආයතනයක් ඉදිරිපත් වූ බවට සඳහනක් නැත. මේ වනාහී අපේ ක්‍රීඩාවේ දුප්පත්කම පිළිබඳ එක්තරා කතාවක් පමණි.

ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා ඇති ක්‍රීඩා සංගම් දුර්වලය. එමෙන්ම ඒවා අතිශය දුප්පත්ය. පාසල් ක්‍රීඩා සමාජ පවා සක්‍රීය නැත. ප්‍රාදේශීය වශයෙන් තරග පවත්වා මුදල් උපයන ක්‍රමයක් ද අපට නැත. රට පුරා කලින් - කල ක්‍රිකට් උන්මාද ඇති වන්නේ වුව එම තත්ත්වය සාධනීය හැරවුම් ලක්ෂ්‍යයක් කරගන්නා අය නැත. වොලිබෝල්, එල්ලේ වැනි ක්‍රීඩා කෙරෙහි නැඹුරු වූ විශාල පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල සිටිති. පාපන්දු ක්‍රීඩාවට යොමු වූ තවත් පිරිසක් නාගරික ප්‍රදේශවල සිටිති. මේ අය සංවිධානගත කිරීම ඔස්සේ ක්‍රීඩාව දියුණු කළ හැකිය. එලෙසම එය ව්‍යාපාරික නැඹුරුවකින් යුතුව ඉදිරියට ගෙන යා හැකිය.

අමාත්‍යවරයා අපේක්ෂා කරන අරමුණු ජය ගැනීමට නම්; ක්‍රීඩාව ජන ජීවිතයේ කොටසක් බවට පත්කර ගත යුතුය. ක්‍රීඩාව විනෝදය සපයන මාධ්‍යයක් ලෙස ජන සමාජයෙහි තහවුරු කිරීම ඉතා වටී. ක්‍රීඩාවටම වෙන් වූ රූපවාහිනී සහ රේඩියෝ නාළිකා පවති. ඇතැම් රටවල ක්‍රීඩාවට සම්බන්ධ විදුත් මාධ්‍ය ලොව පුරා ප්‍රකටය. චීනයේ වූෂු සටන් කලාව සඳහා වෙන් වූ රූපවාහිනී චැනලයක් තිබේ. එය වූෂු සටන් කලාව ආශ්‍රයෙන් නිපදවූ සිනමා කෘති දවස පුරා ප්‍රදර්ශනය කරයි. එය සාර්ථක ව්‍යාපාරයක් බවට ද පත් වී ඇත. ක්‍රීඩාවේ ව්‍යාපාරික පැත්ත මතු කර ගැනීම සඳහා අලුතින් සිතන තරුණ පිරිසක් අවශ්‍ය වේ. ඒ තරුණ පිරිස අපට සිටිති.

ජනාධිපතිවරයා සුදුසුම පුද්ගලයන් වෙත එකිනෙක අමාත්‍යාංශ භාරදී ඇති බව ඉතා පැහැදිලිය. නාමල් රාජපක්ෂ තරුණ මන්ත්‍රීවරයා ද එය සනාථ කර තිබේ. රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය ඔහු වැනි තරුණ ජවසම්පන්න මන්ත්‍රීවරයකුට භාර කිරීම ඉතා කාලෝචිතය. ඔහු එක අතෙකින් කාර්යක්ෂම මන්ත්‍රීවරයෙකි. තව අතෙකින් ක්‍රීඩකයෙකි. නාමල් රාජපක්ෂ මහතා සැලසුම් කර ඇති වැඩසටහන් සාර්ථක කර ගත හොත් ක්‍රීඩාවත් දියුණු වෙයි. ආර්ථිකයත් දියුණු වෙයි.

ඇරඹී ඇති නිසා පාසල්, කන්තෝරු
මහ මඟ යළිත් තදබදයට විය මාරු
බස් ධාවනය විය යුතු කොටසෙයි තේරු
අද සිට වැඩ කරයි නීතිය මංතීරු

මහනුවර වෘත්තීයවේදීන්ගේ සංගමය මගින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් සංවිධානය කර තිබූ සම්මන්ත්‍රණයකදී අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා දැක්වූ අදහස් ඇසුරෙන් මේ ලිපිය සකස් කෙරිණි.

විසිවන ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය වන්නේ ඇයි?

අධ්‍යාපන අමාත්‍ය
මහාචාර්ය
ජී.එල්. පීරිස්

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ නිර්මාණය වෙමින් තිබෙන සමාජ කතිකාව තුළ එයට පක්ෂව මෙන්ම විපක්ෂව ද මත ඉදිරිපත් වෙමින් තිබේ. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් තහවුරු වූ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, බලය බෙදීම, අධිකරණයේ ස්වාධීනත්වය වැනි සමාජය ගරු කරන සංකල්ප විසිවන ව්‍යවස්ථා සංශෝධනය මගින් අහෝසි වී යන බවට මතවාදයක් විස්සට එරෙහි බලවේග මගින් මෙවන විටත් සමාජගත කරන්නට උත්සාහ කරමින් සිටිති. මෙම ජාතිද්‍රෝහී වැඩපිළිවෙළට එකහෙළා විරුද්ධ විය යුතු බව පවසන මෙම පිරිස් එසේ නොවුණ හොත් ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් පමණක් නොව පාර්ලිමේන්තුවට ද මරු පහරක් එල්ල වන බව පවසති. මෙම පසුබිමේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ජනතාව දැනුවත් කරමින් එහි යථාර්ථය කුමක්ද යන්න සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම කාලෝචිත අවශ්‍යතාවකි. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය රැක ගත යුතු බව කියන පිරිස් ඒ වෙනුවෙන් ගෙන හැර දක්වන උදාහරණ ඔස්සේ ජනගත කිරීමට උත්සාහ කරන මිථ්‍යාව බිඳ දැමිය හැක්කේ එමගින් ඇතිව තිබෙන අර්බුද මොනවාද යන්න සරලව ජනතාවට තේරුම් කර දීමෙනි.

■ පටු පර්මාර්ථ

නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා වූ ක්‍රියාවලියට ප්‍රථම මේ සම්බන්ධ යථාර්ථය රටට පැහැදිලි කර දීම අත්‍යවශ්‍ය කාරණයකි. එසේ නොකර මෙය හදිසියේ සම්මත කර ගැනීම සුදුසු නොවන අතර රජය මේ ආකාර තීරණාත්මක පියවරක් ගැනීමට තීරණය කළේ ඇයි ද යන්න සම්බන්ධව ජනතාවට වැටහීමක් හා අවබෝධයක් දීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි. විසිවන ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව යම් යම් බලවේග දැවැන්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් සිටින්නේ පටු පර්මාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ අදහස ඇතිවය. රටකට ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ ඇයි කියන කාරණය පිළිබඳව අප අවධානය යොමු කළ හොත් ප්‍රමුඛතා කිහිපයක් ඒ සඳහා පෙළ ගැස්සවීමට පුළුවන. ආර්ථික සංවර්ධනය, සංස්කෘතික පුනර්ජීවනය ඇතුළු තවත් කාරණා ගණනාවක් මේ සඳහා පෙන්වා දිය හැකිය. ඒ සියල්ලට වඩා වැදගත් වන කාරණයක් තිබේ. ඒ ජාතික ආරක්ෂාවයි. සියල්ලට වඩා වැදගත් වන්නේ රටක ජීවත් වන ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගැනීමයි. මේ නිසා ආණ්ඩුවක මූලික යුතුකම වන්නේ රටක ආරක්ෂාව තහවුරු කිරීම බව අපට පෙන්වා දීමට පුළුවන.

දිවිහිමියෙන් ආරක්ෂා කර ගත යුතු බවට පිරිසක් ප්‍රකාශ කරන 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙරට ජාතික ආරක්ෂාවට සිදු වූයේ කුමක්ද යන්න සියල්ලට පෙර අප තේරුම් ගැනීම වැදගත්ය. මෙරට ජනපති ධුරයට යමකු පත් කර ගනු ලබන්නේ ඡන්ද අයිතිය ඇති රටේ සියලුම ජනතාවගේ කැමැත්ත විමසා පවත්වනු ලබන මැතිවරණයකිනි. සර්වජන ඡන්ද බලය පාවිච්චි කර ජනතාව විසින් බහුතර කැමැත්ත මත පත් කර ගනු ලබන ජනපතිවරයාගේ ප්‍රමුඛතම වගකීම වන්නේ රටේ ආරක්ෂාව තහවුරු කිරීමයි. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනපතිවරයාට ආරක්ෂක ඇමැති ධුරය පමණක් නොව කිසිදු ඇමැති ධුරයක් දැරීමේ හැකියාව අහෝසි කර තිබේ. මෛත්‍රීපාල සිරිසේන මහතා ජනපති ධුරයේ කටයුතු කරන කාලය තුළ පමණක් ඔහුට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය දැරීමට අවකාශ සලසමින් අදාළ සංශෝධනය කර තිබිණි. එය පුද්ගල කේන්ද්‍රීය ව්‍යතිරේකයකි. ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් ආදි සියල්ල එවැනි වගන්තියකින් ආරක්ෂා වන්නේ ද යන ප්‍රශ්නය අප හමුවේ තිබේ.

■ විධායක බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 හා 04 වගන්ති මගින් මේ ගැටලුව සම්බන්ධ පැහැදිලි අවබෝධයක් ලද හැකිය. එහි 04 (අ) කොටසේ විධායක බලය නිර්වචනය කර තිබේ. රටේ ආරක්ෂාව තහවුරු කිරීම විධායකයට පැවරෙන බව එහි පැහැදිලිව දක්වා ඇත. 03 න් වන වගන්තිය මගින් විධායක බලය පැවරෙන්නේ රටේ ජනතාව විසින් පත් කර ගනු ලබන ජනපතිවරයාට බව පෙන්වා දී තිබේ. විධායක බලයේ සංකේතය ජනපති බව එමගින් පැහැදිලිය. රටේ ආරක්ෂාව විධායක බලයේ අන්තර්ගත ප්‍රධාන කොටසකි. රටේ ආරක්ෂාව තහවුරු කිරීම විධායක ජනපතිවරයාගේ ප්‍රමුඛ වගකීමක් බව ව්‍යවස්ථාව මගින්ම පෙන්වා දී තිබියදී විධායක ජනපතිවරයාට ආරක්ෂක ඇමැති ධුරය දැරීමට නොහැකි වීම අර්බුදයක් වෙත රට කැන්දාගෙන යෑමක් නොවේද? ජනපතිවරයාට එක් පැත්තකින් වගකීමක් පවරා අනෙක් පැත්තෙන් එම වගකීම ඉෂ්ට කිරීමට ඇති බලය අහිමි කිරීම 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇතිකර තිබේ. මෙමගින් සිදුවූයේ රටේ ආරක්ෂාවේ පදනම දෙදරා යෑමයි.

දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දීමට පෙර දින හතක් තුළ හදිසි පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ බලය රජයට තිබිණි. පනතක් ඉදිරිපත් කිරීම දීර්ඝකාලීන වැඩපිළිවෙළකි. යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් ඉක්මනින් පාර්ලිමේන්තුවේ මැදිහත් වීම අවශ්‍ය මොහොතක හදිසි පනතක් දින 07 ක් තුළ ඉදිරිපත් කිරීමට තිබූ අවකාශය 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් දින 14 ක් දක්වා ඉහළ දැමීමෙය. හදිසි අවස්ථාවකදී ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා ආණ්ඩුවට තිබූ බලය 19 මගින් පැහැර ගැනීමක් කළේ යැයි

> **ජනතාව විසින් පත් කරනු ලබන ජනපතිවරයාට වඩා වැඩි බලතල කොමිෂන් සභාවලට ඇත. එහෙත් වසර පහකින් පසු ජනපතිවරයා ජනතාව හමුවට ගොස් ගත වූ කාලය තුළ තමන් කළ කී දෑ සම්බන්ධව ජනතා මතය උරගා බැලිය යුතුය. ජනතාව සැහීමකට පත් නොවන්නේ නම් ඔවුන් කරන්නේ ජනපතිවරයා ගෙදර යැවීමය.**

පැවසීම නිවැරදිය. එකිනෙක සමඟ ගැටෙන බල කේන්ද්‍ර දෙකක් මෙම සංශෝධනයෙන් නිර්මාණය විය. ජනපතිවරයා සතු යම් යම් බලතල අගමැතිවරයා අතට පත් විය. දේශපාලන පක්ෂ දෙකක් එකතු වී සහාග රජයක් පවත්වාගෙන යන අවස්ථාවක ජනපතිවරයා එක් පක්ෂයකත් අගමැතිවරයා තවත් පක්ෂයකත් වූ විට ප්‍රතිපත්ති පිළිබඳව හා දර්ශනය සම්බන්ධයෙන් පුද්ගල කේන්ද්‍රීය ගැටුම් නිර්මාණය වීමේ ප්‍රවණතාවක් ඇති වූ අතර යහපාලන ආණ්ඩු කාලයේ දී එය මෙරට ජනතාවට පැහැදිලිව දක්නට ලැබිණි. එයට වන්දි ගෙවීමට සිදු වූයේ මෙරට ජනතාවටය. පාඨකු ප්‍රහාරය එහි එක් ප්‍රතිඵලයකි. ජනපතිවරයා මෙන්ම අගමැතිවරයා ද මෙම ජීවිතවල වගකීම බාර නොගත්හ.

ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම්වලට තමන්ට ආරාධනා නොකරන බව අගමැති පැවසුවේය. අගමැතිවරයා විසින් නිකුත් කරනු ලබන නිවේදන ජනපතිවරයා දැනුවත් ද නැද්ද යන්න ප්‍රශ්නයකි.

■ ඉහළ තනතුරු

දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනපතිවරයාට ඉහළින් යම් යම් ආයතන නිර්මාණය විය. පොලීසියේ හා රාජ්‍ය සේවයේ ඉහළ තනතුරුවලට ප්‍රධාන තනතුරුවලට පුද්ගලයින් පත් කිරීමේ බලය ජනපතිවරයා වෙතින් උදුරා ගනු ලැබ එය රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් ප්‍රමුඛ ව්‍යවස්ථා මණ්ඩලයක් යටතට පත් කෙරිණි. ස්වාධීන යැයි කියාගත් සියලුම කොමිෂන් සභාවන්හි සාමාජිකයන් පත් කරනු ලැබුවේ මෙම ව්‍යවස්ථා මණ්ඩලය මගිනි. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධව ඍජුව සම්බන්ධ වන පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා පත්කිරීමේ හැකියාවක් ජනපතිවරයාට නොතිබිණි. ඒ සඳහා ව්‍යවස්ථා මණ්ඩලයේ නිර්දේශය හෝ අනුමැතිය අත්‍යවශ්‍ය විය. මෙරට ජනතාව තමන්ගේ ඡන්දයෙන් පත් කරනු ගනු ලබන ජනපතිවරයා අබිබවා තීරණ ගැනීමේ බලයක් ව්‍යවස්ථා මණ්ඩලය සතු වීම නිසා පොලිස්පතිවරයා ඉවත් කර ගැනීම පවා ජනපතිවරයාට කළ නොහැකි තත්ත්වයක් උදා විය. ජනපතිවරයාගේ බලතල කප්පාදු කරමින් ඒවා කිසිදු ආකාරයකින් ජනතාවට වග නොකියන පිරිසකගෙන් සැදුම්ලත් ව්‍යවස්ථා මණ්ඩලයට හා ස්වාධීන කොමිෂන් සභාවලට පැවරීම කෙතරම් දුරට සාධාරණ ද යන්න සලකා බැලිය යුතුය. දේශපාලන බලපෑම්වලින් මෙම පත්වීම් කළ යුතු බවට 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය රැක ගැනීම වෙනුවෙන් පෙනී සිටින පිරිස් පැවසුවත් ව්‍යවස්ථා මණ්ඩලය හා ස්වාධීන කොමිෂන් සභා නියෝජනය කළ පිරිස් දේශපාලනයෙන් තොරව කටයුතු නොකළ බව රටම දන්නා කරුණකි. පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් වඩා මොවුන් දේශපාලනයේ නිරත වූ බව තව දුරටත් රහසක් නොවන්නේය.

මෙරට ආර්ථිකය අද පවතින්නේ දැඩි අර්බුදකාරී තත්ත්වයකය. යහපාලන ආණ්ඩු සමයේ බරපතළ ආර්ථික කඩාවැටීමක් රටේ සිදු විය. ණය වෙනුවට ආයෝජන රටට ගෙන්වා ගැනීම ආර්ථික අර්බුදයෙන් ගොඩ එමට ඇති එක් ප්‍රධාන විසඳුමකි. ලෝක ආර්ථිකය තුළ පවත්නා තරගකාරිත්වය තුළ ආයෝජකයන් දිනා ගැනීම සඳහා ඇත්තේ දැඩි තරගයකි. වියට්නාමය, පිලිපීනය, මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවල් මෙම තරගයට සාර්ථකව මුහුණ දෙමින් සිටින්නේය. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ ජනපති හා අගමැති අතර පැවැති බල අරගලය රටේ ආර්ථිකයකට අයහපත් ලෙස බලපෑවේය. අගමැතිවරයා තමන්ට පැවරුණු බලතල අනුව ආර්ථිකය කළමනාකරණ කමිටුවක් පත් කළේය. තමන්ගේ හිතවතුන් මෙයට පත් කර එමගින් ගන්නා තීන්දු තීරණ වලට අනුමැතිය දෙන මුද්‍රාවක් ලෙස කැබිනට් මණ්ඩලය පත් කළ ස්වභාවයක් පැහැදිලිව දක්නට ලැබිණි. මෙමගින් සිදු වූයේ කැබිනට් මණ්ඩලය සතු බලය කමිටුව මගින් උදුරා ගැනීමකි. මෙම කමිටුව කැබිනට් මණ්ඩලය ද අභිබවා කටයුතු කිරීම සම්බන්ධයෙන් නොසතුටට පත් ජනපතිවරයා විසින් එම කමිටුව අහෝසි කර ජාතික ආරක්ෂක මණ්ඩලයක් පත් කරනු ලැබිය. එයට ජනපතිවරයා විසින් පත් කරනු ලැබුවේ ඔහුගේ හිතවතුන්ය. එහි සභාපති ලෙස පත් කළ පුද්ගලයා රුපියල් ලක්ෂ 04 ක පමණ වැටුපක් ලබාගෙන තිබෙන්නේ රටේත් නොසිටියදී බව ජනපතිවරයාම පවසා අඳාළ මණ්ඩලය අහෝසි කිරීමට පියවර ගත්තේය. මෙවැනි වාතාවරණයක් රටේ තිබියදී රටට අයෝජකයින් ඇදී එන්නේ නැත. ලෝකයටම පැහැදිලිව පෙනෙන අවුල් ජාලයක් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් රටේ ඇති කර තිබිණි.

■ කොමිෂන් සභා

ජනතාව විසින් පත් කරනු ලබන ජනපතිවරයාට වඩා වැඩි බලතල කොමිෂන් සභාවලට ඇත. එහෙත් වසර පහකින් පසු ජනපතිවරයා ජනතාව හමුවට ගොස් ගත වූ කාලය තුළ තමන් කළ කී දෑ සම්බන්ධව ජනතා මතය උරගා බැලිය යුතුය. ජනතාව සැහීමකට පත් නොවන්නේ නම් ඔවුන් කරන්නේ ජනපතිවරයා ගෙදර යැවීමය. එසේ වුවත් ජනපතිවරයාටත් වඩා ඉහළින් සිට තීන්දු තීරණ ගන්නා ව්‍යවස්ථා මණ්ඩලයේ හා කොමිෂන් සභාවල නියෝජිතයන් සම්බන්ධයෙන් ඒ අකාර තීන්දුවක් ගැනීමට ජනතාවට නොහැකිය. පසුගිය නොවැම්බර් මාසයේ පටන් මේ දක්වා ජනපති, අගමැති, ආණ්ඩුව, කැබිනට් මණ්ඩලය වෙනස් වුවත් මේ කොමිෂන් සභාවල සාමාජිකයන් වෙනස් වුණා ද? ජනතාව තමන්ගේ ඡන්දයෙන් පත්කර එවන අයට බලය දීම වැරදියැයි කියා ජනතාවට කිසිදු වග නොකියන පිරිසකට බලය ලබාදීම සාධාරණ ද යන ප්‍රශ්නය 19 අවශ්‍ය යැයි කියන අයගෙන් අපට ඇසීමට සිදුව තිබේ. බලය නොමැතිව රටක් සංවර්ධනය කළ නොහැකිය. මැලේසියාව, දකුණු කොරියාව, සිංගප්පූරුව වැනි රටවල් සංවර්ධනය කරා ගමන් කළේ එම රටවල නායකයින්ට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට බලය තිබීම හේතුවෙනි. නව ව්‍යවස්ථාවක් ගෙන එම පිණිස වත්මන් ආණ්ඩුව පියවර ගෙන තිබේ. එය හඳුන්වා දීමට කලක් ගත වනු ඇත. එතෙක් රට ඉදිරියට ගෙන යෑම පිණිස අවශ්‍ය තීන්දු තීරණ ගැනීමේ හැකියාව ජනපති සතු විය යුතුය. විස්සට එරෙහි වන්නන්, විස්ස ගෙන ඒමට සිදුව තිබෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරු සෙවිය යුතුය. දහනවයෙන් ඇති වූ අර්බුද ගැන ද ඒ සමඟම ඔවුන් කල්පනා කර බැලීම සුදුසු වන්නේය. යහපත් සංවාද මගින් යහපත් සංශෝධනයක් ගෙනැවිත් රටට ගැළපෙන නව ව්‍යවස්ථාවක් ගොඩනැඟීම රජයේ අපේක්ෂාවයි.

අසේල කුරුළුවංශ



විසඳුමක් සෙවිය යුතු රත්තරන් ප්‍රශ්න

සහන සැලසීම හොඳයි

ටික දිනකින් රත්‍රන් මිල බහියි

රත්‍රන් මාෆියාවක් තිබෙනවා

රත්‍රන් පිළිබඳ සහ එහි වටිනාකම පිළිබඳ ලෝකයේ කිසිවකුට අමුතුවෙන් හඳුන්වාදිය යුතු නොවේ. කලින් කලට මිල ඉහළ පහළ යමින් කතාබහට ලක් වන රන් මිල පිළිබඳ ලෝකයම නිරතුරුව අවධානයෙන් පසුවේ.

ශ්‍රී ලංකාවේද තත්ත්වය මීට වෙනස් නොවේ.කලින් කලට මිල ඉහල පහල යන රන් මිලට ගත නොහැකි අන්දමින් ඇතැම්විට මිල නංවාගනී. පොලොවෙන් ගන්නා රන් වලට මිල නියම කරනු ලබන්නේ මහපොලොව මත ඉන්නා මිනිසුන් විසිනි. එබැවින් ලෝක වෙළෙඳපොළේ රත්‍රන් නිතර සාකච්ඡාවට බඳුන්වන මාතෘකාවකි.

එතරම් විශේෂිතවූ රත්‍රන් පිළිබඳ ශ්‍රී ලාංකිකයන්ට මේ දිනවල ඇත්තේ අලුත් බලාපොරොත්තුවකි.රන් කර්මාන්තය ජනාධිපතිවරයා විසින් සෘජු සහන ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ රන් කර්මාන්තය සඳහා සහන රැසක් ලබාදීමට තීරණය කරන ලදී. ඒ අනුව රන් ආනයනයේදී පැනවූ 15%ක බද්ද ඉවත් කෙරිණි. එසේම රන් අලෙවි කොට උපයන ලාභය මත මෙතෙක් පනවා තිබූ බදු ද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අහෝසි කරන ලදී. ඒ සමඟම එම කර්මාන්තකරුවන්ට 4% සහන පොලියට ණය ලබා ගැනීමට ද පහසුකම් සපයාදීමට තීරණය විය.

මෙම සහන ලබාදීම සමඟ ජනතාව රත්‍රන් පිළිබඳ දැඩි උද්‌යෝගයකින් පසුවෙති. රන් පවුමක මිල පහළ යාම පිළිබඳ රත්‍රන්වලට ප්‍රිය බොහෝදෙනා නොඉවසිල්ලෙන් බලා සිටිති.

අප අද සොයාබලන්නට සැරසෙන්නේ ජනාධිපතිවරයා විසින් ලබාදුන් සහන ලබන වෙළෙන්දන් ඒ පිළිබඳ දක්වන අදහස් සහ පාරිභෝගිකයන්ගේ බලාපොරොත්තුව පිළිබඳයි.

ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ පිළිබඳ සොයාබැලීමට යා යුතු ප්‍රධාන ස්ථාන දෙකකි. ඉන් පළමුවැනි ස්ථානය කොළඹ කේන්ද්‍රගතකොට ඉදි කළ කලම්බු ගෝල්ඩ් සෙන්ටර් ගොඩනැගිල්ලයි. දෙවැන්න සාම්ප්‍රදායික රන් කරුවන් රැසක් තම වෙළෙඳ මධ්‍යස්ථානය කරගත් හෙට්ටිවිදියයි.

අප මේ පිළිබඳ කරනු ලබන තොරතුරු සොයාබැලීමේදී කොළඹ හෙට්ටිවිදියේ සහ ඊට ආසන්න 'කලම්බු ගෝල්ඩ් සේනටර්'හිදී හමුවූ රන් භාණ්ඩ වෙළෙන්දන් අවධාරණය කළ කරුණු රැසකි.මෙම ලිපිය සැකසෙන්නේ අප කළ ගවේෂණයේදී ඔවුන් සෘජුව සහ වක්‍රව ලබාදුන් තොරතුරු මතයි.

ඒ. දිනේෂ්

ඒ. දිනේෂ් දශක ගණනාවක් මේ ක්ෂේත්‍රයේ නියැළෙන ව්‍යාපාරිකයෙකි. නුවරඑළියේ සිට කොළඹ රන් වෙළෙඳාම සඳහා පැමිණි හෙතෙම අද කලම්බු ගෝල්ඩ් සෙන්ටර් හි වෙළෙඳසලක හිමිකරුවෙකි.ඔහු අප සමඟ කතා කරන්නේ මෙම සහනය සහ එය ජනතාවට ලබාදෙන ආකාරය ගැනය.

'අපි වරකට රත්තරන් 100g පමණ ප්‍රමාණයක් තොග මිලට ගන්නවා. ඒවා අලෙවි කළ පසුව නැවත ඒ විකුණුනු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් ගෙනෙනවා. ඉදිරියට දිගටම ගැනුම් මිල අඩු වුණොත් ඒ සහනය අපි අනිවාර්යයෙන්ම පාරිභෝගිකයාට දෙනවා. මේ දිනවල වෙළෙඳාම් අඩුයි. කොහොමටත් බදු සහන ලබාදී සතියක් පමණ ගතවූ පසුවයි ඒ වාසිය ජනතාවට දෙන්න පුළුවන් වෙන්නේ.අපට ලැබෙන සහනය අපි පෙරළා ජනතාවට දෙනවා.එතකොට දෙපැතටම හොඳයි.

එසේ ජනතාවට සහනයක් ලබාදීම හරහා නැවතත් රත්තරන් මිලට ගැනීමට ජනතාව ඇදිඵනු ඇත.ඒ හරහා රත්තරන් වෙළඳාම වැඩිදියුණු වී වෙළෙන්දන්හටද සුබදායී හෙටක් උදාවනු ඇත.රත්තරන් වෙළෙන්දන් බහුතරයක් සිටින්නේ ඒ බලාපොරොත්තුව සමඟය.

වී. බාලු

අප ඊළඟට කතා බහ කරන්නේ වී. බාලු. කේ. සුබ්‍රමනියම් සහ නන්ද කුමාර් , පුනිදන් බාන්, ජී. ගනේෂන් සමඟය. ඔවුන් පිරිස මේ කාරණාව පිළිබඳ දක්වන අදහස දිනේෂ් ට වඩා වෙනස් එකකි.

'බදු සහනය දීම අපි අගය කරනවා. ඒත් ප්‍රායෝගිකව එය වඩාත් අර්ථවත් වෙන්නේ තවත් කරුණු කිහිපයකට රජයේ අවධානය යොමු වුණොත් පමණයි. කොහොමටත් ලෝක වෙළෙඳපොළේ රත්රන් මිල අපිටත් තදින් බලපානවා. පොඩි රටක් විදියට අපට ඊට බලපෑම් කිරීම අසීරුයි. නමුත් බැංකුවලින් රත්තරන් ලබා ගැනීමේදී වෙනදාට වඩා තරමක් වැඩියෙන් රත්රන් මිලදී ගැනීමේ හැකියාවක් මේ සහනය අනුව ලැබේවි.

නන්ද කුමාර්

පුනිදන්

කොහොම වුණත් අසීරුවෙන් වෙළෙඳාම් කරමින් සිටින අපට සහනයක් මිසෙක ගැටලුවක් නොවෙන විදියට මේ බදු සහනය ක්‍රියාත්මක විය යුතුයි. මේ වන විට බදු සහනයට කලින් මිලදී ගත් සංචිත යම් ප්‍රමාණයක් අප සතුව තිබෙනවා. ඒවා පවුම රුපියල් 90,000 පමණ මට්ටමින් විකුණන්න කාටවත්ම දැනට හැකියාවක් නෑ. ඒ නිසා මේ සහනය 5%, 10% ආදී වශයෙන් පියවර කිහිපයක් ඔස්සේ ක්‍රමානුකූලව ජනතාවට ලබාදිය යුතු වෙනවා. නැතිනම් කුඩා පරිමාණයේ වෙළෙන්දාට කබලෙන් ලිපට වැටෙන තත්ත්වයක් ඇති වෙන්නේ. ඊට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මැදිහත්වීම අපේක්ෂා කරනවා.

■ කලම්බු ගෝල්ඩ් සෙන්ටර් අර්බුදයක

නියමිත ප්‍රමිතියෙන් සහ බරින් යුතු බවට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වගකීම සහිතව එකම තැනකින් හිතේ හැටියට හොඳම රත්‍රන් අලෙවිය කලෙකට පෙර විවෘත කළ ගෝල්ඩ් සෙන්ටර් කෙරෙන් රජය අපේක්ෂා කළ කාර්‍යභාරයයි. ඒ වන විට මහල් දෙකකින් යුතුව වෙළෙඳසැල් සියයකට ආසන්න ගණනකින් සැදුම්ලත් එයින් පසුගිය වසර ගණනාවේදී බොහෝ ව්‍යාපාරික පිරිසක් ඉවත්ව ගොස් තිබේ. ඊට හේතුව පැවැති රජයේ සැලකිලි මේ කෙරෙහි නොලැබීම බවට ද එම ව්‍යාපාරිකයන්ගෙන් මැසිවිලි නැඟේ. ඒ කෙසේ වුවද සුවිශාල රථ ගාලක් සහිත ස්ථානයක් වන ඊට රථ ගාල් කිරීමේ ගාස්තුවකින් තොරව අදටත් පාරිභෝගිකයාට භාවිත කළ හැකිය. එසේම සුපිරි වෙළෙඳ සංකීර්ණයක් ලෙස බැලූ බැල්මට පෙනුනද සුපිරි මිලක් එහි නොමැති බවට මහජනතාව දැනුවත් කෙරෙන විධිමත් ප්‍රචාරණයක් මේ කෙරෙහි අවශ්‍ය බව දැනට ගෝල්ඩ් සෙන්ටර්හි රන් භාණ්ඩ අලෙවිසැල් පවත්වාගෙන යන ව්‍යාපාරිකයන්ගෙන් ඉදිරිපත් වන තවත් ඉල්ලීමකි. මසකට රුපියල් 50,000 තරම් කුලියක් ගෙවන්නට සිදුවන ගෝල්ඩ් සෙන්ටර් ගොඩනැගිල්ල සඳහා මීට වඩා ප්‍රතිලාභ ලබාදෙන ලෙස ඔවුහු ඉල්ලා සිටිති.

'මේ ජාතික සම්පතක්. කෝටි සිය ගණනක් වැයකොට ඉදි කර පවත්වාගෙන යන මෙතැන මහජනතාවට ළඟ තැනක් කරන්න. පසුගියදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ අප කළ සාකච්ඡාවේදී ඉදිරිපත් කළ යෝජනාවලට අපට සතුටුදායක පිළිතුරු ලැබුණා. ගෑස්පහ හන්දිය දෙසින් ආකර්ෂණීය පිවිසුම් මාර්ගයක් ඇති කිරීම එහිදී කැපී පෙනෙනවා.

එපමණක් නොවෙයි ජනාධිපතිතුමාගේ ආශිර්වාදය ලැබී තිබෙන අප කෙරෙහි දැන් මහ බැංකුවේ සහ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අවධානය නොමඳව ලැබිය යුතුයි. තවමත් බලපත්‍රලාභීන්ට පමණක් රත්තරන් රටින් ගෙන්වීමට ඉඩ ලබාදීම මෙන්ම මහ බැංකුව මැදිහත් වී රන් මිල නියාමනයක් විධිමත්ව නොකිරීම නිසා අතරමැදියන් කෝටි ප්‍රකෝටි ගණන් ලාභ ලබනවා මිසක මහජනතාවට සහන ලැබෙන්නේ නැහැ.

රත්‍රන් බිස්කට් වශයෙන් ගෙන්වන හුඟ දෙනෙක් ඒ එකකින් රුපියල් 50ක් තරම් කුඩා ලාභයක් පමණක් තබා ගන්නවා. ඒත් ඒ අතළොස්සක පිරිස එකවර බිස්කට් දසදහස් ගණනක් ගෙන්වූ විට අත්වන ලාභය අති විශාලයි. ඒවා දේශීය වශයෙන් අලෙවි කිරීම හැරෙන්නට මේ කර්මාන්තයට දායකත්වයක් ඔවුන්ගෙන් ලැබෙන්නේ නැහැ.

පාලිත ඇළපාත

ඒ අපේ කර්මාන්තයට බලපාන මහා ප්‍රශ්නවලින් එකක්. කෙසේ වුවත් ගෝල්ඩ් සෙන්ටර් ඉදිරියේදී සුපිරි වෙළෙඳසල් අවන්හල් ආදියෙන් සම්පූර්ණ වුණොත් ජනතාව වැඩිපුර මෙහි ඒවි. ප්‍රමිතිගත රන් භාණ්ඩ ජනතාවට ලබා දීමට ද එය රුකුලක් වෙනවා. ඒ අනුව ගෝල්ඩ් සෙන්ටර් හරහා ස්වර්ණාභරණ අධිකාරියට විශාල කඩ කුලියක් ලැබෙනවා. ඊට නාගරික සංවර්ධන අධිකාරියේ සහ ස්වාර්ණාභරණ අධිකාරියේ නිසි කැපවීම අවශ්‍යයි. මේ වනවිටත් ඒ පිළිබඳ සාකච්ඡා පැවැත්වෙනවා. ඉන් ප්‍රායෝගිකව වැදගත් තීන්දු තීරණ ගනිවි කියලා අප බලා සිටිනවා.' ඒ 'කලම්බු ගෝල්ඩ් සෙන්ටර්'හි රන් වෙළෙන්දන්ගේ සංගමයේ ලේකම් පාලිත ඇළපාත අප සමඟ දැක්වූ අදහස් ය. ඉසුරු මධුසංක සහ ලක්?ෂාන් මුණසිංහ රන් මිල අඩුවීම පිළිබඳ බලාපොරොත්තු දල්වා සිටින දෙදෙනෙකි.

■ තිරෙන් පිටුපස තිත්ත කතාව

ඉවත් තොටුපළින් පවා මෙරට රත්‍රන් පිටරටවලට ගෙන යෑම් පිළිබඳ දේශීය රත්‍රන් ව්‍යාපාරිකයන් දක්වන්නේ අප්‍රසාදයකි. බදු සහනය යථාර්ථයක් වන්නට නම් එය මුළුමනින්ම නවතා දැමිය යුතු වන බව අපගේ ගවේෂණයේ දී අනාවරණය විය. ඒ ජාවාරමෙන් කෝටි ගණන් ලාභ ලබන ජාවාරම්කරුවන් රජයට බදු

රන් කර්මාන්තයේ මෙරට ඉතිහාසය

ඒ ය ඉතා ඇත අතීතයට අදිවයයි. රදලවරුන්ට රන් ආභරණ සැදූ කුලය හෙවත් ආභරණ පට්ටලය නම් ශ්‍රේණියක් පිළිබඳත් පත පොතේ සඳහන්ය. අඹන්පොල රන්කරුවන්ගේ පරපුර ඊට ජීවමාන සාක්ෂියකි.

ක්‍රි.පූ. 6 වැනි සියවසේදී පවා ශ්‍රී ලංකාවේ තඹ නිධි ආශ්‍රිතව රන් හමුවීම පිළිබඳ ඉතිහාසයේ ලියැවී ඇත. නිල්වලා නිම්නය, කතරගම, ඇඹිලිපිටියේ, කිරිඉබ්බන්ආර, කන්තලේ ඒ ඇසුරේ අසන්නට ලැබෙන ප්‍රදේශවල ගංගා ආශ්‍රිතව රන් ගැරීම 'ගඟ ඇදීම' නමින් ප්‍රකටව තිබී ඇති බවට ජනවහරේ එයි. අවසානයේදී එසේ එකතුකර ගත් ඉල්මනයිට් ගැනට, දාකොන්, තඹ, රිදී කලවම් වැලි ආදිය කෝවේ දමා මකවා රන් වෙන්කර ගැනීම පිළිබඳ විශේෂ දැනුමක් අතීත ලාංකිකයා සතු විය.

'රන්බෑව ගම' රබෑව වූ බව එවැනි ජනප්‍රවාදයේ රත්රන් පිළිබඳ පැවත එන්නකි.

රන් පිළිබඳ විශේෂඥයකු වූ ජී.ජී. ඩික්සන් මෙරට දකුණ, මධ්‍යම හා බස්නාහිර පළාත්වල රත්රන් හමුවන ස්ථාන පිළිබඳ සඳහන් කළ පරීක්ෂකයෙකි. එසේම බ්‍රිතාන්‍ය පාලන සමයේදී හොරණ, දෙනියාය, අකුරැස්ස ප්‍රදේශවල රත්තරන් පතල් 16ක් සඳහා අවසර ගෙන තිබූ බව ද රත්රන් පිළිබඳ සඳහන් කරමින් ආනන්ද කුමාරස්වාමි, මහාචාර්ය ඩබ්. එන්. කරුණාරත්න ආදීන් හෙළි කර තිබේ.

මැතකදීම මෙරටින් රන් නිධි හමුවීම පිළිබඳ සම්ක්ෂණය ප්‍රංශ පරීක්ෂණ කණ්ඩායමක් සහ භූ විද්‍යා සම්ක්ෂණ සහ පතල් කාර්යාංශය එක්ව කරන ලද්දකි. අරිප්පු ප්‍රදේශයේ වර්ග කි.මී100ක දුරක රන් පැතිරී ඇතැයි හඳුනා ගෙන තිබේ. එය ශ්‍රී ලංකාවට සුභාරංචියකි.

ගෝල්ඩ් සෙන්ටර් හදලා දෙන්න

නොගෙවා මුදල් උපයන්නන් අතුරින් ඉදිරියෙන්ම සිටිති.එය උණ්ඩියල් ජාවාරමකි. එසේ විදෙස් රටවලට යවන රන් වෙනුවට එම මුදල් වල වටිනාකමට සරිලන භාණ්ඩ යළි මෙරටට එවීම කලක් තිස්සේ යහතින් කෙරෙන ව්‍යාපාරයයක් බව අප කළ ඇතැම් සාකච්ඡාවලදී අසන්නට ලැබිණි.

විශේෂයෙන් ඉන්දියාවට ගෙන ගොස් අලෙවිකොට උපයන වැඩිපුර ලාභය රන් කිලෝවකට රුපියල් 875,000ක් තරම් වන වන බව එහිදි අනාවරණය වූ අතර එය විශාල මාෆියාවකි. නීති විරෝධීව හොර රහසේ මෙරටට ගෙනෙනෙ රත්‍රන් සඳහා ප්‍රමිතිය පිළිබඳ සහතිකයක් කිසිවකුට ලබා දිය නොහැකියි.

ලක්ෂාන්

මිලට විකිණෙන නිසා ජනතාව වැඩිපුර ඒ ඒ කරා යොමු වේ. එයින් දිනකට රුපියල් කෝටි 50 - 60ක ශුද්ධ ලාභයක් උපයන සමහර කුට වෙළෙඳුන් පිටතට පෙන්වන්නේ මාස ගණනකින් කිසිම වෙළෙඳාමක් කරගත නොහැකි වූ අන්දමේ දුක්බර පෙනුමක් බව අප ගවේෂණයේදී සොයාගත් තවත් කරුණකි.

ඉසුරු

කෙසේවෙතත් ජනාධිපතිතුමන් විසින් රන් ව්‍යාපාරය සඳහා ලබාදුන් සහනය ජනතාවට ලබා දීමට ව්‍යාපාරිකයන් සූදානම්ව සිටිති.ඒ අනුව පාරිභෝගිකයන් සඳහා රත්තරන් මිල සහනයක් ලඟදීම ලැබෙනු ඇති බවට බලාපොරොත්තුවක් තබාගත හැකිය.රත්තරන්වලට ප්‍රිය සැමට මෙය සුබ ආරංචියකි.කෙසේවෙතත් රජයෙන් ව්‍යාපාරිකයන් වෙනුවෙන් සහන ලබාදීම සමඟ එම සහනය සෘජුව ජනතාවට ලැබිය යුතුය.එම දිනය වැඩි ඇතක නොවනු ඇත.

නුවන් මහේෂ් ජයවික්‍රම
ඡායාරූප - සමන්ත වීරසිරි

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 09 - 08	2020 - 09 - 07	2020 - 09 - 08	2020 - 09 - 06	2020 - 07 - 31	2020 - 09- 09	2020 - 09 - 09	2020 - 09- 07	2020 - 09-02	2020 - 09 - 09	2020 - 09 - 07	2020 - 07 - 30
දිනුම් වාරය - 2534	දිනුම් වාරය - 1533	දිනුම් වාරය - 2916	දිනුම් වාරය - 621	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1688	දිනුම් වාරය - 3366	දිනුම් වාරය - 1208	දිනුම් වාරය - 1051	දිනුම් වාරය - 1036	දිනුම් වාරය - 1611	දිනුම් වාරය - 013
13 32 39 68	05 20 33 60	21 37 45 59	05 15 40 45	22 23 40	07 31 35 43	31 34 60 64	25 43 48 66	6 4 8 3 9 6	07 12 39 48	10 11 37 57	04 12 33 63
අක්ෂරය O	සුපිරි අංකය -01	ලග්නය-මිතුන විශේෂිත අංක	ඉංග්‍රීසි අක්ෂරය- Q	දෙවෙ අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-A	අක්ෂරය - D	අක්ෂරය - U	අක්ෂරය -K	අක්ෂරය - K	අක්ෂරය - Z	අක්ෂරය - U
		රු 500 තෘතීය සඳහා-9609 රු 100 තෘතීය සඳහා-757							රු 500 තෘතීය සඳහා-2169 රු 100 තෘතීය සඳහා-786		

එම්.අයි.එම්. මාහිර් විසි වෙයි

සමන්තුරේ සභාපති ධුරය යළි නවුෂාඩිට

මැද කොළඹ සමූහ ආර්යරත්න ගණේගොඩ

දිගාමඩුල්ල දිස්ත්‍රික්කයට අයත් සමන්තුරේ නගර සභාවේ ඇති වූ බල අරගලයකින් සමස්ත ලංකා මහජන කොංග්‍රසය නියෝජනය කරන පුරපති ධුරයේ කටයුතු කළ මොහොමඩ් නවුෂාඩ් ඉකුත් මහ මැතිවරණයේ දී සමඟි ජන බලවේගයට උදව් උපකාර කළ නිසා ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගනු ලැබිය. ඒ අනුව සමස්ථ ලංකා මහජන කොංග්‍රසයේ ලේකම්වරයා සමඟ තිදෙනකුගෙන් සමන්විත විනය කමිටුවක් ද පත් කළේය.

තත්ත්වය මෙසේ පවතිද්දී පසුගිය 02 වැනි දින සමන්තුරේ සභාපතිවරයාව සිටි මොහොමඩ් නවුෂාඩ් ඉවත් කර නගර සභාවේ නව සභාපතිවරයා ලෙස එම. අයි. එම්. මාහිර් මහතාව රිෂාඩ් බදුර්දීන් මහතා විසින් පත් කළේය.

ඒ පිළිබඳ මහත් ආන්දෝලනයක් හටගෙන තිබිය දී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රාවුෆ් හකීම් මන්ත්‍රීවරයා සැප්තැම්බර් 01 වැනි දින පස්වරුවේ දිගාමඩුල්ලට පැමිණ තිබිණි. රාවුෆ් හකීම් මහතාගේ දේශපාලන ගැටයකින් සැප්තැම්බර් 02 වැනි දින සමන්තුරේ සභාපති ධුරයට පැවැති ඡන්ද විමසීමක දී රාවුෆ් හකීම්ගේ පක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනා සමන්තුරේ නගර සභාවේ හිටපු සභාපති මොහොමඩ් නවුෂාඩ් මහතාට ඡන්දය ලබා දුන්හ. ඔහුට ඡන්ද 13ක් ලැබිණි. රිෂාඩ් බදුර්දීන්ගේ පක්ෂයෙන් නම් කර සිටි එම්. අයි. එම්. මාහිර්ට හිමි වූයේ ඡන්ද 07කි. ඒ අනුව සමන්තුරේ හිටපු සභාපති මොහොමඩ් නවුෂාඩ් මහතාට සභාපති ධුරය හිමි විය.

අඩ මසක වැටුප් ගෙවීම දීර්ඝ කිරීමේ හාම්පුතුන්ගේ ඉල්ලීම ඉවතට

අනුර ප්‍රේමලාල්

කොරෝනා උවදුර සමයේ සේවකයන්ට අඩ මසක වැටුප හෝ රුපියල් දාහතරදහස් පන්සියයක වැටුපක් ගෙවන ලෙසට පැනවූ නීතිය දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලෙසට හාම්පුතුන්ගේ සම්මේලනය රජයෙන් කළ ඉල්ලීම කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා තරයේ ප්‍රතික්ෂේප කර තිබේ.

හාම්පුතුන් වෙත මේ සහනය ලබාදෙන ලද්දේ සැප්තැම්බර් මාසය දක්වා පමණක් බවත් මේ වන විට කර්මාන්ත යථා තත්ත්වයට පත්ව ඇති බවත් පවසමින් කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා හාම්පුතුන්ගේ මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබේ. කම්කරු අමාත්‍යාංශයේ පිහිටුවා තිබෙන කොවිඩ්19 හෙවත් නව කොරෝනා වසංගතය සඳහාවූ කාර්ය සාධක බළකාය ඇමැති නිමල් සිරිපාලද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් (10) රැස්වූ අවස්ථාවේදී හාම්පුතුන්ගේ සම්මේලනය කළ මේ යෝජනාව ඇමැතිවරයා තරයේ ප්‍රතික්ෂේප කර තිබේ.

කම්කරු අමාත්‍යාංශයේ පිහිටුවා තිබෙන කොවිඩ්19 හෙවත් නව කොරෝනා වසංගතය සඳහාවූ කාර්ය සාධක බළකාය ඇමැති නිමල් සිරිපාලද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් (10) රැස්වූ අවස්ථාවේදී ඇමැතිවරයා මේ බව පවසා ඇත.

එජාප කෘත්‍යාධිකාරි රැස්වීම අද

ශිරෝමි අබයසිංහ සහ මැදකොළඹ සමූහ ආර්යරත්න ගණේගොඩ

එක්සත් ජාතික පක්ෂයේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය නායක ඇතුළු තනතුරු ගණනාවක් සම්බන්ධයෙන් වන යෝජනා සලකා බැලෙන තීරණාත්මක පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම පක්ෂ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් අද (14) හවස සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පැවැත්වේ.

නියෝජ්‍ය නායක ධුරයට අමතරව පක්ෂයේ සභාපති, භාණ්ඩාගාරික ඇතුළු තනතුරු ගණනාවක් පුරප්පාඩුව පවතින අතර, ඒවා සඳහා සුදුස්සන් ගැන සලකා බැලීමද අද කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී සිදු කිරීමට නියමිතය. එම තනතුරු දැරුවන් සමඟි ජන බලවේගයට එක් වීම නිසා පුරප්පාඩු පවතින අතර, එක්සත් ජාතික පක්ෂ ව්‍යවස්ථාව අනුව මාස දෙකකට වඩා එම තනතුරු පුරප්පාඩුව පැවතිය නොහැක. අදාළ තනතුරු සම්බන්ධයෙන් පක්ෂයේ සියලු දෙනාගේ එකඟතාව පළ වූ සැනින් පත් කිරීම් සිදු කරන බව පක්ෂයේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් පැවසීය.

නියෝජ්‍ය නායකයා පත් කිරීම ගැන එකඟතාවකට එළැඹීමට නොහැකි වුවහොත් පමණක් ඡන්දයක් පැවැත්වෙනු ඇතැයි හෙතෙම පැවසීය.

තෝරා පත් කර ගනු ලබන නියෝජ්‍ය නායකයා නායකත්වයේ අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට නියමිතය. දැනට පැවති සාකච්ඡා අනුව එළඹෙන පළාත් සභා මැතිවරණයෙන් පසු අනුප්‍රාප්තිකයාට නායකත්වය පැවරීමට අදහස් කර ඇති අතර, පළාත් සභා මැතිවරණය ඉක්මනින් නොපැවැත්වුණොත් ලබන ජනවාරි මස අනුප්‍රාප්තිකයාට නායකත්වයේ බලය පැවරීම බොහෝ දුරට සිදු වනු ඇති බවත් එම ප්‍රකාශකයා පැවසීය.

එක්සත් ජාතික පක්ෂයේ ඉදිරි ප්‍රතිසංවිධාන කටයුතු, පක්ෂ මහ ලේකම් ධුරය පූර්ණ කාලීන තනතුරක් ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති යෝජනා සහ 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීම කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී සිදු කිරීමට නියමිත බවද එම ප්‍රකාශකයා වැඩිදුරටත් පැවසීය.

සහරාන් සහ දේශපාලන නියෝජිතයන් කළ සාකච්ඡාවක වීඩියෝවක් ජනපති කොමිසමට

සුභාෂිණී සේනානායක

යහපාලන රජය පිහිටුවීමට දායක වූ දේශපාලන නියෝජිතයන් පිරිසක් 2015 වසරේ මහ මැතිවරණය ආසන්න කාලකදී සහරාන් හෂීම් සමඟ දීර්ඝ සාකච්ඡාවක නිරත වන වීඩියෝ පටයක දර්ශන පාඨකු ඉරිදා ප්‍රහාරය පිළිබඳ විමර්ශනය කෙරෙන ජනාධිපති කොමිසමේදී ඉකුත් 11දා පෙන්වා සිටියේය.

එම වීඩියෝ පටයේ 2015 දී යහපාලනය රජය ස්ථාපිත කිරීම සඳහා ගොඩනැඟුණු NFGG හෙවත් යහපාලනය සඳහා වූ ජාතික පෙරමුණ සංවිධානය 2015 වසරේදීම මහ මැතිවරණයට ඉදිරිපත්ව පරාජය වූ අපේක්ෂකයකු වන මොහොමඩ් මුස්තෆා අබ්දුල් රහුමාන් යන අය සහ නැඟෙනහිර පළාත් සභාවේ හිටපු මුස්ලිම් කොංග්‍රස් මන්ත්‍රී ශිබිලි ෆාරූක් පාඨකු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර මාලාව දියත් කළ සහරාන් හෂීම් සමඟ සාකච්ඡාවක නිරත වන අයුරු දර්ශනය විය.

එම වීඩියෝ පටයට අනුව ඔවුන් අතර සිදු වන සාකච්ඡාව දමිළ බසින් සිදුව තිබූ අතර, මේ සාකච්ඡාවට අනුව එම්. එල්. ඒ. එම් හිස්බුල්ලාට අරාබි රටකින් ලැබී තිබූ රියාල් මිලියන එකක පමණ මුදලක් සම්බන්ධයෙන් සහරාන් හෂීම් සහ ශිබිලි ෆාරූක් සංවාදයක යෙදෙන අයුරු දැක ගැනීමට ලැබුණු අතර, එම මුදල හිස්බුල්ලාගේ දේශපාලන කටයුතු සඳහා අරාබියෙන් ලැබෙන හෝ හිරා පදනම මඟින් ලැබෙන ඒවා ද යන්න සම්බන්ධයෙන් ඔවුන් එහිදී වැඩිදුරටත් සාකච්ඡා කරනු දක්නට ලැබිණි.

මේ වීඩියෝ පටය ප්‍රදර්ශනය කිරීම සිදු කෙරුණේ කොමිසම හමුවේ මොහොමඩ් මුස්තෆා අබ්දුල් රහුමාන් යන දේශපාලන නියෝජිතයා සාක්ෂි ලබා දුන් අවස්ථාවේදීය.

ඉකුත් සිකුරාදා (11) දින ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි ලබාදීම සඳහා කැඳවා තිබුණේ, NFGG හෙවත් යහපාලනය සඳහා වූ ජාතික පෙරමුණ " සංවිධානයෙන් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය යටතේ 2015 වසරේදී මහ මැතිවරණයට ඉදිරිපත්ව පරාජය වූ අපේක්ෂකයකු වන මොහොමඩ් මුස්තෆා අබ්දුල් රහ්මාන් නමැත්තා වන අතර, කොමිසමේ සභාපති විනිසුරුවරයා ප්‍රමුඛ සාමාජික විනිසුරු මඩුල්ල හමුවේ රජයේ ජ්‍යෙෂ්ඨ අධි නීතිඥවරිය සාක්ෂි මෙහෙයවනු ලැබිය.

මේ වීඩියෝ පටයෙහි ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රී ශිබිලි ෆාරූක් සහ සාක්ෂිකාර අබ්දුල් රහුමාන් මෙලෙස රැඳී සිටින අතර, ඔවුන්ගේ ඉදිරියේ අසුන්ගෙන සිටින්නේ බෝම්බ පිපිරවූ සහරාන් හෂීම් සහ ඔහුගේ සොහොයුරු සෙයිනි මොහොමඩ් යන අය බවට සාක්ෂිකාර අබ්දුල් රහුමාන් විසින් හඳුනා ගනු ලැබූ අතර, මේ වීඩියෝ පටය විනාඩි 30කට ආසන්න කාලයක් රූගත කර ඇති අතර, එම කොටස පමණක් සාක්ෂිකරු ඉදිරියේ කොමිසම විසින් දර්ශනය කෙරිණි.

ශිබිලි ෆාරූක් සමඟ සහරාන් හෂීම්ව හමු වුණේ ඇයි ද යන්න මෙහිදී රජයේ ජ්‍යෙෂ්ඨ අධි නීතිඥවරිය සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කළ අතර, ඊට පිළිතුරු ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ මෙය සහරාන්ගේ කාර්යාලයේ පැවැත් වුණු දේශපාලනික සාකච්ඡාවක් බවත් තමාගේ මතකය අනුව 2015 මහ මැතිවරණයට සතියකට පමණ ඉහත දී එය සිදු වූ බවය.

01 වැනි පිටුවෙන්...

රාජ්‍ය අංශයට...

මූලස්ථාන, රෙජිමේන්තු මූලස්ථාන සහ පුහුණු පාසල් ඇතුළු මධ්‍යස්ථාන 51ක වැඩසටහනක් ආරම්භ කර ඇත.

මාසයක කාලයකට පැවැත්වෙන මෙම එක් වැඩසටහනකට 10,000 බැගින් වාර 5කදී පැවැත්වෙන අතර එහි අරමුණ රාජ්‍ය සේවයට ඇතුළත් වන උපාධිධාරීන්ට නේවාසික පුහුණුවක් ලබා දීමයි. ඒ පුහුණුව යටතේ බඳවා ගන්නා උපාධිධාරීන්ගේ කුසලතා, දැනුම සහ ආකල්ප වර්ධනය කිරීමට කටයුතු යෙදේ.

මේ පුහුණුව තුළින් රාජ්‍ය සේවය පූර්ණ ඵලදායීතාවයෙන් යුතුව ක්‍රියා කිරීම වෙනුවෙන් අවශ්‍ය හැඩගැස්වීම ලබාදෙන අතර නායකත්වය සහ කණ්ඩායම් හැඟීම ගොඩනැඟීම, කළමනාකරණ පුහුණුව, රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනගත පුහුණුව, ව්‍යාපෘති වැඩ සහ ක්ෂේත්‍ර අධ්‍යයන, සහජීවනය සහ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය ආදී පුහුණුව ලබා දෙයි.

මැදපෙරදිගින් බලපෑම් එයි කියා...

රැස්වීමේදී දැනුම් දුන් බව නීතිය හා සාමය අමාත්‍යාංශයේ හිටපු ලේකම් සහ වත්මන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර මහතා පෙරේදා (12) පැවැති පාඨකු ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ පැවැසීය.

අන්තවාදය සම්බන්ධයෙන් සෘජු තීරණ ගැනීම සඳහා යහපාලන රජයට ශක්තිමත් පිටකොන්දක් නොතිබූ බවද ඒ මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

නීතිය හා සාමය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ජගත් පී. විජේවීර මහතා වැඩිදුරටත් සඳහන් කළේ මෙවැනි තීරණ ගැනීම් පිටුපස මුස්ලිම් ඇමැතිවරුන් සිටින බව තමන්ට හැඟී ගිය බවය.

මේ සම්බන්ධයෙන් අන්තර්ජාතික බලපෑම්වලට අවධානය යොමු කළත් දේශීය වශයෙන් වන බලපෑම සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේ අවධානය යොමු නොකළේද යන්න එහිදී කොමිසමේ ප්‍රධාන විනිසුරුවරයා සාක්ෂිකරුගෙන් විමසා සිටි අතර, එහිදී හිටපු ලේකම්වරයා කියා සිටියේ මේ සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව සිටින ලෙස හිටපු ජනාධිපතිවරයා සහ හිටපු අග්‍රාමාත්‍යවරයා ආරක්ෂක මණ්ඩලයේ දී සඳහන් කළ බවය.

නමුත් එම ආරක්ෂක මණ්ඩල රැස්වීමට හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහභාගි නොවූ බව සාක්ෂිකරු කොමිසම හමුවේ පැවසීය.

ඔහු වැඩිදුරටත් සඳහන් කළේ එවක ජනාධිපතිවරයා සහ පොලිස්පතිවරයා අතර තිබූ විරසකයන් හේතුවෙන් පොලිස්පතිවරයාව ආරක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා නොකැඳ වූ බවයි.

එමෙන්ම එවක සිටි පොලිස්පතිවරයා ඉවත් කරන ලෙස හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඉල්ලීමක් කළ බව තමා පසුව දැන ගත් බවද විජේවීර මහතා කොමිසම හමුවේ කීවේය.

රාජ්‍ය බුද්ධි අංශ ඇතුළු බුද්ධි අංශ ඔස්සේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය, එහි නායක සහරාන් හෂීම් සහ මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් කරුණු රැසක් 2017 වසරේ අනාවරණය වී තිබූ බව නීතිය හා සාමය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ජගත් පී. විජේවීර මහතා සාක්ෂි ලබාදෙමින් කියා සිටි අතර, තමා 2017 වසරේ එම අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවී පිටව ගිය බවත් කියා සිටියේය.

මම 2015 නොවැම්බර් මස 11 වැනි දා සිට 2017 දෙසැම්බර් 12 වැනි දා දක්වා ජගත් පී විජේවීර මහතා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළා.

එවක අග්‍රාමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා තම කාලය තුළ පැවති ඇතැම් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගි වූයේ නැහැ. අධික කාර්ය බහුල බව නිසා රනිල් වික්‍රමසිංහ මහතා රැස්වීමට නොඑන බව දැන ගත්තා. ඔහු සහභාගි වූ ඇතැම් රැස්වීම්වලදී රැස්වීම අවසන්වීමට පෙර පිටව ගිය බවත් ජගත් පී විජේවීර මහතා කොමිසම හමුවේ වැඩිදුරටත් සඳහන් කළේය.

කොමිසමේ සභාපති විනිසුරුවරයා ඇතුළු සාමාජික විනිසුරු මඩුල්ලක් හමුවේ සාක්ෂි කැඳවීම සිදු කළ අතර, එහිදී රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා යොමු කළ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් ඒ මහතා මේ කරුණු අනාවරණය කළේය.

කංජිපානි ඉමිරාන්...

පසුගිය සිකුරාදා (11) හදිසියේ අසනීප වූ කංජිපානි බ්ලස්ස නාවික රෝහලට බන්ධනාගාර නිලධාරීන් විසින් රැගෙන ගිය අතර එහිදී ඔහුට ඊ.සී.ජී. පරීක්ෂණයක් ද රුධිර පීඩනය සහ රුධිරයේ සීනි ප්‍රමාණය පිළිබඳ පරීක්ෂණ ද සිදු කර ඇත. පපුව රිදෙන බවත් තමන්ව ඉක්මනින් රෝහල්ගත කරන ලෙසත් බන්ධනාගාරය තුළ මහත් කලබගෑනියක් ඇති කර කරාපිටිය රෝහලට යාමට වෑයම් කර ඇති කංජිපානිව ආරක්ෂක හේතූන් මත බ්ලස්ස නාවික රෝහලට රැගෙන ගිය අතර එහිදී අනාවරණය වී ඇත්තේ ඔහුගේ රෝගී තත්ත්වය බරපතළ නොවන බවයි. නැවත බ්ලස්සට ඔහුව රැගෙනවිත් දැඩිව සෝදිසි කිරීම්වලට යොමු කර ඇත්තේ බන්ධනාගාර නිලධාරීන්ට පවසා ඇත්තේ දින 2කින් ආහාර නොගත් නිසා වැසිකිළියාමට නොහැකි බවයි.

එසේ නම් ආහාරයට යමක් ගෙන එය සිදු කරන ලෙස බන්ධනාගාර නිලධාරීන් පැවසූ විට හොදි වර්ගයක් සමඟ ඉඳිආප්ප 15 පමණ ගිල දැමූ කංජිපානි වැසිකිළි යාමෙන් පසු බන්ධනාගාරයට ඇතුළු වී යළිත් සිරකරුවන්ගේ ආහාර වර්ජනයට එක්ව තිබේ.

විශේෂ ගණයේ සිරකරුවන් 45 දෙනෙකු පසුගිය 10 දා සිට ඇරඹූ මෙම ආහාර වර්ජනයට කංජිපානි ඉමිරාන්ගේ නායකත්වය හිමි වී ඇති අතර එය වෙලේ සුදා විසින් මෙහෙයවනු ලැබේ. ඊයේ (13) වන විට සිරකරුවන් 30 දෙනකු ආහාර වර්ජනය අතහැර ඇති බව බන්ධනාගාර ප්‍රකාශකයකු දිනමිණට කීය.

මෙම ආහාර වර්ජනය පොට්ට නවුෆර්, පිට්ගල කැවුමා, ආම් සම්පත් ඇතුළු විශේෂ ගණයේ සිරකරුවන් 9 දෙනකු සහාය දක්වා නොමැත.

වෙලේ සුදාගේ නංගී...

හක්මන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නලින් වීරවර්ධන, විශේෂ කාර්යාංශයේ පොලිස් සැරයන් චන්දන (52681) යන මහත්වරුන්ට ලැබුණ තොරතුරක් මත විශේෂ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් කරන ලද වැටලීමකදී සැකකරුවන් මෙලෙස අත්අඩංගුවට ගෙන තිබේ.

හක්මන ප්‍රදේශයේ ලැඟුම්හලක රැඳී සිටි අවස්ථාවේ මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් සැක පිට ප්‍රශ්න කිරීම සඳහා මේ අය අත්අඩංගුවට ගත් බව පොලීසිය වැඩිදුරටත් සඳහන් කරයි. මේ පිරිස කොළඹ ප්‍රදේශයේ සිට මෝටර් රථයකින් හක්මන ප්‍රදේශයට පැමිණ ඇති බවත්, ඔවුන් පැමිණි මෝටර් රථය ද පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

එම මෝටර් රථයේ රියැදුරු ලැඟුම්හලේ කාමරයක රැඳී සිටි අවස්ථාවේ පරීක්ෂාවට භාජනය කිරීමේදී ඔහු සන්තකයේ තිබී නීති විරෝධී මත්ද්‍රව්‍යයක් වන කේරළ ගංජා මිලිග්‍රෑම් 4,940 ක් ද පොලීසිය විසින් සොයාගෙන ඇති අතර, පසුව එම සැකකරු අත්අඩංගුවට ගෙන දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබන 14 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. සැකපිට අත්අඩංගුවට ගන්නා ලද අනෙක් සැකකරු සහ සැකකාරිය සම්බන්ධයෙන් පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

පක්ෂයේ මතයට ...

යම් කිසි මන්ත්‍රීවරයකුට පක්ෂයේ මතයට පටහැනි මතයක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය නම් එය කණ්ඩායම් රැස්වීමේදී සාකච්ඡා කළ යුතු වන අතර, එසේ නොමැතිව කටයුතු කිරීම පක්ෂයේ විනය කඩ කිරීමක් ලෙස සලකන බවත් දන්වා ඇත.

පසුගිය පළාත් පාලන මැතිවරණය, ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය යන මැතිවරණ තුනේදීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට අතිවිශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වූයේ පක්ෂය ආරම්භයේ සිට පවත්වාගෙන ආ විනයත්, සියලු සාමාජිකයන් එක මතයක පිහිටා කටයුතු කිරීමත්, සියලු දෙනා පක්ෂයේ ප්‍රතිපත්තිවලට අනුගතව කටයුතු කිරීමත් නිසා වන බව ප්‍රධාන ලේකම්වරයා සිය ලිපිය මඟින් පෙන්වා දී තිබේ.

ඒ අනුව පක්ෂයේ මහජන නියෝජිතයන් ප්‍රසිද්ධ ප්‍රකාශ කිරීමේදී සහ මාධ්‍ය වෙත අදහස් දැක්වීමේදී පක්ෂයේ පොදු මතයට අනුගතව සහ පක්ෂයේ ක්‍රියාපිළිවෙතට එරෙහි නොවන ආකාරයෙන් කටයුතු කිරීමේ වැදගත්කම මේ මඟින් අවධාරණය කර ඇත.

01 වැනි පිටුවෙන්...

සංචාරක පුරවල...

දැනට සංචාරක පුරවර සඳහා පිවිසීමට ඇති මාර්ග හා අබලන් තත්ත්වයේ පවතින සියලු මාර්ග මේ යටතේ අලුත්වැඩියා කිරීම කඩිනමින් සිදු කරන ලෙස ද අග්‍රාමාත්‍යවරයා අදාළ අංශවලට උපදෙස් ලබා දී ඇත. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීමේ අරමුණින් අග්‍රාමාත්‍යවරයා මේ තීරණයට එළඹ තිබේ.

මේ අවස්ථාව වන විටත් දේශීය සංචාරකයන්ද තම සංචාරක කටයුතු රට තුළ ආරම්භ කර ඇති පසුබිමක හා විදේශීය සංචාරකයන් අතර ශ්‍රී ලංකාව සංචාරය කිරීමට සුරක්ෂිත රටක් ලෙස අවධානය යොමුව ඇති බැවින් රටේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ද විශේෂයෙන් කටයුතු කළ යුතු බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පෙන්වා දෙයි.

ඉවත්තොටුපොළ විවෘත කිරීමෙන් පසු විදේශීය සංචාරකයන් මෙරටට පැමිණීම හා සංචාරක ක්ෂේත්‍රය නඟා සිටුවීමේ පෙර සුදානමක් ලෙස මේ මාර්ග පිළිසකර කිරීම හා අලුත්වැඩියා කිරීමේ වැඩපිළිවෙළ කඩිනමින් ආරම්භ කරන ලෙස අග්‍රාමාත්‍යවරයා අවධාරණය කරයි.

ලක්ෂ 10ක මත්ද්‍රව්‍ය...

ප්‍රශ්න කිරීම්වලදී මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචි ඇයගේ 42 හැවිරිදි සහෝදරිය හෙරොයින් ග්‍රෑම් 20ක් සමඟ අත්අඩංගුවට ගත් බව පොලීසිය සඳහන් කළේය. එම සැකකාරියන් දෙදෙනාගෙන් ලද තොරතුරු මත මාලිගාවත්ත ප්‍රදේශයේදීම හෙරොයින් ග්‍රෑම් 10ක්, මාවා කිලෝග්‍රෑම් 4ක් සහ කේරළ ගංජා පැකට් 29ක් සමඟ 70 හැවිරිදි කාන්තාවක් අත්අඩංගුවට ගැනීමට කොළඹ අපරාධ කොට්ඨාසයට හැකියාව ලැබී තිබේ.

සැකකාරියන් තිදෙනා අද (14) අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතයි.

රටට යෝග්‍ය...

ඓතිහාසික අනුරාධපුරය අටමස්ථානය වැඳ ආශීර්වාද ගත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙරේදා (12) පෙරවරුවේ ලංකාරාමය, මිරිසවැටිය සහ ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරස්ථාන වෙත ගිය අවස්ථාවේ විහාරාධිකාරී හිමිවරු මේ බව කියා සිටියහ.

ලංකාරාම විහාරයට ගිය ජනාධිපතිවරයා විහාරාධිකාරී රළපනාවේ ධම්මජෝති හිමියන් බැහැදැක කෙටි පිළිසඳරක නිරත විය. විහාරස්ථානයේ සංරක්ෂණ කටයුතු නිරීක්ෂණය කළ ජනාධිපතිවරයා පූජා භූමියට පැමිණ සිටි බැතිමතුන් සමඟ කථා බහක නිරත වූයේය. ජනාධිපතිවරයා, මිරිසවැටිය විහාරාධිකාරී ඊතලවැටුණුවැවේ ඥාණතිලක නායක හිමියන් බැහැ දැක ආශීර්වාද ලබා ගත් අතර, ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරය වැඳපුදාගෙන නුගේතැන්නේ ශ්‍රී පඤ්ඤානන්ද හිමියන් බැහැදැක සුව දුක් විමසීය.

මන්ත්‍රී ආරක්ෂාව...

රංජිත් මද්දුමබණ්ඩාර පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවෙන් ඉල්ලීමක් කර තිබේ. කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 03 වැනිදා රැස්වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී මේ ඉල්ලීම ඉදිරිපත්ව තිබේ.

කැබිනට් ඇමැතිවරයකුට ඇමැති ආරක්ෂකයන් 07 දෙනෙකු, රාජ්‍ය ඇමැතිවරයකුට ඇමැති ආරක්ෂකයන් 05 දෙනකු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ඇමැති ආරක්ෂකයන් දෙදෙනකු බැගින් ආරක්ෂාව යොදවා ඇති අතර, සෑම මන්ත්‍රීවරයකුගේම නිවාසවලට ද පොලිස් නිලධාරියකු බැගින් යොදවා ඇති බව ඇමැති චමල් රාජපක්ෂ මහතා මෙහිදී පෙන්වා දී තිබේ. වර්තමානයේ පොලිස් නිලධාරීන්ගේ හිඟයක් පවතින අතර, මන්ත්‍රීවරයකුට පවතින ආරක්ෂක තර්ජන පිළිබඳ ඇගයීමකින් පසුව පමණක් ආරක්ෂක නිලධාරීන් වැඩි කිරීම සලකා බැලිය හැකි බවත් රාජපක්ෂ මහතා දැනුම් දී ඇත.

මංතීරු නීතිය...

මාර්ග හතරක් ඔස්සේ මේ මංතීරු නීතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව පොලිස් රථ වාහන පාලන හා මාර්ග ආරක්ෂාව පිළිබඳ අධ්‍යක්ෂ ඉන්දික හපුගොඩ මහතා සඳහන් කළේය.

මංතීරු නීතිය පිළිනොපදින රියැදුරන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සියලු පොලිස් නිලධාරීන් වෙත දැනුම් දී ඇති බව ඉන්දික හපුගොඩ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

ආණ්ඩුවේ තුනෙන් දෙක රහස් ඡන්දයකදී වෙනස් වෙනවා

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේපාල හෙට්ටිආරච්චි

විසි වැනි සංශෝධනය සම්මත කිරීම සඳහා තුනෙන් 02ක සහායක් ඇතැයි ආණ්ඩුව උපකල්පනය කළද පාර්ලිමේන්තුවේ ඔළුගෙඩි ගණනින් පෙන්වන සංඛ්‍යාව රහස් ඡන්දයකදී වෙනස් විය හැකි බව සමඟි ජන බලවේගයේ සාමාජික, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේපාල හෙට්ටිආරච්චි මහතා පැවසීය.

සමඟි ජන බලවේගය පක්ෂ මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවට පෙරේදා (12) සහභාගි වෙමින් හෙතෙම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ මෙසේද ප්‍රකාශ කළේය.

ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් වෙනස් කරනවා නම් ජනමත විචාරණයකට යන්න ඕනේ. හැබැයි කොටස් වශයෙන් කරනවා නම් 3න් දෙ

ජනපති ජය ශ්‍රී මහා බෝධිය ඇතුළු අටමස්ථානය වැඳ පුදා ගනී

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අනෝමා රාජපක්ෂ මහත්මිය පසු ගිය දා (11) අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය ඇතුළු අටමස්ථානය වැඳ පුදා ගත්තේය. ඉන් අනතුරුව මහා සංඝ රත්නයේ ආශීර්වාද ලබා ගැනීමෙන් අනතුරුව අටමස්ථානයේ අඩු පාඩු සොයා බැලීම ද සිදු විය.

ජනතාවගේ ඉල්ලීම් කෙරෙහි ද ජනාධිපතිවරයා මෙහිදී අවධානය යොමු කළේය.

මෙම අවස්ථාවන්ට අටස්ථානාධිපති පල්ලේගම සිරි නිවාස නාහිමි පාණන් ඇතුළු මහා සංඝ රත්නය, බැතිමතුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

ඡායාරූප සහ සටහන
චිත්‍රාරත්න කළුආරච්චි
හිදෝගම සමූහ

මාලබේ ශ්‍රී විමලාරාමයේ අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේගේ අනුරුව සහිත පිළිම වහන්සේ අගමැති බුදු සසුනට පූජා කරයි

මාලබේ, ශ්‍රී විමලාරාම විහාරස්ථ පුදබිමේ ඉදි කළ අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේගේ දහඅට රියන් අනුරුව නිරාවරණය කිරීමේ උත්සවය හා බුද්ධ මන්දිරය හා සංඝාවාසය සඳහා මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ උත්සවය පෙරේදා (12) අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ධර්මායතනාධිපති ඇල්ලේ ගුණවංශ නාහිමියෝ දහඅට රියන් අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේගේ අනුරුව නිරාවරණය කළහ.

ඊට අදාළ සමරු ඵලකය හා බුද්ධ ප්‍රතිමා වහන්සේට ප්‍රථම මල් පූජාව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් සිදු කෙරිණි.

මෙම අවස්ථාවට බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක මහාචාර්ය මැදගම නන්දවංශ නාහාමි, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ නියෝජ්‍ය ලේඛකාධිකාරී මාලබේ, ශ්‍රී විමලාරාම විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය විලේබොඩ ගුණසිරි ස්වාමීන් වහන්සේ ඇතුළු මහා සංඝ රත්නය හා රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ප්‍රදීප් උදුගොඩ, ජගත් කුමාර මහත්වරුන් ඇතුළු ප්‍රදේශවාසී බෞද්ධ බැතිමතුන් විශාල පිරිසක් එක්ව සිටියහ.

බෞද්ධ දර්ශනය පිළිබඳ උනන්දුවක් දක්වන ලොව ඕනෑම පුද්ගලයකුට කල්‍යාණෝදා වෙබ් අඩවියෙන් දැනුම ගත හැකියි

අගමැති කියයි

කැලණිය රජමහා විහාරයේ නිල වෙබ්අඩවිය www.kelaniyatemple.lk අන්තර්ජාලයට මුදා හැරීමේ “කල්‍යාණෝදා” උත්සවය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (12) සිදු කෙරිණි.

එහිදී අග්‍රාමාත්‍යතුමන් අවධාරණය කළේ ලොව පුරා විසිරී සිටින බෞද්ධ ජනතාවට මෙන්ම බෞද්ධ දර්ශනය පිළිබඳ උනන්දුවක් දක්වන අන්‍යාගමිකයන්ටත් දැනුම ලබා ගැනීම සඳහා කැලණිය රජමහා විහාරයේ නිල වෙබ්අඩවිය ඉතා ප්‍රයෝජනවත් වනු ඇති බවයි.

කැලණිය රජමහා විහාරයේ නිල වෙබ් අඩවිය අන්තර්ජාලයට

බෞද්ධ දර්ශනය පිළිබඳවත්, ස්වාමීන් වහන්සේලාට යොමුවන විවිධ ප්‍රශ්න පිළිබඳවත්, පිළිතුරු සැපයීමට රජය කළ යුතු කාර්යක් අද කැලණිය රජමහා විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමියන් ඇතුළු දායක සභාව ඉටු කොට ඇතැයි ද අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පැවැසීය.

කැලණිය රජමහා විහාරයේ දායක සභාවේ සභාපති වෛද්‍ය සමන් වීරසිංහ මහතාගේ සංකල්පයකට අනුව මෙම නව වෙබ්අඩවිය නිර්මාණය කර තිබේ.

“ශ්‍රී කල්‍යාණි දුරුතු ධර්ම දේශනා - 12 ග්‍රන්ථය” අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට පිළිගැන්වීම, විහාර දායක සභාවේ සභාපති වෛද්‍ය සමන් වීරසිංහ මහතා මෙහිදී සිදු කළේය.

කැලණිය රජමහා විහාරයේ නිල වෙබ්අඩවිය ආරම්භ කිරීම ඓතිහාසික අවස්ථාවක් බවත්, ලොව පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇති අවස්ථාවක බෞද්ධ දර්ශනය පිළිබඳ උනන්දු වන සියලු දෙනාට මෙම නව වෙබ් අඩවිය ඔස්සේ බෞද්ධ කරුණු අධ්‍යයනය කළ හැකි බවත්, ශ්‍රී කල්‍යාණි ධර්ම විද්‍යාලාධිපති කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙණියායේ පඤ්ඤාලෝක හිමියෝ මේ අවස්ථාවේදී පැවසුහ.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා කැලණිය රජමහා විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමියන්ගේ සුව දුක් විමසා උත්සව සභාවට එක්ව සිටි අනෙකුත් ස්වාමීන්වහන්සේලා සමඟ සුහද පිළිසඳරක ද නිරත වූයේය.

කොළඹ නව කෝරලේ හා නව තොටමුණේ උප ප්‍රධාන සංඝනායක පානාකාවේ ශ්‍රී පේමරතන නාහිමි ඇතුළු මහා සංඝරත්නය, රාජ්‍ය අමාත්‍යවරුන් වන සිසිර ජයකොඩි, ප්‍රසන්න රණවීර මහත්වරුන්, කැලණිය රජමහා විහාර දායක සභාවේ සාමාජිකයන්, ශ්‍රීකල්‍යාණි ධර්ම විද්‍යාලයේ සිසු දරුවන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

රාජ්‍ය ඇමැති ගම්ලත්ගේ මෑණියන්ට අගමැතිගෙන් අවසන් ගෞරව

රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් මහතාගේ ආදරණීය මෑණියන් වූ අභාවප්‍රාප්ත පනාගොඩගේ දොන් දයාවතී මහත්මියට අවසන් ගෞරව දැක්වීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා එක් වූ අවස්ථාව.

පොලොන්නරුව, පලුගස්දමන, මොනරතැන්න නිවෙසට ගිය අගමැතිවරයා ඇයට අවසන් ගෞරව දක්වමින් රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් මහතා ඇතුළු පවුලේ සාමාජිකයන් සමඟ ශෝකය බෙදා ගත්තේය.

පිරිමි දරුවන් නවදෙනකුගේ, ආදරබර මෑණියන් වූ දයාවතී මහත්මිය සිය මවගේ භූමිකාව තුළ ආදර්ශවත්, නිහතමානී හා යහපත් ජීවිතයක් ගත කළ ශ්‍රේෂ්ඨ කාන්තාවක් බව එහිදී පැවසූ අග්‍රාමාත්‍යතුමන් අවධාරණය කළේ, ජාතිය ගොඩනැඟීමට ඇය ශක්තිමත් දරු පරපුරක් මේ රටට දායාද කිරීම අගය කළ යුතු බව යි.

රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත් මහතා සිය මෑණියන්ගේ අභාසය ලබමින් ආගමික ස්ථාන රැසක් ගොඩනැඟීමට මුල් වී කටයුතු කළ බව සිහිපත් කළ අගමැතිවරයා, සෝමාවතිය විශ්‍රාම ශාලාව ඇතුළු ආගමික වෙහෙර විහාර රැසක් ගොඩනැඟීමට සිරිපාල ගම්ලත් මහතා කළ මෙහෙවර ද සිහිපත් කළේය.

නව ව්‍යවස්ථාවක් කඩිනමින් ගෙන ආ යුතුයි

ඇමැති විමල් වීරවංශ

රක්ෂණ ශ්‍රියන්ත

දැනට ගැසට් කොට ඇති 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතෙහි අඩුපාඩු කම්ටුවක් මගින් හඳුනාගෙන, ඒවා නිවැරදි කොට නව කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පසුගියදා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති ශ්‍රී ලංකා නිදහස් පොදුජන සන්ධානයේ පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී තීරණය කළ බව ජාතික නිදහස් පෙරමුණේ නායක, කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පවසයි.

තමන් ඇතුළු පක්ෂ නායකයන්, තම කඳවුරේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දුන්, දැනට ගැසට් කොට ඇති 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙහි අඩුපාඩු හඳුනාගෙන, නිර්දේශ ඉදිරිපත් කිරීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා මෙම කම්ටුව පත් කළ බවත් එය හෙට (15) දිනයේ රැස්වී සමාලෝචන කටයුතු ආරම්භ කරන බවත් ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

විමල් වීරවංශ ඇමැතිවරයා මේ අදහස් පළ කළේ මහ මැතිවරණයේදී තම ජයග්‍රහණය වෙනුවෙන් කැපවූ පක්ෂ ක්‍රියාකාරීන්ට තුති පිදීම සඳහා පෙරේදා (12) අවිස්සාවේල්ල කොස්ගම ප්‍රදේශයේ සංවිධානය කර තිබූ ජනහමුවක් අමතමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද සඳහන් කළේය.

"ලැබී ඇත්තේ සුජාත ජනවරමක්. එමගින් ජනතා අපේක්ෂාවන් ඉටුකළ හැකියි. ඒ නිසා තමයි ජනාධිපතිතුමන් හා අගමැතිතුමන් 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් රාජ්‍ය පාලනයට සිදුකර ඇති අකුල් හෙළීම් ඉවත් කරන්න, 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ආවේ. නමුත් අපේ නම් අදහස වුණේ එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වෙනුවට කඩිනමින් පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පරිවර්තනයකට යා යුතු බවයි. ඒ කියන්නේ නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදිය යුතු බවයි. මේ රට බලගන්වන, රටවැසි අයිතිවාසිකම් බලගන්වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වුවමනා බවයි.

නිදසුනක් ලෙස යම් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කර සති දෙකක් ඇතුළත අධිකරණ හමුවේ අභියෝගයට ලක් කිරීමට ඕනෑම රටවැසියකුට හැකියාව තිබෙනවා. එලෙස අධිකරණ හමුවට යා හැක්කේ ඒ හදන්න සූදානම් වන නීතියෙන් රටට හෝ තමන්ට අගතියක් වන බව හැඟී යනවා තමයි. නමුත් ඒ පනත් කෙටුම්පත සම්මත කළාට පසුව කිසිදු රටවැසියකුට අධිකරණය හමුවේ එය අභියෝගයක් ලක් කරන්න බැහැ.

නමුත් ඇතැම් රටවල මාසයක පමණ කාලයක් දෙනවා එම සම්මත කළ නීතියේ යම් අඩුපාඩුවක් ඇතොත් ඊට එරෙහිව අධිකරණය හමුවට යාමට. පසුගිය යහපාලන ආණ්ඩුව කාරක සභා අවස්ථාවේදී තමයි යම් පනත් කෙටුම්පතකට අලුත්ම සංශෝධන ගෙන ආවේ. එහෙම වුණාම ඒ සංශෝධනවලට එරෙහිව කිසිවකුට අධිකරණය හමුවට යාමේ අවස්ථාව අහිමි වෙනවා. රටවැසි අයිතිවාසිකම් බලගන්වනවා කියන්නේ සම්මත කළ පනතකට එරෙහිව වුවත් එහි වරදක් ඇතොත් අධිකරණයට හමුවට යාමේ අවස්ථාව ලබාදීමයි. ඒ විදිහට රටවැසියා, රාජ්‍යය බලගන්වන, රාජ්‍ය පාලනය පහසු කරවන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කඩිනමින් ගෙන ආ යුතුයි කියන මතයේයි අපි ඉන්නේ.

ජනාධිපතිතුමන් දැනටමත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා විශේෂඥ කම්ටුවක් පත්කර තිබෙනවා. ඒ අතරේ තමයි මේ ටික කාලයකට 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් රැගෙන එන්නේ. එසේ රැගෙන ආ 20 වැනි සංශෝධන කෙටුම්පතේ අඩුපාඩු අද අපේ කඳවුරේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින්ම පෙන්වා දී තිබෙනවා. අග්‍රාමාත්‍යවරයා ඒවාට ඇහුම්කම් දීලා, ඒ 20 වැනි සංශෝධනයේ අඩුපාඩුකම් මොනවාද කියා හඳුනාගෙන, ඒවා නිවැරදි කරන්න කම්ටුවක් පත් කළා. ඒ කම්ටුවේ මමත් සාමාජිකයකු ලෙස කටයුතු කරනවා. ඒ මගින් අපි බලාපොරොත්තු වෙනවා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට පෙර, පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 20 වැනි සංශෝධනයක් ගෙන එනවා නම්, පොදු ජනතාව බලාපොරොත්තු වන යහපත් අංග, රටට හිතකර අංග රැකගෙන එම සංශෝධනය ඉදිරිපත් කරන්න. අප ඒ කම්ටුවේ නිර්දේශ කඩිනමින් ජනාධිපතිවරයා හා අගමැතිවරයා වෙත ලබාදීමට සූදානම්. ඒ අනුව ඉදිරි කටයුතු සිදුවේවි."

මෙම ජනහමුවට ජානිපෙ අවිස්සාවේල්ල ආසන සංවිධායක, සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී චන්දන ලියනගේ, සරත් කළුපහන, තමරා ප්‍රියදර්ශනී යන මහත්ම මහත්මිහු එක්ව සිටියහ.

බන්ධනාගාර නිලධාරී හිඟයට කඩිනම් විසඳුමක් දෙනවා

රාජ්‍ය ඇමැතිනි සුදර්ශනී පුනාන්දුපුල්ලේ

බුද්ධිකා ඉඹුලාන

බන්ධනාගාර නිලධාරි හිඟය පිළිබඳ ජනාධිපතිවරයා සහ ජනාධිපති කාර්ය සාධක බළකාය දැනුවත් කර එයට පිළියම් සොයන බව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී පුනාන්දුපුල්ලේ මහත්මිය පැවසුවාය.

බන්ධනාගාර නිලධාරීන්ගේ හිඟයක් පැවැතියද සිටින නිලධාරීන්ගේද සහාය ඇතිව බන්ධනාගාර පරිපාලන කටයුතු මෙන්ම ආරක්ෂක කටයුතු ද හැකි උපරිමයෙන් සිදු කිරීම පිළිබඳ බන්ධනාගාර අධිකාරිවරුන්ට තම කෘතඥතාව පිරිනමන බවද ඇමැතිනිය කීවාය.

රාජ්‍ය ඇමැතිනිය මේ අදහස් පළ කළේ සිය අමාත්‍යාංශයේදී බන්ධනාගාර අධිකාරිවරුන් හමු වූ අවස්ථාවේදීය.

පසුගිය මාස කීපය තුළ බන්ධනාගාර රැසක සිදු කළ සෝදිසි මෙහෙයුම් රැසකදී තහනම් ද්‍රව්‍ය සොයා ගැනීමට හැකි වූ බවත් ඒ සඳහා කැපවී කටයුතු කළ බන්ධනාගාර අධිකාරිවරුන් ඇතුළු නිලධාරීන්ගේ සේවය අගයන බවත් ඇමැතිනිය පැවැසුවාය.

සිරකරුවන්ද මනුෂ්‍යයන් ලෙස සලකා බන්ධනාගාරය තුළදී නිලධාරීන් කටයුතු කළ යුතු බවද රාජ්‍ය ඇමැතිනිය මෙහිදී අවධාරණය කළාය.

බන්ධනාගාර අධිකාරිවරුන්, සහකාර අධිකාරිවරුන්, ජේලර් සහ නියාමකවරුන්ගේ සේවා ගැටලු රැසක් පවතින බව මෙහිදී බන්ධනාගාර නිලධාරීන් විසින් රාජ්‍ය ඇමැතිනියට කරුණු පැහැදිලි කළ අතර දිගු කලෙකින් ඔවුන්ට උසස් වීම් නොලැබීම පිළිබඳ ඇමැතිනියට දන්වා සිටින ලදී.

එමෙන්ම සිරකරුවන් අධිකරණය වෙත ගෙන යෑමේදී බන්ධනාගාර නිලධාරීන් මුහුණ දෙන ආරක්ෂාව සම්බන්ධ ගැටලු මෙන්ම නිලධාරි හිඟය නිසා පැන නැගෙන ගැටලු පිළිබඳවද මෙහිදී බන්ධනාගාර අධිකාරිවරුන් ඇමැතිනියට කරුණු පෙන්වා දුන් අතර ස්කයිප් තාක්ෂණය ඔස්සේ මෙම නඩු කටයුතු සිදු කරගෙන යෑමට හැකි නම් මේ ගැටලු අවම කර ගැනීමට හැකි වන බවද කීය.

යුද හමුදාපති, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා විශේෂ බළකා රෙජිමේන්තු අධිපති ලුතිනල් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ විශේෂ බළකා මූලික පුහුණු පාඨමාලාව අංක-05 කණ්ඩායමේ විසිරයාමේ පෙරේදා (12දා) මාදුරුඔය පුහුණු පාසලේදී සිදුකෙරුණු අවස්ථාවේ දක්ෂතා දැක්වූවකුට රතා කුසලාන පිරිනැමූ අයුරු. එම අවස්ථාවට විශේෂ බළකා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ආර්.පී.එස්.ප්‍රසාද් මහතා ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයන් විශාල පිරිසක් එක්ව සිටියහ.

2013 වසරට පෙර රතුපස්වල පානීය ජල ගැටලුවක් තිබුණේ නැහැ

ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැමිණිල්ලේ සාක්ෂිකරු කියයි

ගම්පහ සංචාරක - නිමල් ජයසිංහ

ගම්පහ වැලිවේරිය රතුපස්වල ප්‍රදේශයේ පැවැති උද්ඝෝෂණයක් අතරතුර ඇති වූ වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් යුද හමුදා බ්‍රිගේඩියර්වරයකු ඇතුළු හමුදා නිලධාරීන් සිවිදෙනකුට එරෙහි නඩුව විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරුවරු තිදෙනකු එනම්, මේනකා විජේසුන්දර, නිමල් රණවීර, නිශාන්ත හපුආරච්චි යන මහත්ම මහත්මීන් ඉදිරියේ ඉකුත් 11දා ගම්පහ මහාධිකරණයේදී විභාගයට ගන්නා ලදී.

මෙම නඩුවේ අධි චෝදනා ලැබූ විත්තිකරුවන් වූයේ බ්‍රිගේඩියර් අනුර දේශප්‍රිය ගුණවර්ධන හා හමුදා නිලධාරීන් වන ඩිංගිරි අරුණගේ සිරිසේන, ජයසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න හා ලලිත්ශ්‍රේ යන අයවළුන්ය. මොවුනට එරෙහිව නීතිපතිවරයා විසින් අධි චෝදනා ගොනු කර තිබිණ.

සැප්තැම්බර් 11 දින ගම්පහ මහාධිකරණයේදී මොවුන්ට එරෙහිව ඇති සියලු චෝදනා කියවා දෙන ලද අතර චුදිතයන් සිවුදෙනාම වෙන වෙනම තමන් නිවැරදිකරුවන් යැයි ප්‍රකාශ කළහ.

ඒ අනුව නඩුවේ සාක්ෂි විමසීම ආරම්භ වූ අතර, පැමිණිල්ල වෙනුවෙන් රජයේ නීතිඥ වසන්ත පෙරේරා, උදාර කරුණාතිලක හා අකිලා දල්පදාදු මෙනෙවිය පෙනී සිටියහ.

රජයේ නීතිඥ වසන්ත පෙරේරා මහතා - පැමිණිල්ලේ සාක්ෂිකරු වන එන්. එස්. වික්‍රමආරච්චි යන අයගෙන් ප්‍රශ්න කරයි. ඔබ 2013 වර්ෂයේ පදිංචිව හෝ ව්‍යාපාරයක් කළේ කොහේද?

සාක්ෂිකරු එන්. එස්. වික්‍රමආරච්චි - මම රතුපස්වල 'බවර්' ආයතනයේ කෘෂි පොහොර සම්බන්ධ අලෙවි ගබඩාවක බෙදාහැරීමේ කටයුතු භාරව කටයුතු කරමින් සිටියා.

රජයේ නීතිඥවරයා - රතුපස්වල ගම් ප්‍රදේශයේ ජනතාව පානීය ජලය ලබාගත්තේ කෙසේද?

සාක්ෂිකරු - ළිං ජලයෙනි.

රජයේ නීතිඥවරයා - 2013 වසරේ රතුපස්වල ප්‍රදේශයේ පානීය ළිං ජලය පිළිබඳ ගැටලුවක් තිබුණාද? එය ආරම්භ වූයේ කොයි කාලයේද?

සාක්ෂිකරු - 2013 වසරට වසර කිහිපයකට පෙර සිටම තිබුණා.

රජයේ නීතිඥවරයා - 2013 වසරට පෙර හෝ වසරේ මුල් කාලයේ පානීය ජලය පිළිබඳ ප්‍රශ්නයක් වුණේ නැද්ද?

සාක්ෂිකරු - මුල් කාලයේ ප්‍රශ්නයක් වුණේ නැහැ.

රජයේ නීතිඥවරයා - ළිං ජලය පරීක්ෂාවක් කළේ කොයි කාලයේද?

සාක්ෂිකරු - 2012 වර්ෂයේ පමණය. මට අයත් ළිං දෙකක් තිබුණා. එම ජලයද පරීක්ෂා කළා.

රජයේ නීතිඥවරයා - රතුපස්වල ප්‍රදේශවාසීන් සම්බන්ධ කරගෙන ජලය සම්බන්ධ සමීතියක් පිහිටුවා ගත්තද?

සාක්ෂිකරු - ඔව්. මමත් බැඳුනා.

රජයේ නීතිඥවරයා - ජලය සම්බන්ධ සමීතියක් පිහිටුවා ගත්තේ ඇයි?

සාක්ෂිකරු - ඔය ප්‍රදේශයේ වෙනිගෝස් නමින් අත්වැසුම් (ග්ලවුස්) නිපදවන කම්හලක් තිබුණා. එම කම්හලින් පිටකරන අපජලය පොළවට මුදාහැරීම මත ප්‍රදේශයේ පානීය ළිංවල ජලයට හානිකර වුණා.

රජයේ නීතිඥවරයා - ඔය කම්හල ඔබේ පදිංචියට කොපමණ දුරින්ද පිහිටියේ?

සාක්ෂිකරු - මීටර් 300 ක් පමණ දුරින්.

රජයේ නීතිඥවරයා - ඔබ ඔය කම්හලින් පිටකරන අපජලය දැක තිබේද?

සාක්ෂිකරු - අපජලය පිටකරන්නේ එම කම්හලෙනි.

රජයේ නීතිඥවරයා - ඔබලා පිහිටු වූ ජලය සම්බන්ධ සමීතියෙන් කළේ මොනවාද?

සාක්ෂිකරු - ප්‍රදේශවාසීන් දැනුවත් කළා. සමීතියට ගොවීන්, වෙදමහත්වරුන්, නීතිඥවරු එකතුව සිටියා.

රජයේ නීතිඥවරයා - සමීතියෙන් ගත් තීන්දුව කුමක්ද?

සාක්ෂිකරු - පොලීසියට පැමිණිලි කිරීමට තීන්දු වුණා.

රජයේ නීතිඥවරයා - වෙනිගෝස් ආයතනයට එරෙහිව උද්ඝෝෂණයක් කළාද?

සාක්ෂිකරු - ඔව්. විරෝධතාවක් දැක්වුවා.

රජයේ නීතිඥවරයා - පොලීසියේ දැමූ පැමිණිල්ල අස්කර ගත්තද?

සාක්ෂිකරු - ඉවත් කරගෙන තිබේ. හේතුව නොදනිමි.

රජයේ නීතිඥවරයා - සාක්ෂිකරුට ජල සම්පත් මණ්ඩලයේ ජලය පිළිබඳ තත්ත්ව වාර්තාවක් පෙන්වා දේ. සාක්ෂිකරු වැලිවේරිය, රතුපස්වල විරෝධතාව සම්බන්ධව ආරක්ෂක ලේකම්තුමා හමුවී සාකච්ඡා කිරීමට අගෝස්තු 01 දා තීරණය කර තිබුණා දන්නවාද?

සාක්ෂිකරු - ඔව්.

වැඩිදුර විභාගය ඔක්තෝබර් 23 දිනට කල් තැබිණ. විත්තිකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ අනිල් සිල්වා, අසේල සේරසිංහ, ඩී. සී. විරත්න, නන්දන පෙරේරා, ශිරානි දිසානායක ඇතුළු නීතිඥවරු පිරිසක් පෙනී සිටියහ.

වෛද්‍ය සභාව රුසියානු වෛද්‍ය විද්‍යාල 3ක් අසාධු ලේඛනගත කරයි

බුද්ධි කරුණාරත්න

පැට්‍රික් ලුමුම්බා වෛද්‍ය විද්‍යාලය ඇතුළු රුසියානු වෛද්‍ය විද්‍යාල 3ක් ශ්‍රී ලංකාවේ පිළිගන්නා විදේශ වෛද්‍ය විද්‍යාල ලේඛනයෙන් ඉවත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කොට ඇත. ඉතා තියුණු විමර්ශනයකින් අනතුරුව මෙම තීරණය ගත් බව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව කියයි.

මේ තීරණය ගෙන ඇත්තේ 2020 ජූනි 26 වැනිදා පැවැති වෛද්‍ය සභාවේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ය. අසාධු ලේඛනගත කර ඇති වෛද්‍ය විද්‍යාල තුන වන්නේ රුසියාවේ මහජන මිත්‍රත්ත්ව විශ්වවිද්‍යාලය ලෙස කලින් හැඳින්වූ පැට්‍රිස් ලුමුම්බා විශ්වවිද්‍යාලය, පිරෝගෝව් රුසියානු ජාතික පර්යේෂණ වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ වේර් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලයයි.

දේශීය ව්‍යාපාරිකයන් රකින්න උපදේශක සභාවක් පත් කරයි

ජයසිරි මුණසිංහ

දේශීය ව්‍යාපාර සහ ව්‍යාපාරිකයා සුරක්ෂිත කොට සවිබල ගැන්වීම සඳහා ව්‍යවසාය සංවර්ධන උපදේශක සභාවක් පත්කිරීමට රජය තීරණය කොට ඇත.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථික සැලැස්ම බිම් මට්ටමේ සිට සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ව්‍යාපාරිකයන් සම්බන්ධ කර ගනිමින් ඔවුන්ට ප්‍රායෝගිකව සහයෝගය දෙමින් කටයුතු කිරීමට නව උපදේශක සභාවේ කාර්යභාරයක් වන බව මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්‍රාල් මහතා ප්‍රකාශ කළේය.

විසිදෙනකුගෙන් සමන්විත මෙම උපදේශක සභාව සඳහා තෝරා ගත් පිරිස වෙත එම ඇරැයුම පිළිගැන්වීම සඳහා වූ විශේෂ හමුවක් ඉකුත් 12 වෙනිදා මුදල් අමාත්‍යාංශයේ පැවැති අවස්ථාවට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍යවරයා, දේශීය ව්‍යාපාරිකයන් සුරක්ෂිත කරමින් අන්තර්ජාතික වෙළෙඳ පොළ සමඟ සම්බන්ධ කරවීමේ අරමුණෙන් ඔවුන් සවිබල ගැන්වීමට අදාළ උපදෙස් ලබාදීම සඳහා ව්‍යවසාය සංවර්ධන උපදේශක සභාවක් පත්කළ බව කීය.

ජනතා කේන්ද්‍රීය ආර්ථික සැලැස්ම යටතේ බිම් මට්ටමේ සිට සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ව්‍යාපාරිකයන් සම්බන්ධ කර ගනිමින් ඔවුන් සුරක්ෂිත කරවීම සඳහා ප්‍රායෝගිකව සහය දැක්වීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙම උපදේශක සභාවෙන් තමන් අපේක්ෂා කරනවා යැයි ද අජිත් නිවාඩ් කබ්‍රාල් මහතා මෙහිදී සඳහන් කළේය.

ගිනි ගත් නැව වන්දි ගෙවන්න එකඟ වෙයි

"එම්.වී නිව් ඩයමන්ඩ්" නෞකාවේ ගින්න නිවීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකාව දැරූ වියදමේ හානි පූර්ණ මුදල මෙරටට ගෙවීමට අදාළ නෞකාවේ නියෝජිතයන් වාචිකව එකඟවී ඇතැයි සමුද්‍රීය පරිසර අධිකාරිය සඳහන් කරයි.

ඊට අදාළ ක්‍රමවේදය සම්බන්ධයෙන් තීරණාත්මක සාකච්ඡාවක් අද (14දා) නීතිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිතය.

සම්පූර්ණයෙන්ම ගින්න නිවා දමා ඇති නිව් ඩයමන්ඩ් නෞකාව මේ වන විට මඩකලපුවට නැගෙනහිරින් නාවික සැතපුම් 52ක් දුරින් ගැඹුරු මුහුදේ ස්ථානගත කර තිබේ. තව දුරටත් නෞකාව ටග් යාත්‍රා යොදවා ගනිමින් ආරක්ෂා සහිතව ගැඹුරු මුහුදේ රඳවා තබාගෙන සිටින බව නාවික හමුදාව සඳහන් කරයි.

මෙම නෞකාව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා අද (14) නීතිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට සැලසුම් කර තිබේ. ඒ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව, වරාය අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර පරීක්ෂණ ආරක්ෂා අධිකාරිය සහ වෙළෙඳ නැව් දෙපාර්තමේන්තුව යන ආයතනවල නිලධාරීන් සහභාගීවීමට නියමිතව ඇත.

ගිනි ගැනීමට ලක් වූ "එම්.වී නිව් ඩයමන්ඩ්" නෞකාව සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරිය පසුගියදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝගයක් දී තිබුණි.

ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිව් ඩයමන්ඩ් නෞකාවේ කපිතාන්වරයා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ප්‍රකාශ ලබා ගැනීම් පෙරේදා (12) සිදු කර තිබුණි. නෞකාවේ ඇති සියලුම තෙල් සාම්පල ගැනීමටද විශේෂඥ කණ්ඩායමක් ඊයේ (13) පිටත්ව ගොස් තිබිණි.

කාගිල්ස් දේශීය ව්‍යවසායකයන් දිරිගන්වයි

දේශීය ගොවියන් සහ ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා ඔවුන් විසින් නිෂ්පාදන කරන ලද රසකැවිලි, කොළ කෑල්, කිරි පැණි, කජු, ඇසුරුම් කරන ලද එළවළු, අතිරස හා කුළුබඩු වර්ගවලින් පිරුණු වෙළෙඳ කූට රාශියක් පැලවත්ත කාගිල්ස් ෆුඩ්සිටි වාහන අංගනයේදී ඊයේ (13දා) දැකගන්න ලැබුණු අයුරු. දේශීය ගොවියන් හා ව්‍යවසායකයන් දිරිගැන්වීමේ අරමුණින් කාගිල්ස් ආයතනය සති අන්තදිනවල පරිභෝගිකයන්ට ලබාදෙන බව කාගිල්ස් ෆුඩ්සිටි ආයතනයේ සමුහ කළමනාකාර (කෘෂි ව්‍යාපාර හා නිෂ්පාදන) හරිදාස් ප්‍රනාන්දු මහතා මේ අවස්ථාවට සහභාගි වෙමින් පැවසීය.

ඡායාරූපය - හිරන්ත ගුණතිලක

දිනකට මෙගාවොට් 165ක් පාඩුයි

යහපාලන සමයේ කැලණිතිස්ස බලාගාරයේ යන්ත්‍ර 2ක් වසර 2ක් අක්‍රියව තිබිලා

චන්දිමා කරුණාරත්න

යහපාලන ආණ්ඩු සමයේ කැලණිතිස්ස විදුලි බලාගාරයේ යන්ත්‍ර දෙකක් අක්‍රිය වීමෙන් දෛනිකව නිෂ්පාදනය කළ මෙගාවොට් 165ක විදුලි බලය ජාතික පද්ධතියට වසර දෙකක් තිස්සේ අහිමි ඇත.

කැලණිතිස්ස පිහිටි සංයුක්ත චක්‍රීය බලාගාරයේ විදුලි ජනන යන්ත්‍ර දෙකෙහි රෝදය මෙසේ අක්‍රිය වී ඇත. මෙගාවොට් 115ක් නිපදවන ගෑස් ටර්බයිනය හා එහි වාෂ්පයෙන් බලගැන්වෙන විදුලි ජනන යන්ත්‍රයෙන්ද මෙගාවොට් පනහක් නිපදවන අතර එහි රොටරයද මෙසේ අක්‍රිය වී තිබේ.

පසුව එම රොටර් විදුලි ජනන යන්ත්‍ර දෙකේ රොටර් දෙක ලිහිසි තෙල් කාන්දු වීම හේතුවෙන් අලුත්වැඩියා කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයට මීට වසරකට පෙර යවා ඇති අතර, පසුව එහි තවත් අලුත්වැඩියාවක් සඳහා එම රොටර් දෙක ඉන්දියාවට එවා ඇතත් මේ වන තෙක් වැඩ අවසන්ව ආපසු එවා නොමැත. ඉන්දියාවේ පවතින කොවිඩ් 19 වසංගතයට සමග එම උපකරණ අලුත්වැඩියා කර මෙරටට ගෙන්වීම ප්‍රමාද වී ඇත.

උපකරණ අලුත්වැඩියා කිරීම ප්‍රමාද වී ඇත්තේ ඉන්දියාවේ දැඩි ලෙස ව්‍යාප්ත වන කොරෝනා නිසා බව විදුලි බල මණ්ඩලය මාධ්‍ය ප්‍රකාශක සුලක්ෂණ ජයවර්ධන මහතා පැවසුවේය.

මඩකලපුවේ 'කඩු පහර' කල්ලියේ 2ක් අල්ලයි

මඩකලපුව ප්‍රදේශයේ ක්‍රියාත්මක 'කඩු පහර' නැමැති අපරාධ කල්ලියේ නායක ධනූ ඇතුළු දෙදෙනකු පෙරේදා (12) පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

කඩු පහර නමැති මෙම අපරාධ කල්ලිය ජනතාව බිය වද්දමින් විවිධ අපරාධවල නිරතවී තිබෙන බවට පොලිසියට පැමිණිලි ලැබී තිබිණි. සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යෑමේදී පොලිසියට ද කඩු පහර එල්ල කිරීම තැත් කර ඇති අතර පොලිසිය සාර්ථක ලෙස මෙහෙයුම සිදුකර සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් සමග කඩු සහ අත්බෝම්බද පොලිස් භාරයට ගෙන ඇත.

ආලින්දය

ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න මම ශක්තිමත්

විශේෂඥ වෛද්‍ය පබා පලිහවඩන

දෙනෙතට නොපෙනෙන කොවිඩ් මාරයාගෙන් අප මුදා ගැනීමට සටන් කළ දිරිය කාන්තාවක වන විශේෂඥ වෛද්‍ය පබා පලිහවඩන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරිය ද (මහජන සෞඛ්‍ය) වන්නීය. දෙස් විදෙස් වසංගතවලට පවා නොබියව මුහුණ දුන් දිරිය මානාවක වන ඇය අද 'ආලින්දය' හා එක්ව සිය ජීවිතයේ තතු මෙසේ හෙළි කරයි.

● ඔබේ පවුලේ විස්තර ගැන මුලින්ම කතා කරමු ....

මගේ ගම, මාතර - කරගොඩ උයන්ගොඩ කියන සුන්දර ගම. කුසුමා තල්ලපෙරුම මගේ මව, ඇය ගුරුවරියක්. පසුව විදුහල්පතිවරියක් වුණා. තාත්තා රොබට් කොඩිකාර පලිහවඩන. ඔහු ඉංග්‍රීසි ගුරුවරයෙක්. සහෝදරයන් හතර දෙනකු අතරේ මම පවුලේ දෙවැනියා. අපේ මව්පියන් නිදහසේ සෙල්ලම් කරන්න අපට අවසර දීලා තිබුණා වගේ ඉගෙන ගැනීමේ පරිසරයකුත් නිර්මාණය කරලා දීලා තිබුණා. හොඳ ගුණ ධර්ම අපිට හුරු කළා. පවුලෙන් ලැබූ ඒ පත්තරය මට ජීවිතය ජයගන්න ගොඩක් උපකාර වුණා.

● ඔබටත් සුන්දර ළමා කාලයක් තියෙන්න ඇති...?

මම පොඩි කාලේ හැදුණේ ගමේ. ළමයින් එක්ක කෙළිදෙළෙන් කාලය ගත කළ අපිට සුන්දර ළමා කාලයක් තිබුණා. නැදෑයන්, හිතවතුන්, වැඩිහිටියන් සමඟ අපට හොඳ ඇසුරක් තිබුණා. මම හැමෝම අතරේ ජනප්‍රියයි. මම සින්දු කියනවා නටනවා. ඒ නිසා පවුලේ හැමෝම මට ආදරෙයි. මට ආයුර්වේද වෛද්‍ය මාමා කෙනකුයි, බාප්පා කෙනකුයි හිටියා. ඔවුන් දෙස්තර කෙනෙක් වෙන්න කියලා හැම වෙලාවෙම මට කිව්වා. ආයුර්වේද ඖෂධ පැළැටි, අරිෂ්ට බෝතල් ගැන මම ඔවුන්ගෙන් අහනවා. එතකොට, ඔවුන් "ඕවා දුවට වැඩක් නෑ, දුව බටහිර වෛද්‍ය විද්‍යාව කරන්නකෝ" කියලා මට කියනවා.

● පාසල් ජීවිතය ගැන මතකය අවදි කරමු...

අද කාලෙ වගේ නෙවෙයි ඒ කාලේ පාසල් ජීවිතය හරිම පහසුයි. අධ්‍යාපන කටයුතු වගේම නිදහසේ සෙල්ලම් කරන්නත් කාලය තිබුණා. මානසික පීඩාවකින් තොරව ඉගෙන ගන්න අවස්ථාව ලැබුණා. පාසල් අවදියේ මම දිස්ත්‍රික් හා සමස්ත ලංකා ගායනා තරඟවලට ඉදිරිපත් වුණා. කුඩා කාලයේ මම ගියේ මගේ මව ඉගැන්වූ අතුරලියේ මහා විද්‍යාලයට. නමුත්, 7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා නුගේගොඩ අනුලා විද්‍යාලයේ ඉගෙනුම ලැබුවා. එහිදී ගායණ තරඟවලදී පළමුවැනියා වුණා. උසස් පෙළට කොළඹ දේවි බාලිකා විද්‍යාලයට ඇතුළත් වුණා.

● ඔබට අමතක නොවන අත්දැකීමක් තිබෙනවද?

උසස් පෙළ අවසන් කරලා අපි කෝදගොඩ ගුරුතුමියත් එක්ක දියතලාවේ විනෝද චාරිකාවක් ගියා. කෝච්චියේ ගිය මේ ගමනෙදි වෙන ළමයි ටිකක් දඟ කළාට මම දඟ කළේ නැහැ. අපි රෑ සින්දු කියලා හොඳට විනෝද වුණා. හැමෝම නිත්දට ගියාට පසුව යාළුවෝ කට්ටියක් තවත් යාළුවන්ගේ මුහුණේ දන්තාලේප ගැවා. ඒවා ගෑ අය මම දැක්කා. ඒ ගැන ගුරුවරු ප්‍රශ්න කරද්දී මම ඒවා සැඟවුවා. මම තව කෙනකුගේ සිත රිදෙන වැඩ කරත්තේම නැහැ.

● ඔබේ සරසවි ජීවිතය....

මම විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණේ 1981 වසරේදී. ගොඩාක් මහන්සි වෙලා පාඩම් වැඩ කරලා සාර්ථක ලෙස වෛද්‍ය උපාධිය නිම කළා.

● විවාහ ජීවිතය ගැන කිව්වොත්?

වසර 1988 දී මම විවාහ වුණා. මගේ ස්වාමි පුරුෂයා ඉංජිනේරුවෙක්. ඔහුගේ නම ජයන්ත සමරකෝන්. මට දියණියක් සහ පුතෙක් ඉන්නවා. දියණිය ඉංජිනේරුවරියක්. ඇය රාධවී සමරකෝන්. ඇය ඇමෙරිකාවේ කැලිෆෝනියා සරසවියක පශ්චාත් උපාධිය හදාරනවා. පුතා ඇමෙරිකාවේ අධ්‍යාපනය හදාරා ඇවිත් දැන් ලංකාවේ. නම ලසිරු සමරකෝන්.

● අධ්‍යක්ෂ ධුරයක් දක්වා පැමිණි ගමන ගැන මතක් කරමු....

මගේ පළමු පත්වීම ලැබුණේ කොළඹ කළුබෝවිල ශික්ෂණ රෝහලට (1986). අනතුරුව, හෝමාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය ලෙස කටයුතු කළා. ඒ කාලයේ මම පශ්චාද් උපාධිය කළා. ප්‍රජා වෛද්‍ය විද්‍යාවෙන් 'විද්‍යාපති' සමත් වුණා. කළුතර ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරිය වශයෙන් වැඩ කළා. වසංගත රෝග විද්‍යා අංශයේ පත්වීම බාර ගත්තේ 1995 වසරේදී. එහි අවුරුදු 25 ක් සේවය කළා. අමෙරිකාවේ හෙක්ටර්ස් සී.ඩී.සී. ආයතනයේ පශ්චාද් උපාධියෙන් පසුව පුහුණුවක් ලැබුවා. එය අවසන් කර ලංකාවට පැමිණ 2001 වසරේ සිට වසංගත රෝග විද්‍යා අංශයේ විශේෂඥ වෛද්‍යවරියක ලෙස සේවය කළා. , නියෝජ්‍ය වසංගත රෝග විද්‍යාඥවරිය, ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥවරිය කියන තනතුරුත් දරුවා. දැන් මම නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය) තනතුර දරනවා. වසංගත රෝග විද්‍යා අංශය මගේ යටතේ තිබෙන එක් ආයතනයක්. මම තවත් ආයතන දහයක වගකීම දරනවා. බෝවන රෝග මර්දනය, ලිංගාශ්‍රිත රෝග මර්දනය, ජලභීතිකා, බරවා, ඩෙංගු මර්දන කටයුතු බාරව තිබෙන්නේ මට.

● රැකියාවට පවුලෙන් ලැබෙන සහයෝගය කොහොමද?

මට මේ තනතුර දක්වා එන්න මගේ ස්වාමි පුරුෂයා, දරුවන් ලොකු ශක්තියක් දුන්නා. දරුවන් පොඩි කාලයේ නම් ටිකක් අපහසුවක් තිබුණා. නමුත්, මගේ ස්වාමි පුරුෂයා හොඳ සහායක් ලබා දුන්නා. ඇතැම් දිනවල රාජකාරී වැඩ අවසන් වී නිවෙසට යන විට පාන්දර එක දෙක වෙනවා. සුනාමි, සෙට්ටිකුලම් ගැටලුව, යුද කාලයේ වගේම එච් වන් එන් වන් කාලයේ ඔවුන් මට විශාල සහයක් දුන්නා.

> **"ආයතනයේ වැඩ කරගෙන යන විට තර්ජන ගර්ජන නැතුවාමත් නොවෙයි. ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ තනතුරේ සිටින විට ගොඩාක් බලපෑම් එල්ල වුණා. මා ඉවත් කර වෙනත් පරිපාලකයකු තනතුරට අනුයුක්ත කළා. ඕනෑම තැනක වැඩ කරන්න මම සූදානම්. ඒත් කෙනෙක් ලබා ගත් දැනුම, විෂයේ පරිණතභාවය හා සුදුසුකම් නොසලකා වැඩ කිරීමෙන් වසංගත කාලවලදී මිනිස්සුන්ට ගැටලුවක් ඇති වෙනවා නම්, මා ඒ වෙනුවෙන් පෙනී සිටිනවා.**

හැටේදිත් කඩවසම්

2021 දී සුනිල් ෂෙට්ටි තම අභිසංක දඩබ්බරයා ලබන වසරේ අගෝස්තුවේදී සමරත්තේ හැට වැනි උපත් දිනයයි. ඔහු නිතරම ඉන්ස්ටග්‍රම් සමාජ වෙබ් අඩවියේ රසිකයන් වෙත ගෙන එන්නේ ජිම් ගොස් ව්‍යායාම කරන පින්තූර ය. සුනිල් පවසන්නේ තමන්ගේ අංක එක කායික සුවතාව බවයි. තම ක්‍රියාදම විරයකු වූයේ ශක්තිමත් කඩවසම් සිරුර නිසා බව ඔහු නිතර පවසයි. එය ඔහු කිසි දින අමතක නොකරන අතර රසිකයන්ට කඩවසම් සුනිල් ෂෙට්ටි ලෙසින් තමන් මතකයේ රැඳෙනවාට ඔහු කැමැති ය. "වයස අංකයක් විතරයි. මගේ දින දර්ශනය සැකසිලා තියෙන්නේ වයසට ගැළපෙන්න නෙවෙයි" ඔහු අභිමානෙන් පවසයි. ජිම් යෑමට අමතරව සමබල ආහාර ගැනීම, භාවනා කිරීම, යෝගා ව්‍යායාමයෙහි නිරත වීමට ද ඔහු අමතක නොකරයි.

රියාට චෝදනා



සුෂාන්ත් සිං රාජ්පුත් කොවිඩ් - 19 නිසා ඉන්දියාව වසා දැමූ සමයේ අකාලයේ ජීවිතයෙන් සමුගත් දක්ෂ ජනප්‍රිය බොලිවුඩ් තරුවයි. ඉංජිනේරුවකු වීමට දිල්ලි ඉංජිනේරු කොලීජියට ඇතුළත් වුවද නර්තනයට හා රංගනයට ඇති උමතුව නිසාම ඔහු ඉගෙනීම අත්හළේ ය. බොලිවුඩයේ අති සාර්ථක ජනප්‍රිය නළුවකු ලෙසින් සුබ අනාගතයකට මුලපුරා තිබියදී හදිසියේම ජූනි 14 වැනිදා ගෙල වැලලා ගෙන සියදිවි නසා ගැනීමත් සමඟ මරණය සම්බන්ධයෙන් ඇඟිල්ල කෙළින්ම දිගු වූයේ ඔහුගේ පෙම්වතිය රියා චක්‍රබෝර්ති කෙරෙහි ය. රියා වට්ස්ඇප් මඟින් මත්ද්‍රව්‍ය ගැන කළ කතා බහක් මේ වනවිට සැකයට ලක් වී තිබේ. මත් ද්‍රව්‍ය තිරෝධන අංශයේ නිලධාරීන් පස් දෙනකු ඇයගේ නිවෙසට පැමිණ විමර්ශනයක් කර තිබේ. රියාගේ නිවෙසට අමතරව ඔවුන් ඔහුගේ මිතුරකුගේ නිවසක් ද පරීක්ෂා කර ඇත.

රියා තමන්ට එරෙහි නඩුවේදී තෝරා ගෙන ඇත්තේ සල්මන් ඛාන් සහ සංජය දත් වෙනුවෙන් කතා කළ නීතිඥයා ය. මේ නිසා දැන් සල්මන්ට කෙරෙන චෝදනා ද බරපතළ ය. සල්මන්ගේ 'මුව දඩයම' නඩුවට කතා කළ රියාගේ නීතිඥයා පවසන්නේ රියා කිසි දිනක මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවයි. සුසාන්ත්ගේ පවුලේ සාමාජිකයන් පවසන්නේ රියා රහසිගතව සුසාන්ත්ට මත්ද්‍රව්‍ය දුන් බවයි. සල්මන් රියාට හොර රහසේ උපකාර කරන්නේ ඇයිද සහ ඇය ඔහුගේ නිවෙසේ සැඟව සිටියාද යන්න තවමත් සුසාන්ත්ගේ මරණය මෙන්ම අබිරහස් ය.



Bollywood

ජැකලින්ට කොරෝනා නෑ

සෙමෙන් සෙමෙන් බොලිවුඩයේ වැඩ ඇරඹිණි. අපේ ජැකලින් ෆර්නැන්ඩස් ද නව සිතමා පටයේ රූගතවීම්වල යෙදී සිටියදී කණ්ඩායමේ දෙදෙනකුට කෝවිඩ් - 19 ආසාදිත වී ඇති බව අනාවරණය විය. ඒ සමඟම රූ ගත කිරීම් ද නතර වූ අතර නව කොරෝනා වයිරසය සඳහා ඇය ද පරීක්ෂාවට ලක් කෙරිණි. වාසනාවකට ඇය රෝගයට ගොදුරු වී නැත. ඒ බව වහාම ඉන්ස්ටග්‍රම් වෙබ් අඩවියෙන් ඇය රසිකයන්ට දැනුම් දුන්නා ය. බූට් පොලිෂ්, කික් 2 සිතමා පටවල ඇය ඉදිරියට රඟ පෑමට නියමිත සිතමාපට වේ.

මරණ තර්ජනවලට මම කලබල වෙන්නේ නෑ

සමහරුන්ට කරන්න පුළුවන් දේත් බැරි දේත් තියෙනවා

ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න

අසේල කුරුළුවංශ

අසාධාරණ ඉල්ලීම් කිහිපයක් මුල් කරගෙන මෙරට දරුණුම අපරාධකරුවන් පිරිසක් බූස්ස බන්ධනාගරයේ ආහාර වර්ජනයක නිරත වන බවත් තවත් දින දෙක තුනක් ගිය පසු බඩගින්න දරා ගැනීමට නොහැකිව ඔවුන් ආහාර ගැනීමෙන් අනතුරුව එම වර්ජනය නිමා කරනු ඇති බවත් ආරක්ෂක ලේකම්, විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා පැවසීය.

මාරාන්තික උපවාස සිදු කර මෙරට මියගිය එකම පුද්ගලයා තිලීපන් පමණක් බවත් ඔහුද මරණයට පත් වූයේ අසනීප තත්ත්වයක් තිබියදී උපවාසයට එක් වීම නිසා බවත් ඒ මහතා එහිදී සිහිපත් කළේය. හෙතෙම මේ බව කියා සිටියේ, මත්ද්‍රව්‍ය හා පාතාලය මර්දනය කිරීමට කරනු ලබන අඛණ්ඩ වැටලීම් මඟින් අත්අඩංගුවට ගන්නා සැකකරුවන් රඳවා තැබීමට බන්ධනාගාරවල ඉඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඔවුන්ගෙන් කොටසක් දැනට වසා දමා තිබෙන බෝගම්බර පැරණි බන්ධනාගාරයේ රඳවීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමට පෙරේදා (12) මහනුවරට පැමිණි අවස්ථාවේදීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් ආරක්ෂක ලේකම්වරයා සඳහන් කර සිටියේ, මාරාන්තික උපවාස කරන සියලු දෙනා දින කිහිපයක් උපවාසයේ නිරතව සිට බඩගින්න දරාගත නොහැකි මට්ටමට එන විට කුමන හෝ හේතුවක් ඉදිරියට දමා කවුරුන් හෝ ලවා වතුර නැත්නම් තැඹිලි පොවාගෙන උපවාසය අත් හරින බවයි. දැනටමත් බූස්ස බන්ධනාගාරයේ උපවාසයේ නිරතව සිටි අයගෙන් කොටසක් ආහාර ලබාගෙන උපවාසය අත්හැර තිබෙන බව කී ඒ මහතා, සෙසු පිරිසද ඉදිරියේදී එම මාර්ගයම අනුගමනය කරනු ඇති බවද අවධාරණය කළේය. උපවාස සිදු කර ඉල්ලන්නේ මොනවාද කියන එක වැදගත් බවත් අසාධාරණ ඉල්ලීම් කරන්නේ නම් ඒවා ඉටු කිරීමට කිසිදු හැකියාවක් නොමැති බවත් හෙතෙම ප්‍රකාශ කර සිටියේය.

දැනට බූස්ස බන්ධනාගාරයේ උපවාසයේ නිරත අය තමන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරු බන්ධනාගාරයට එන විට පරීක්ෂා නොකරන ලෙස ඉල්ලීමක් කරන බවත් බූස්ස බන්ධනාගාරයට ඇතුළුවන විට ආරක්ෂක ලේකම් වන තමන්වද පරීක්ෂා කරන ලෙස දැනුම් දී තිබියදී අපරාධ චෝදනා ලත් අය වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරු පරීක්ෂා නොකර සිටීමට කිසිදු හේතුවක් නොමැති බවත් කී ගුණරත්න මහතා, බූස්ස වැනි අධි ආරක්ෂිත සිරවන්ට කලින් ඇතුළු පිරිසුදු කර ගැනීමට අවශ්‍ය වූ නිසා බවත් ඒ මහතා පෙන්වා දුන්නේය. ඔහු කියා සිටියේ, ඇතුළු පිරිසුදු කර ගත් පසු රාජකාරි කරන නිලධාරීන්ට ගෞරවාන්විතව තම රාජකාරිය ඉටු කිරීමට පසුබිම සැලසෙන බවයි. වැරදි කරනවා නම් ඔහු නිල ඇඳුමක් අඳිනවාද නැද්ද යන්න ප්‍රශ්නයක් නොවන බවත් කී ආරක්ෂක ලේකම්වරයා වරදේදී සියලු දෙනාට අත් වන්නේ එකම ඉරණම යැයිද කීය. ගෞරවාන්විත රාජකාරියක් කරන බව පුරවැසියන්ට පෙන්වාගෙන පොලීසියේ, බන්ධනාගාරයේ, හමුදාවේ අය සොරකම් කරනවා නම්, කුඩු විකුණන මුදලාලිලා ලෙස කටයුතු කරනවා නම්, ජාවාරම් කරනවා නම්, අපරාධ මෙහෙයවනවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙන බවත් මුලින් එයට තින තැබීමට පියවර ගැනීම වැදගත් බවත් ගුණරත්න මහතා සිහිපත් කර

ඔවුන්ගේ ඉල්ලීම් අපි දෙන්නේ නෑ

ගෙදරක පරීක්ෂණ කටයුතු පිළිබඳ කතා කිරීමට රඳවූවන්ට අවශ්‍යතාවක් නොමැති බවද අවධාරණය කළේය.

තත්ත්වය, තරාතිරම නොබලා වැරදි කරන අය අත්අඩංගුවට ගන්නා බවත් පොලිසිය, හමුදාව හා බන්ධනාගාරය තුළ සිට වැරදි කරන නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම මුලින් ආරම්භ කළේ පිට සිටින වැරදිකරුවන් පත් කර ඔවුන් සමාජයට යොමු කිරීම තම බලාපොරොත්තුව බවද හෙතෙම පැවසුවේය.

අපරාධ චෝදනා ලැබ බන්ධනාගාරගතව සිටින අයගෙන් තමන්ට එල්ල වන මරණීය තර්ජන සම්බන්ධයෙන් අදහස් දැක්වූ ආරක්ෂක ලේකම්වරයා, මිනිසුන්ට කළ හැකි දේ මෙන්ම නොහැකි දේද තිබෙන බවත් ඇතැම් පුද්ගලයන් කළ නොහැකි දේවල් කියද්දී තමන් ඒ සම්බන්ධයෙන් කලබල නොවන බවද ප්‍රකාශ කළේය. ඔහු වැඩිදුරටත් කියා සිටියේ, මේ රටේ ජනතාවට නිදහසේ ජීවත් වීමට අවශ්‍ය පරිසරය උදා කිරීමට කළ හැකි සියලු දේ කරන බවත් එසේ කළ නොහැකි වුවහොත් මේ රටට අනාගතයක් නොමැති බවත් වගකිවයුතු රාජකාරියක් තමන් බාර ගත්තේ තර්ජනවලට බය නැති නිසා බවත්ය.

සංවිධානාත්මකව සිදු කරන මත්ද්‍රව්‍ය ජාවාරම හා අපරාධ මැඬලීමට මහජන සහාය අත්‍යවශ්‍ය බවත් තොරතුරු ලබා දෙන අයගේ රහස්‍යභාවය රැකගන්නා අතර ඔවුන්ට මුදල් ත්‍යාග ලබා දීමටද පියවර ගෙන තිබෙන බවත් ඒ මහතා මෙහිදී සිහිපත් කර සිටියේය.

බන්ධනාගාරයට එද්දි මාවත් පරීක්ෂා කරනවා: අපරාධකරුවන්ගේ නීතිඥයන් නිකම් යවන්න බෑ



දිනුම් වාරය 609

නිල පුතිඵල

දිනය: 2020.09.11

ඉංග්‍රීසි අකුර: B

සුපිරි අංකය: 09 18 22 25 65

ජයග්‍රාහී අංක

	තෑගෑ රාවය	තෑගෑ මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන තෑගෑය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන තෑගෑය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	04
3 වන තෑගෑය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	150
4 වන තෑගෑය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	334
5 වන තෑගෑය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	8,861
6 වන තෑගෑය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	5,770
7 වන තෑගෑය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	144,596
8 වන තෑගෑය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	26,180

ලංකාවේ විශාලම සුපිරි තෑගෑය

මීළඟ මෙගා සුපිරි තෑගෑය

රු. 234,388,349.15

මීළඟ පවර් සුපිරි තෑගෑය	මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි තෑගෑය
රු. 11,223,316.00	රු. 14,614,795.20

දිනා ඇති මුළු මුදල

රු. 5,249,420.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑගෑ රජයේ බදු නීති පරිදි වලට යටත් වේ.
- තෑගෑ මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය

නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

දිනුම් වාරය 610

නිල පුතිඵල

දිනය: 2020.09.12

ඉංග්‍රීසි අකුර: A

සුපිරි අංකය: 26 10 59 62 64

ජයග්‍රාහී අංක

	තෑගෑ රාවය	තෑගෑ මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන තෑගෑය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	01
2 වන තෑගෑය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	09
3 වන තෑගෑය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	141
4 වන තෑගෑය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	334
5 වන තෑගෑය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	8,197
6 වන තෑගෑය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	5,310
7 වන තෑගෑය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	135,257
8 වන තෑගෑය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	24,579

ලංකාවේ විශාලම සුපිරි තෑගෑය

මීළඟ මෙගා සුපිරි තෑගෑය

රු. 234,502,951.95

මීළඟ පවර් සුපිරි තෑගෑය	මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි තෑගෑය
රු. 11,337,918.80	රු. 14,729,398.00

දිනා ඇති මුළු මුදල

රු. 6,436,820.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑගෑ රජයේ බදු නීති පරිදි වලට යටත් වේ.
- තෑගෑ මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය

නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

බෞද්ධ සාහිත්‍ය උත්සවය හෙට අගමැති ප්‍රධානත්වයෙන්

චන්දිමා කරුණාරත්න

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා බුද්ධශාසන ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව වාර්ෂිකව සංවිධාන කරන බෞද්ධ සාහිත්‍ය උත්සවය කොළඹ 07 සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බී.එම්. විලියම් ශාලාවේදී අග්‍රාමාත්‍ය සහ මුදල්, බුද්ධශාසන ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හෙට (15) පස්වරු 2.45 ට පැවැත්වේ.

ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාවගේ ප්‍රධානතම බෞද්ධ සංවිධානය වන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් බෞද්ධ සාහිත්‍ය සහ පුරාවිද්‍යාවේ උන්නතිය සඳහා දායකත්වය දුන් ගත්කතුවරුන්, චිත්‍ර ශිල්පීන් හා විද්වතුන් ඇගයීම සහ ප්‍රණාමය පුද කිරීම වෙනුවෙන් මෙම උත්සවය සංවිධාන කර තිබේ.

පුරාවිද්‍යා චක්‍රවර්ති පූජ්‍ය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ මූලාසනයෙන්ද ජාතික උරුම ප්‍රාසාංගික කලා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මහතාගේ සහභාගීත්වයෙන්ද මෙම බෞද්ධ සාහිත්‍ය මහෝත්සවය පැවැත්වීමට නියමිතය.

පුරාවිද්‍යාත්මක හා සංචාරක මාර්ගෝපදේශන ක්‍රියා අගමැති උපදෙසින් විධිමත් කෙරේ

චන්දිමා කරුණාරත්න

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරාවිද්‍යාත්මක හා සංචාරක මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් විධිමත් කිරීමට සැලසුම් කර ඇති අතර, එහි මූලික නිරීක්ෂණ කටයුතු මේ දිනවල සිදු කෙරෙමින් පවතී.

ආරක්ෂක, මුදල්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු හා නාගරික සංවර්ධනය හා නිවාස අමාත්‍ය, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි එම කටයුතු සිදු කෙරේ. මධ්‍යම සංස්කෘතික අරමුදලින් ක්‍රියාත්මක සංවර්ධන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව නීත්‍යනුකූල ක්‍රමවේදයන්ට අනුව සිදු කිරීමත් අනාගත ඉලක්කයන් කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන වශයෙන් සැලසුම් කොට ක්‍රියාවේ යෙදවීම, පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් සඳහා අවශ්‍ය ආරක්ෂාව, යටිතල පහසුකම් හා අධ්‍යාපනික මාර්ගෝපදේශන කටයුතු විධිමත් කර ජාත්‍යන්තර නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම ඒ යටතේ සිදු කිරීමට නියමිතය. මේ අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරාවිද්‍යාත්මක ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන හා ඉදිරි ආයතනික සැලසුම් පිළිබඳව විශේෂ සාකච්ඡාවක් ද පසුගියදා පැවැත්විණි.

රාජ්‍ය නාට්‍ය උළෙළ 2020 උත්කර්ෂවත්ව නිමා වෙයි

උපාලි කරුණාරත්න

රාජ්‍ය නාට්‍ය උළෙළ - 2020 සම්මාන ප්‍රදානෝත්සවය පසුගියදා (11) කොළඹ, නෙළුම් පොකුණ රඟහලේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කර තිබිණි. ජාතික උරුම, ප්‍රාසංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම උළෙල පැවැත්වූ අතර රඹුකන සිද්ධාර්ථ හිමියන් ඇතුළු මහා සංඝරත්නය, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ, රාජ්‍ය නාට්‍ය උපදේශක සභාවේ සභාපති මහාචාර්ය ආරියරත්න ඇතුගල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක (වැඩ බලන) තරණි අනෝජා ගමගේ, මාලනී ෆොන්සේකා, ධර්මසිරි බණ්ඩාරනායක යන මහත්ම මහත්මීන් ඇතුළු කලාකරුවෝ රැසක් මෙම සම්මාන උළෙළ සඳහා සහභාගී වූහ.

මෙහිදී ජීවිතයේ එක් වරක් පමණක් පිරිනමන නාට්‍ය කීර්ති සම්මානයෙන් ප්‍රවීණ නාට්‍යවේදී නිශ්ශංක දිද්දෙණිය, ප්‍රවීණ නාට්‍යවේදිනී අනුලා බුලත්සිංහල, ප්‍රවීණ නාට්‍යවේදී බුද්ධදාස ගලප්පත්ති, ප්‍රවීණ නාට්‍යවේදී මරිය ෂේවියර් පියතුමා යනාදීහු පිදුම් ලැබූහ. හොඳම නාට්‍ය නිර්මාණය - 2020 සඳහා සම්මානය එච්.පී. නිලංක නිසලාංජල් ධර්මදාසගේ 'අතරමැදියා' දිනා ගත්තේය. දමිළ අංශයෙන් සිවරාසා ප්‍රදීප් සහ ඒ. සත්‍යනාදම්ගේ 'මන්කුලිතු' ද දිගු නාට්‍ය (සිංහල) හොඳම අධ්‍යක්ෂණය සඳහා සම්මානය අතරමැදියා නාට්‍යයේ අධ්‍යක්ෂක එච්. පී. නිලංක නිසලාංජල් ධර්මදාසටද හිමි විය. හොඳම අධ්‍යක්ෂණය දිගු නාට්‍ය (දමිළ) සඳහා සම්මානය 'මන්කුලිතු' අධ්‍යක්ෂණය කළ සිවරාසා ප්‍රදීප් සහ ඒ. සත්‍යනාදම් දිනා ගත්හ.

හොඳම නළුවා (දිගු නාට්‍ය - සිංහල) සම්මානය මගුල් කපුවා නාට්‍යයේ මාරියෝගේ චරිතය නිරූපණය කළ තිලාන් වර්ණජිත් ද හොඳම නළුවා (දිගු නාට්‍යය-දමිළ අංශය) සඳහා සම්මානය 'මන්කුලිතු' නාට්‍යයේ සම්පත් ලෙස රඟ පෑ ආර්. ශ්‍රී කාන්ත්ද දිනා ගත්හ හොඳම නිළිය (දිගු නාට්‍ය - සිංහල) සඳහා සම්මානය 'අතරමැදියා' නාට්‍යයේ අමන්දිගේ චරිතය නිරූපණය කළ සිඳිදු රන්වලටද දමිළ අංශය සඳහා සම්මානය Flightless Butterfly නාට්‍යයේ මවගේ චරිතය රඟපෑ ආර්. නිර්ජනාටද හිමි විය.

මේ අතර, හොඳම කෙටි නාට්‍ය නිෂ්පාදනය සඳහා සම්මානය (සිංහල) පළමු ස්ථානය පොත්ගුල නාට්‍යය නිෂ්පාදනය කළ සුරේෂ් මධුෂාන්ද දමිළ අංශය සඳහා පළමු ස්ථානය 'අංගිගරාමි' නිෂ්පාදනය කළ ආර්. ශ්‍රී කාන්ත්ද හොඳම කෙටි නාට්‍යය (සිංහල) අධ්‍යක්ෂණය සඳහා සම්මානය පොත් ගුල නාට්‍ය අධ්‍යක්ෂණය කළ සුරේෂ් මධුෂාන්ද දමිළ අංශයෙන් 'අංගිගරාමි' අධ්‍යක්ෂණය කළ ආර්. ශ්‍රී කාන්ත්ද දිනා ගත්තේය. හොඳම ස්ටීය නොවන රචනය (දිගු නාට්‍යය - සිංහල) සඳහා හස්තිරාජ මහත්තයා නාට්‍යය රචනා කළ රංජිත් ධර්මකීර්තිද හොඳම ස්ටීය රචනය (දිගු නාට්‍ය - සිංහල) සඳහා පළමු ස්ථානය අතරමැදියා රචනා කළ එච්.පී. නිලංක නිසලාංජල් ධර්මදාසද හොඳම රචනය (දිගු නාට්‍ය - දමිළ) සඳහා පළමු ස්ථානය 'මන්කුලිතු' නාට්‍යය රචනා කළ සිවරාසා ප්‍රදීප් සහ හොඳම රචනය (කෙටි නාට්‍ය - සිංහල) සඳහා පළමු ස්ථානය පොත්ගුල නාට්‍ය රචනා කළ එම්. සුරේෂ් මධුෂාන් සහ පී. සුදර්ශන ක්‍රිෂාන්තද හිමි කර ගත්තේය.

හොඳම රචනය (කෙටි නාට්‍ය - දමිළ) සඳහා පළමු ස්ථානය 'අංගිගරාමි' රචනා කළ ආර්. ශ්‍රී කාන්ත්ටද හොඳම සහාය නිළිය සම්මානය (දිගු නාට්‍ය සිංහල) 'මගුල් කපුවා' නාට්‍යයේ බ්‍රිස්ගේ චරිතය නිරූපණය කළ ඉමායා සෙව්වන්දිකාටද හොඳම සහාය නළුවා සම්මානය (දිගු නාට්‍ය සිංහල) 'මම නෙවෙයි වෙන කෙනෙක්' නාට්‍යයේ වත්තෙගේ චරිතය නිරූපණය කළ සම්පත් ජයවීරටද දමිළ අංශයෙන් සම්මමානය Flightless Butterfly නාට්‍යයේ තාත්තාගේ චරිතය නිරූපනය කළ ටී. කවිතරන්ටද හොඳම නිළිය (කෙටි නාට්‍ය - සිංහල) සම සම්මානය පළමු ස්ථානය Female නාට්‍යයේ ෆාතිගේ චරිතය නිරූපනය කළ ඒ.එම්. බුද්ධිමා අබේසිංහටද එම නාට්‍යයේ තිලාගේ චරිතය නිරූපණය කළ ආර්.ජී. තිලංකා වික්‍රමසිංහටද හිමි විය.

සම්මාන උළෙළේදී හොඳම නිළිය (කෙටි නාට්‍ය - දමිළ) පළමු ස්ථානය Pennal නාට්‍යයේ ගැහැනු ළමයාගේ චරිතය රඟපෑ ටී. ඉමල්නීද හොඳම නළුවා සම සම්මාන (කෙටි නාට්‍ය - සිංහල) පළමු ස්ථාන පොත්ගුල නාට්‍යයේ සේල්වාගේ චරිතය නිරූපණය කළ ඩබ්.එම්.ඩී.බී. වන්නිනායකද එම නාට්‍යයේ භූමිගේ චරිතය නිරූපනය කළ ශානක උදාර රාජරත්නද දමිළ අංශයෙන් හොඳම කෙටි නාට්‍ය නළුවා ලෙස පළමු ස්ථානය 'අංගිගරාමි' නාට්‍යයේ මෝසස් ප්‍රපන්තද දිගු නාට්‍යය (සිංහල) කුලසතා සහතික විජයන්තිමාලා නාට්‍යයේ විජයන්ති චරිතය නිරූපණය කළ කසුනි ගනේවත්තද, ගලේ පිපුන මල් නාට්‍යයේ බොක්කි චරිතය නිරූපණය කළ තිලිණ පෙරේරා ද කෙටි නාට්‍ය කුසලතා සහතික බෝම්බ ගැහුවට කමක් නෑ සිංදු කියමු නාට්‍යයේ නිවේදකයාගේ චරිතය නිරූපණය කළ දුලාජ්ද ඇවිත් බලන්න නාට්‍යයේ ප්‍රදීප් කොටුගොඩ චරිතය නිරූපණය කළ යසිදු බිම්සරද පශ්චාත්තාපය නාට්‍යයේ ඕපාත චරිතය නිරූපනය කළ ඩී.ඒ. තරිඳු මධුශංකද දිනා ගත්තේය.

හොඳම රංග වින්‍යාසය (දිගු නාට්‍ය - සිංහල) සඳහා සම්මානය අතරමැදියා නාට්‍යයේ එච්.බී. ඉමිත ජයකොඩිටද දමිළ අංශයෙන් 'මන්කුලිතු' නාට්‍යයේ ඒ. සත්‍යානන්දම්ට සහ වී. විෂ්නුනාදන්ටද හොඳම රංග වින්‍යාසය සම්මානය (කෙටි නාට්‍ය - සිංහල) පොත්ගුල නාට්‍යයේ දුම්න්ද සඳරුවන්ටද දමිළ අංශයෙන් Pennal නාට්‍යයේ විරවගු කතිෂන්ටද හොඳම සංගීත නිර්මාණය (දිගු නාට්‍ය - සිංහල) මගුල් කපුවා නාට්‍යයේ ප්‍රබෝධ බුද්ධිප්‍රියටද දමිළ අංශයෙන් 'මන්කුලිතු' නාට්‍යයේ එස්. අනෝජා රෝහිණීට සහ ආර්. ශ්‍රී ස්කන්ධරාජාටද කෙටි නාට්‍ය (සිංහල) බෝම්බයක් ගැහුවට කමක් නෑ සිංදු කියමු නාට්‍යයේ හේෂාන් කුරුප්පුටද, දමිළ අංශයෙන් Pennal නාට්‍යයේ කේ. සත්‍යශීලන්ටද හිමි විය.

මීට අමතරව හොඳම වේදිකා පරිපාලනය සම්මානය (දිගු නාට්‍ය සිංහල) අතරමැදියා නාට්‍යයේ පී.වී.ඩී. සඳුන් ලක්ෂාන් ධර්මගුණවර්ධනද දමිළ අංශයෙන් 'මන්කුලිතු' නාට්‍යයේ ඒ. අභිෂන් සහ එස්. ෂාරන්ද, කෙටි නාට්‍ය (සිංහල) පොත් ගුල නාට්‍යයේ පී. දිනූෂ ප්‍රියශාන් සහ මධුශංක ගමගේ ද දමිළ අංශයෙන් 'බක්කි' නාට්‍යයේ බී. ප්‍රියන්තිනීද දිනා ගත්තේය. වේදිකා පරිපාලනය කුසලතා සහතික (දිගු නාට්‍ය - සිංහල) මගුල් කපුවා නාට්‍යයේ චරිදු කසුන් අලුවිහාරේ, යසිදු බිම්සර, පැතුම් ප්‍රමෝදිත, මලිෂ මැදගමටද හොඳම අංග රචනය (දිගු නාට්‍ය - සිංහල) ගලේ පිපෙන මල් නාට්‍යයේ පසන් මල්ශාන්ටද දමිළ අංශයෙන් Flightless Butterfly නාට්‍යයේ ටී. කෝකිලා සහ එම්. මනෝවසන්තිටද කෙටි නාට්‍ය (සිංහල) 'ඩාර්ක් කලර්' නාට්‍යයේ එච්. ඒ රන්දික විෂාන්ටද දමිළ අංශයෙන් 'අංගිගරාමි' නාට්‍යයේ එස්. අනෝජා රෝහිණීටද කුසලතා සහතිකය (දිගු නාට්‍ය සිංහල) 'මගුල් කපුවා' නාට්‍යයේ එච්.ඒ. රන්දික විෂාන් සහ නිරන්ස අකලංකටද හිමි වී තිබිණි. හොඳම රංග භූමි අලංකරණය සම්මාන (දිගු නාට්‍ය සිංහල) 'අතරමැදියා' නාට්‍යයේ එච්.කේ. නදීක සුපුන් ද කෙටි නාට්‍යය සිංහල සඳහා පොත් ගුල නාට්‍යයේ කේ.එම් ඩිල්ශාන් රංග සහ ආර්. එම් අනුරුද්ධ රාජපක්ෂද කෙටි නාට්‍ය - දමිළ අංශයෙන් 'අංගිගරාමි' නාට්‍යයේ එම්. පිරපන්ත සහ පී. නිශාන්ත ද හොඳම රංගවස්ත්‍ර නිර්මාණය (දිගු නාට්‍ය සිංහල) මගුල් කපුවා නාට්‍යයේ ඉරේෂා ජානකීද දමිල අංශයෙන් Flightless Butterfly නාට්‍යයේ ටී. විදූෂා සහ කේ. සුරෙන්තිනීද කෙටි නාට්‍ය (සිංහල) ඩාර්ක් කලර් නාට්‍යයේ සහන් අංජන විජේතුංග සහ ඩී.ටී. නිල්මිණී සුරංගිකා චන්ද්‍රසිරිද දමිළ අංශයෙන් Pennal නාට්‍යයේ එන්. තේවදාස්ද, කුසලතා සහතික (කෙටි නාට්‍ය දමිළ) 'පවිචායි මාරමුම් පාඩුම්' නාට්‍යයේ පී. ශ්‍රී ලේඛා සහ ඊ. අනෝජාද දිනා ගත්තේය. හොඳම රංගාලෝකනය සම්මානය දිගු නාට්‍ය - සිංහල අතරමැදියා නාට්‍යයේ ඩබ්.ඒ. දුලංජ විතාන ආරච්චි සහ එම්. සුරේෂ් මධුෂාන් පෙරේරාටද දමිළ අංශයෙන් 'මන්කුලිතු' නාට්‍යයේ වී. විෂ්නුනාදන්ටද, කෙටි නාට්‍යය සිංහල 'පොත් ගුල' නාට්‍යයේ එම්. සුරේෂ් මධුෂාන්ටද දමිළ අංශයෙන් 'අංගිගරාමි' නාට්‍යයේ ශිවරාසා ප්‍රදීප්ටද හිමි විය. බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රාජ්‍ය නාට්‍ය උපදේශක සභාව, ශ්‍රී ලංකා කලා මණ්ඩලය මෙම 48 වැනි අභිමානවත් රාජ්‍ය නාට්‍ය උළෙළේ වැඩ කටයුතු මෙහෙයවීය.

ජායාරූප - තුෂාර ප්‍රනාන්දු

ජීවිතයේ එක් වරක් පිදෙන 'නාට්‍ය කීර්ති' සම්මානය සිව් දෙනකුට

හොඳම නාට්‍ය 'අතරමැදියා'

ඉදිරි වසර දෙකේදී ආයෝජන කලාප 5ක් කඩිනමින් අරඹනවා

නුවන් කොඩිකාර

ඖෂධ, රබර්, තොරතුරු තාක්ෂණය, කෘෂි, විදුත් හා විදුලි නිෂ්පාදනයන්ගෙන් සමන්විත ආයෝජන කලාප 5 ක් ඉදිරි වසර දෙක තුළ කඩිනමින් ආරම්භ කිරීමට රජය සැලසුම් කර ඇතැයි ගුවන් සේවා හා ආයෝජන කලාප සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.වී.චානක මහතා පැවැසීය.

එම කලාප ආරම්භ කිරීමට අවශ්‍ය පාරිසරික හා අනෙකුත් අනුමැතීන් ලබා ගැනීමෙන් පසු යටිතල පහසුකම් සංවර්ධනය කර කර්මාන්ත ශාලා ඉදිකිරීමට ආයෝජකයන්ට අවසර ලබා දෙන බවත්, ඒ අනුව කෙටි කාලයක් තුළ නිෂ්පාදන සිදු කිරීමට හැකිව ලැබෙනු ඇති බවත් හෙතෙම කීවේය.

ගුවන් සේවා හා ආයෝජන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සමඟ ආයතනයේ ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳ එම අමාත්‍යාංශයේ දී පසුගිය දා පැවැති සාකච්ඡාවේ දී ඩී.වී.චානක මහතා එසේ කියා සිටියේය.

කටුනායක,බියගම, සීතාවක, කොග්ගල යන ආයෝජන කලාපවල ඉඩ කඩ ඇතිරි ඇති හෙයින් දැනට ඉදිකිරීම් නතර වී ඇති බිංගිරිය, මිල්ලනිය ඉදිකිරීම් කටයුතු කඩිනම් කරන්නැයි රාජ්‍ය ඇමැතිවරයා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

මෙරටට විදේශ විනිමය ගෙන එමින් ඉහළ රැකියා බිහි කළ හැකි මෙන්ම අපනයන ආදායම ඉහළ නංවන කර්මාන්ත ගෙන්වා ගැනීම කඩිනම් කළ යුතු බව පවසන ඒ මහතා එහිදී පරිසරයට, සංස්කෘතියට හානි නොවන කර්මාන්තවලට කඩිනමින් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවස්ථාව ලබා දෙන බව පැවැසීය.

ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා දකුණු ආසියාවේ අනෙක් රටවල ද විශාල දිරි ගැන්වීම් ලබා දෙන බවත්, ඉන් ජය ගත හැකි වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත් හෙතෙම නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය.

රාජ්‍ය ඇමැති ඩී.වී.චානක මහතා මෙසේද කියා සිටියේය.

රාජ්‍ය ඇමැති ඩී.වී.චානක

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සියලු දෙනා මෙම ආයතනය මෙහෙය වීමේදී මටත් අප රජයටත් සෑම අයුරකින්ම සහාය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා. වසර හතළිහකට පෙර මෙම ආයතනය බිහි කරද්දි එවකට පැවැති ආර්ථික, විරැකියාව සහ ගෝලීය තත්ත්වයන් පදනම් කර ගන්න ඇති. එහෙත් තව දුරටත් එම නිර්ණායකයන් වර්තමානයට ගැළපෙනවාද යන්න අප සොයා බැලිය යුතුයි. මොකද 1978 දී අපේ විරැකියාව සියයට 25 කටත් වැඩියි. එදා බංග්ලාදේශය, වියට්නාමට හා බොහෝ ආසියානු රටවල් ලෝකයට විවෘතව තිබුණේ නැහැ. අද වන විට පරිගණක, ජංගම දුරකථන ආදි විදුත් උපකරණ නිෂ්පාදනයත් සමඟ මිල අධික නිෂ්පාදු ලොවට එක් වී තිබෙනවා. ඒ අනුව අද සියලු තත්ත්වයන් වෙනස් බව අප තේරුම් ගත යුතුයි. මෙහිදී ඇඟලුම්, තොරතුරු තාක්ෂණය, ඉදිකිරීම්, ඖෂධ හා කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීම යන අංශ ගැන පෙන්වා දිය යුතුයි. ඇඟළුම් කේෂ්ත්‍රය අපට ඉතාම හොඳ ආදායම් ලබා දෙන කර්මාන්තයක්. මෙරට මුළු අපනයන ආදායමෙන් සියයට 43ක් වගේ අගයක් ලබා දෙන්නේ ඇඟළුම් කර්මාන්තයෙන්. එය වාර්ෂිකව ඇමරිකානු ඩොලර් බිලියන 5 ඉක්ම වූ ආදායමක්. එහෙත් වසර 50කට වැඩි කාලයක් මෙම කේෂ්ත්‍රයේ ඉදළත් ඒ සඳහා අවශ්‍ය අමුදුව්‍ය නිපදවීමට අපට නොහැකි වී තිබෙනවා. කුවේණිගේ කාලයේ සිට කපු කටින අප මෙතරම් දැවැන්ත කර්මාන්තයක් සඳහා තවමත් රෙදි හා අමු දුව්‍ය ආනයනය කරනවා.

එරාවුර් ඇඟලුම් ගම්මානය ස්ථාපිත කර ගැනීමට හැකි වුවහොත් ඩොලර් මිලියන 600 -700 ඉතිරි කර ගැනීමට හැකියාව ලැබෙනවා. එය මෙරට ආර්ථිකයට විශාල ශක්තියක්. ඒ මඟින් අවට ජනජීවිතය ද නඟාසිටුවීමට හැකියි.

එසේම මෙරට ශ්‍රම බළකාය ගත් විට, දකුණු ආසියාවේ අනෙක් ශ්‍රමිකයන්ට වඩා ඉහළ මට්ටමක අප සිටිනවා. ඒ නිසා ඔවුන් ඉහළ වැටුප් අපේක්ෂා කරනවා. ගුණාත්මක බවින් ඉහළ අගය වැඩි නිෂ්පාදන කරා යායුතුයි කියා මා යෝජනා කරනවා .

ජනාධිපතිවරයා මෙරට නිෂ්පාදන කේෂ්ත්‍රයට අලුතින්ම හඳුන්වා දෙන නිෂ්පාදනය තමයි ඖෂධ නිෂ්පාදනය. ඒ සඳහා විශ්වවිද්‍යාල මහාචාර්වරයකු යටතේ රාජ්‍ය අමාත්‍යාංශයක් පවා ඇති කර තිබෙනවා. එය විශාල ලෙස බලාපොරොත්තු තැබිය හැකි ක්ෂේත්‍රයක්. ඖෂධ ආනයනයෙන් ඩොලර් මිලියන ගණනක් වාර්ෂිකව මෙරටට අහිමි කරනවා. මේ නිසා ඉන් අඩක්වත් ඉතුරු කර ගැනීමට අපේක්ෂා කරනවා. එසේම මෙම ක්ෂේත්‍රයට අවශ්‍ය ව්‍යාත්තිකයන් බිහි කිරීම අපට කළ හැකියි. එය විශාල ආයෝජනයක්. ලොව පුරා ඖෂධ නිෂ්පාදන කේෂ්ත්‍රයේ ව්‍යාත්තිකයන්ට විශාල ඉල්ලුමක් පවතිනවා. අපේ තරුණ පරපුර එම කේෂ්ත්‍රයට අවතීරණවීම අවශ්‍යයි. අනෙක් කරුණ නම් ජාතියක් ලෙස නිරෝගී වී සිටීමට අවශ්‍ය ගුණාත්මක බවින් ඉහළ ඖෂධ මෙරට දී ලබා ගැනීමට හැකිවීමයි. ඖෂධ නිෂ්පාදන ආයෝජන කලාප ඉදිකිරීම අපගේ වැඩපිළිවළේ මුල් තැනට පැමිණිය යුත්තේ ඒ නිසායි.

තොරතුරු තාක්ෂණ අංශය දෙස අවධානය යොමු කළහොත් ඉතා ඉක්මනින් අපේක්ෂිත ඉලක්ක කරා යා හැකි අංශයක්. මේ කේෂ්ත්‍රය ලොව පුරා විශාල ඉල්ලුමක් පවතින කේෂ්ත්‍රයක්. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් ඊට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කළ යුතුයි.

අපේ මෘදුකාංග කර්මාන්තය ඉතාමත් ඉහළ තැනක පවතිනවා. ශ්‍රී ලාංකික සමාගමක් වන වර්වුසා සමාගම ඩොලර් බිලියන 2කට විකුණුනා. අප වගේ පුංචි රටකට එය විශාල අගයක්. පරිගණක මෘදුකාංග සඳහා ශ්‍රී ලංකාව හොඳම මධ්‍යස්ථානයක් බවට පත් කළ හැකියි. විදේශ රටවලින් මෘදුකාංග ගෙන්වීම වෙනුවට මෙරටින් මෘදුකාංග නිපදවීමට අපේ ඉංජිනේරුවන් හා නිර්මාණකරුවන්ට අවශ්‍ය පහසුකම් සැකසිය යුතුයි.

ඒ වගේ අපේ ක්‍රිස්ටල් සිලිකන් වලින් පොලිකාබනේට් නිෂ්පාදනයට දිරිමත් කළ යුතුයි. ඒ තුළින් සූර්ය පැනල හා ප්‍රොසෙසර් ආදි නිෂ්පාදනය කළ හැකියි. මෙහි නිෂ්පාදන ව්‍යසම කළමනාකරණය කරමින් තරගකාරීව වෙළෙඳපොළට අවතීර්ණ වීමට ආයෝජකටයන් පෙළඹවිය යුතුයි.

ඉදිකිරීම් කේෂ්ත්‍රය ගත් කළ විශාල අවධානයට ලක්විය යුතු කේෂ්ත්‍රයක්. මාත් මෙම කේෂ්ත්‍රයේ ව්‍යාත්තිය ඉංජිනේරුවරයෙක් නිසා මේ ගැන වැඩි අවධානයක් යොමු කරනවා.

2020-09-11 හා 2020-09-12 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු තෑග ලාභීන් සංඛ්‍යාව 1,422,302

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු තෑග මුදල 125,005,852.40

www.nlb.lk

රු. 65,061,962.40 සුපිරි තෑග 01 රු. 2,000,000.00 තෑග 04 රු. 1,000,000.00 තෑග 02 රු. 100,000.00 තෑග 52

නීරෝගා ලග්න ජය

දිනුම් වාරය 702
දිනය 2020/09/11
නිල ප්‍රතිඵල

ලග්නය: ධනු
ජයග්‍රාහී අංක: 03 10 27 68

	තෑග රටාව	තෑග මුදල	ජයග්‍රාහකයින් සංඛ්‍යාව
1 වන තෑගය	අංක 4 ම ගැළපේ නම්	රු. 1,000,000/-	1
2 වන තෑගය	අංක 3 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 10,000/-	5
3 වන තෑගය	අංක 3 ක් ගැළපේ නම්	රු. 2,000/-	71
4 වන තෑගය	අංක 2 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 200/-	335
5 වන තෑගය	අංක 2 ක් ගැළපේ නම්	රු. 100/-	3,563
6 වන තෑගය	අංක 1 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 60/-	4,687
7 වන තෑගය	අංක 1 ක් ගැළපේ නම්	රු. 20/-	51,490
8 වන තෑගය	ලග්නය පමණක් ගැළපේ නම්	රු. 20/-	18,974

මෙවර දිනා ඇති මුළු තෑග මුදල
රු. 3,305,800.00

මීළඟ සුපිරි තෑගය
රු. 17,355,320.50

රුපියල් ලක්ෂ 5 ක් හෝ ඊට වැඩි තෑග රජයේ බදු නීති රීතිවලට යටත් වේ.
තෑග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 2324324, 011 4607000
වෙබ් අඩවිය: www.nlb.lk

නිල ප්‍රතිඵල — සුපිරි වාසනා

දිනුම් අදින ලද දිනය: 2020 / 09 / 12
1534 දිනුම් වාරය

සුපිරි අංකය 07
ජයග්‍රාහී අංක 21 40 43 44

1 තෑගය	අංක 04 ම ගැලපේනම්	රු. 500,000.00	01
2 තෑගය	සුපිරි අංකය සමඟ අංක 3 ක් ගැලපේ නම්	රු. 15,000.00	07
3 තෑගය	අංක 03 ක් ගැලපේ නම්	රු. 1,000.00	116
4 තෑගය	සුපිරි අංකය සමඟ අංක 2 ක් ගැලපේ නම්	රු. 200.00	381
5 තෑගය	අංක 02 ක් ගැලපේ නම්	රු. 100.00	4844
6 තෑගය	සුපිරි අංකය සමඟ අංක 1 ක් ගැලපේ නම්	රු. 60.00	4521
7 තෑගය	අංක 01 ක් ගැලපේ නම්	රු. 20.00	62037
8 තෑගය	සුපිරි අංකය පමණක් ගැලපේ නම්	රු. 20.00	15326

මෙවර දිනා ඇති මුළු මුදල
රු. 3,100,120.00

ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 06 ක කාල සීමාවක් පමණි. රුපියල් ලක්ෂ 05 හෝ ඊට වැඩි තෑග රජයේ බදු නීති රීති වලට යටත් වේ. තෑග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.

ලබන දිනුම් වාරයේ සුපිරි තෑගය
රු. 20,921,767.08

ජාතික ලොතරැයි මණ්ඩලය
නැගෙනහිර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ



මිනිසුන් තෘප්තිමත් නොවන්නේ තණ්හාව නිසයි

කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
විශ්‍රාමික මහාචාර්ය
දේවාලේගම මේධානන්ද හිමි

වර්තමානයේ පවතින්නේ අධි තරගකාරී සමාජ ක්‍රමයකි. එහි ජීවත් වන මිනිසුන්ට සැබෑ තෘප්තිමත් ජීවිතය යනු කුමක් ද? යන්න පවා අමතක වී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අධික තණ්හාවෙන් ආත්මාර්ථකාමිත්වය පෙරදැරිව කෙසේ හෝ තමන්ගේ අරමුණු ඉෂ්ට කර ගැනීමට උනන්දු වන මිනිස්සු අවසානයේදී විනාශයට පත් වෙති. මෙබඳු කාරණා හේතුවෙන් තෘප්තිමත්භාවයෙන් තොර වීම සමාජ ගැටලු රාශියක් ඇති වීමට ප්‍රබල සාධකයක් වී තිබේ. පහත දැක්වෙන්නේ බුදු දහම තුළ තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට ඉවහල් වන කාරණා පෙන්වා දී ඇති අන්දම පිළිබඳ කැලණිය විශ්වවිද්‍යාලයේ, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ විශ්‍රාමික මහාචාර්ය, දේවාලේගම මේධානන්ද හිමියන් සමඟ සිදු කළ ධර්ම සාකච්ඡාවකි.

● ස්වාමීන් වහන්ස, බුදුදහමට අනුව තෘප්තිමත් ජීවිතයක් කියලා කියන්නේ කුමක් ද?

ලෝකයා නිතරම අතෘප්තියෙන් පෙළෙනවා. ඔවුන් කිසිම දෙයකින් අවසාන තෘප්තියක් ලබන්නේ නැහැ. ඒක මනුස්ස ස්වභාවය. මිනිස්සු තණ්හාව නිසා තමයි තෘප්තිමත් වෙන්නේ නැත්තේ. තණ්හාවෙන් යුක්තව සංසාරයේ ජීවත් වන කෙලෙස්වලින් පිරුණු මිනිසුන් අවසාන වශයෙන් පුර්ණ තෘප්තියකට පත් වෙන්නේ නැහැ. පුර්ණ තෘප්තිය තිබෙන්නේ නිවනේ විතරයි.

● බුදු රජාණන් වහන්සේ නිවනෙන් මෙපිට තාවකාලික තෘප්තියක් ලබා ගන්න පුළුවන් බව දේශනා කර තිබෙනවා. ඒ ගැන පැහැදිලි කළොත්?

බුදු රජාණන් වහන්සේ අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ හා අනවජ්ජ සුඛ කියලා ගිහියන්ට අදාළ සැප 04ක් දේශනා කරලා තිබෙනවා. අත්ථි සුඛය කියලා කියන්නේ කෙනකුට තමන්ගේ ස්වයං පෝෂිතභාවය ගැන ඇති කර ගත හැකි සතුට. භෝග සුඛය කියන්නේ දැහැමින් ලත් ධනය පරිභෝජනය කිරීමෙන් ලබන සතුට. අණන සුඛය කියලා කියන්නේ කවරකුට හෝ අල්ප වශයෙන් හෝ බොහෝ වශයෙන් ගෙවිය යුතු ණය නැති නිසා ඇති වන සතුට. අනවජ්ජ සුඛය කියන්නේ කයින්, වචනයෙන්, සිතින් පවිකම් නොකිරීම නිසා නිවැරදි දිවිපෙවෙතක් ගත කිරීමෙන් ලබන සතුට. මේ දේවල්වලින් ඈත් වෙලා කටයුතු කරන පුද්ගලයන් කිසිසේත්ම සතුටක් ලබන්නේ නැහැ.

පැවිද්දන් සිවිපසයෙන් තෘප්තිමත් වෙන්න ඕනෑ. පැවිද්දා තමන්ට පිඬු සිඟාවෙන් ලැබෙන ඕනෑම කටුක ආහාරයකින් තෘප්තිමත් වෙන්න ඕනෑ. ඒ සඳහා පැවිද්දාට උසස් මානසික ශික්ෂණයක් සහ දියුණුවක් තියෙන්න ඕනෑ. ගොරෝසු කටුක වස්ත්‍රයකින් කළ සිවුරකින් පවා සතුටු වෙන්න ඕනෑ. ගසක් යට, පැල්පතක, මඩුවක හෝ ඕනෑම කටුක ස්ථානයක ජීවත් වෙන්න පුළුවන් වෙන්න ඕනෑ. ඕනෑම ආකාරයකට සකස් කළ බෙහෙත් වර්ගවලින් සතුටු වෙන්න ඕනෑ. පැවිද්දා මේ දේවල්වලින් සතුටු වෙන්න ඕනෑ. ලැබුණු සිවුරකින්, ලද පිණ්ඩපාතයකින්, ලද කුටියකින්, ලද ගිලන්පසකින්, ලද බෙහෙතකින් සතුටු වෙමින් හංසයන් මෙන් නිදහස් ජීවිතයක් ඇති කර ගන්න කියලා බුදු රජාණන් වහන්සේ තමන්ගේ භික්ෂූ ප්‍රජාව උදෙසා දේශනා කර තිබෙනවා.

● අතෘප්තිය නිසා මිනිසුන්ගේ ජීවිතවලට අහිතකර බලපෑම් ඇති වෙනවා. උදාහරණයක් විදිහට මිනිසුන් තමන් නොදැනීම විනාශ වෙනවා. ඒ නිසා තෘප්තිමත් නොවීම මිනිස් ජීවිතවලට සෘජුවම බලපාන බව පැහැදිලි වෙනවා. ඒ ගැන ඔබ වහන්සේගේ අදහස කුමක් ද?

යමක් ලැබුණට ඒ දෙයින් සෑහීමකට පත්වෙන්නේ නැතුව තව තව දේවල් එකතු කර ගන්න ගිහින් මිනිසුන් එකිනෙකා අතර ගැටුම් ඇති කර ගන්නවා. අතෘප්තිය නිසා මිනිසුන් පස් පව්, දස අකුසල් කරනවා. කොයිතරම් දේවල් ලැබුණත් ඒවා මදියි කියන ආකල්පය මත ඉඳන් මිනිසුන් මානසික මට්ටම දුර්වල කර ගනිමින් වැරදි චර්යාවන්ට යොමු වෙනවා. ඒ නිසා අන්තිමේදී මිනිසුන් නොදැනුවත්වම විනාශයට පත් වෙනවා.

අතෘප්තිය නිසා මව්පියන්, සහෝදර සහෝදරියන්, රජවරුන්, සිටුවරුන් අතර ගැටුම් ඇති වීම, කලකෝලාහල ඇති වීම, එකිනෙකාට පහර දීම, එකිනෙකා ඝාතනය කිරීම ආදී දේවල් සිදු වන බව බුදු රජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා. මිනිස්සු අතෘප්තිය නිසා නොමගට යනවා.

"අසීමිත තණ්හාවෙන් සොයන විට, ඒවා ලැබෙනවා, ලැබෙන විට ඇගයීම් කරනවා, ඇගයීම් කරන විට තව තවත් ඒවාට වහල් වෙනවා. ඒ නිසා අවි ආයුධ දරමින් ඒවා ආරක්ෂා කිරීමට පෙලඹෙනවා, අවසානයේදී ගැටුම් ඇති වෙනවා කියලා" බුදුරදුන් මහා නිධාන සූත්‍රයේ දක්වා තිබෙනවා. අසීමිත ආශා නිසා සමාජයේ ගැටුම් ඇති වෙලා, මානව සම්බන්ධතා බිඳ වැටිලා, වෛරය, ඊර්ෂ්‍යාව, තණ්හාව, ක්‍රෝධය පැතිරිලා මිනිස් ජීවිත පවා විනාශ වෙනවා. ඒ නිසා තෘප්තියෙන් තොරව ජීවත් වීම මිනිස් ජීවිතවලට සෘජුවම බලපෑම් කරනවා. අද කාලේ තෘප්තිමත් ජීවිත ගත කරන්න බැරි වුණාම මිනිස්සු තමන්ගේ ජීවිත නැති කර ගන්නවා. ඒ නිසා සෑම පුද්ගලයෙක්ම තමන්ගේ ජීවිතවල වටිනාකම දැනගෙන ධාර්මිකව තෘප්තිමත් වෙන්න අධිෂ්ඨානය ඇති කර ගන්න අවශ්‍ය වෙනවා.

> **● අසීමිත ආශා නිසා සමාජයේ ගැටුම් ඇති වෙලා, මානව සම්බන්ධතා බිඳ වැටිලා, වෛරය, ඊර්ෂ්‍යාව, තණ්හාව, ක්‍රෝධය පැතිරිලා මිනිස් ජීවිත පවා විනාශ වෙනවා. ඒ නිසා තෘප්තියෙන් තොරව ජීවත් වීම මිනිස් ජීවිතවලට සෘජුවම බලපෑම් කරනවා.**

● ඔබ වහන්සේට හැඟෙන ආකාරයට වර්තමාන සමාජයේ මිනිස්සු තෘප්තිමත් ජීවිතයකට ඇලුම් නොකරන්නේ අධි තරගකාරිත්වය නිසා ද?

ඇත්තටම ඔව්, වර්තමානයේ තිබෙන ආර්ථික ක්‍රමය, දේශපාලන ක්‍රමය, සමාජීය ක්‍රමය, සහ අධ්‍යාපන ක්‍රමය තුළින් මිනිස්සු අතෘප්තියට තල්ලු කරලා තිබෙනවා. අතෘප්තිය නිසා සමාජයේ මානසික දියුණුවත් නැති වෙලා ගිහින්. අද කාලයේ මිනිස්සු පන්සිල් රකින්නේ නෑ. කරණීය මෙන්ත සූත්‍රය හැමදාම සජ්ඣායනා කළත් ඒ දේවල් පිළිපදින්නේ නෑ. පන්සිල් පද පහ කොයිතරම් කිව්වත් ඒ දේවල් පිළිපදින්න කියලා කිසිම තැනකින් අණ කරන්නේ නෑ. සමාජයේ ගැටලු ඇති වෙන්න මේ දේවල් සෘජුවම බලපානවා.

අද කාලේ ඉන්න මිනිස්සු අධි තරගකාරිත්වය කියන දේට ඇබ්බැහිවෙලා. මිනිසුන්ව ඒකෙන් ගලවා ගන්න පවා අමාරුයි. පාසල් අධ්‍යාපනයේ සිටම දරුවන් තරගකාරී අධ්‍යාපන රටාවකට යොමු වෙලා. ඒ නිසා දරුවන් වැඩිහිටියන් වුණාම නිරායාසයෙන්ම තරගකාරී ජීවිතයකට යොමු වෙනවා. අධි තරගකාරීත්වය නිසා මිනිසුන්ට තමන් කවුද කියන එක අමතක වෙලා තියනවා. ඒක සමාජ ප්‍රශ්න ඇති වෙන්න බරපතළ විදිහට බලපාලා තියනවා. අද කාලේ මිනිස්සු "කොයිතරම් මුදල් හම්බ කරත් මදියි, මොන දේ කරලා හරි තමන්ගේ ආසාවන් ඉෂ්ට කර ගන්න ඕන" කියන මතයේ ඉන්නවා. මේ දේවල් හිතට අරගෙන ඉන්න මිනිස්සු තෘප්තිමත් ජීවිතය අමතක කරලා ජීවත් වෙන්න පුරුදු වෙලා ඉන්නවා. ආසාවල් පිටිපස්සේ ගිහින් හෙම්බත් වෙලා ඉන්න මිනිස්සු මනුෂ්‍යත්වය අමතක කරලා ජීවත් වෙනවා. ඒක සමාජය පිරිහෙන්න බලපානවා.

● තෘප්තිමත් ජීවිතයක් ළඟා කර ගැනීම සඳහා ඔබ වහන්සේ සමාජයට දෙන උපදේශය කුමක් ද?

ලද පමණින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි කෙනෙක් වීම, වැඩ අඩු කෙනකු වීම, සිත සැහැල්ලුවෙන් තබා ගැනීම යන දේවල්වලින් තෘප්තිමත් ජීවිතයක් ගත කරන්න පුළුවන් බව බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා. මේ දේවල්වලින් පුද්ගලයින්ගේ ඉන්ද්‍රිය සංවරය ඇති වෙලා ස්වයං හික්මීම තුළින් තෘප්තිමත් ජීවිතයක් ළඟා කර ගැනමට අවශ්‍ය මානසික මට්ටම ඇති වෙනවා. තෘප්තිමත් ජීවිතයක් ළඟා කර ගන්න මුල්ම අඩිතාලම දාන්න ඕන පාසල් අධ්‍යාපනයෙන්. මම අනෙකාට වඩා වැඩියෙන් ලකුණු ගන්නවා කියන දේ අද අධ්‍යාපන ක්‍රමවේදය තුළින් දරුවන්ගේ හිත්වලට දාලා තියනවා. දරුවන්ගේ හිත්වලට දාන්න ඕන, ඔයා තමන්ට හැකි උපරිමයෙන් මහන්සි වෙලා වැඩ කරන්න. එතකොට ඔයාටත් හොඳ මට්ටමකට පත් වෙන්න පුළුවන් කියන එක. ඒ වුණාට අද දරුවන්ගේ මව්පියන් දරුවන්ගේ සිත් අධි තරගකාරීත්වයට යොමු කරන්නන් වෙලා ඉන්නවා. අවසානයේදී තරගකාරී අධ්‍යාපනයෙන් හෙම්බත් වුණු දරුවන් මානසික රෝගීන් බවට පත් වෙනවා. තමන්ගේ විවාහය තුළින් අවංකවම තෘප්තිමත් වෙන්නේ කියෙන් කී දෙනා ද? තෘප්තිමත්ව පවුල් ජීවිත ගත කරන්න බැරි හින්දා ලංකාවේ පවුල් ජීවිත කියක් බිඳ වැටිලා තියනවද? ඇත්තටම මේක සාමාජයේ දැඩි අර්බුදකාරී ප්‍රශ්නයක් වෙලා තියනවා.

දරුවන්ට කුඩා කාලයේ ඉඳන්ම සරල සැහැල්ලු ගති පැවතුම්වලින් ධාර්මිකව ජීවත් වෙන්න පුරුදු කරන්න ඕන. ඒ සඳහා අදාළ පොත් පත් කියවන්න පුරුදු කරන්න ඕන. දරුවන්ව දහම් පාසල් අධ්‍යාපනයට යොමු කරවන්න ඕනෑ. සෑම පුද්ගලයෙක්ම තමන්ට ළඟා කර ගැනීමට හැකි දේවල් පිළිබඳ පැහැදිලි අවබෝධයකින් ඉන්න ඕනෑ. නිකරුණේ හැල්මේ දුවන පුද්ගලයන් නොවෙන්න වග බලා ගන්න ඕන. තමන්ට ලැබී තිබෙන මිල මුදල්, වත්කම්, නැති නාස්ති නොකරගෙන, ඒ දේවල් නිසි ලෙස කළමනාකරගෙන තමන්ගේ බලාපොරොත්තු ධාර්මිකව ඉටු කර ගන්න උනන්දු වෙන්න ඕනෑ. ලද දෙයින් සතුටු වෙලා ජීවත් වෙන්න හුරු වුණොත් මුළු සමාජයටම සතුටින් ජීවත් වෙන්න අවශ්‍ය ආත්ම ශක්තිය ළඟා කර ගන්න පුළුවන්.

මදාරා මුදලිගේ

සදහම් මඟ

සිංහල සාහිත්‍යය හා බෞද්ධ සාහිත්‍යය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සංවිධානය කරන "බෞද්ධ සාහිත්‍ය උළෙළ" හෙට (15) දින ප.ව. 2.30ට එම එම සම්මේලනයේ දී පැවැත්වේ. මෙම ලිපිය ඒ නිමිත්තෙනි.

සාහිත්‍යය යනු භාෂාව අනුසාරයෙන් පුදුම සහගත දේ සිදු කරනු ලබන්නකි. සාහිත්‍ය නිර්මාණවල අන්තර්ගත වන්නේ මානව ජීවිතයයි. මානව ජීවිතයේ විවිධ අවස්ථා, සිදුවීම්, චරිත පදනම් කර ගෙන සාහිත්‍ය නිර්මාණ ගොඩනැඟෙයි. භාෂාව මාධ්‍ය කොට ගනිමින් සම්පාදනය වන ලිඛිත මෙන්ම අලිඛිත සියලු දෑ සාහිත්‍යය යනුවෙන් සඳහන් කළ හැකි වේ. මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එන ජනක විභාජන කතා ආදියේ පටන් ආගමික, දාර්ශනික හා විද්‍යාත්මක ලේඛන ද සාහිත්‍ය ගණයෙහිලා සැලකිය හැකිය. එසේ වුවත් වර්තමානයේ සාහිත්‍ය ලෙස සැලකෙන්නේ කිසියම් චින්දනයක් ආස්වාදයක් රසයක් ලැබිය හැකි නිර්මාණාත්මක කෘති වේ. වර්තමානයේ දී ගද්‍ය, පද්‍ය, නවකතා හා කෙටි කතා යනාදී සියල්ලට ම පොදුවේ සාහිත්‍යය යනුවෙන් සඳහන් කරනු ලබයි. භාෂාව භාවිත කර ගනිමින් අසන්නාගේ සිතෙහි භාවමත්කාරයක් ඇති කරන නිර්මාණ සාහිත්‍යය යනුවෙන් තව දුරටත් විග්‍රහ කළ හැකිය.

මහාචාර්ය විමල් දිසානායක සූරීහු සාහිත්‍යය යනු භාෂාත්මක වික්‍රමයකැයි පවසති. "නිර්මාණය හා විචාරය" යන කෘතියෙහි එතුමන් සාහිත්‍යය පිළිබඳ දක්වා ඇති අදහස වනුයේ, "ශූර අසරුවකු අසුන් මෙල්ල කරමින් විස්මය හා දක්ෂතා විදහා දක්වන්නාක් මෙන් නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයෙන් පුරවා දමමින් බස පාලනය කරයි." යන්නයි.

එතුමන්ගේ මෙම ප්‍රකාශනයෙන් පැහැදිලි වන්නේ තම අරමුණු ඉටු කර ගැනීම සඳහා ලේඛකයා භාෂාව යොදා ගන්නා ආකාරයෙන් ඔහුගේ නිපුණතාව ප්‍රකට වන බවයි. වෙනත් සාමාන්‍ය ලේඛනයකට වඩා සාහිත්‍ය නිර්මාණයක දී භාෂාව භාවිත කරන ආකාරය වෙනස් ය. සාහිත්‍ය නිර්මාණයක දී වාචාර්ථය ඉක්මවා ව්‍යංග්‍යාර්ථ ජනනය කෙරෙන ආකාරයට සාහිත්‍යකරුවා බස හසුරුවයි.

සාහිත්‍ය නිර්මාණයක භාෂාව භාවික ගුණයෙන් යුතු වීම අනිවාර්ය ය. සාහිත්‍යකරුවාගේ වික්‍රමයන් ප්‍රකට වන්නේ බසෙහි හසළත්වය මත බැවින් තේමාවට අදාළ යුගයට, චරිතවලට හා එම චරිත අයත් සමාජයට එම මට්ටමට සරිලන උචිත බස් වහරක් භාවිත කිරීමට සාහිත්‍යකරුවා සමත් විය යුතු ය. එමගින් පැහැදිලි වන්නේ සාහිත්‍යකරුවා සිය නිර්මාණයට පාදක කර ගන්නා අත්දැකීමෙහි විශ්වසනීයභාවය තහවුරු කිරීමට ඔහුගේ භාෂා භාවිතය ඉවහල් වන බවයි.

තමාගේ සිත සසල කළ අත්දැකීමක් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම නිර්මාණකරුවකුගේ අභිලාසයයි. ඔහු තම අත්දැකීම රසිකයාට ඉදිරිපත් කරන්නේ භාෂාව මාධ්‍යය කොටගෙන ය. තමාගේ මනසට දැනුණු ලේඛකයා තම සිත වඩාත් කම්පනයට පත් කළ අත්දැකීම පාඨකයා වෙත ගෙන යෑමට භාවිත කරන මාධ්‍යය භාෂාවයි.

ඉහත කී ලක්ෂණයන්ගෙන් සුසංයුක්ත වූ සිංහල සාහිත්‍යයේ සමාරම්භය සිදු වූයේ කවදා දැයි නිශ්චිත වශයෙන් කිව නොහැකි ය. ක්‍රි.ව පස්වන සියවසේ මෙරටට බුද්ධඝෝෂ හිමියන් පැමිණි අවධියේ දී ද මෙරටෙහි සාහිත්‍යයක් විය. එනම් මිහිඳු හිමියන් ප්‍රමුඛ පිරිස පැමිණෙන විට ගෙනෙන ලද පාලි අටඨ කතාවල සිංහල පරිවර්තනයන් වූ හෙළටුවා සාහිත්‍යයයි. මහා අටඨ කථා, මහා පච්චරි කුරුන්දි යන ග්‍රන්ථ එහි ප්‍රධාන ලෙස සැලකිය හැකිය. ක්‍රි. පූ. පළමුවන සියවසේ දී මාතලේ ආලෝක විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, ලංකාවේ මුලින්ම ඇති වූ සාහිත්‍ය කාර්යය ලෙස සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන්ගෙන් පාලි සාහිත්‍යයට අනර්ඝ දායකත්වයක් ලැබිණි. උන් වහන්සේ සිංහල අටුවා පාලි භාෂාවට පෙරළීමෙන් පාලි සාහිත්‍යයේ පෝෂණය සඳහා විශේෂ සේවාවක් සිදු කළහ. පාලි සාහිත්‍ය පෝෂණය කිරීමෙහිලා අප්‍රමාණ සේවාවක් සිදු කළ අය අතර ධම්මපාල හිමි, බුද්ධදත්ත හිමි සහ උපසේන ආදී හිමිවරු සුවිශේෂ වෙති. මෙවැනි උගත් ගිහි පැවිදි දෙපිරිසගේ අපරිමිත උත්සාහයෙහි ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර යුගයේ දී පාලි සාහිත්‍යයත්, සිංහල බෞද්ධ සාහිත්‍යයත් දියුණු විය. මෙම කාල වකවානුවේ දී බෞද්ධ සාහිත්‍යයෙහි සුවිශේෂ දියුණුවක් දැක ගන්නට හැකි විය. අනුරාධපුර යුගයෙහි රචනා වූ සාහිත්‍ය කෘති අතුරින් වර්තමානය වන විට ඉතිරිව ඇත්තේ ධම්පියා අටුවා ගැටපදය කෘතිය සහ සිඛවලඳ විනිස යන කෘති ද්විත්වය පමණි.

අනුරාධපුර යුගයෙන් පසු මෙරට රාජධානිය පොලොන්නරුව වෙත මාරු විය. පොලොන්නරු යුගයේ දී ද බෞද්ධ සාහිත්‍යයේ සැලකිය යුතු දියුණුවක් සිදු වී ඇති බව දක්නට ලැබේ. පොලොන්නරු යුගයෙහි සිට මහනුවර යුගය දක්වා කාල සීමාවෙහි බෞද්ධ සාහිත්‍යයෙහි සුවිශේෂ ලක්ෂණයක් දක්නට ලැබේ. එනම් එම කාල සීමාවෙහි දී වැඩි වශයෙන් ම බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ රචනා වී ඇත්තේ බෞද්ධ කතා පුවත් පදනම් කරගෙන ය. මෙම යුගයන්හි එලෙස බුද්ධ, ධම්ම හා සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳ රචනා වී ඇති ගද්‍ය කෘති රැසකි. එනම්, බුත්සරණ, අමාවතුර, දම්සරණ, සඟසරණ, කාව්‍යශේඛරය, ඉත්තිලය, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, සඳකිඳුරුඳා කව, පන්සිය පනස් ජාතක පොත, මුවදෙවිදාවත, කවිසිළුමිණ, සසදාවත වේ. මෙම ගද්‍ය ග්‍රන්ථයන් තුළ බෞද්ධ කථා වස්තු හා බෞද්ධ ධර්මය වස්තු විෂය වී තිබීමෙන් අනුරාධපුර යුගයේ සිටම ක්‍රමානුකූලව මහනුවර යුගය දක්වා අඛණ්ඩව බෞද්ධ සාහිත්‍ය දියුණු වී පැවතෙමින් තිබී ඇති බැවින් මනාව පැහැදිලි වේ.

කෝට්ටේ යුගයෙහි හා මහනුවර යුගයේ මුල් කාල වකවානුවල රචනා වූ ප්‍රශස්ති කෘති හා ගම්පොළ හා කෝට්ටේ යුගවල දී රචනා වී දියුණුවට පත් වූ සන්දේශ කෘති කිහිපයක් හැරුණු කොට සිංහල සාහිත්‍යයට අයත් සෑම ග්‍රන්ථයක් ම බෞද්ධ ධර්මයෙන් පෝෂණය වී ඇත.

අතීතයේ සිට වර්තමානය දක්වාම බෞද්ධ සාහිත්‍යයෙහි උන්නතිය උදෙසා ඇප කැප වූවෝ රැසක් වෙති. හෙළ සිරිතට විරිතට සේ ම හෙළ සාහිත්‍යයට ද බෞද්ධ ආභාසය නිතැතින් ම සුමටව භාවිත කරලීම දැයේ අනන්‍යතාවට සිදු කරනු ලබන මෙහෙවරකි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ කටයුතු රැසක් ඉටු කළ සහ ඉටුකරමින් සිටින ආයතන රාශියක් වේ. එම ආයතනයන් අතරින් සියවසක් පුරාවට ශ්‍රී ලාංකේය බෞද්ධ උරුමය සුරක්ෂා කිරීමේ උදාරතර අරමුණින් යුක්තව නිරන්තරයෙන් සාධු සිතින් කටයුතු කරනු ලැබූ ආයතනය ලෙස බෞද්ධ මහා සම්මේලනය හැඳින්විය හැකිය.

බුදු දහමත්, සඟරුවනත්, බොදු ජනයාත් සුරකින ආයතනයක් වශයෙන් ඔවුන් විසින් සිදුකරනු ලබන සේවය ප්‍රශංසනීය ය. සෑම වර්ෂයක දී මෙන් ම මෙවර ද සාහිත්‍ය මාසය වෙනුවන් බෞද්ධ මහා සම්මේලනයෙහි වැඩසටහන් රාශියක් නිර්මාණය කර ඇති බව අප කළ විමසීමක දී දැන ගන්නට ලැබුණි. අපේක්ෂා කරන්නේ බෞද්ධාගම සුරක්ෂිත කිරීමට මෙවැනි ආයතනවලට නිතැතින් ම ශක්තිය ධෛර්ය ලැබිය යුතු ය.

ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ

රටට සෙත් පතා පෙරහරක්...

කොරෝනා වසංගතය දුරු වී රටට සෞභාග්‍යවත් කාලයක් ප්‍රාර්ථනා කරමින් අටවිසි බුදුරජාණන් වහන්සේලාගේ ප්‍රතිමා රැගත් පෙරහරක් හලාවත නගරයේ විථි සංචාරය කෙරුණි. හලාවත මයික්කුලම පරමධම්ම පිරිවෙන් විහාරස්ථානය පෙරහර සංවිධානය කරන ලදී. විහාරාධිපති රාගල ඝාසනසිරි තිස්ස ස්වාමීන් වහන්සේ ද පෙරහරේ ගමන් කළහ.

ඡායාරූප
ආරච්චිකට්ටුව සමූහ
අතුකෝරාල යූ. ගුණපාල

බෞද්ධයන් නොසිතන පැත්තක්

උදාස් පන්සියකටත් වඩා එහා ඉතිහාසයක පටන් පැවතගෙන එන පැවිදි පක්ෂය උදෙසා ගරු බුහුමන් දැක්වීම ශාසනයේ ප්‍රාණ වායුවයි. සජීවී බවක් ඇත්තේ සංඝ රත්නය තුළයි. බුදු රජාණන් වහන්සේ අද ඊවමානව නොමැත. ධර්ම රත්නයේ ගුණ සුවඳ ඉස්මතු කොට ලෝක සත්ත්වයාට පෙන්වන්නේ ද සංඝරත්නයයි. වෙහෙර-විහාර, බෝධි, පිළිම, ස්ථූප කුමන ආකාරයෙන් පැවතුණ ද ඒවා සුරක්ෂිතව හා ඉදිරියට ආරක්ෂා කරමින් ගෙන යන්නේ භික්ෂූන් වහන්සේලායි.

බුදු රජාණන් වහන්සේ ආරම්භ කළ බුද්ධ ශාසනයේ පළමු ශ්‍රාවකයා වන්නේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේයි. ඉන් පසු උපාලි, දාසක, සෝනක, සිග්ගව, මොග්ගලීපුත්තතිස්ස, මහින්ද, මහා අරිට්ඨ, කුඩා අරිට්ඨ ආදී ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් අවිච්ඡින්නව නොකැඩී නොබිඳී පැවත ගෙන ආ සංඝ සංස්ථාවක් අද වන තුරුම පවතී. හරියට දම් වැලක පුරුක් සේ මුල මැද අග කිසිදු පළුදු වීමක් නොමැතිව අතීත වර්තමාන, අනාගත තුන් කාලයටම සාපේක්ෂව සංඝ සමූහයකින් හෙබි බුද්ධ ශාසනය තුළ පහළ වූ රහතන් වහන්සේලාගේ ගණන අසීමිතය. අනාගාමී වූවන්ගේ ගණන අසීමිතය. සකෘදාගාමී වූවන්ගේ ගණන අසීමිතය. සෝවාන් වූවන්ගේ ගණන අසීමිතය. සමස්ථ මහා සංඝ රත්නයේම ගුණ සැකවින් දක්වා ඇත්තේ මෙලෙසිනි.

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා
එස භගවතෝ සාවක සංඝෝ ආහුණෙයියෝ
පාහුණෙයියෝ දක්ඛිණෙයියෝ
අඤ්ජලිකරණීයෝ
අනුත්තරං පුඤ්ඤක්ඛේත්තං ලෝකස්සාති

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම මනාව පිළිපන් සේක. සෘජුව පිළිපන් සේක. නිවනට සුදුසුව පිළිපන් සේක. නොයෙක් ගරු බුහුමනට සුදුසුව පිළිපන් සේක. ඒ අෂ්ට ආර්ය පුද්ගල වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආගන්තුකයන් සඳහා පිළියෙළ කරන ලද දන් පිළිගැනීමට සුදුසු වන සේක. පූජා පිණිස හෝ මියගිය ඇත්තන්ට පින් පිණිස දෙන පඬුරු පිළිගැනීමට සුදුසු වන සේක. පූජා පිණිස හෝ මියගිය ඇත්තන්ට පින් පිණිස දෙන පඬුරු පිළිගැනීමට සුදුසු වන සේක. කර්ම ඵල අදහා දෙන ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසු වන සේක. දැත් බැඳ කරන නමස්කාරයට සුදුසු වන සේක. පින් කරනු කැමැත්තෙන් ම උතුම් වූ පින් කෙතක් හා සමාන වන සේක.

මා කතා කිරීමට බලාපොරොත්තු වන්නේ දෛනික ජීවිතයේ දී භික්ෂූන් වහන්සේලා අත්විඳින ගැටලුවක් පිළිබඳවයි. බෞද්ධ ආකල්ප වර්තමානය තුළ තදින්ම ඉස්මතු විය යුතු අවස්ථාවක් පිළිබඳවයි. එය ධර්මමය ප්‍රශ්නයකටත් වඩා එදිනෙදා ජීවිතයේ දී 'පූජාව පූජනීයානං' යන බුදු වදනට අනුව පිදිය යුත්තන් පිදීම පිළිබඳ මතු වී ඇති ප්‍රායෝගික ප්‍රශ්නයක් යැයි කීවොත් ඉතා නිවැරදිය.

පොදුජන සේවයක් වශයෙන් පවතින මගී ප්‍රවාහන සේවය ලංගම හා පෞද්ගලික වශයෙන් දෙඅංශයක් පැවැතුණ ද, ඒ දෙඅංශයම පොදු ජන සේවය සඳහා යොදා ඇත. එහි දී සමස්ථ රට වැසියාටම සාධාරණත්වයක් සම සේ ඉටුවිය යුතුය. සමාජය ගිහි පැවිදි වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. බස් රථවල බහුතරයක් ගිහි ජනතාව ගමන් කරන අතර ඊට සාපේක්ෂව පැවිදි පක්ෂය ද වැඩම කරති.

ඕනෑම බස් රථයක ඉදිරිපෙළ පළමු අසුන පැවිදි පක්ෂය සඳහා වෙන් කොට ඇත්තේ ගිහි පැවිදි දෙපක්ෂයටම යහපත උදෙසාත් විශේෂයෙන් සංඝරත්නය තුනුරුවන්ට අයත් එක් රත්නයක් වන බැවිනුත් ඔවුන්ට විශේෂ ගෞරවයක් දැක්වීම පිණිසත්ය.

නමුත් අප රටේ අද සිදුවන දෙයක් නම් මුළු බසයටම වෙන්කොට ඇති එම ආසනයේ හිඳ ගැනීමට ගිහි පින්වතුන් වෙහෙසවීමත් ස්වාමීන් වහන්සේ නමක් බස් රථයට වැඩම කළ විට එම ආසනය නැවත දීමට අදිමදි කිරීමත්ය. ගැබිනි මාතාවන්, රෝගී අය, ආබාධිත අය, මත්පැන් පානය කළ අය, දරුවන් වඩා ගත් මව්වරුන් පුරුද්දක් ලෙස මෙම ආසනයේ හිඳ ගනී.

ඇතැම් බෞද්ධයින් මහා සංඝරත්නයේ සුළු සුළු අඩු පාඩු දැක සමස්ථ මහා සංඝරත්නය කෙරෙහි මෙන්ම බුද්ධ ශාසනය කෙරෙහිම අමනාපකම් ඇති කර ගෙන ඇත. එය අකුසල ක්‍රියාවකි. නිරන්තරයෙන් බුද්ධියට තැන දී ක්‍රියා කිරීමට සිතන්නේ නම් ඒ සැබෑ බෞද්ධයාගේ ස්වරූපයයි. වැඩිහිටියන් නිසි ලෙස කටයුතු නොකිරීමෙන් වන්නේ අනාගතය බාර ගැනීමට සිටින දූ දරුවන් පවා වැරදි ආදර්ශ ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගැනීමයි. මේ නිසා බෞද්ධයන් බුද්ධිමත්ව ක්‍රියා කිරීමට නිරන්තරයෙන් උත්සාහ ගන්නේ නම් එය ඉතා අගනා ක්‍රියාවකි.

කු/නික/වාරි රතනසෙල
ඓතිහාසික මහ පිරිවෙන්හි
නියෝජ්‍ය පරිවේණාධිපති
ගලගෙදර රතනවංස හිමි

වතු ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට ඇති වගකීම් කිසිවක් මට බරක් නොවේ

රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන්

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර

සමස්ත වතු ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට මේ මොහොතේදී තම දෙවුර මත පැටවී ඇති වගකීම තමන්ට කිසිදු බරක් නොවන බව වතු නිවාස හා සමාජ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මහතා පාර්ලිමේන්තුවේදී පසුගිය දා (11) ප්‍රකාශ කළේය.

වතු ජනතාව වෙනුවෙන් තම පියා හා සීයා විසින් ඉටුකරන ලද කාර්ය භාරය එලෙසින්ම ඉටුකරන බවද රාජ්‍ය ඇමතිවරයා පැවසීය.

රාජ්‍ය ඇමතිවරයා මේ බව සඳහන් කළේ අභාවප්‍රාප්ත ආරුමුගම් තොණ්ඩමන් මහතා පිළිබඳ ශෝක යෝජනා විවාදයට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මහතා- මට මගේ පියා ගැන තිබෙන්නේ අභිමානයක්. මගේ සීයාගේ ගමන් මග නියෝජනය කරමින් අපගේ ජනතාව වෙනුවෙන් සේවය කළේ මගේ පියා. මගේ පියා අද ජීවතුන් අතර නැහැ. මට දුකක් තිබෙනවා මගේ තාත්තා සමඟ දිගු කාලයක් සිටීමට අවස්ථාව නොලැබීම ගැන. කුඩා කාලයේ මට තාත්තා ගැන කුඩා ඊර්ෂ්‍යාවක් තිබුණා. තාත්තාට තිබූ කීර්තිය ගැන. කෙසේ වුවද තාත්තා අපේ ජනතාව වෙනුවෙන් බොහෝ සේවාවක් කළා. තොණ්ඩමන් ක්‍රීඩාංගණය අන්තර්ජාතික ක්‍රීඩාංගණයක් බවට පත්කිරීමට ඔහුට ආශාවක් තිබුණා .ඒ වගේම වතු දරුවන් වෙනුවෙන් පරිගණක දැනුම ලබාදීම වෙනුවෙන් මගේ පියා වැඩපිළිවෙළක් සකස් කළේ තාක්ෂණික විෂයන් ගැන කතා කරන්නටත් කළින්. ඒ වගේම මගේ පියාට දැඩි අවශ්‍යතාවක් තිබුණා වතුකරයේ දූ දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නංවන්නට. ඒ වගේම ඒ ජනතාවගේ නිවාස අවශ්‍යතාව සපුරාලීම මෙන්ම ඒ මිනිසුන්ගේ වැටුප් වැඩිකිරීම ආදිය එතුමාගේ සිහින බවට පත්ව තිබුණා. ඒ පිළිබඳව මියයන දිනයේදීත් සාකච්ඡා කළා. ඒ වගේම නුවරඑළිය වෙනුවෙන් විශ්ව විද්‍යාලයක් ලබාගැනීමත් එතුමාගේ තිබූ සිහිනයක්. මියයාමට දින කිහිපයකට කලින් පියා මට, සෙන්දිල් තොණ්ඩමන් මහතා ඇතුළු තවත් කිහිප දෙනකුට දුරකතන ඇමතුම් දී තිබුණා. එතුමාගේ උපන්දිනය යෙදෙන බැවින් එදිනට කොළඹට පැමිණෙන ලෙස. නමුත් එතුමා උපන්දිනය දිනට පෙර දින මියගියා. වතු ජනතාව වෙනුවෙන් මාගේ දෙවුර මත විශාල වගකීමක් පැවරී තිබෙනවා. මගේ පියා, සීයා එම ජනතාව වෙනුවෙන් ඉටු කළ වගකීම මම ඉටුකරනවා. ඒ වගකීම මට බරක් නෙවෙයි. මගේ දෙවුර මත පැවරී ඇති ඒ වගකීම මට කිසිදු බරක් නෙවෙයි.

පත් කළ මන්ත්‍රී ඛයනා ගමගේ මහත්මිය (ස ජ බ)

වතුකරයේ ජනතාව කියන්නේ බොහෝ දුක්ගැහැට විඳින පිරිසක්. තොණ්ඩමන් මැතිතුමා හැම වෙලාවෙම එතුමාගේ ජනතාව වෙනුවෙන් හඬ නැඟුවා. විශ්නේශ්වරන් මන්ත්‍රීවරයා හැම වෙලාවෙම ජාතිවාදය ගැන කතා කරනවා. නමුත් මම ඔබතුමාට කියනවා, ඔබතුමා තොණ්ඩමන් මහතාගේ ජීවිතය කියන පොතෙන් පිටුවක් අරන් කියවන්න.

අධිකරණ ඇමැති අලි සබ්රි මහතා -තොණ්ඩමන් මහතා පරිපූර්ණ නායකයෙක්. එතුමාට හොඳ ගතිගුණ තිබුණා. පසුගිය හැන්සාඩ්වල තිබෙනවා එතුමන් කළ කතාවන්. එහිදි එතුමා කියලා තිබුණා ඔහු ආදර්ශයට ගන්නේ මහත්මා ගාන්ධි මැතිතුමාය කියලා. ඒ කියන්නේ අහිංසාවාදී ගති ලක්ෂණ තිබුණ නායකයෙක් තමයි තොණ්ඩමන් මහතා. අපි වැඩ කරගෙන යද්දි එවැනි නායකයන්ගෙන් ඉගෙන ගන්න බොහෝ දේ තිබෙනවා. 2015 දී ආණ්ඩුව පැරදුනම අනිත් පැත්තට පැන්නේ නැහැ. ඉතා ඉවසිලිවන්තව ඉදිරිය දිහා බලාගෙන තමන්ගේ ජනතාව වෙනුවෙන් පෙනී සිටියා.

කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා (ශ්‍රී.ල.පො.පෙ)- 2015 සිට පසුගිය ආණ්ඩු සමයේ තොණ්ඩමන් මහතාගේ කාර්යභාරය ගැන ගෞරවයෙන් සිහිපත් කරනවා. තොණ්ඩමන් ඇමැතිවරයා යෝජනා කළේ බුදුපිළිම ඉවත් කරන්න නොවෙයි. බොහෝ ප්‍රදේශවලට විශ්විද්‍යාල, අධ්‍යාපන පීඨ ලබා දෙන්නයි. එතුමා සෑම විටම උත්සාහ කළේ සියලුම ජාතීන්ගේ සාම්ප්‍රදායන් එකට එකතු කරගෙන ඉදිරියට යන්නයි.

පත් කළ මන්ත්‍රී ඉම්තියාස් බාකීර් මාකාර් මහතා (ස ජ බ)- අපේ රටේ ජීවනාලිය වන වතු ජනතාවගේ අයිතීන් වෙනුවෙන් තොණ්ඩමන් පවුල කැපවී සිටියා. ආරුමුගම් තොණ්ඩමන් මහතා මෙන්ම ජ්‍යෙෂ්ඨ තොණ්ඩමන් මහතාත් ඒ ආකාරයටම වතු ජනතාව වෙනුවෙන් පෙනී සිටියා. වැවිලි ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපන අයිතියි වෙනුවෙන්ද තොණ්ඩමන් පවුල කැපවුණා. අද පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ තොණ්ඩමන් තුන්වන පරම්පරාව. ඒ නිසා සීයාගේ, පියාගේ අඩිපාරේ යමින් අහිංසක වතුජනතාව වෙනුවෙන් කටයුතු කරන ලෙස මම ජීවන් කොණ්ඩමන් මහතාගෙන් ඉල්ලා සිටිනවා.

පත් කළ මන්ත්‍රී තිස්ස විතාරණ මහතා (ශ්‍රීලපොපෙ)

බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ වහලුන් ලෙස කාලයක් පුරා වතු ජනතාව යොදවාගෙන සිටියා. වතු ජනතාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් තොණ්ඩමන් පවුල විසින් ඉටු කර තිබෙනවා. ඒ වගේම ඒ වගකීම, වතු ජනතාව වෙනුවෙන් හඬ නැගීමේ වගකීම ජීවන් තොණ්ඩමන් මහතා වෙත පැවරී තිබෙනවා. එම වගකීම නිවැරදිව ඉටු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතා- තොණ්ඩමන් ඇමැතිතුමාගේ දේශපාලන භූමිකාව තීරණාත්මක වූවක්. එතුමා සෑම මොහොතකම වගකීමෙන් කටයුතු කළා. පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම වෙනුවෙන් එතුමා කටයුතු කළා. තිස් අවුරුදු යුද්ධය වකවානුවේදීත් එතුමා බොහොම වගකීමෙන් කටයුතු කළා. ඒ වගේම ජාතිවාදී ගිනිදැල් කන්ද උඩරට වතුකරයටත් ඇතුල් වුණා නම් අද තත්ත්වය මීට වඩා වෙනස් වන්නට තිබුණා. ඒ නිසා එතුමා ඇගයීමට ලක්කළ යුතු නායකයෙක්. එතුමා කිසිම වෙලාවක ජාතිවාදි ගිනිදැල් වැපිරුවෙ නැහැ.

පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණියේය.

මොනරාගල දිස්ත්‍රික් මන්ත්‍රී ගයාෂාන් නවනන්ද මහතා(ශ්‍රීලපොපෙ)- ආරුමුගම් තොණ්ඩමන් මහතා කියන්නේ තමන්ගේ ආදරණීය ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් ඉටුකළ නායකයෙක්. ඒ වගේම එතුමා සෑම වෙලාවෙම නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටීමට පියවර ගත්තා. එමෙන්ම ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ භූමිකාව මෙහෙයවීමේ වගකීම අද දරන්නේ ජීවන් තොණ්ඩමන් මහතායි.

දිගාමඩුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ඒ.එල්.එම් අතාවුල්ලා මහතා (ජාතික කොංග්‍රසය)- තොණ්ඩමන් මහතා යනු අපේ මිතුරෙක්. සුළුතර ජනතාවගේ නායකයෙක්. කඳුකරයේ ජනතාවගේ නිවාස ගැටළුව විසඳීම වෙනුවෙන් එතුමා විශාල වෙහෙසක් දැරුවා.

වතු ජනතාව වෙනුවෙන් තොණ්ඩමන් පවුලම කැප වුණා

මන්ත්‍රී
ඉම්තියාස් බාකීර් මාකාර්

වෙලාවක මම බැලුවේ තමන්ගේ ජනතාව වෙනුවෙන් කවර හෝ සහනයක් ලබා දීමටයි.

රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රී වරුණ ලියනගේ මහතා -

රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව 72000 කට ආසන්න පිරිසක් සිටිනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක් නොව මධ්‍යම පළාත, රත්නපුර වැනි දිස්ත්‍රික්කවල සිටින වතු ජනතාව වෙනුවෙන් විශාල වගකීමක් රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන් මහතා වෙත පැවරී තිබෙනවා.

රාජ්‍ය ඇමති සුසිල් ප්‍රේමජයන්ත මහතා- ලංකා කම්කරු කොංග්‍රසයේ නායකයා ලෙස ආරුමුගම් තොණ්ඩමන් මහතා සෑම මොහොතකම එක්සත් ජනතා නිදහස් සන්ධානයට සහාය ලබාදුන්නා. එතුමා කිසිම අවස්ථාවක තමන්ගේ ස්ථාවරය

ජනතාව අතර නායකයෙකු වූ මිතුරන් අතර මිතුරකු වූ ආදර්ශවත් දේශපාලකයෙක්

මන්ත්‍රී
ඩිලාන් පෙරේරා

වෙනස් කළේ නැහැ. එතුමා තමන්ගේ ජනතාව වෙනුවෙන් සිදු කළ සේවය අති විශාලයි. ඒ වගේම තොණ්ඩමන් මහතාට තම පියාගේ ආභාෂය නිවැරදිව ලැබී තිබෙනවා. ඒ නිසා ජීවන් තොණ්ඩමන් මහතාට විශාල වගකීමක් තිබෙනවා. තම සීයා, තම පියා වතු ජනතාව, වෙනුවෙන් ඉටුකළ සේවාව අඛණ්ඩව කරගෙන යාමේ වගකීම පැවරෙනවා.

වී හා ධාන්‍ය කාබනික ආහාර එළවළු පලතුරු මිරිස් ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන රාජ්‍ය ඇමති ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා - ආරුමුගම් තොණ්ඩමන් මහතා මගේ පියාගේ සමකාලීනයෙක්. මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ හිතවතෙක්. ජාතික සමඟිය වෙනුවෙන් කැප වී සිටි තොණ්ඩමන් මහතා වතු ජනතාවගේ අයිතින් වෙනුවෙන් සෑම මොහොතකම කටයුතු කළා.

වෙළෙඳ ඇමති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා- එකම කැබිනට් මණ්ඩලයේ සිටි සගයෙක් ලෙස මම තොණ්ඩමන් මහතා වෙනුවෙන් මගේ ශෝකය ජීවන් තොණ්ඩමන් මහතාට පිරිනමනවා. තොණ්ඩමන් මහතා කිසිම වෙලාවක ප්‍රචණ්ඩ දේශපාලනය අනුමත කළේ නැහැ. ඔහුව විවිධ දේ වෙනුවෙන් පෙලඹවීමට ඇතැමුන් උත්සාහ කළා. නමුත් ඔහු බුද්ධිමත් ලෙස කටයුතු කළා. ඒ වගේම උතුරේ වගේම කඳුකරයේ ජනතාවත් ආයුධ අතට ගත්ත නම් වෙනදේ හිතා ගන්නටත් අමාරුයි. ඒ නිසා ඔහු මේ රට වෙනුවෙන් ඉටුකළ සේවය අති විශාලයි. ඒ වගේම තොණ්ඩමන් මහතා ඉන්දියාව සමඟ සමීප සම්බන්ධතාවක් පැවැත්වුවා.

පරිසර ඇමති මහින්ද අමරවීර මහතා- තොණ්ඩමන් මහතා අප සමඟ සමීපව ඇසුරු කළ වතු ජනතාව වෙනුවෙන් සෑම මොහොතකම පෙනී සිටි නායකයෙක්. එතුමා සමඟ අපි දේශපාලන වැඩවලට සම්බන්ධ වුණා. වතුකරයට අවශ්‍යම නායකත්වයක් තමයි තොණ්ඩමන් මහතා කියන්නේ. එතුමා මියයන මොහොතේත් කතා කළේ වතු ජනතාවගේ වැටුප් වැඩිකර ගැනීම වෙනුවෙන්.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය- තොණ්ඩමන් මහතා කියන්නේ ප්‍රායෝගික දේශපාලන නායකයෙක්. කුඩා කල සිටම තම සීයාගේ ආභාසය ලැබූ තොණ්ඩමන් මහතා සීයාගේ අඩිපාරේ යමින් වතු ජනතාව වෙනුවෙන් තම සේවය ඉටු කළා. එතුමාගේ අභාවය වතු ජනතාවට වගේම එතුමාගේ බිරියට, දරුවන්ටත් විශාල පාඩුවක්.

අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණියේය.

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විරසුමන වීරසිංහ මහතා (ශ්‍රීලපොපෙ)- තොණ්ඩමන් පරම්පරාව දිගුකාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා පිළිබඳ බොහෝ දේ කිය වුණා.

ඉන්දියානු සම්භවයක් සහිත ජනතාවගේ පුරවැසිභාවය හා තොණ්ඩමන් පරම්පරාව අතර විශාල බැඳීමක් තිබෙනවා. ඒ ජනතාවගේ පුරවැසි භාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් හඬ නැගුවේ තොණ්ඩමන් පරම්පරාවයි. ආරුමුගම් තොණ්ඩමන් මහතා කියන්නේ නිහතමානී මිනිසෙක්. වතුකරය තුළ කවර හෝ ප්‍රතිසංස්කරණයක්, වෙනසක් නිර්මාණය වුනා නම් ඒ වෙනසට තොණ්ඩමන් පරම්පරාව දායක වී තිබෙනවා.

බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා (ශ්‍රීලපොපෙ) - වතුකරයේ ජනතාව වෙනුවෙන් තොණ්ඩමන් මහතා පෙනී සිටියා වගේම එතුමා සිංහල ජනතාව වෙනුවෙන්ද පෙනී සිටියා. එතුමාගේ මිත්‍රයින් අතර සිංහල මිත්‍රයන් පිරිසක් සිටියා. එතුමා ජනතාව අතර නායකයෙක් වුනා වගේම එතුමා මිතුරන් අතර මිතුරෙක් වුණා. ඔහු ක්‍රිකට් තරඟ නැරඹීමට විශාල ආශාවක් දැක්වූවා. ඔහු තරඟ නරඹන්නට යන්නේ සිංහල මිතුරන් සමඟ. උතුරේ තරුණයින් ආයුධ ගත්තා වගේ වතුකරයේ තරුණයන්ද ආයුධ ගත්තා නම් තත්ත්වය වෙනස් වෙන්නට තිබුණා. එතුමා වතුකරයේ තරුණයින් එයින් මුදා ගත්තා. වතුකරයේ ජනතාවගේ පුරවැසි භාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් එතුමා විශාල වෙහෙසක් දැරුවා.

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චින්තක මායාදුන්න මහතා (ශ්‍රීලපොපෙ)- ජාතිවාදී අදහස් වලින් තොරව කටයුතු කළ නායකයෙක් ලෙස තොණ්ඩමන් මහතා හඳුන්වන්නට පුළුවන්. ඒ වගේම එතුමා විවිධ කුමන්ත්‍රණවලට හසු වූයේ නැහැ.

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතා - මාතලේ දිස්ත්‍රික්කයේ වතු ජනතාව ඇතුළු සමස්ත ජනතාව වෙනුවෙන් හා තොණ්ඩමන් මහතා වෙනුවෙන් මාගේ ශෝකය පිරිනමනවා. වතු ජනතාවට අලුත් ජීවිතයක් ලබාදීමට තොණ්ඩමන් මහතා විශාල වෙහෙසක් දැරුවා. මාතලේ වතු 22 ක ජනතාවට අවශ්‍ය පහසුකම් පවා ලබාදීමට තොණ්ඩමන් මහතා මහන්සි වුණා.

තැපැල් හා ජනමාධ්‍ය රාජ්‍ය ඇමැති එස් වියාලේන්ද්‍රන් මහතා- තොණ්ඩමන් මහතාගේ අභාවය වතු ජනතාවට පමණක් නොව සියලු ජනතාවට බලපානවා. ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ නාමය අමරණීයයි. එතුමාගේ දේශපාලන ගමන් මග දිගුකාලීනයි. ඔහුගේ දේශපාලන ගමන් මග තුළ විවේචන ඇති. නමුත් තොණ්ඩමන් මහතා වතු ප්‍රජාව වෙනුවෙන් විශාල සේවාවක් ඉටු කළා. කඳුරට දේශපාලනයේ පෞරුෂය ලෙස මාධ්‍ය මඟින් පවා එතුමාව හඳුන්වා තිබුණා. කඳුරට ජනතාව වෙනුවෙන් නිර්භයව සටන් කිරීමට හැකි නායකයෙක් අද අහිමි වෙලා තිබෙනවා.

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කරුණා කොඩිතුවක්කු මහතා (ශ්‍රීලපොපෙ)- ආරුමුගම් තොණ්ඩමන් මහතා අපගෙන් සමුගත්තේ අපි කවුරුත් විශ්වාස නොකළ විදිහට. ජාතිවාදී ගිනි දැල් වලින් උතුර ගිනි ගත්තත් වතුකරය ඇවිලීමට එතුමා ඉඩ දුන්නේ නැහැ. වතු ජනතාවගේ මූලික අවශ්‍යතා ටික ලබාදීම වෙනුවෙන් එතුමා විශාල වෙහෙසක් දැරුවා. වතුකරයේ ජනතාවගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමටත් එතුමා වෙහෙසුනා.

(කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මුලසුනට පැමිණියේය)

රාජ්‍ය ඇමැති ජානක වක්කුඹුර මහතා -ආරුමුගම් තොණ්ඩමන් මහතා මම හඳුනාගත්තේ 2010 පාර්ලිමේන්තුවට ආවට පස්සේ. එතුමා මෙරට කම්කරු ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කළා. එතුමා මියයන මොහොත දක්වාම වතු ජනතාව වෙනුවෙන් සේවය කළා. ඒ වගේම එතුමා කිසිදු අවස්ථාවක ජාතිවාදී අදහස් ප්‍රකාශ කළේ නැහැ.

ඉඩම් කළමනාකරණ රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා- තොණ්ඩමන් මහතා වතු යටිතල පහසුකම් ඇමතිවරයා ලෙස විශාල සහයෝගයක් පොළොන්නරුව වෙනුවෙන් ලබා දුන්නා. සංහිඳියාවට, එතුමා හොඳ උදාහරණයක්. එතුමාට සිංහල, දෙමළ මුස්ලිම් සියලු දෙනාම හිටියා.

පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල අතුකෝරළ මහතා (ශ්‍රීලපොපෙ)- ලංකා කම්කරු කොංග්‍රසයේ නායක ආරුමුගම් තොණ්ඩමන් මම ආශ්‍රය කරලා නැහැ, නමුත් එතුමාගේ හැඩය මම දැනගත්තා.

යුද්ධය වතුකරයට යන එක වැළැක්වුණේ තොණ්ඩමන් මහතා වැනි අය නිසායි. එතුමා ඉටුකළ සේවය අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට ජීවන් තොණ්ඩමන් මහතාට හැකි වේවි යැයි හිතනවා.

පත් කළ මන්ත්‍රී සුරේෂ් රාඝවන් මහතා (ශ්‍රීලපොපෙ)

වතු ජනතාව වෙනුවෙන් නායකත්වය ලබාදීම සඳහා හතරවැනි පරම්පරාව ලෙස ජීවන් තොණ්ඩමන් මහතා පත්ව සිටිනවා. ඔබතුමාගේ උර මත විශාල වගකීමක් තිබෙනවා. ඔබ ඔබතුමාගේ පියා, සීයා වෙනුවෙන් ඒ වගකීම ඉටු කළ යුතුමයි.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා -දීර්ඝ කතාවක් සකස් කරගෙන සිටියේ. නමුත් කාලය ප්‍රමාණවත් නැති නිසා මම රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන් මහතාට කාලය ලබා දෙනවා. ආරුමුගම් තොණ්ඩමන් මහතා වෙනුවෙන් එතුමාගේ බිරිය, පුත් ජීවන්, දියණියන් දෙදෙනාට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස ශෝකය පිරිනමනවා. ඒ වගේම තොණ්ඩමන් මහතා සෑම වෙලාවකම ප්‍රජාතන්ත්‍රවාදී මතවාද දරු මිනිසෙක්. නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටි මිනිසෙක්. රට වෙනුවෙන් පෙනී සිටි මිනිසෙක්. අද තොණ්ඩමන් මහතාට ශෝකය පිරිනැමීමටවත් දෙමළ නායකයන් නැහැ. අඩුම තරමේ දිගම්බරම් මහතාවත් ඇවිත් නැහැ. ත්‍රස්වාදය, යුද්ධය පැවැති වකවානුවේදී වතුකරයේ තරුණයින් ආයුධ අතට ගනිවි කියල සියලු දෙනාටම බයක් තිබුණා. නමුත් තොණ්ඩමන් මහතා එසේ සිදුවන්න ඉඩ දුන්නේ නැහැ.

මාලිහි පරිවර්තන සමයේ මිලිටරි ජුන්ටාව පීඩනයක

චන්න සංජීව මාලි සිට

මාලි හිටපු ජනාධිපති ඊබ්‍රහිම් බවුබකර් කෙයිටා බලයෙන් පහ කරමින් හමුදා කැරැල්ලක් ඇති කළ හමුදා ජුන්ටාවට, බටහිර අප්‍රිකානු ආර්ථික ප්‍රජාව සහ අන්තර්ජාතික ප්‍රජාව දැක්වූ පීඩනය හමුවේ සිය පාලනය ස්ථාවරත්වයට පත් කර ගැනීමට නොහැකි වී ඇත.

සැප්තැම්බර් 15 වැනි දාට පෙර මාලි රාජ්‍යයේ සංක්‍රාන්ති ආණ්ඩුවේ ජනාධිපති ධුරයට සහ අගමැති ධුරයට සිවිල් වැසියන් පත් කිරීමට අවශ්‍ය බව බටහිර අප්‍රිකානු ආර්ථික ප්‍රජාව දැඩි ලෙසම කියා සිටියි. මේ තීරණය ගනු ලැබුවේ නයිජර් රාජ්‍යයේ නියාමෙයිහි සංගමයට අයත් රටවල් 15 හි ප්‍රධානීන් සැප්තැම්බර් 5 වැනි දා රැස් වූ අවස්ථාවේ දී ය. එසේ සිවිල් නායකයන් පත් වන තුරු කලින් පැන වූ සම්බාධක දිගටම පවත්වාගෙන යාමට එහිදී තීරණය කෙරිණි.

අප සහ අනෙකුත් අන්තර්ජාතික පාර්ශ්ව මාලි රාජ්‍යය සම්බන්ධයෙන් ගන්නා පියවරවලට මිලිටරි ජුන්ටාව සහයෝගය දක්වනු ඇතැයි තමන් සිතන්නේ යැයි බටහිර අප්‍රිකානු ආර්ථික ප්‍රජාවේ සභාපති නයිජීරියානු ජනාධිපති ඉසෝමොවි මහමදොව් මෙහිදී ප්‍රකාශ කළේය. මාලි ජනතාවට ද එම විශ්වාසය ම ඇතැයි ද ඔහු වැඩි දුරටත් කීවේය. මාලි ජනතාවගේ සියලු ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කළ යුතුව ඇතැයි ද ඔහු පැවැසීය.

මේ අතර එම්පීෆෝ ලෙස ප්‍රකට සැප්තැම්බර් 4 ජනප්‍රිය බලවේගය මිලිටරි ජුන්ටාවට සහාය පළ කරමින් නිදහස් මාවතට රැස් වී විශාල රැලියක් පැවැත්වීය. සැප්තැම්බර් 4 ජනප්‍රිය බලවේගය ඓතිහාසික එකතුවකි. ඔවුන්ගේ අරමුණ වන්නේ මාලි හමුදාවට සහාය පළ කර හමුදාවට ස්ථාවර පාලනයක් ඇති කර ගැනීමට සහාය ලබා දීමයි. එසේම හමුදාව වටා එක්රැස් වී ත්‍රස්තවාදයට සහ අනාරක්ෂිතභාවයට එරෙහිව කටයුතු කිරීමට ජනතාව පෙළ ගැස්වීමට මේ මහා ජන රැලිය උත්සාහයක් දැරිය.

හමුදාව සහ සිවිල් සමාජය අතර සංවාදය ආරම්භ වූයේ ඉකුත් සෙනසුරාදාය. මේ සාකච්ඡාවල අරමුණ වූයේ අගෝස්තු 18 වැනි දා ජනාධිපති ඊබ්‍රහිම් බවුබකර් කෙයිටාට එරෙහිව ඇති වූ කුමන්ත්‍රණයේ දී සිවිල් ජනතාව හමුදා නායකත්වයට සහාය දෙන්නේ කෙසේ ද යන්නයි. මිලිටරි ජුන්ටාව සහ ජනතාවගේ ගැළවීම සඳහා වූ ජාතික කමිටුව අදියර දෙකකින් සමන්විත ජාතික උපදේශන සැලැස්මක් යෝජනා කරයි. උපදේශනය ලබා දීමේ පළමු සැලැස්ම යෝජනා කළේ සැප්තැම්බර් 5 වැනි දා බමාකෝ කලාපයේ

ආණ්ඩුකාරවරුන් පැවැත්වූ වැඩමුළු පෙළක ස්වරූපයෙනි. දෙවැනි අදියර 2020 සැප්තැම්බර් 10 සහ 12 අතර බමාකෝවල නියෝජිතයන් මෙන්ම මාලිවල සියලුම කලාපවල නියෝජිතයන් සහ මාලි ඩයස්පෝරාවේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පැවැත් වීමට නියමිතව තිබිණි. උපදේශනවල දෙවැනි අදියරේ දී දේශපාලන පක්ෂ නියෝජිතයන්, සිවිල් සමාජය, ත්‍රෘතීය සමිති, සන්නද්ධ හමුදා වෙනුවෙන් සාම ගිවිසුමට අස්සන් කරන්නන් පරිවර්තනීය සමය ගැන පැහැදිලි අවබෝධයෙන් පැමිණිය යුතුය.

මාලි ජාතික සභාවේ ව්‍යවස්ථාපිත පැවැත්ම සහ සම්මුතිය පවත්වාගෙන යාම සඳහා නැවත ජාතික සභාව ස්ථාපිත කරන ලෙස එරට පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෝ

93කට වැඩි පිරිසක් බටහිර අප්‍රිකානු ආර්ථික ප්‍රජාව වෙත සන්දේශයක් යොමු කරමින් කීහ.

බටහිර අප්‍රිකානු ආර්ථික ප්‍රජාවේ සහ අන්තර්ජාතික ප්‍රජාවේ නොනවතින පීඩනය හමුවේ මිලිටරි ජුන්ටාව සහ ජනතාවගේ ගැළවීම සඳහා වූ ජාතික කමිටුව සිවිල් නායකත්වයක් වෙනුවෙන් සුදුසුම යන්ත්‍රණයක් සැදීමට මහන්සියක් ගනියි. එහෙත් මෙහිලා වැදගත්ම කාරණය වන්නේ රටේ උතුරු කොටස පාලනය කරන සීඑම්ඕ වැනි සන්නද්ධ සංවිධාන ද මෙම සාකච්ඡා ක්‍රියාවලියේ කොටසක් බවට පත් කිරීමෙන් ස්ථිරසාර සාමය මාලි දේශයට රැගෙන ඒමයි.

පරිවර්තනය
බුද්ධි කරුණාරත්න

ලංසු කැඳවීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

ලංසු අංකය : 063/T/2020

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිටවීමේ පර්යන්තයේ ගමන්මලු හැසිරවීමේ ප්‍රදේශ තුළ SERVO ASSISTED ගමන්මලු හැසිරවීමේ පද්ධතියක් සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(Design, Supply & Installation of a Servo Assisted Baggage Handling System at Departure Baggage Claiming Area at Bandaranaike International Air Port, Katunayake)

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපති විසින් කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිටවීමේ පර්යන්තයේ ගමන්මලු හැසිරවීමේ ප්‍රදේශය තුළ Servo Assisted ගමන් මලු හැසිරවීමේ පද්ධතියක් සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම (Design, Supply, Installation & Commissioning of a Servo Assisted Baggage Handling System at Departure Baggage Claiming Area at Bandaranaike International Air Port, katunayake) සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපිලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රුපියල් තුන්දහස් පන්සියයක (රු. 3,500.00) මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ. කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශය වෙතින් 2020.09.15 වන දින සිට 2020.11.02 වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී ප.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපිලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපිලේඛන සැපයුම්දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ සීල් තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකවද ගෙනවිත් බාරදිය හැකිය.

ලංසු තැබීම 2020.11.03 වන අඟහරුවාදා දින ප.ව. 2.00 ට අවසන් වන අතර, අදාළ ලංසු, විවෘත කිරීම ඒ සමගම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැකිය.

ලංසු සුරැකුම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත ඉල්ලුම මත ගෙවෙන සේ නිකුත් කරන ලද රුපියල් ලක්ෂ හතරක (රු. 400,000.00) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

ලංසු තැබීමට අදාළ විස්තර පැහැදිලි කිරීම 2020.10.14 වන දින ප.ව. 10.00 ට කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ යාන්ත්‍රික ඉංජිනේරු නඩත්තු ගොඩනැගිල්ලේ, සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශයේ දුරකථන අංක 011-2264103 / 011-2264128 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයේ හෝ අපගේ www.airport.lk යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

සභාපති,

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,

කටුනායක.

කොළඹ මහ නගර සභාවට ආපන ශාලාවක් දෙන්න මන්ත්‍රී සමන් අබේගුණරත්නගෙන් යෝජනාවක්

මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ

කොළඹ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් සඳහා මෙතෙක් අඩුපාඩුවක්ව පැවැති ආපන ශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නාගරික මන්ත්‍රී සමන් අබේගුණරත්න මහතා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවෙන් ඉල්ලා ඇත. මන්ත්‍රීවරයාගේ එම ඉල්ලීම අනුව මෙම ආපන ශාලාව පවත්වාගෙන යාමේ මූලික අරමුණ වන්නේ නාගරික මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට, නිලධාරි මහත්ම/ මහත්මීන්ට සහ සභාවේ සේවය කරන සියලුම සේවක මහත්ම/ මහත්මීන්ට ඉතා සාධාරණ මිලකට උසස් තත්ත්වයේ ආහාරපාන සහනදායී ලෙස ලබා ගැනීමයි. මාසිකව රුපියල් 25,000ක කුලියක් අය කරයි.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2019.10.18 දිනැති හා 2020 අගෝස්තු 10 වැනි දින පැවැති ආයතන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවේ දී (විශේෂ කමිටුව) ඉහත වාර්තාව සම්මත කරන අවස්ථාවේ දී ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ, සුබසාධන සංගමයට එය ලබා දීමටත් මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කිරීමටත් නිර්දේශ කර තිබිණි.

වැඩි බදු ආදායමක් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය ඇති විශේෂ ඒකකයක්

ජයසිරි මුණසිංහ

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ නව පහසුකම් සහිත විශේෂ ඒකකයක් ආරම්භකොට ඇත.

විශාල පරිමාණ බදු ගෙවන්නන්ගෙන් වැඩි ආදායමක් උපයා ගැනීමේ අරමුණින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ නව පහසුකම් සහිත විශේෂ ඒකකයක් එම දෙපාර්තමේන්තුවේ ආරම්භකොට තිබේ.

ඒ අනුව විශාල බදු ගෙවන්නන්ගේ උනන්දුව සහ ඔවුන් පිළිබඳ අධීක්ෂණය වේගවත්කොට කාර්යක්ෂම බදු අය කර ගැනීමේ ක්‍රියා පිළිවෙතක් හඳුන්වාදුන් බව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නදුන් ගුරුගේ මහතා "දිනමිණට" ප්‍රකාශ කළේය.

වාර්ෂිකව මෙරටට මහ පරිමාණ බදු ගෙවන සමාගම් 532ක බදු ලිපි ගොනු පරීක්ෂා කිරීමේ සහ ඒවා පිළිබඳ ක්‍රියා කිරීමේ දී මීට පෙර එක් නිලධාරියකුට ලිපි ගොනු තිහක් හතළිහක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදු වී තිබිණි. එනමුත් නව පහසුකම් සහිත විශේෂ ඒකකය ආරම්භ කිරීමෙන් පසු එක් නිලධාරියකුට ලිපි ගොනු පහක් දහයක් අතර ඉතා කුඩා ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉඩ කඩ ලබා දී තිබේ. මෙලෙස එක් නිලධාරියකුට කටයුතු කිරීමට ඇති බදු ලිපි ගොනු සංඛ්‍යාව අඩු කිරීම නිසා බදු ආදායම වැඩිකර ගැනීමේ මඟ පෑදෙන බව ද කොමසාරිස් ජනරාල්වරයා කීය.

දැනට වාර්ෂිකව මෙරට දේශීය බදු ආදායමෙන් සියයට හැටපහක් හැත්තෑවක් ප්‍රමාණයක් බදු අයවනුයේ විශාල පරිමාණ බදු ගෙවන්නන්ගෙනි. මෙම ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස සියයට අසූව දක්වා ඉහළ නංවාගැනීම නව විශේෂ ඒකකය ආරම්භ කිරීමේ අරමුණක් වී තිබිණි. මීට අමතරව බදු ලිපිගොනු තුන්දහක පමණ ප්‍රමාණයක් පහළ සමාගම් අංශයේ එනම් සුළු හා මධ්‍ය පරිමාණ අංශයට වඩා ඉහළටත් විශාල පරිමාණ බදු ගෙවන්නන්ගේ අංශයෙන් පහළටත් ඇතුලත් වෙති. මෙම පිරිසගේ ද නියමිත බදු ආදායම ලබා ගනිමින් ඔවුන් රටේ ආර්ථික දියුණුවට ලබා දෙන දායකත්වය දැනට වඩා සවිබල ගන්වා ඔවුන් ද විශාල පරිමාණ බදු ගෙවන්නන් බවට පරිවර්තනය කර ගැනීම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව වී ඇතැයි ද නදුන් ගුරුගේ මහතා සඳහන් කළේය. තමාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන නව ඒකකයේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු දෙදෙනකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු හතර දෙනෙකු , කොමසාරිස්වරු දහතුන්දෙනෙකු ඇතුළු නිලධාරීන් හැත්තෑදෙදෙනෙක්ගෙන් සමන්විත බව ද ඒ මහතා කීය.

සෞභාග්‍යයේ දැක්ම රජයේ ආර්ථික වැඩපිළිවෙළට අනුව සුළු හා මධ්‍ය පරිමාණ බදු ගෙවන්නන්ට බදු සහන ගණනාවක් ලබා දී තිබේ. එමෙන්ම බදු ක්‍රමය සරල කොට තිබේ. තව දුරටත් එය සරල කරමින් සිටී. ඊට අමතරව වසර පහක් හෝ ගතවන තුරු නොවෙනස් වන බදු ප්‍රතිපත්තියක් රටට හඳුන්වාදීමට රජය කටයුතු කරමින් සිටී. මේ අනුව ඉදිරියේදී බදු සහන ලබා ගනිමින් තමන්ගේ නිෂ්පාදන, කර්මාන්ත , කෘෂිකර්මාන්ත හා සේවා සඳහා වැඩි මුදලක් අයෝජනය කොට එතුළින් ආර්ථිකයේ බලගැන්වීමට මෙම සමාජ ස්ථරය යොදා ගැනීම ඉලක්ක කොට ඇතැයි නදුන් ගුරුගේ මහතා කීය.

මාර්ග දෙපස පැළ දස ලක්ෂයක් සිටුවන හරිත ව්‍යාපෘතිය කඩිනම් කරන්න ඇමැති ජොන්ස්ටන්ගෙන් නිලධාරීන්ට උපදෙස්

"රට හඳුන සෞභාග්‍යයේ දැක්ම" නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව තිරසාර පරිසර කලමනාකරණය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රට පුරා මාර්ග දෙපස පැළ දස ලක්ෂයක් සිටුවීමේ හරිත ව්‍යාපෘතිය කඩිනම් කරන ලෙස මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

දැනට ක්‍රියාත්මක කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ දී පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී හෙතෙම මේ උපදෙස් ලබා දුන්නේය. ඒ ඒ පළාත්වලට ආවේණික මාර්ග දෙපස සිටුවීම් සඳහා වඩාත්ම ගැළපෙන ශාක ප්‍රභේදයන් හඳුනා ගැනීම සිදු කරන ලෙස ද ඒ සඳහා විශේෂඥ සහය ලබා ගන්නා ලෙස ද මෙහිදී අමාත්‍යවරයා උපදෙස් ලබාදෙන ලදී.

මෙහිදී මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් පැවසුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ සාකච්ඡා කර කඩිනමින් මාර්ග දෙපස සිටුවිය යුතු හා ඒ ඒ පළාත්වලට ගැළපෙන ශාක ප්‍රභේදයන් හඳුනා ගැනීමට කටයුතු කරන බවයි. ඇහැළ, කුඹුක්, කොහොඹ යන ශාක ප්‍රභේද කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බවද නිලධාරීන් පැවැසීය.

මෙම හරිත ව්‍යාපෘතියේ ආරම්භය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මෙහිදී කීවේය. විශේෂයෙන්ම මාර්ග සංවර්ධන කිරීමේදී පරිසරයට ද ප්‍රමුඛස්ථානයක් දිය යුතු බවද අමාත්‍ය වරයා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

දිනමිණ BL BIZ LINE

2020 සැප්තැම්බර් 14 සඳුදා | දිනමිණ | පිටුව 15

biz.dinamina@lakehouse.lk

Business Street

කොළොම්පුරේ කැලෑ පොළේ කතන්දරේ



ආනමඩුවේ නන්දා

නවුෆර්ගේ කෝපි පෝච්චිය

කොස්ඇට

නෙළුම් කුලුනට ඉහළින් අටවක සඳ පායා ඇත්තේ නෙළුම් කුලුනට තනි රකින රිසියෙනි. උදේ හවස සැමදාමත් ජනාකීර්ණව කලබලයෙන් දකින කොළඹ සන්සුන්ය. සිහින් සුළං රැල්ලක් විත් සිහිපත් කළේ ගිනියම් උණුසුම ඇති කොතැනක වුව සිසිලසද හිඟ නොවන බවයි. පාන්දර සන්සුන් බව සැබෑවක් වුව මේ මොහොතේ කොළඹ සන්සුන් නොවන ස්ථාන කිහිපයක්ම තිබේ. ඒ අතරින් කැලෑ පොළ එක් ස්ථානයකි. කැලෑ පොළ සැබවින්ම අපූරු ස්ථානයකි. එහි පැමිණෙන කෙනකුට ගම්පොළ සිට පලතුරු හකුරු ආදිය රැගෙන වෙළෙඳාමේ පැමිණෙන ලුසි නැන්දා, අනුරාධපුරයේ බුල්නෑවේ සිට පැමිණෙන සීලවතී නැන්දා වැන්නියන් මෙන්ම පලා කොළ රැගෙන හලාවත සිට එන නයනා නැන්දා වැනි වෙළෙන්දියෝ හමුවෙති. එපමණක් නොවේ කොළඹ මරදාන කේන්ද්‍ර කොට ජීවත් වන නාගරික වෙළෙඳුන්ද මේ වෙළෙඳපොළෙහි කොටසක් හිමිකරගෙන සිටින්නේ දුර ඈත ගම්වල සිට ගොවින් විසින් කොළඹට එවන ආහාර ද්‍රව්‍ය වෙළෙඳාම් කරන අතරමැදියන් ලෙසිනි.

කොළඹ මැනිං වෙළෙඳපොළ මෙරට එළවළු පලතුරු මිල තීරණය කරන මධ්‍යස්ථාන අතර ප්‍රමුඛ ස්ථානයකි. එහි වෙළෙඳාම් කටයුතු පාන්දර එකේ පමණ සිට සිදු වන්නේ තොග වශයෙනි. මැනිං වෙළෙඳපොළට ආසන්නයේ වසර 35ක 40ක පමණ කාලයක සිට රාත්‍රී 11 සිට උදැසන 10 තෙක් පැය 11ක පමණ කාලයක් පැවැත්වෙන මේ කැලෑ පොළ අශ්‍රිත පසුබිම අපූරු ව්‍යුහයකි. මෙහි බොහෝවිට වෙළෙඳාමේ නිරත වෙන්නේ ගොවියා හෝ ඔහුගේ පවුලේම කෙනකුවීම මේ වෙළෙඳපොළෙහි ඇති සුවිශේෂත්වයයි. මේ ස්ථානයට කැලෑ පොළ නම ලැබී ඇත්තේ ගමේගොඩේ, කැලේකොළේ හැදෙන අල, පලා කොළ, පලතුරු, කොස්, දෙල්, කොස්ඇට, ගඩා ගෙඩි ආදිය රටේ සිව්දිගින්ම පැමිණෙන නිසායි.

කලක් තිස්සේ මැනිං වෙළෙඳපොළ ආසන්නව ස්ථානගතව පැවැත්වෙන මේ වෙළෙඳපොළ මීට වසර 06කට පමණ ඉහතදී පැවැත්වුයේ බැස්ටියන් මාවත ඉදිරි පිට බස්නැවතුම් පොළෙහි කෙළවරකයි. එම ස්ථානයේ වෙළෙඳාම් කටයුතු සිදු කෙරුණද දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදුවූ බව වසර 30ක පමණ කාලයක් මෙහි වෙළෙඳාම් කරන වෙළෙඳුන් සිහි කරන්නේ වැස්සට තෙමී මඩ වූ ගොහොරුවක වෙළෙඳාම් කළ කටුක අතීතය සිහි කරමිනි. පසුගිය සමයේ නාගරික සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් කොළඹ අලංකරණ කටයුතු අතරේ ඉදි කළ ෆ්ලෝටින් මාර්කට් වෙළෙඳපොළ ස්ථාපනය කිරීමේ සංවර්ධන කාර්ය අතරතුර කැලෑ පොළ සඳහා ද බැස්ටියන් මාවත සමීපයේ ෆ්ලෝටින් මාර්කට් සංකීර්ණයට සමීපව දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩමක් ලබාදී ඇත්තේ පොළ පවත්වා ගෙන යෑමට අවැසි විදුලි ආලෝකය මෙන්ම මනාව කොන්ක්‍රීට් අතුරා පොළොව මනා කොට සකසමිනි.

වේලාව පාන්දර 4. 30ට ආසන්නය. කැලෑ පොළ වෙත සමීප වුවද වෙනදා එහි දකින ජනාකීර්ණ බව නැත. කොරෝනා බිය පහව නැති නිසා පොළට පැමිණීම පුරුද්දක් කරගෙන සිටින පාරිභෝගිකයන් තවමත් පසුබටව ඇති හැඩකි. ෆ්ලෝටින් මාර්කට් කෙළවරින් පොළ වෙත ප්‍රවේශවීමේදී විශාල නුග ගසක් දක්නට ලැබේ. ඒ අසල විශාල ප්‍රමාණයේ කරපිංචා රම්පේ ආදිය ගොඩගසාගෙන සිටින වෙළෙන්දිය වෙත සමීපවුවෙමි. සැපවින්ම කතාවට ඉස්පාසුවක් නැත. ඈ ගැනුම්කරුවන් හා අතොරක් නැති කතාබහේමය.

"නම නන්දා. මම පදිංචි ආනමඩුවේ. සතියේ දවස් පහක් හයක්ම වෙළෙඳාමේ එනවා. පුතත් මෙතනට එළවළු අරගෙන එනවා. හවස පුතාගේ ලොරියට බඩු ටික පටවලා මම හයට විටක බස් එකට නඟිනවා. බස් එක කොළඹට 08ට විතර එනවා. ඒ වෙලාවේ ඉඳලා මෙතනම තමා ඉන්නේ ගැනුම්කරුවෝ එන්න පටන් ගන්නේ රෑ 11විතර ඉඳලා ඒ වෙලාවේ ඉඳලා උදේ 9-10 වෙනකන් සෙනඟ ඉන්නවා. බඩු ටික ඉවර වුණාම අපි යනවා. ගිහින් පහුවදාට විකුණන්න බඩු එකතු කරනවා. පුරුදු අය ගෙදරටත් ගෙනත් දෙනවා. දවල් කෑමෙන් පස්සේ පැයක් දෙකක් නිදාගෙන ඉඳලා ආයෙත් හවස එන්න සූදානම් වෙනවා. එහෙම තමා ජීවිතේ ගෙවෙන්නේ. මහ මඟ තමා. කොරෝනා කාලේ හරි වෙළෙඳාමක් තිබුණෙත් නැනෙ. දැන් තමා ටිකෙන් ටික හරියාගෙන එන්නේ. සැමියෙක් නොමැති ගෙදර ජීවත් වීමට ඇය වසර 25ක පමණ කාලයක් කැලෑ පොළ වෙත පැමිණ තිබේ. නිදිවැරීම මෙන්ම වෙළෙඳාමද දැන් ඇයගේ ජීවිතයේ කොටසක් බවට පත්වී ඇති සෙයකි.

සුලභව හමු නොවන නෙල්ලි, වෙරළු, මසං, දම්, දේශීය දෙළුම්, දොඩම් ආදිය කැලෑ පොළෙහි හමුවන පලතුරු වෙයි. වැඩි වශයෙන් පලතුරු මිලදී ගැනීමට පැමිණෙන්නේ කොළඹ අවට ප්‍රදේශවල කුඩා කඩ පවත්වාගෙන යන වෙළෙඳුන් මෙන්ම අච්චාරු අලෙවි කරන වෙළෙඳුන්ය. පාන්දර පැමිණ කිලෝ තුන හතර, පහ, දහය බැගින් ගෙන යන්නේ සුළු ව්‍යාපාර කටයුතු සඳහායි.

ගොටුකොළ මිටි ගෝණි කිහිපයක් අසල ඉඳගෙන සිටින වෙළෙන්දිය ඇයගේ තතු හෙළි කළේ මෙසේයි."නම පී. ඒ. නයනා, මම එන්නේ හලාවත ඉඳලා ඒ පැත්ත කොහොමත් කිරිවලටනෙ ප්‍රසිද්ධ මම හවස අටට විතර එහෙන් පිටත් වෙනවා. එනකොට රෑ 09-10 වෙනවා. එතැන ඉඳලා වෙළෙඳාම තමයි. මම ගොටුකොළ මිටියක් රුපියල් 06ට දෙන්නේ. මේ වෙළෙඳාම ටිකක් අමාරු වෙලා තියන්නේ මහා පරිමාණයෙන් කරන අයත් දැන් මේ පොළට එන නිසා.

මේ දිනවල කොස් ඇට මිල කෙසේ විය හැකිද? ඒ ගැන දැන ගත්තේ ආනමඩුවේ සිට පැමිණි උදේනි වෙළෙන්දියගෙන්. ඇය කී පරිදි කොස් ඇට කිලෝ එකක මිල රුපියල් 80කි. එපමණක් නොවේ හීන් කොච්චි, තිබ්බටු, සුදු කොච්චි, බඩඉරිඟු, කෙසෙල් මුව, කෙසෙල් ආදිය උදේනි වෙළෙන්දිය සම්පයේ තිබේ. ඇගේ කතාව මෙසේයි. "මගේ ගම පාණදුර. මහත්තයා ආනමඩුවේ. මුලින් පොළේ වෙළෙඳාමට ආවේ මහත්තයාගේ අම්මා (නැන්දම්මයි) මහත්තයයි. දැන් ඒ දෙන්නා එහේ වගා කරනවා. ඒ වගාවේ අස්වැන්න බස් එකේ පටවලා එවනවා. මම මගේ එක දරුවෙක් එක්ක මෙහේ නැවතිලා ඉඳලා වෙළෙඳාම් කරනවා. සිකුරාදා සවස මමත් ආනමඩුවේ යනවා. ආයෙත් ඉරිදා රෑට නැති නම් සඳුදට බඩුත් පටවගෙන එහෙන් එනවා."

කැලෑ පොළෙහි විශේෂයෙන් අලෙවි වන ද්‍රව්‍ය අතර බුලත්, දුම්කොළ ප්‍රමුඛ වෙනවා. මේවා අලෙවි කරන්නේ ගම්පහ, වැලිවේරිය ප්‍රදේශයේ වෙළෙඳුන්. මීට අමතරව කොස්, පොල් ආදියත් මේ වෙළෙඳපොළෙහි ප්‍රධාන අංගයක්. කොස් ඉතා ලබාදායී ව්‍යාපාරයක් බවයි කතා බහෙන් වැටහුනේ. දිනක ලාබය හත් අට දහසක් පමණ. පොල් තත්වය කනගාටුදායක බවයි පොල් ලොරි හිමිකරුවකු වන ප්‍රියන්ත ජයලත් පැවසුවේ. වියළි පොල් රට යැවීමේ ව්‍යාපාරය නිසා පොල් ඉල්ලුම ඉහළ ගොස් ඇති බවත් දිනෙන් දිනම සාමාන්‍ය පාරිභෝගිකයාට මිල දී ගත නොහැකි තත්ත්වයකට පොල් මිල ඉහළ යමින් පවතින බවටත් ඔහුගේ අදහසයි. එපමණක් නොවේ කොරෝනා හේතුවෙන් ඔවුන් මෙතෙක් සිදු කළ වෙළෙඳාමට බලපෑම් ඇතිවී ඇති බවත් මින් පෙර පොල් වතු වෙත ගොස් පොල් ලබාගත්තත් කොරෝනා සමයේ කැලෑ පොළ සමිතියේ නිර්දේශයනට අනුව පිටතින් පොල් ගෙන එන වාහන වෙතින් පොල් මිලදී ගෙන අලෙවි කිරීමට සිදුව ඇති නිසා අතරමැදියන් කිහිපදෙනකු අත ලාබය බෙදී යෑම නිසා පොල් මිල තවතවත් ඉහළ යෑමට හේතුවක්වී ඇති බවත් ඔහු අවධාරණය කරයි.

පාණදුරේ ජීවනී

රැයක් පුරා නිදිවරා වෙළෙඳාමෙහි නිරත වන වෙළෙන්දන්ට මද අස්වැසිල්ලක් ලැබෙන්නේ මොහොමඩ් නවුෆර්ගේ කෝපි කෝප්පයෙනි. තොටලඟ පදිංචි නවුෆර් කැලෑ පොළ වෙත එන්නේ රාත්‍රී 10 පසුවූ විටයි. එතැන් සිට කෝපි වක්කරන නවුෆර්ගේ කෝපි කෝප්පයක මිල රුපියල් 10කි.

කැලෑ පොළෙහි අලෙවි ද්‍රව්‍ය අතර නෙළුම්, මානෙල් මල් මිටිද ඇතැම් දිනෙක දක්නට ලැබෙයි. මල් දහයකින් යුතු මිටිය රුපියල් 100කි. එළවළු, පලතුරු සමඟ මල්ද ගෙන යන පාරිභෝගිකයෝ දැකගත හැකිය. ඒ දුරකතර ගෙවා ගෙන ආ මල්වල නැවුම් බව පිළිබඳ විශ්වාසයෙන් යුතුව බව මගේ අදහසයි.

කැලෑ පොළෙහි වෙළෙඳාම් කරන වෙළෙඳුන් ප්‍රමාණය 350කට ආසන්නය. ඔවුන් වෙතින් භාණ්ඩ රැගෙන ගොස් බත් මුල් බඳින කුඩා වෙළෙඳසල් පවත්වාගෙන යන පිරිස මෙන්ම අච්චාරු සැකසීම වැනි ව්‍යාපාරයන්හි නිරත වෙළෙඳුන් ප්‍රමාණය ද තවත් බොහෝය. එපමණක් නොවේ පොලීසිය, වරාය, විශ්වවිද්‍යාල ආදී ප්‍රමුඛ පෙළේ ආපනශාලාවන් සඳහා ආහාර සැකසීම සඳහා ගමේ කෑම සොයා එන අයද මෙහි පැමිණීම සිරිතකි. කැලෑ පොළ මෙරට පොළවල් අතර සුවිශේෂ වන්නේ එහෙයිනි.

නව රජයේ සංවර්ධන සැලසුම් අනුව කැලෑ පොළවාසීන්ගේ ඉල්ලීම් කිහිපයකි. ඉන් එකක් හිසට වහලකි. දෙවැන්න වැසිකිලි පහසුකමක් සමීප ස්ථානයක සලසා දෙන ලෙසයි. ෆ්ලෝටින් මාර්කට් ආසන්නයේ සංවර්ධන කාර්යයන් ආරම්භ වීමට නියමිතය. කැලෑ පොළ වාසීන්ගේ පොදු අවශ්‍යතා පිළිබඳ ද නව සංවර්ධන ව්‍යාපෘති අතර අවකාශයක් හිමි වනු ඇතැයි පොළවාසීන්ගේ අපේක්ෂාවයි.

සටහන - බුද්ධිකා බ්‍රාහ්මණගේ

ඡායාරූප - නිශංක ද සිල්වා

පෙරේරා ටයර් සර්විස් පෞද්, සමාගම GRI දේශීය ටයරය හඳුන්වා දෙයි

ඉහත ඡායාරූපයේ වමේ සිට විමල් විජේන්ද්‍ර (සම්බන්ධීකාරක), සුගන්දන් (ජ්‍යෙෂ්ඨ කළමනාකරු- පෙරේරා ටයර් සර්විස්), යසිරු පෙරේරා (අධ්‍යක්ෂ - පෙරේරා ටයර් සර්විස්), රුවන් පෙරේරා (කළමනාකාර අධ්‍යක්ෂ - පෙරේරා ටයර් සර්විස්), මහේෂ් රනසෝම (ප්‍රධාන විධායක නිලධාරී - GRI සමාගම), ආනන්ද කල්දේරා (විධායක අධ්‍යක්ෂක - GRI සමාගම) ඩිලානි අනුරුද්දිකා (ජ්‍යෙෂ්ඨ කළමනාකරු ව්‍යාපාර ප්‍රවර්ධන- GRI සමාගම)

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රමුඛතාවක් වන දේශීය නිෂ්පාදනවලට මුල් තැන දීමේ සංකල්පය සමඟ අත්වැල් බැඳ ගනිමින් සීමාසහිත පෙරේරා ටයර් සර්විස් පෞද්ගලික සමාගම සුප්‍රකට දේශීය නිෂ්පාදනයක් වන GRI ටයරය මෙරට බෙදා හැරීමේ එකම නියෝජිතයා බවට පත් වෙයි. GRI ටයර් නිෂ්පාදනය කරන සීමාසහිත ග්ලෝබල් රබර් ඉන්ඩස්ට්‍රිස් පෞද්ගලික සමාගම සමඟ පෙරේරා ටයර් සර්විස් පෞද්ගලික සමාගම පසුගියදා බෙදා හැරීමේ ගිවිසුමට එළැඹිණ. මෙතෙක් ලොව පුරා රටවල් 40කට ආසන්න සංඛ්‍යාවකට GRI සන්නාමය යටතේ අපනයනය කරන කෘෂිකාර්මික ටයර්, ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ටයර් සහ ෆෝර්ක් ලිෆ්ට් ටයර් දැන් දේශීය පාරිභෝගිකයන්ටත් ලබා ගත හැකිය.

ටයර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ දශක දෙකකට ආසන්න අත්දැකීම් ඇති GRI සමාගම මෙරට විශාලතම රේඩියල් (Radial) සහ බයස් (Bias) කෘෂිකාර්මික ටයර් නිෂ්පාදන ආයතනයද වේ. ශ්‍රී ලංකාවේ පිහිටි අති නවීනතම තාක්ෂණයෙන් පිරිපුන් pueumatic කර්මාන්තශාලාව 2018දී අරඹන්නට GRI ආයතනය සමත් විය. ISO 9001:2015, ISO 50001:2011, ISO 14001:2004 යන සම්මාන දිනා ගන්නටද GRI සමාගමට හැකි විය. උසස් තත්ත්වයේ විදේශීය ටයර් ආනයනය කිරීමෙහි නියුතු පෙරේරා ටයර් සර්විස් සමාගම දේශීය ටයරයක් අලෙවි කිරීම අරඹන්නේ ප්‍රථම වතාවටය. ලෝකයේ වැඩිපුරම ප්‍රශංසාවට ලක් වන ටයර් අලෙවියෙන් පෙරේරා ටයර් සර්විස් පෞද්ගලික සමාගම වසර 40කට වැඩි කාලයක් පුරා දේශීය පාරිභෝගික විශ්වාසය දිනා ගත්තේය. පෙරේරා ටයර් සර්විස් පෞද්ගලික සමාගම ලොව පුරා නම දිනූ ටයර් හා ට්‍යුබ් අලෙවියට මෙන්ම වත්මන් වාහන ක්ෂේත්‍රයේ අධි තාක්ෂණික රථ සඳහා වඩාත්ම සුදුසු ටයර් විසඳුම් හා සේවා සැපයීමටද හැකි සමාගමක් බවට පත් වී ඇත. එමෙන්ම පහසු මිලට ටයර් නැවත පිරවීමේ කම්හලක්ද සමාගම සතුය.

OPPO A1k පහසු මිලට හොඳම දුරකතනයක්

රු. 19,990 ක මිලකට 4,000mAh බැටරියක්, 2GB RAM සහ 32GB ROM සහිත OPPO A1k දුරකතන මාදිලිය හඳුන්වා දීමත් සමඟ සෑම මිලකටම අයත් මාදිලි රැසක් OPPO සමාගම සතුවන අතර සහන මිලට මිලදීගත හැකි, එහෙත් ඉහළ ක්‍රියාකාරිත්වයෙන් යුත් OPPO ස්මාර්ට්ෆෝන් විශේෂාංග අත්විඳීමේ මහඟු අවස්ථාවද ශ්‍රී ලාංකිකයන්ට ලැබෙනු ඇත.

රු. 20,000 කට අඩු ස්මාර්ට්ෆෝන් කාණ්ඩය මින් ඉදිරියට මෙරට ස්මාර්ට්ෆෝන් වෙළඳපොළේ සැබෑ වෙනසක් ඇතිකරන කාණ්ඩයක් වනු ඇති අතර, එය රටේ ඉහළ යමින් පවතින ස්මාර්ට්ෆෝන් භාවිතය තවදුරටත් පුළුල් කිරීම සඳහා සුවිශේෂ දායකත්වයක් සපයනු නිසැක ය.

ICC Smart Eco වෙතින් ගෘහස්ථ සහ කාර්මික කාබනික අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම්

ගෘහස්ථ සහ කාර්මික කාබනික අපද්‍රව්‍ය පිරිසැකසුම් තාක්ෂණය පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කීර්තිමත් සමාගමක් වන International Construction Consortium (ICC) සමාගම සිය නවතම අපද්‍රව්‍ය පිරිසැකසුම් යන්ත්‍රෝපකරණ මාදිලි පෙළ හඳුන්වා දී ඇත. ICC Smart Eco Solutions හඳුන්වා දුන් මේ නවතම නිෂ්පාදන පෙළ කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් යන්ත්‍ර සහ ස්මාර්ට් මොඩියුල අපජල පිරිපහදු පද්ධතිවලින් සමන්විතය. Smart Eco Quick Composter hka;%h 'FOODCYCLER' යන නමින් නිවෙස්වල භාවිතයට 'PL Series' යන යන්ත්‍ර මාදිලි පෙළ වාණිජමය භාවිතයට ද හඳුන්වා දී ඇත. ගන්ධය පිටතට නිකුත් නොවන ලෙස ගලවා සවි කළ හැකි සක්‍රීය කාබන් ෆිල්ටරයකින් මේ සියලු ඒකක සමන්විතය. කාබනික අපද්‍රව්‍ය පැය 6-24 අතර කාලයකදී ගුණාත්මක බවෙන් ඉහළ කාබනික පොහොර බවට පරිවර්තනය කිරීමේ හැකියාව එම යන්ත්‍ර සතුය.

තට්ටු නිවාස, හෝටල්, නිවාස සංකීර්ණ සහ කර්මාන්තශාලා ඇතුළු ක්ෂේත්‍ර රැසකට මේ යන්ත්‍රයෙන් ප්‍රතිලාභ ලැබිය හැකිය. ICC සමාගමේ නවතම තාක්ෂණය මගින් කර්මාන්තශාලාවලට පහසුවෙන් සිය අපද්‍රව්‍ය ප්‍රති සැකසුම්කරණය කර අපද්‍රව්‍ය ගබඩා කිරීමට වැය වන අධික පිරිවැය ඉතිරි කර ගැනීමටද මෙමගින් හැකිය. ස්මාර්ට් කාබනික අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය සඳහා පාරිභෝගිකයන්ට ඇති ප්‍රවේශය පුළුල් කරමින් ICC සමාගම මෙරට කසළ ගැටලුව විසඳීමේ ප්‍රයත්නයේ ක්‍රියාකාරී හවුල්කරුවකු ලෙස සිය දායකත්වය දෙයි. ICC Smart Eco Solutions අපජල පිරිපහදුව සඳහා ද අඩු පිරිවැය, කාර්යක්ෂම සහ ප්‍රායෝගික විසඳුම් රැසක් හඳුන්වා දී ඇත. ජර්මනිය, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල තාක්ෂණයෙන් සවිබල ගන්වා ඇති මේ යන්ත්‍ර පහසුවෙන් ස්ථාපනය කළ හැකිය. සාම්ප්‍රදායික පද්ධති සමඟ සැසඳීමේදී කාර්යක්ෂමතාවෙන් වැඩි අතර, කාබන් විමෝචනයද සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට සමත්ය. මේ නිෂ්පාදන සියල්ල සතුව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය සහ 40 වසරක අත්දැකීම් සහිත ICC සමාගමේ වගකීම් සහතිකයකය ඇත.

පීපල්ස් ලීසිං කැලණිය ශාඛාව අලුත් තැනක

ශ්‍රී ලංකාවේ බැංකු නොවන ප්‍රමුඛතම මූල්‍ය සමාගම වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ කැලණිය ශාඛාව ගනුදෙනුකරුවන්ට වඩාත් සුවපහසු හා කඩිනම් මූල්‍ය සේවාවක් ලබාදීමේ අරමුණෙන් නව පරිශ්‍රයක (අංක 950, නුවර පාර, හිඹුටුවැල්ගොඩ, දළුගම, කැලණිය) මහජන බැංකුව හා පීපල්ස් ලීසිං සමාගමේ සභාපති, සුජීව රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා විවෘත කෙරුණි. ගනුදෙනුකරුවන්ගේ ප්‍රමාණය ඉහළ යෑම මත එම ශාඛාව වැඩි ඉඩකඩ හා පහසුකම් සහිත නව පරිශ්‍රයකට ගෙවැදීම සිදුවිය.

පීපල්ස් ලීසිං කැලණිය නව ශාඛාව විවෘත කිරීමේ උත්සවයට එම සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී, සබ්‍රි ඊබ්‍රහිම්, හිටපු ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ඩී. පී. කුමාරගේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලයනල් ප්‍රනාන්දු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් වන රොහාන් තෙන්නකෝන්, දමිත් මලවිතන්තිල, ලක්සඳ ගුණවර්ධන, ප්‍රභාත් ගුණසේන හා උදේශ් ගුණවර්ධන, ප්‍රධාන කළමනාකරුවන් වන සමන් ලියනගේ, චමිල් හේරත්, වජිර රාමනායක හා පීපල්ස් ලීසිං කැලණිය ශාඛා ජ්‍යෙෂ්ඨ කළමනාකරු සමන්ත සෙනෙවිරත්න මහතා ඇතුළු ගනුදෙනුකරුවෝ රැසක් සහභාගී වූහ.

ඡායාරූපය – සුලෝචන ගමගේ

කොවිඩ් වසංගතයෙන් පසු පැවැත්වෙන පළමු ජාතික ශූරතාවලිය

රළ මත ලිස්සා යෑමේ තරගාවලිය 26-27 ආරුගම්බේ මුහුදු තීරයේදී

ඉදිරි වසර පහේදී ක්‍රීඩාවෙන් ඩොලර් බිලියනයක විදේශ විනිමයක්

ඇමැති නාමල් රාජපක්ෂ ක්‍රීඩා ආර්ථිකයකට මුල පුරයි

ෆවුස් මොහොමඩ්

ඉදිරි වසර 5ක කාලය ඇතුළත මෙරට ආර්ථිකයට ක්‍රීඩාවෙන් ඩොලර් බිලියනයක ආදායමක් එක් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවීම තම ඉලක්කය බව ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය. මෙරට ආර්ථිකය මෙන්ම ජන ජීවිතය ද ගොඩනඟමින් ක්‍රීඩාව ප්‍රතිසංවිධාන කිරීමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීම සඳහා කැප වන බව ද ඇමැතිවරයා සඳහන් කළේය.

ශ්‍රී ලංකා රළ මත ලිස්සා යෑමේ සංගමයේ සහ ලංකා ස්පෝර්ටරයිසින් ආයතනයේ මෙහෙයවීමෙන් මේ මස 26 සහ 27 දෙදින ආරුගම්බේ මුහුදු තීරයේ දී පැවැත්වෙන 'රළ මත ලිස්සා යෑමේ' (සර්ෆින්) ජාතික හා විවෘත තරගමාලාව පිළිබඳ පසුගියදා ක්‍රීඩා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැති මාධ්‍ය හමුවට එක් වෙමින් ක්‍රීඩා ඇමැතිවරයා සිය අනාගත ඉලක්කය එසේ අනාවරණය කළේය.

කොවිඩ් වසංගතයෙන් පසු මෙරට පැවැත්වෙන පළමු ජාතික ශූරතාවලිය බවට පත් වන රළ මත ලිස්සා යෑමේ තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයත්, සංචාරක අමාත්‍යාංශයත් අත්වැල් බැඳගනිමින් ක්‍රීඩාවත්, සංචාරක ක්ෂේත්‍රයත් යළි නඟා සිටුවීමේ ජාතික මෙහෙයුමට උරදී සිටී. මේ මස 27 වැනිදාට යෙදී ඇති ලෝක සංචාරක දිනයට සමගාමීව පැවැත්වෙන මේ තරගාවලිය තුළින් නැගෙනහිර පළාතේ බිඳ වැටුණු සංචාරක ව්‍යාපාරය යළි ඉහළට ඔසවා තැබීමට විශාල දායකත්වයක් ලැබෙනු ඇතැයි විශ්වාස කෙරේ.

කෝවිඩ් වසංගතයත් සමඟ ලොව පුරා ක්‍රීඩාව යම් පසුබෑමකට ලක් වුවත් ක්‍රම ක්‍රමයෙන් බොහෝ රටවල් ජාත්‍යන්තර සහ ජාතික තරගවලට නැවැත පිවිසෙමින් සිටින බව අවධාරණය කළ ක්‍රීඩා ඇමැතිවරයා, ඒ අනුව සෞඛ්‍ය උපදෙස් මධ්‍යයේ මෙරට ජාතික මට්ටමේ ක්‍රීඩා තරග ද නැවත ආරම්භ කළ යුතුව ඇතැයි කියා සිටියේය.

ක්‍රීඩාවත්, සංචාරක ව්‍යාපාරයත් රටක ආදායම් ලබන ව්‍යාත්තීන් බව සඳහන් කළ ඇමැතිවරයා ක්‍රීඩකයා ව්‍යවසායකයෙකු කිරීමේ වැදගත්කම ද මෙහිදී පෙන්වා දුන්නේය.

"ක්‍රීඩකයෙක් කියන්නේ ව්‍යවසායකයෙක්. අපේ රටේ පහුගිය කාලේ ක්‍රීඩකයා දිහා බැලුවේ ඉතාමත් පහත් මට්ටමකින්. සමහර තෝරා ගත්තු ක්‍රීඩාවලට පමණක් අප ඉහළ තැනක් දුන්නත් අප ක්‍රීඩකයා දිහා බැලුවේ අමුතු විදිහකට. ඉතින් මං හිතන්නේ අද අප ක්‍රීඩකයා ව්‍යවසායකයෙක් විදිහට බලන්න ඕනෑ කාලේ ඇවිත්. ලෝකේ බොහෝ රටවල තමන්ගේ පවුලේ දරුවෙක් ක්‍රීඩාවෙන් ඉහළට යනවා කියන්නේ මව්පියන්ට ආඩම්බරයක් වගේම ඒ පවුලට ආදායමක්. නමුත් අපේ සමහර පවුල්වලට දරුවා හොඳින් ක්‍රීඩා කරනවා කියන්නේ මව්පියන්ට හිසරදයක්. ඔවුන්ට පාවහන් ලබාදීමත්, ක්‍රීඩා ඇඳුම් සපයා දීමත්, ඔවුන් ජාතික තරග සඳහා සහභාගි කරවීමත් අපහසු වෙලා. මේක තමයි යථාර්ථය. ඉතින් මේ තත්වයෙන් අපි ක්‍රීඩකයා මුදා ගන්නේ කොහොමද කියලයි බලන්න ඕනෑ." නාමල් රාජපක්ෂ මහතා පැවැසීය.

"අනිත් පැත්තෙන් ක්‍රීඩාවත් එක්ක බැඳුණු ආර්ථිකය දියුණු කරන්නේ කොහොමද. ක්‍රීඩාවත් එක්ක බැඳුණු සංචාරක ව්‍යාපාරය අපි දියුණු කරන්නේ කොහොමද. දකුණු මුහුදු තීරය වෙන්න පුළුවන්. ඇල්ල බදුල්ල බණ්ඩාරවෙල වැනි කඳු වැටි වෙන්න පුළුවන්. මේ සියල්ලම ඒවාට ආවේණික වුණු සංචාරක ව්‍යාපාරයට වගේම ක්‍රීඩාවටත් බැඳුණු ප්‍රදේශ විදියට තමයි ලංකාවේ අප නොදැක්කත් ලෝකයා එක දැකලා තියෙන්නේ. හයිකින්වලට නැතිනම් කඳු තරණය කරන්න බොහෝ පිරිසක් විදෙස් රටවලින් ඇල්ලට එනවා. ඒ වගේම වෙරළ ක්‍රීඩා කරන්නත් ලෝකයේ විශාල පිරිසක් ලංකාවට එනවා. ඉතින් මේවා ප්‍රතිසංවිධාන කරලා ඉදිරි කාල සීමාව තුළ ආර්ථික වශයෙන් රටට විදේශ විනිමය ගේන්න පුළුවන් ක්ෂේත්‍රයක් බවට මේ ක්ෂේත්‍රය පරිවර්තනය කරන්න අවශ්‍යයි. ඒ වගේම ක්‍රීඩකයා ව්‍යවසායකයෙක් බවට පත් කරන්න ඕනෑ." ඔහු කීවේය. "ඩොලර් බිලියනක විදේශ විනිමයක් ඉදිරි වසර 5 තුළ ලැබීමේ අපේ ඉලක්කයයි. මම විශ්වාස කරනවා පෞද්ගලික අංශයත්, රාජ්‍ය අංශයත් එකතුවෙලා මේ ගමන ගියොත් අපට හැකියාව ලැබෙයි අන්න ඒ ඉලක්කය කරා ගමන් කරන්න. මොකද තව දුරටත් අනාගතයේදී ක්‍රීඩාව රටට, ආණ්ඩුවට බරක් නොවන ක්ෂේත්‍රයක් බවට ආයතනයක් බවට පරිවර්තනය කරන්න ඕනෑ. හැබැයි ක්‍රීඩකයාට අසාධාරණයක් වෙන්න තියන්න බෑ. ක්‍රීඩකයාට සාධාරණීයකරණය වෙන්න නම් ක්‍රීඩකයා ව්‍යාත්තීමය ක්‍රීඩකයෙක් බවට පත්වෙන්න ඕනා. ක්‍රීඩකයා ව්‍යාත්තීය ක්‍රීඩකයෙක් බවට පත්වෙනවා කියන්නේ ක්‍රීඩකයා ඉබේම ව්‍යවසායකයෙක් බවට පත්වෙනවා කියන එකයි. ක්‍රීඩකයා ව්‍යාත්තිමය ක්‍රීඩකයෙක් වෙලා ව්‍යවසායකයෙක් බවට පත්වුණාම මේ රටේ ක්‍රීඩා ආර්ථිකයක් ගොඩනැගෙනවා." ක්‍රීඩා අමාත්‍යවරයා කියා සිටියේය.

මොබිටෙල් සමාගම සහ ලින් එෂියා හෝල්ඩින්ග්ස් සමාගම පූර්ණ අනුග්‍රාහකයන් ලෙස කටයුතු කරන රළ මත ලිස්සා යෑමේ ජාතික හා විවෘත තරගාවලිය ක්‍රීඩා ඉසවුවක් වුවත් ආරුගම්බේ අවට ජනතාවට එය සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනයට විශාල දායකත්වයක් ලබාදෙන ඉසවුවක් වනු ඇතැයි ද ඇමැතිවරයා විශ්වාසය පළ කළේය.

සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා විශේෂ ආරාධිතයකු ලෙස සහභාගි වූ මේ මාධ්‍ය හමුවට රළ මත ලිස්සා යෑමේ ක්‍රීඩා සංගමයේ සභාපති හිරාන් උක්වත්ත, ලංකා ස්පෝර්ටරයිසින් ආයතනයේ සභාපති තිලක් වීරසිංහ මහත්වරු ද එක් වූහ.

ක්‍රීඩා ඇමැතිගෙන් මාධ්‍යට පැසසුම්

කොවිඩ් වසංගතය ව්‍යාප්ත වූ කාලසීමාව තුළ මෙරට කිසිදු ක්‍රීඩා තරගයක් නොපැවැත්වූව ද සිය කාර්ය භාරය ඉහළින්ම ඉටු කරමින් මෙරට ක්‍රීඩා මාධ්‍යවේදීන් සිදු කළ සේවය ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාගේ පැසසුමට ලක් විය.

"මම මාධ්‍යවේදීන්ට හදවතින්ම ස්තුතිවන්ත වෙනවා කොරෝනා වයිරසයෙන් ක්‍රීඩාව රටේ වැළලී යද්දී ඔබ තමයි එය ඉහළට ඔසවා තැබුවේ. ඔබ සැම ඒ කාලසීමාව තුළ ක්‍රීඩා වාර්තාකරණය නතර කළා නම් මේ රටේ ක්‍රීඩාව නැත්තටම නැති වෙනවා. ඒ නිසා තමයි මා ක්‍රීඩා ඇමැතිවරයා විදියට මේ අමාත්‍යාංශයට එනකොට ක්‍රීඩාව ඉතුරු වෙලා තිබුණේ. මොකද අපි අමාත්‍යාංශයට එද්දී ක්‍රීඩකයන් පිටිටනියේ හිටියේ නෑ. ඔවුන් හිටියේ නිවාස ඇතුළේ. ඔබ සැම තමයි ක්‍රීඩාව ඉදිරියට අරගෙන ගියේ" ඇමැතිවරයා සඳහන් කළේය.

ප්‍රංශ සවාරියේ 14 වැනි අදියරේ ජය ඩෙන්මාකයේ සෝරෙන් ක්‍රාග්ට

ඩෙන්මාකයේ සෝරෙන් ක්‍රාග් ඇන්ඩර්සන් ප්‍රංශ සවාරියේ 14 වැනි අදියර දිනා ගනියි.

ස්ලෝවේනියාවේ ලූකා මෙස්ජෙක් දෙවැනි ස්ථානය දිනා ගත්තේ ඇන්ඩර්සන්ට තත්පර 15 ක් පසුපසිනි. ඒ සමඟම තරගය නිමා කළ ස්ලෝවේනියාවේ පීටර් සාගන් තෙවැනි ස්ථානයට පත් විය. අදියර 21කින් යුත් ප්‍රංශ සවාරිය මේ මස 21 වැනිදා පැරිස් නුවරදී නිමාවට පත් වේ.

ප්‍රංශයේ ක්ලියර්මොන්ට් ෆෙරුන්ඩහි සිට ලියෝන් දක්වා පැවැති 14 වැනි අදියරේ තරගය කිලෝමීටර් 194.5ක් දුරින් යුතු විය. 14 වැනි අදියර නිමාවෙද්දී සමස්ත ශූරතාව දිනා ගැනීමට ස්ලෝවේනියානු ප්‍රිමෝස් රොග්ලික් කහ පැහැති ජර්සිය දිනා තත්පර 44ක් ඉදිරියෙන් සිටියි. වත්මන් ශූර කොලම්බියාවේ ඊගන් බර්නාල් තත්පර 59ක් පසුපසින් සිටී.

කොවිඩ් හමුවේ ක්‍රීඩා ඉසවු අවදානම් කලාප 4කට වර්ග කරයි

රග්බි-බොක්සිං ඇතුළු ක්‍රීඩා 12කට රතු ඉර

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා පුහුණුවීම් හා තරග පැවැත්වීමේදී ලියාපදිංචි ක්‍රීඩා අවදානම් කලාප 4කට වර්ගීකරණය කොට, සෘජු ජාත්‍යන්තර භෞතික සම්බන්ධතා පවතින ක්‍රීඩා 12ක් කොවිඩ් පැතිරීමේ දැඩි අවධානමක් ඇති ක්‍රීඩා ලෙස නම් කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් පියවර ගනියි.

එලෙස දැඩි අවධානමක් ඇති ක්‍රීඩා ලෙස රග්බි, කබඩ්, බොක්සිං, මල්ලවපොර, වුෂූ, කරාටෙ, ජූඩෝ, ටයිකොන්ඩෝ, අංගම්පොර, ඇරොබික් ජිම්නාස්ටික්, කඹ ඇදීම හා ජීවිතාරක්ෂක ඉසවු නම් කොට ඇත.

දැඩි අවදානමක් ඇති ක්‍රීඩාවලට අමතරව ඉහළ මධ්‍යම අවදානමක්, පහළ මැදි අවදානමක් හා පහළ අවදානමක් ඇති ක්‍රීඩා ලෙස වර්ගීකරණය කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පියවර ගෙන තිබේ.

ඉහළ මධ්‍යම අවදානමක් පවතින ක්‍රීඩා ලෙස වොලිබෝල්, ත්‍රෝ බෝල්, හෑන්ඩ්බෝල්, බේස්බෝල්, නෙට්බෝල්, රෝල්බෝල්, ෆුට්සාල් හා බාස්කට්බෝල් ක්‍රීඩා නම් කොට ඇති අතර, පහළ මැදි අවදානමක් පවතින ක්‍රීඩා ලෙස ක්‍රිකට් (සැහැල්ලු පන්දු ක්‍රිකට් ඇතුළු), හොකී, එල්ලේ, ස්කොෂ් හා බිව් වොලිබෝල් නම් කොට තිබේ. පහළ අවදානමක් ඇති ක්‍රීඩා ලෙස ටේබල් ටෙනිස්, ටෙනිස්, බැඩ්මින්ටන්, මලල ක්‍රීඩා, ඔරු පැදීම, ජල ක්‍රීඩා, මුහුදු රළ මත ලිස්සා යෑම, රුවල් ඔරු පැදීම, ජිම්නාස්ටික්, ඇරොබික්ස්, වෙඩි තැබීම, බර ඉසිලීම, සවි එසැවීම, කරාටේ, ටයිකොන්ඩෝ, දුනුවිදීම, කඩු හරඹ, කායවර්ධන, මෝටර් ක්‍රීඩා, පාපැදි, රෝලර් ස්කේටින්, තුරඟ තරග, ගොල්ෆ්, බිලියර්ඩ් ඇන් ස්නූකර්, වෙස් හා කැරම් නම් කොට ඇත.

කොරෝනා වසංගත රෝග තත්ත්වය හමුවේ වුවද ඉහළ මධ්‍යම අවදානමක්, පහළ මැදි අවදානමක් හා පහළ අවදානමක් ඇති ක්‍රීඩා පුහුණුව අනුමත කෙරෙන අතර, ක්‍රීඩක ක්‍රීඩකාවන් ක්‍රියාකාරකම් සියල්ල ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තීන්ට යටත් බව දක්වා තිබේ. ක්‍රීඩා තරග පැවැත්වෙන අවස්ථාවලදී සීමිත පිරිසකට තරග නැරඹීමේ අවස්ථා උදා කරන ලෙසත් මීටරයක දුර පවත්වා ගැනීම අනිවාර්ය බවත්, ක්‍රීඩාගාරවල ආසන සංඛ්‍යාවෙන් සියයට පනහක් ඉක්මවා නොයා යුතු බවත් උපදෙස් දී ඇත.

රග්බි ක්‍රීඩාව යළි පණ ගැන්වීමට සෞඛ්‍ය - ක්‍රීඩා උපදෙස් පතයි

ෆවුස් මොහොමඩ්

කොවිඩ් වසංගතය හේතුවෙන් මාස 6කට වැඩි කාලයක් වසා දැමූ මෙරට රග්බි ක්ෂේත්‍රය නැවත පණ ගැන්වීම සඳහා ක්‍රීඩා සහ සෞඛ්‍ය අමාත්‍යාංශවල උපදෙස් ඉල්ලා සිටීමට ශ්‍රී ලංකා රග්බි ආයතනය තීරණය කර ඇත. ලබන ඔක්තෝබර් මාසයේදී අන්තර් සමාජ සත් සාමාජික තරගාවලි 4කින් යළි ක්‍රීඩාව පණ ගැන්වීම රග්බි ආයතනයේ බලාපොරොත්තුව වී තිබේ.

මෙරට රග්බි ක්‍රීඩාවේ අනාගත සැලසුම් පැහැදිලි කිරීමට සහ නව පරිපාලනයේ නිලධාරීන් හඳුන්වාදීමට පසුගියදා කොළඹ නාවික හමුදා 'ලයිට් හවුස් ගැලි' පරිශ්‍රයේ පැවැති මාධ්‍ය හමුවේදී ශ්‍රී ලංකා රග්බි ආයතනයේ නව සභාපති රිස්ලි ඉල්යාස් මහතා මේ බව ප්‍රකාශ කළේය.

රග්බි ක්‍රීඩාව යළි ආරම්භ කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා සිටීමට පෙර ඒ සඳහා නිශ්චිතව සූදානම් විය යුතු බව මෙහිදී ප්‍රකාශ කළ රග්බි ආයතනයේ සභාපතිවරයා, මේ මස 17 වැනිදා ක්‍රීඩකයන් සහ සෙසු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු යොදා ඇතැයි කියා සිටියේය. මෙරට පළමු පෙළ ක්‍රීඩා සමාජ 8ක් සහ කාන්තා ක්‍රීඩා සමාජ 4ක් සහභාගි කර ගනිමින් අදියර දෙකකින් යුතු සත් සාමාජික රග්බි තරගාවලි දෙකක් පැවැත්වීම සැලසුම් වී තිබේ. එහි තරගාවලි කොළඹ, මහනුවර, රදෑල්ල සහ දකුණු පළාත කේන්ද්‍ර කරමින් පැවැත්වීමට ද සැලසුම් කර ඇත.

සත් සාමාජික රග්බි තරගාවලිය කෙටි කාල සීමාවක තරග මුහුණුවරක් බැවින් එය සෞඛ්‍ය අංශයේ කෝවිඩ් නීති රෙගුලාසිවලට අනුකූලව පැවැත්වීම පහසු බව මෙහිදී අදහස් පළ කළ සත් සාමාජික නව තරගාවලි අධ්‍යක්ෂ රංජිත් විරසිංහ මහතා පැවැසීය. එමෙන්ම සත් සාමාජික තරගවලින් නැවැත රග්බි ක්‍රීඩාව ඇරඹීමට තීරණය කරනු ලැබුවේ ඊට සහභාගි වන ක්‍රීඩකයන් ප්‍රමාණය අඩු වීම කෙරෙහි ද අවධානය යොමු කරමින් බව ඔහු කීවේය.

මීට අමතරව ලබන දෙසැම්බරයේදී අවුරුදු 24ත් පහළ 15 සාමාජික තරගාවලියක් පැවැත්වීමට ද අවධානය යොමු වී ඇතැයි මෙහිදී අදහස් දැක්වූ රග්බි ආයතනයේ නියෝජ්‍ය සභාපති නසීම් මොහොමඩ් මහතා ප්‍රකාශ කළේය. එමෙන්ම ඩයලොග් අන්තර් සමාජ ලීග් තරගාවලිය ලබන වසරේ පෙබරවාරියේ ආරම්භ කිරීමට තීරණය වී ඇතැයි ද ඔහු කියා සිටියේය. දැනට මෙරට ස්ථාපිතව ඇත්තේ කාන්තා ක්‍රීඩා සමාජ 4ක් පමණක් බව කී නසීම් මොහොමඩ් මහතා, එම සංඛ්‍යාව 10 දක්වා ඉහළ දැමීම නව පරිපාලනයේ අරමුණ බව ද පැවැසීය.

රග්බි ආයතනයේ ලේකම් ජූඩ් පිල්ලේ, උප සභාපති සහ කාන්තා රග්බි කමිටුවේ සභාපති රියර් අද්මිරාල් එච්.ඒ.යූ.ඩී. හෙට්ටිආරච්චි, විධායක අධ්‍යක්ෂ කෙවින් හර්ෆට් සහ උපදේශක ඩිල්රෝයි ප්‍රනාන්දු මහත්වරු ද මාධ්‍ය හමුවට එක් වූහ.

රග්බි සභාපති රිස්ලි ඉල්යාස් මහතා මාධ්‍ය හමුවේදී. උප සභාපති රියර් අද්මිරාල් එච්.ඒ.යූ.ඩී. හෙට්ටිආරච්චි, තරගාවලි අධ්‍යක්ෂ රංජිත් විරසිංහ සහ නියෝජ්‍ය සභාපති නසීම් මොහොමඩ් මහත්වරු ද මෙහි වෙති.

ඡායාරූපය – රංජිත් අසංක

නයෝමි ඔසාකා අමෙරිකානු කිරුළ දිනයි

අමෙරිකානු විවෘත ටෙනිස් තරගාවලියේ කාන්තා කේවල ශූරතාව දිනා ගැනීමට ජපානයේ නයෝමි ඔසාකා සමත් වූවාය.

මෙය නයෝමි දිනාගත් තෙවැනි ග්‍රෑන්ඩ් ස්ලෑම් කිරුළ වන අතර, දෙවැනි අමෙරිකානු කිරුළයි. මින් පෙර 2018 වසරේදී ඇය අමෙරිකාවේ සෙරිනා විලියම්ස් පරාජය කරමින් ශූරතාව දිනා ගත්තාය.

නිවියෝක්හි පැවැති තරගාවලියේ අවසන් මහ තරගයේදී නයෝමි හමුවේ බෙලරුස් ක්‍රීඩිකා වික්ටෝරියා ඇසරෙන්කා පරාජයට පත් විය. තරගයේ පළමු වටය 1-6ක් ලෙස පහසුවෙන් ජය ගැනීමට ඇසරෙන්කා සමත් වුවද, තරගය අත් නොහැරි නයෝමි දෙවැනි සහ තෙවැනි වට 6-3ක් ලෙස ජය ගනිමින් ශූරතාව දිනා ගත්තාය. අමෙරිකානු තරගාවලියේදී ඇසරෙන්කාට අනුශූරතාව හිමි වූ තෙවැනි අවස්ථාව මෙයයි.

මේ තරගාවලිය අතරතුර අමෙරිකාවේ ජාතිවාදයට සහ පොලිස් ක්‍රියාකාරිත්වයට එරෙහිව විරෝධය පළ කිරීම සඳහා පසුගිය දිනවල පොලිස් වෙඩි පහරින් මිය ගිය පුද්ගලයන්ගේ නම් සහිත මුඛ ආවරණ පැලඳීමට ද නයෝමි කටයුතු කර තිබිණි.

මේ අතර, තරගාවලියේ පිරිමි කේවල ඉසවුවේ අවසන් තරගය අද (14) ඩොමිනික් තීම් සහ ඇලෙක්සැන්ඩර් ස්වෙරෙව් අතර පැවැත්වේ.

ලෝක ටෙනිස් පිටියේ ශ්‍රේණිගත කිරීම්වල තෙවැනි ස්ථානය තීම්ට හිමිව ඇති අතර, ස්වෙරෙව් 7 වැනි පසුවෙයි.

අමෙරිකාවේ ජාතිවාදයට එරෙහිව

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020

Recognizing talent, inspiring greatness.

Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මඟින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මඟින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....

(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)

පාසල : .....

ඔබේ නම : .....

ලිපිනය : .....

ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සහිපතා ත්‍යාග දිනාගන්න.

ප්‍රථම ත්‍යාගය : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-

තෙවන ත්‍යාගය : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-09-19 **අංකය** 28

2020 සැප්තැම්බර් 14 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

■ එන්. පී. රාජදොරේ
රත්නපුර විශේෂ

පොත් 6ක් එළිදැක්වීම අද

රත්නපුර මිහිදු විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයකු වූ සිරි උපුල් ද සිල්වා මහතා විසින් රචිත නවකතා පොත් 6ක් අද (14) සබරගමු ආණ්ඩුකාර විකිරි කොබෑක්ඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර නිලානි ලොජ් ශාලාවේදී සවස 2.00ට එළිදැක්වීමට නියමිතය.

සබරගමු පළාත් සාහිත්‍ය උත්සවයේදී සම්මානයට පාත්‍ර වූ 1997 - උපහාර, 1999 වසරේදී අකීකරු පිලුම් බබා, 2000 වසරේදී - නිදහස යන පොත් සහ නව කථාවක් වන 'ඔවි අපට පුවවන්', කෙටි කථාවක් වන 'නොලැබීම' සහ කවි 16කින් සමන්විත කවි පොතක් ද එළිදැක්වීමට නියමිතව තිබේ.

■ ප්‍රසන්න පත්මසිරි - උඟ පළාත් සමූහ

මාදුරුඔය ලස්සන කරන්න පිටරටින් ආව කුරුල්ලෝ

දිනමිණ දිසත්
දස අත ම එක තැන

මාදුරුඔය ජාතික වනෝද්‍යානයේ විශාල ගසක කුඩු එකොළහක විදේශීය පක්ෂීන් මේ දිනවල රැඳී සිටින බව උද්‍යාන භාරකාර බුද්ධික විදානගේ මහතා පැවසීය. දිවා කාලයේ වනයේ තිබෙන වැව් අමුණු ආශ්‍රිතව කාලය ගත කර රාත්‍රී කාලයේ කුඩුවලට පැමිණෙන මෙම පක්ෂීන් හේතුවෙන් මාදුරුඔය වනෝද්‍යානය අලංකාර වී ඇති බව විදානගේ මහතා වැඩිදුරටත් පවසා සිටියේය.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

ප්ලාස්ටික් බිත්තර දාලා රෝල්ස් හදලා

ප්ලාස්ටික්වලින් නිපදවන ලද කෘත්‍රිම බිත්තර යොදා කෙට්ටු කෑම පිළියෙල කළ වවිනියාව නගරයේ පිහිටි හෝටලයක් නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් පසුගියදා (09) වටලා එහි හිමිකරුට එරෙහිව නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේ.

මෙම හෝටලයෙන් බිත්තර රෝල්ස් ඇණවුම් කොට එය ආහාරයට ගත් පාරිභෝගිකයකුට ඊට දමා ඇති බිත්තර රසය පිළිබඳව සැකයක් මතු වී ඒ ගැන හෝටල් හිමියාට දැනුම් දී ඇත. නමුත් ඔහු ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් පාරිභෝගිකයා මේ සම්බන්ධයෙන් වවිනියාව නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට දැනුම් දී ඇත. වහාම මේ හෝටලයට පැමිණි සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් හෝටලය පරීක්ෂා කිරීමේදී ආහාරවලට යොදා ඇත්තේ කෘත්‍රිම බිත්තර බව හෙළි කර ගැනීමට හැකි වී තිබේ. මේ දිනවල බිත්තරවල මිල ගණන් අධික වීම හේතුවෙන් හෝටල් හිමියා මේ ක්‍රියාව සිදු කරන්නට ඇතැයි විශ්වාස කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඔහුට එරෙහිව නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

මහ රෑ ගෙට ඇවිත් ඇඳේ නිදා සිටි කතකට

පිහියක් පෙන්නා අතවර කරලා

අවිවාහක කාන්තාවකට මරණීය තර්ජන එල්ල කොට බලහත්කාරයෙන් දූෂණය කළ පුද්ගලයකු අධිකරණය හමුවට පැමිණවීමෙන් පසු ලබන 24 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට මූතූර් මහෙස්ත්‍රාත් එම්. සම්සුදීන් මහතා පසුගියදා (10) නියෝග කළේය.

මෙලෙස රිමාන්ඩ කරන ලද්දේ සේරුනුවර පොලිස් බල ප්‍රදේශයට අයත් සෝමපුර සිරිමංගලපුර ප්‍රදේශයේ පදිංචි 38 හැවිරිදි දෙදරු පියෙකි. අතවරයට පත්ව ඇත්තේ ගොඩකවෙල ප්‍රදේශයේ සිට සේරුනුවර සිරිමංගලපුර ප්‍රදේශයට පැමිණ නිවෙසක් කුලියට ගෙන කන්තලේ අඟලුම් හලක සේවය කරමින් සිටි 30 හැවිරිදි අවිවාහක කාන්තාවකි. ඇය පොලීසියට පවසා ඇත්තේ සිද්ධිය වූ 8 වැනිදා රාත්‍රී 11ට පමණ නිදාගත් බවත් රාත්‍රී 12ට පමණ ඇඟට යම් බරක් වැටෙනවා සේ දැනුණු බවත් පසුව කරුවලේම යම්කිසි පුද්ගලයකු තමා ඉදිරියේ පිහියක් වැනි යමක් දික්කරගෙන සිටිනු දුටු බවත්ය. පසුව ඇය ඔහුගේ ඇඟට පැන පොරබඳා ඇති අතර එහිදී පිහිය පසෙකට විසි වූ බවත් එකෙනෙහිම එම පුද්ගලයා තමාට මරණීය තර්ජන එල්ල කොට තමා ග්‍රහණයට ගෙන දූෂණය කොට නික්ම ගිය බවත් වැඩිදුරටත් පොලීසිය හමුවේ ප්‍රකාශ කර තිබේ.

කාන්තාව බියට පත් කළ කුඩා පිහියේ මිට 'සිවා' නමැති නිල සුනඛයාට ඉව කරවීමෙන් අනතුරුව වහා ක්‍රියාත්මක වී සිද්ධිය වූ නිවෙසට නිවාස 2කට පමණ එහායින් තිබූ නිවෙසකට ගොස් නැවතී ඇති අතර එම අවස්ථාවේ එහි කිසිවකු සිට නැත. පසුව වසා තිබූ නිවෙසේ නිවැසියන් පිළිබඳව කඩිනමින් තොරතුරු සොයාගත් පොලීසිය සෝමපුර ප්‍රදේශයේ නිවෙසක සැඟවී සිටිය දී සැකකරු අත්අඩංගුවට ගෙන මෙසේ අධිකරණය හමුවට පමුණුවා තිබිණි.

කන්තලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ධම්මික වීරසේකර මහතාගේ නියෝග මත සේරුනුවර පොලිස් ස්ථානාධිපති ආනන්ද හේරත්, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂ එස්. අයි. කුමාරරත්න, පොලිස් සැරයන්වරුන් වන බණ්ඩාර (42348), මංජුල (390150), පොලිස් කොස්තාපල්වරුන් වන හරිස්චන්ද්‍ර (83026), විජිත (68871), කාන්තා පොලිස් කොස්තාපල් නිරෝෂණි යන නිලධාරිහු සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වති.

■ රූපිකා කේ. බණ්ඩාර - කුරුවිට සමූහ

රෝස්මේරිවත්ත හයදෙනකුගේ උරුමයක් කරගෙන

රක්වාන, රෝස්මේරිවත්ත රක්ෂිතය අනවසරයෙන් කැලෑ කපා විනාශ කිරීම හේතුවෙන් මහා පරිසර විනාශයක් සිදු වන බව ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත ගුණතිලක මහතා පෙන්වා දෙයි.

කොලොන්න, රක්වාන හා ගොඩකවෙල සභා බල ප්‍රදේශවලට අයත්ව පවතින මෙම රක්ෂිතය සංවේදී කලාපයක් බවත් පෞද්ගලික ඉඩමක් බවට පත්කර ගනිමින් 6 දෙනකු විසින් වසර ගණනාවක සිට අයිතිවාසිකම් කියමින් මෙසේ කැලෑ කපා එළිපෙහෙළි කිරීම් සිදු කරන බවත් ඔහු පැවසීය. රක්ෂිත ප්‍රදේශයේ ජල මූලාශ්‍ර යොදා ගනිමින් පානීය ජල ව්‍යාපෘති රැසක්ම ක්‍රියාත්මක වන අතර මධ්‍යම පරිසර අධිකාරිය සඳහන් කරන්නේ මෙම රක්ෂිතය ජලපෝෂිත වටිනාකමකින් මෙන්ම වනාන්තර වැදගත්කමකින්ද යුතු බවත් සංවේදී ප්‍රදේශයක් ලෙස ගැසට් කළ හැකි බවත්ය.

■ එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

මුහුණුපොත් සාදයේ තරුණයන්ට දඩ

මුහුණුපොත හරහා සංවිධානය කර තිබූ සාදයක් වටලා කේරළ ගංජා සමඟ අක්මීමණ පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රිමාන්ඩ් බන්ධනාගාර ගතකොට පසුව ඇප මත මුදාහැර සිටි තරුණයන් 26 දෙනා සහ තරුණියන් දෙදෙනා ඇතුළු 28දෙනාගේ නඩුව පසුගියදා (09) කැඳවීය.

එම අවස්ථාවේ අධිකරණයේ පෙනී සිටි විසිපස් දෙනාගෙන් උසස් අධ්‍යාපනය ලබන සිසුන් පස්දෙනාට රුපියල් 1500 බැගින් රජයේ ගාස්තුවක් ගෙවීමටත් අනෙක් විසිදෙනාට එක් අයකුට රුපියල් පන් දහස බැගින් දඩ මුදල් ගෙවීමටත් ගාල්ල ප්‍රධාන මහෙස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා නියෝග කළේය.

■ මහානාම විතානගේ - මල්වාන සමූහ සහ
සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

මුස්ලිම් අධ්‍යාපනය නඟාසිටුවීමට සාකච්ඡාවක්

ගම්පහ දිස්ත්‍රික්කයේ විවිධ ක්ෂේත්‍රයන්හි නියැළී සිටින මුස්ලිම් විද්වතුන් පිරිසක් එක් වී ගම්පහ දිස්ත්‍රික්කයේ මුස්ලිම් අධ්‍යාපන කටයුතු නඟාසිටුවීම පිළිබඳව මූලික සාකච්ඡාවක් පසුගියදා (09) පස්වරුවේ මල්වානේදී පවත්වන ලදී.

මල්වාන අල් මුසීන්ත් අධ්‍යාපන ආයතනයේ අධිපති අල්හාජ් එම්. එම්. ඒ. ස්මයිල් මහතා විසින් මෙය සංවිධානය කර තිබිණි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්, ආසියානු සංවර්ධන බැංකුවේ හා ආසියානු ඵලදායිතා ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක මහාචාර්ය එම්. තිලකසිරි යන මහත්වරුන් විසින් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ පැමිණ සිටි පිරිස දැනුම්වත් කෙරිණි. මෙ සාකච්ඡාවට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර කොමසාරිස් එම්. ආර්. රහුමාන්, විභාග දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය කොමසාරිස් ඒ. එස්. මොහොමඩ්, හිටපු මැතිවරණ නියෝජ්‍ය කොමසාරිස් එම්. එම්. මොහොමඩ්, ගුරු උපදේශක එම්. ආසීම් හා හිටපු රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ඒ. හිල්මි මොහොමඩ් යන මහත්වරු ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

■ ඒ්. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

ධීවරයන්ට දෙන්න ගෙනා මත් පෙති අල්ලයි

බහුදින ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයන් සඳහා අලෙවි කිරීමට සන්තකයේ තබාගෙන සිටි මත් පෙති හා කේරළ ගංජා තොගයක් පසුගියදා (09) සොයා ගැනීමට ත්‍රිකුණාමලය කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය ඒකකයේ පොලිස් නිලධාරීන් සමත් වී තිබේ.

මත් පෙති 68ක් හා කේරළ ගංජා මිලිග්‍රෑම් 24,000ක් සමඟ මෙලෙස සැකකරුවන් තිදෙනකු පොලිස් අත්අඩංගුවට පත් වී ඇති අතර සැකකරුවන් මත් පෙති ගංජා සමඟ වැඩිදුර පරීක්ෂණ සඳහා ත්‍රිකුණාමලය මූලස්ථාන පොලිසියට භාර දී තිබේ.

කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උදය හේමන්ත මහතාගේ උපදෙස් මත ත්‍රිකුණාමලය කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක අයි. එම්. ආර්. බණ්ඩාර, සැරයන් (60250) ප්‍රියංකර, කොස්තාපල්වරුන් වන (8265) කුමාර, (89029) රමේෂ්, (17480) චතුර යන නිලධාරිහු මෙම වැටලීමට එක් වූහ.

■ විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

උපාධිධාරී රැකියාලාභීන්ට මනෝ උපදේශන

උපාධිධාරීන්ට රැකියා දීමේ රජයේ වැඩපිළිවෙළ යටතේ අභ්‍යාසලාභී පුහුණුව සඳහා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට උපාධිධාරීන් 82ක් පසුගියදා බඳවාගෙන තිබේ.

ඔවුන් සඳහා මනෝ විද්‍යා උපදේශනාත්මක වැඩසටහනක් අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. අතුරලිය ප්‍රාදේශීය ලේකම් නිරෝෂා ගමගේ මහත්මියගේ උපදෙස් සහ මඟපෙන්වීම මත මෙම උපදේශන වැඩසටහන පැවැත් වූ අතර මනෝ විද්‍යා උපදේශක නිලධාරී දිසාර බුද්ධික මහතා සම්පත් දායකත්වය සපයන ලදී.

■ ඒ්. පී. දයාචන්ද්‍ර
උඟරුබොක්ක විශේෂ

විදුලිසැර වැදී අයෙක් මරුට

මොරවක පොලිස් වසමේ මොරවක වත්ත ප්‍රදේශයේදී විදුලිසැර වැදීමෙන් පුද්ගලයකු පසුගියදා (09) රාත්‍රී මියගොස් තිබේ.

මොරවක වත්තේදී මෙම පුද්ගලයාට විදුලිසැර වැදී ඇති අතර එහි වතු නිවාස පේළියකට ඇද තිබූ වයර් දෙකක් ගැලවී තිබී නැවත සම්බන්ධ කිරීමට යෑමේදී මෙම පුද්ගලයාට විදුලිසැර වැදී ඇති අතර එම අවස්ථාවේදීම විදුලිසැර වැදුනු පුද්ගලයා මොරවක කොස්නිල්ගොඩ ප්‍රාදේශීය රෝහලට රැගෙන යෑමෙන් අනතුරුව මිය ගොස් ඇත. මිය ගිය පුද්ගලයා තිස්පහස් හැවිරිදි එක්දරු පියකු වන අතර මොරවක අලුවනවත්ත ප්‍රදේශයේ පදිංචිව සිටි අයෙකි.

■ ඒ්. ඒ. ඒ්. ඒ්. ඒ්

දිනමිණ
දිසත
දස අත ම එක තැන

■ සුනේත්‍රා වන්නි ආරච්චි - කළුතර දකුණ විශේෂ

අසරණ මිනිස් ජීවිතවලට සහන සරණ සංගමයෙන් අත්වැලක්

භාරකාර දෙපාර්තමේන්තුව මඟින් එකල පාලනය වූ රිච්මන්ඩ් කාසල් ආයතනයේ පාලකයා ලෙස පැමිණි එම්. ආරියදාස මහතා එම රාජකාරියෙන් නොනැවතී වැඩිදුර ඉගෙනීම සඳහා ජපානයට ගොස් පැමිණියේ ගම්වැසියන්ගේ පමණක් නොව රටවැසියන්ගේම පිනකට බව නොකියාම බැරිය. ඔහුගේ පාලන කාලය තුළදී රිච්මන්ඩ් කාසල් ආයතනයේ නොමිලයේ පවත්වාගෙන ගිය ළදරු පාසලෙන් උගත් අය අද සමාජයේ උසස් තැන්වල සිටින අතර සමහරුන් වෙනත් රටවල පවා ගොස් සේවයේ යෙදෙති. එහි අසරණ දරුවන් වෙනුවෙන් ළමා නිවාසයක්ද තිබූ අතර අද ඒවා එකක්වත් දක්නට නොමැත. ආරියදාස මහතා එයින් විශ්‍රාම ගියද සරණක් අවැසි අය සහ අසරණ දරුවන් වෙනුවෙන් කරනා සේවය නැවැත්තුවේ නැත. ශාස්ත්‍රපති පලාතොට පඤ්ඤානන්ද හිමියන් පවසන අයුරින් අසරණ දරුවන්ගේ දුක ඔහුගේ ජීවයට කාවැදී ඇතුවා සේය. ඔහුගේ පරම පැතුම වී ඇත්තේ අසරණයන්ට සේවය කිරීමය. ඒ සඳහා ගමේ ක්‍රියාශීලී ගමට වැඩදායී කිහිප දෙනෙකු එකතු කොට ගෙන සහන සරණ නමින් සමාජ සේවා සංගමයක් පිහිටුවා ගන්නා ලදී. එමගින් දැනට කර ඇති සේවා අති මහත්ය. මේ සියල්ල වෙනුවෙන් නොමසුරු ආධාර සපයනු ලබන්නේ ජපානයේ Japan National Council of Social Welfare ආයතනයයි. එමඟින් රෝද පුටු ගෙන්වා ගෙන දිවයින පුරා අත - පය අහිමි ආබාධිත අය වෙනුවෙන් රෝද පුටු 2700කට වඩා වැඩි ප්‍රමාණයක් බෙදා දී ඇත. පූර්ණ ආබාධිත හතර දෙනෙකු වෙනුවෙන් ස්වයංක්‍රීය පුටු ලබා දී ඇත. සුනාමියෙන් ගේ-දොර පවා අහිමිව බහුකාර්ය වඩු කාර්මික යන්ත්‍රයද අහිමි වූ වඩු කාර්මිකයකු වෙනුවෙන් වටිනා වඩුකාර්මික යන්ත්‍රයක් පරිත්‍යාග කර ඇත. සුනාමියෙන් අසරණ වූ කළුතර පාසල් දරුවන් දස දෙනෙකු සඳහා පාපැදි 10ක් පිරිනමා ඇත. පාසල් දරුවන්ට ක්‍රීඩා ඇඳුම් කට්ටල, සහ සපත්තු ද පිරිනමා ඇති අතර, කොහොලාන පාසලේ විනෝද චාරිකාවක් සඳහා රුපියල් විසි දහසක මුදලක් ලබාදී ඇත. කළුතර ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුලක් සඳහා නිවෙසක්ද ඉදිකර දී ඇත.

■ ලාහුගල ගයාන් චින්තක

ආරුගම්බේ වෙරළ මුහුදටම සින්න වෙයිද?

පරාක්‍රම ගුණසේකර-සූරියවැව සමූහ.

පොතුවිල් ආරුගම්බේ මුහුදු වෙරළ දැඩි ලෙස බාදනයට ලක් වීමට පටන් ගෙන තිබේ. ඒ ආසන්නයේ ගොඩනැSලි මෙන්ම ගස්ද විශාල ලෙස බදනයට ලක්ව ඇති බව ප්‍රදේශවාසීහු පවසති. සුන්දර වෙරළ තීරය මේ වන විට විශාල වශයෙන් බාදනයට ලක් ව තිබේ.වෙරළ තීරයේ ඇති විශාල ගස් තාප්ප වෙළෙඳ සල් ධීවර කටයුතුවල නියැළෙන අයගේ බෝට්ටු තබා ගැනීමට මුහුදු වෙරළක් නොමැති තරමට බාදනය වී ඇති අයුරු දක්නට හැකිය.මේ බාදන තත්ත්වය වාර්ෂිකව සිදු වන අතර මාසයක් පමණ යන විට සමාන්‍ය තත්ත්වයට පත් වෙයි.නමුත් මෙවර මාස 10කට අධික කාලයක් වන අතර එන්න එන්නම බාදනය වැඩි වන අයුරු දක්නට ලැබේ. දැනට මීටර 50කට වැඩි ප්‍රමාණයක් බාදනය වී ඇත .හොටෙල් සීමාවන්වල ඉදිකර තිබු බැම් වෙරළෙ තිබු විශාල ගස් ගැල වී ගසාගෙන ගොස් ඈතක ඇති අතර ධීවරයන්ගේ ධීවර බෝට්ටුද ගසා ගෙන ගොස් ඇති බව ධීවරයෝ කීහ. වගකියයුතු අංශ දැනුවත් කරනු ලැබුවත් මෙතෙක් කිසිදු අවදානයකට ලක් කර නොමැති බවද ධීවරයෝ කියති.

■ මහානාම ගලහිටියාව - මහනුවර උතුර විශේෂ

පාර්ලිමේන්තු ගිය නවක මන්ත්‍රීවරුන්ට අකුරණ ප්‍රාදේශීය සභාවෙන් සුබපැතුම්

2020 පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා ඉදිරිපත් වී මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ජයග්‍රහණය කොට නව පත්වීම් ලැබූ ඇමැතිවරුන්ට සහ මන්ත්‍රීවරුන්ට සුභාසිංසන පළකිරීමේ යෝජනාවක් අකුරණ ප්‍රාදේශීය සභාව ඒකමතිකව සම්මත කළේය. සභාපති අයි.එම්.ඉස්තිහාර් මහතාගේ ප්‍රධානත්වයෙන් අලවතුගොඩ ප්‍රාදේශීය සභා සංකීර්ණ රැස්වීම් ශාලාවේදී මේ රැස්වීම පැවැත්විණි.

අමර්ජීව ඉන්ද්‍රකුමාර (ශ්‍රී ලං.පො.පෙ.) මහතා - මේ යෝජනාවට පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරු අදහස් දැක්වීම පිළිබඳ ස්තුතියි. පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණතිලක රාජපක්ෂ මහතා සමඟ එක්වී අකුරණ බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා කටයුතු කරමු.

එස්.එම්.ටී. ද අල්විස් (එ.ජා.ප.) - ගුණතිලක රාජපක්ෂ මහතාට මා සුබ පතනවා. හාරිස්පත්තුව ආසනයට සිංහල මන්ත්‍රීවරයෙක් පත්වීම පිළිබඳ සතුටු වනවා. ඔහු සමඟ එකතු වී අකුරණ බල ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා කටයුතු කළ හැකියි.

සභාපති අයි.එම්. ඉස්තිහාර්, ගාමිණී වසන්ත කුමාර, චමින්ද තිලකරත්න, සරත් අමරකෝන් (උප සභාපති), ඒ.ආර්.එම්. ෆරූක්, සිරිමල් විජේතුංග , එස්.ඒ.එම්.මුෆීද්, අනුරුද්ධ කුමාර ජයසුන්දර යන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සහ නිල්මිණි දමයන්තී මන්ත්‍රීවරියද මෙහිදී සුභාසිංසන එක් කරමින් කතා කළහ.

■ පී.මද්දුමගේ - මාවරල සමූහ

දෙයියන්දර උසාවියේ ලේඛනාගාරයට වහලෙන් පැන ලිපිගොනුවලට ගිනි තියලා

දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාර වහලයෙන් ඇතුළු වී ලිපි ගොනුවලට ගිනි තබා විනාශ කිරීමේ චෝදනාවට සැකපිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි සැක කරුවන් පසුගියදා අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ යළි ලබන 17 වැනි දින දක්වා නැවත රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට දෙයියන්දර මහේස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු ලුෂාකා කුමාරි ධර්මකීර්ති මහත්මිය නියම කළාය. මෙහිදී පළමුවන සැකකරු වෙනුවෙන් කිසිම නීතිඥවරයෙක් පෙනී නොසිටියහ. දෙවන සැකකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ප්‍රසන්න කොඩිතුවක්කු මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේ ,පළමුවන සැකකරු විසින් මේ දෙවන සැකකරු සිද්ධියට අදාළ බවට ප්‍රකාශ කර ඇත්තේ පෞද්ගලික අමනාපයක් මත බවත්, නියම කරනු ලබන ඕනෑම ඇප කොන්දේසියක් පිළිගැනීමට සූදානම් බවත්,එම නිසා දෙවන සැකකරුට ඇප ලබා දෙන ලෙසත් ඉල්ලීය. එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ මහේස්ත්‍රාත්වරිය සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියම කළාය. මෙසේ රක්ෂිත බන්ධනාගාර ගත වූයේ ,හක්මන පොලිස් වසමේ දේවාලෙගම පදිංචි, නම්මුනි විදාන කංකානම්ගේ ප්‍රියන්ත නොහොත් ඇච්චා සහ දෙයියන්දර පොලිස් වසමේ පදිංචි වන්නිපුරගේ රත්නසිරි නමැති දෙදෙනාය.

පැමිණිල්ල වෙනුවෙන් දෙයියන්දර පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුදේශ් නාලක මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් අධිකරණයට කියා සිටියේ පළමු සැකකරු ගැන සොරකම් හා මංකොල්ල කෑම් පිළිබඳ තොරතුරු ඇති බවත්, සිද්ධියට සම්බන්ධ රසපරීක්ෂක වාර්තා මෙතෙක් ලැබී නොමැති බවත්ය.

■ ඒ.එම්.සරත් කුමාර - බිංගිරිය මධ්‍යම සමූහ

බිංගිරිය කඳුරුවැව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ පිරිත් පින්කමෙන්...

ශ්‍රී ලංකාවාසි ජනතාවට සෞභාග්‍ය හා සෙත් ප්‍රාර්ථනා කරමින් බිංගිරිය කඳුරුවැව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේදී පසුගියදා සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පැවැත්විණි.බිංගිරිය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරි හා කඳුරුවැව ශ්‍රී සුදර්ශනාරාමාධිපති රත්මල්වල රේවත හිමියන්ගේ අනුශාසනා පරිදි විහාරස්ථ දායක සමිතිය විසින් මේ වැඩසටහන සංවිධාන කර තිබිණි.

■ සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ සමන්තා කංකානම්ගේ

දියවැඩියාව පාලනයට විශේෂ තේ පානයක්

සබරගමුව විශ්වවිද්‍යාලයේ පර්යේෂණයක ප්‍රතිඵලයක්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් ස්වාභාවික ඖෂධ ඇසුරෙන් දියවැඩියාව පාලනය කිරීමේ පානයක් ලෙස නිපදවූ ඩයබිටි තේ ෆැඩ්නා වෙළෙඳ නාමය යටතේ ෆුඩ් ඇන්ඩ් නේචර් සමාගම සමඟ අත්වැල් බැඳගනිමින් වෙළෙඳ පොළට හඳුන්වා දීම පසුගියදා එම විශ්වවිද්‍යාලයේ දී සිදු කෙරිණි. ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපති මෙන්ම ආහාර හා පෝෂණ විද්‍යා මහාචාර්යවරයෙක් වන උදය රත්නායක මහතාගේ අධීක්ෂණයෙන් ආචාර්යවරු හා සිසුන් කණ්ඩායමක් එක්ව මේ දියවැඩියාව පාලනය කිරීම සඳහා වූ තේ නිෂ්පාදනය සිදුකර ඇත. මේ පර්යේෂණ හා නවෝත්පාදන ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකු මූල්‍යාධාර මත AHEAD ව්‍යාපෘතිය මඟින් සිදුකර ඇති අතර එහි අධීක්ෂණය මහාචාර්ය තුසිතා අබේතුංග මහත්මිය විසින් සිදුකර තිබේ.

මෙම අවස්ථාවට ෆුඩ් ඇන්ඩ් නේචර් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ චාමේන්ද්‍ර සෝමතුංග මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දර්ශන පෙරේරා මහතා ඇතුලු කණ්ඩායම සහභාගී වූ අතර විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති මහාචාර්ය අතුල ඥාණපාල, මහාචාර්ය යසරත්න අමරසිංහ, මහාචාර්ය ඉඳුනිල් දයාරත්න, ආචාර්ය නාමල් පෙරේරා, ආචාර්ය කපිල රත්නායක, ආචාර්ය රසාංගිකා සබරගමුව යන මහත්ම මහත්මීහු එක්ව සිටියහ.මහාචාර්ය උදය රත්නායක මහතා මෙහිදී කියා සිටියේ පරිණාමවාදයේ පියා ලෙස සැලකෙන චාල්ස් ඩාවින් පැවසූ ලෙස ලෝකයේ ඉතිරි වන්නේ ශක්තිවන්තයන් නොවන බවත් පරිසරයේ වෙනස්වීමට වෙනස්විය හැකි ජීවීන් පමණක් බවත් ඒ කියමන මිනිසාගේ ක්‍රියාදාමයන් අනුව අදට ගැලපෙන ලෙස එම රටාවන්ට අනුව සෞඛ්‍ය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන්ට අනුගත වියයුතු බවයි. ඒ අනුව විශ්වවිද්‍යාලයන් කොතරම් පර්යේෂණ සිදු කළත් ඒවා පර්යේෂණ පත්‍රිකා ලෙස ඉදිරිපත් කළත් එම සොයා ගැනීම් පුස්තකාලයක නිබන්ධන ලෙස පවතින අතර පරිශීලනයට පමණක් සීමා වන අතර එම සොයා ගැනීම් භාවිතයට ගැනීමට නම් මෙවැනි ව්‍යවසායකයන් තුළින් එහි ප්‍රයෝජනය මහජනතාව වෙත ලබාදිය යුතු බවයි. මේ නිෂ්පාදනය දියවැඩියාව ඇති අයට මෙන්ම දියවැඩියාව නොමැති අයටද භාවිතා කළ හැකි බව මහාචාර්ය උදය රත්නායක මහතා පැවැසීය. දියවැඩියාව පාලනය කිරීමට මේ පානය තුළින් හැකි බව විද්‍යාත්මක පර්යේෂණ රාශියක් සිදුකර තහවුරු කිරීමෙන් අනතුරුව මේ නිෂ්පාදන මහජනයා වෙත ඉදිරිපත් කිරීමේ නිල වාණිජ සහකරු ලෙස ඉහත කී සමාගම ඉදිරිපත්ව සිටියි. ඉදිරියේදී මේ නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට නියමිත බව සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ චාමේන්ද්‍ර සෝමතුංග මහතා පවසයි.

■ ධම්දාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

දරුවන් හැදුවේ රජ සැප දීලයි ලෙඩ වූ පසු හිමිවුණේ මහ පාරයි

වයස අවුරුදු හැත්තෑවක් පමණ වූ වයෝවෘද්ධ වැඩිහිටියෙක් පසුගිය දිනෙක අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට ඇති ත්‍රිරෝද රථ ගාලට ගෙනැවිත් දමා ගොස් තිබේ.කෙසේ වුවද මොහු ගැන විස්තර සොයා බැලූ ත්‍රිවිල් රථ ගාලේ සිටි පිරිස් මොහුට කෑම බීම ලබාදුන් අතර එදින සිට ඔහුගේ නවාතැන එම ස්ථානය විය. මෙසේ මහ පාරට වැටුණේ දියණියන් තිදෙනකුගේ පියකු වූ ඇල්මන් දේවින්ද (72) නමැත්තෙකි. රන්දොඹේ ප්‍රදේශයේ පදිංචිව සිටි මොහු පෙදරේරුවකු ලෙස කටයුතු කර ඇති අතර අංශභාග රෝගයෙන් පෙළෙන්නෙකි. ඔහු පවසන්නේ මෙවැන්නකි. මට අංශභාගෙ හැදුණට පස්සේ දූලා සලකන්නේ නැතුව ගියා. මුණුබුරොත් එහෙමයි. පස්සෙ මම ත්‍රිවීල් එකක දාල අම්බලන්ගොඩට එව්වා. කරන්න දෙයක් නැති නිසා අම්බලන්ගොඩට ආවා. මගේ දුක කියන්න කෙනෙක් නෑ. පස්සේ මේ ත්‍රිවිල් රථ මහත්වරු තමයි මට දරුවො උණේ. මට තුන් වේලම කන්න දෙනවා. මා ගැන සොයා බලනවා. ඒ නිසා මම මෙතනම ඉන්නවා. යන්න තැනක් නෑ. මට වැඩිහිටි නිවාසයකට යන්න හදලා දෙනවා නම් ලොකු පිනක්.

රියැදුරෙකු මෙසේ කීය. මේ සීයා කන්න දෙයක් නැතිව ඇවිත් කලන්තේ දාලා වගේ හිටිය. අපි වතුර දීලා විස්තර ඇහුවම දැනගත්තා දරුවන් සලකන්නේ නැතුව ගෙනත් දාලා කියලා. ඊට පස්සේ අපි තුන් වේලම කන්න බොන්න දෙනවා. අපි ඇඳුම් පැළඳුම් ටිකත් අරන් දීලා කොන්ඩෙ කපලා පිරිසුදු කරන්න කටයුතු කරනවා. මේක අපි කරගත්ත පිනක් කියලයි අපි හිතන්නේ. මේ සලකගන්නෙ අපිටමයි. කොහොම වුණත් මේ සීයා වැඩිහිටි නිවාසයකට රැගෙන යනවා නම් හොඳයි. මෙතන අව්වට වේලෙනවා වැස්සට තෙමෙනවා. මෙයාගෙ දරුවන් ගැන සොයා බලා නීතිමය පියවරක් ගැනීමට අදාළ අංශවල අවදානය යොමු විය යුතුයි.

■ ඩබ්ලිව්.පී.ධර්මසේන - මාතර සමූහ

නිදාසිටි තරුණයාට ආයුධයකින් පහර දීලා

මවත් සමඟ නිවෙසේ නිදාසිටි තරුණයකුට තියුණු ආයුධයකින් පහරදී බරපතළ තුවාල සිදු කිරීමේ සිද්ධියක් වැලිගමින් වාර්තා වේ.පසුගිය 09 වැනි දින අලුයම් කාලයේ මිදිගම කළපුව නුගහකොරටුව නමැති ස්ථානයේ නිවෙසක් තුළ සිදුවී ඇති මේ සිද්ධියෙන් බරපතළ තුවාල සහිතව මාතර මහ රෝහලට ඇතුළත් කර ඇත්තේ රන්මුතුගේ විජේසේන නැමති 29 හැවිරිදි ඇයෙකි. 08 වැනි දින රාත්‍රියේ මේ තුවාලකරු මව සමඟ නිවෙසේ නිදා සිට ඇති අතර 09 වැනි දින අලුයම මවට ඇසී ඇති කෙඳිරිලි හඬක් නිසා මව ඇවිත් බලන විට පුතාගේ මුහුණින් ලේ ගනවා දැක අසල්වාසීන්ගේ සහායෙන් තුවාලකරු මාතර මහ රෝහලට ඇතුළත් කර ඇත. තුවාලකරුගේ තත්ත්වය බරපතළ හෙයින් ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට නොහැකිවී අති බව පොලීසිය පවසයි. සිද්ධිය පිළිබඳ වැලිගම පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

කතරගම වළේ පාර්ක් එක වළටම යවනවාද?

■ කේ. ඩී. දේවප්‍රිය - කතරගම සංචාරක

වතුරත් නෑ: වැසිකිළිත් නෑ: මහ රෑට අඳුරේ

පසුගිය යහපාලන රජය විසින් කතරගම නගරයේ අනවසර වෙළෙඳුන් සඳහා සාදවන ලද කඩ ව්‍යාපෘතියක් ජනතාව ප්‍රතික්ෂේප කිරීම මත අති විශාල මුදලක් දරා සෑදූ කඩ සංකීර්ණ රැසක් හානියට ලක්වෙමින් පවතී. 2012 වර්ෂයේ දී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් කතරගම නගරය සහ සෙල්ලකතරගම නගර සංවර්ධනයට රුපියල් මිලියන 300කට ආසන්න මුදලක් අනුමත කර තිබිණි .කතරගම නව නගර සංවර්ධනය සඳහා යොදවා තිබූ අතර පසුව යහපාලනය රජය විසින් මේ මුදල් නිසි ලෙස උපයෝගී කර නොගෙන අවිධිමත් අයුරින් මේ කඩ සාදා තිබේ. කතරගම වළේ පාක් (රථගාල) ලෙස හැඳින්වෙන මේ කඩ කතරගම නගරයේ අවිධිමත් ලෙස සිටි අනවසර වෙළෙඳුන් වෙනුවෙන් සාදා ලබා දීමට පියවර ගෙන තිබේ. මේ වනවිට මේ කඩ ලබා ගැනීම වෙළෙඳුන් ප්‍රතික්ෂේප කර ඇති අතර පිරිසක් කඩ සඳහා රුපියල් ලක්ෂ තුනකට ආසන්න මුදලක් ගෙවා ලබා ගෙන තිබුණත් මේ ස්ථානය වෙත බැතිමතුන් නොපැමිණීම මත කිසිදු ආදායම් නැති තත්ත්වයකට පත්ව ඇති බව දැනට සිටින වෙළෙඳුන් මැසිවිලි නඟති. 2016දී මේ වළේ රථ ගාල සඳහා රුපියල් මිලියන 60ක් පමණ වියදමක් දරා කඩ 70කට ආසන්න ප්‍රමාණයකින් යුතුව සාදා තිබේ. මේ වනවිට කඩ 14ක් පමණක් විවෘත ඇති මුත් මේ කඩ සංකීර්ණය සඳහා ජලය, වැසිකිළි පහසුකම් නොමැති අතර පහත් භූමියක පවතින කඩ වැසි සමයේ දි ජලයෙන් යට වීම නිරන්තරයෙන් සිදු වෙමින් පවතී. රථ ගාලක් ලෙස මෙම ස්ථානය හැඳින් වුවත් පියගැටපෙළවල් නොමැති නිසා පැමිණීමට නොහැකි වී තිබේ. අවට වල් බිහි වීමත් මුල් කර ගෙන වන්දනා බැතිමතුන් මෙම රථ ගාල වෙත සිය වාහන නවතා තැබීම ප්‍රතික්ෂේප කිරීම නිසා මෙම කඩ මිල දි ගත් පිරිස් දැඩි අපහසුතාවට පත්ව සිටිති. මේ කඩ 30 අවුරුදු බදු ලෙස වෙළෙඳුන් වෙත ලබා දී ඇති අතර වෙනදා මාසයකට රුපියල් 500 ගෙවුමක් කළ වෙළෙඳුන්ට මේ වනවිට රුපියල් 7000ක කුලියක් ගෙවීමට සිදුව ඇතැයි වෙළෙඳුන් පවසති.

උකුස ඇසා
ukusuase@lakehouse.lk

■ හැටන් මධ්‍යම විශේෂ

හැටන් කොළඹ මාර්ගයේ කුයිල් වත්ත නාය යෑමේ තර්ජනයක

මධ්‍යම කඳුකරයට පවතින වැසි තත්වයන් සමඟ හැටන් කොළඹ ප්‍රධාන මාර්ගයේ කුයිල් වත්ත ප්‍රදේශයේ මාර්ගයේ කොටසක් නැවත නාය යෑමේ තර්ජනයකට ලක්ව ඇත.

මෙම මාර්ග කොටස මෙයට වසර දෙකකට පමණ පෙරද මෙසේ නාය යෑමේ තර්ජනයකට ලක් වුවද එම අවස්ථාවේ එම මාර්ග කොටසට තාවකාලික පිළියම් යෙදුවද දැනට පවතින වැසි සමඟ එම ස්ථානය නැවත නාය යෑමේ තර්ජනයකට මේ වන විට ලක්ව ඇත.

මේ පිළිබඳව අදහස් දක්වන එම ප්‍රදේශයේ ජනතාව මෙන්ම රථ වාහන රියදුරන් කිප දෙනකුම පවසන ලද්දේ මෙම ස්ථානය මෙයට පෙර නාය යෑමකට ලක් වූ අවස්ථාවේදී එම ස්ථානය තාවකාලිකව පිළිසකර කළද එයට පසු එම ස්ථානය නිසි ලෙස සකස් කිරීමට කිසිදු පියවරක් නොගත් බවත්ය.

එම මාර්ගයේ තාවකාලිකව යොදන ලද පැලැස්තර දැමූ ස්ථානද මේ වන විට පුපුරා ඇති අතර එම ස්ථානයේ විශාල නාය යෑමකට පෙර එම ස්ථානය නිසි ලෙස සකස් කර දීමට අදාළ බලධාරීන් කඩිනමින් පියවර ගත යුතු බවද ඔවුන් වැඩි දුරටත් පවසන ලදි.

■ පේරාදෙණිය සමූහ

පේරාදෙණිය සරසවියෙන් අරලගංවිලට ජල පෙරන යන්ත්‍ර

පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය රොටරැක්ට් සමාජය මඟින් සංවිධාන කරනු ලබන ප්‍රධාන ව්‍යාපෘතියක් වන Reach For Water සමාජ සත්කාර වැඩසටහනේ 2019 වර්ෂයේ පැවති තෙවැනි අදියරේ ප්‍රධාන කාර්යය වූ RO ජල පෙරන යන්ත්‍රය(RO Water Plant) පසුගිය දා පොලොන්නරුව, අරලගංවිල, ගල්එළිය D3 ගම්මානයේදී ජනතා අයිතියට පත්කෙරුණි.

මෙම Reach For Water සමාජ සත්කාර ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත මූලික කරගනිමින් ජන ජීවිතවලට අඳුරු පැතිකඩක් විවර කරමින් පැතිරියන හඳුනා නොගත් වකුගඩු රෝගයෙන් පීඩා විඳින හා අවදානම් සහිත ජනතාව ජීවත්වන ජල පෙරන යන්ත්‍ර සපයාගැනීමට අපහසු දුෂ්කර ප්‍රදේශ ඉලක්කකර ගනිමින් ඔවුන්ට පිරිසුදු ජලය ලබාගැනීමට අවශ්‍ය ජලපෙරන යන්ත්‍ර සපයා දීමයි.

පේරාදෙණිය රොටරැක්ට් සමාජයේ සභාපති තරිදු පින්නදූවගේ මහතා,2020-21 වාරයේ පේරාදෙණිය රොටරැක්ට් සමාජයේ සභාපති රවිඳු සෙනවිරත්න මහතා,ගල්එළිය ගම්මානයේ ගොවි සමිතියේ සභාපතිතුමා, තරුණ සමිතියේ සාමාජිකයන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගිත්වයන් මෙය පැවැත්විණි .

දිනමිණ දසත දස අත ම එක තැන

■ අනුර දිසානායක - මල්ලවපිටිය සමූහ

පානීය නළ ජල පහසුකම් ලබා දීමේ ජංගම සේවාවක්

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට කඩිනමින් පානීය නළ ජල පහසුකම් ලබා දීමේ ජංගම සේවාවක් පසුගිය දිනවල දී කුරුණෑගල සාරගම වැව අසලදී පැවැත්විණි.

විමසුමෙන් නොනැවතී විසැඳුමක් යන්න තේමාව කර ගනිමින් කුරුණෑගල විසල් ජල යෝජනා ක්‍රමය යටතේ කුරුණෑගල නගර සභා සීමාවෙන් පිටත ජනතාවට ජල පහසුකම් ලබා දීමේ අරමුණු කර ගෙන මෙම ජංගම සේවාව කුරුණෑගල නගරාධිපති තුෂාර සංජීව විතාරණ මහතාගේ අදහසකට අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභාව හා ඒකාබද්ධව පැවැත්විණි.

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභාපති අචල නිමන්ත වික්‍රමතිලක මහතාගේ මඟ පෙන්වීමෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. කුමාරදාස මහතාගේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම ජංගම සේවයේදී යන්තම්පලාව, උඩ දිගන, මා වී දළුපත පස් වන පටුමඟ - දොළොස් වැනි පටුමග දක්වා ජනතාව, සූරිය වත්ත, වෙළගෙදර උයන, උඩත්තාපොල, විල්ගොඩ වත්ත, කවුඩා වත්ත, අස්වැද්දුම, දෙමටගහ පැලැස්ස, සාරගම යන ප්‍රදේශ වල ජනතාවගේ පානීය නළජල අවශ්‍යතා සපුරා දීමට අවශ්‍ය කටයුතු මෙහිදී සිදු කෙරිණි.

■ පරාක්‍රම ගුණසේකර-සූරියවැව සමූහ

කුලී වෑන් රිය මඟ නවතා රියැදුරු ගසක බැඳ මුළු සේසතම අරන්

තංගල්ලේ සිට කුලී වෑන් රථයකින් සෙවණගල හබරළුආර ප්‍රදේශයට ගොස් අතුරු මාර්ගයකදී වෑන් රථයේ රියැදුරා ගසක බැඳ දමා ඔහු ළඟ තිබූ මුදල් රුපියල් හත්ද හසක්ද (රු: 7000/=) පැහැරගෙන වෑන් රථයෙන් පලාගොස් තිබේ.

එම වෑන් රථයේ රියැදුරු වන ජේ. ඒ. බෙනට් නැමත්තා විසින් සෙවණගල පොලිසියට මේ බව පැමිණිලි කර ඇත.ඔහු තංගල්ල නාකුළුගමුව පදිංචි කරුවෙකි. ඔහු තංගල්ලේ සිට රථයෙන් කුලී ගමන් යන අයෙකි. ඉකුත්දා (08) දහවල් නාඳුනන පුද්ගලයන් දෙදෙ නෙක් පැමින කිරි හට්ටි ගෙන ඒමට සෙවණගලට යෑමට කථාකළා.කුලී ගමන් ගාස්තු කථා කරගෙන මම ආවා. සෙවණගල එක ගමකට යමින් සිටියදී අතුරු මාර්ගයක වෑන්රථය නතර කිරීමට කීවා . නතර කළාට පසුව ඔවුන් පිස්තෝලයක් වැනි ගිනි අවිය එල්ලකර මරණීය තර්ජනය කර මා අසල තිබූ ගසක බැඳ දමා මගේ ළඟ තිබූ මුදල්ද පැහැරගෙන මගේ වෑන් එකෙන් පලාගියා. වෑන් රථයේ අංකය SPTC2280 ය. පැමිණිල්ලේ සඳහන් වෙයි.

මේ දක්වා වෑන් රථය ගැන තොරතුරක් ලැබී නැති අතර සෙවණගල පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වාගෙන යයි.

■ ප්‍රසන්න පත්මසිරි - උඟව පළාත් සමූහ

යාල වනයේ පාරවල් මඩ වගුරු වෙලා

මේ දින වල පවතින අධික වර්ෂාවත් සමඟ යාල ජාතික වනෝද්‍යානයේ මාර්ග රැසක් ජලයෙන් යටවී මඩ වගුරක් බවට පත්ව තිබෙන බව සංචාරකයෝ පවසති.

වනය මධ්‍යයේ සංචාරකයන් ගමන් ගන්නා මාර්ග හරහා විශාල ජලධාරාවන් ගලා යෑමත් සමඟ මඩ වගුරක්ව පවතින මාර්ග වලින් ගමන් කිරීම ඉතා අසීරුබව සංචාරකයෝ කියති.

■ එස්.පී.විජේරත්න-කටුගස්තොට සමූහ

ආයතන රැසකට යන මේ පාර හදා දෙනවාද?

මහනුවර ජාතික රෝහල් පරිශ්‍රයේ පිහිටි හෙද විදුහල,පිළිකා සංගමය,මධ්‍යම පළාත් වෛද්‍ය සේවා සැපයීම් අංශය,බෙහෙත් ගබඩාව,වෛද්‍යවරුන්ගේ රථගාල,පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයට යන මාර්ගය මේ වන විට දැඩි ලෙස අබලන්ව තිබෙනු දක්නට ලැබේ.

මෙම මාර්ගය භාවිතා කරමින් හෙද විදුහල වෙත හා හෙද විදුහලේ සිට රෝහල කරා සිසු සිසුවියෝ විශාල පිරිසක් නිල ඇඳුමින් සැරසී දෛනිකව ගමන් ගනිති. පවතින වැසි තත්වය හේතුවෙන් මාර්ගය මඩ වගුරක් බවට පත්ව ඇති නිසා එම එම පිරිසද දැඩිලෙස අපහසුතාවයට පත්ව සිටිති.

මේ පිළිබඳව මහනුවර ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමියගෙන් කළ විමසීමේදි එතුමිය පවසා සිටියේ රෝහලෙන් හා හෙදි විදුහලේ කාර්ය මණ්ඩලයද මෙම මාර්ගය අලුත්වැඩියා කර දෙන ලෙස මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලීමක් කර ඇති බවය.

■ එච් එම් රංජිත් කරුණාවිර - මාපාකඩවැව සමූහ

නගරයේ අනවසර කඩ ඉවත් කිරීමකදී සේවකයන් දෙදෙනකුට පහර දීලා

මහියංගණ ප්‍රාදේශීය සභාවේ කම්කරු සේවකයෝ වර්ජනයේ

මහියංගණ නගරයේ අනවසර වෙළෙඳ ව්‍යාපාරික ස්ථාන රැසක් (09) දින ප්‍රාදේශීය සභාවේ සභාපති කරු වීරරත්න මහතාගේ මැදිහත්වීමෙන් ඉවත්කිරීම සිදුකරනු ලැබූ අතර, එයට උරණ වූ අනවසර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යනු ලැබූකාන්තාවන් දෙදෙනෙක් (10) උදෑසන ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා යමින් සිටි කම්කරු අඹු සැමි යුවළකට පහර දීම හේතුවෙන් ප්‍රතිකාර සඳහා මහියංගණ මූලික රෝහලට ඇතුළත්ව ඇති බව මහියංගණ ප්‍රාදේශීය සභාවේ සභාපති කරුවිරරත්න මහතා පවසයි.

පහරදීමට විරෝධය පා කම්කරුසේවකයන් සියල්ල (10) උදෑසන සේවයෙන් ඉවත්ව සිටි අතර පහරදුන් කාන්තාවන්අත් අඩංගුවට ගන්නා බවට මහියංගණ පොලිසිය පොරොන්දුවීමත් සමඟ කම්කරුවන් දහවල් කාලයෙන් පසු සේවය සඳහා වර්තා කර ඇති බව ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු ප්‍රකාශ කර සිටියේය.

දහවල් 1.30 පමණ වන තුරුත් ප්‍රාදේශිය සභාවේ කම්කරුවන් දෙදෙනාට පහරදුන් කාන්තාවන්දෙදෙනා මහියංගණ පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන නොමැති බව සභාපති කරු වීරරත්නමහතා මාධ්‍ය හමුවේ ප්‍රකාශ කර සිටියේය.

මහියංගණ පොලිස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒස්.ජේ.ඒ.ආර්.එල් සේනාධීර මහතාගෙන් සිද්ධිය සම්බන්ධයෙන් විමසීමේදී " සභාවේ කම්කරුවන්ට පහරදුන් කාන්තාවක් සභාවේ කම්කරුවන් ඇයට පහරදුන් බවපවසමින් (10) මහියංගණ රෝහලට ඇතුළත්වෙලා තියෙනවා. අපි මෙම පහරදීම සම්බන්ධයෙන් මහියංගණ උසාවියේ ගරු මහේස්ත්‍රාත්තුමන්හට කරුණු වාර්තා කරනවා. ඒ අනුව එතුමන් රෝහලට ගොස් ඒ සම්බන්ධයෙන් පරීක්ෂාකර බැලීමෙන් අනතුරුව ලබාදෙන නියෝගය අනුව අපි ක්‍රියාත්මක වෙනවා" යැයි පැවසීය.

■ පී.එස්.තැලිගම-කිරිඳිවැල සමූහ.

කුස්සියේ රොටී පුච්චමින් සිටියදී බිත්තියට යටවී දෙදරු මව මරුට



අධික වර්ෂාවත් සමඟින් කඩා වැටුණු තාප්ප බිත්තියකට යටවීමෙන් මල්වතු හිරිපිටිය අමුණුකුඹුර ප්‍රදේශයේ 47 හැවිරිදි දෙදරු මවක මියගොස් ඇතැයි මල්වතු හිරිපිටිය පොලිසිය කියයි.

8දා සවස 2.30ට පමණ කුස්සියේ රොටී පුච්චමින් සිටියදී බිත්තියට යටවී බරපතළ තුවාල ලබා මල්වතුහිරිපිටිය රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මෙලෙස මිය ගොස් ඇත්තේ ආර්.පී.අනුරුද්ධිකා නැමැති දෙදෙරු මවය.

එදින දහවල් පාසල් ගොස් නිවෙසට පැමිණි ඇගේ 8 හැවිරිදි පුතා රොටියක් පුළුස්සා දෙන ලෙස කළ ඉල්ලීමකට අනුව කුස්සියේ සිටියදී මෙලෙස බිත්තියට යටවී ඇතැයි පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

මියගිය අයගේ පශ්චාත් මරණ පරීක්ෂණය 9දා ගම්පහ මුලික් රෝහලේදී සිදු කිරීමට නියමිතව තිබිණි.මල්වතුහිරිපිටිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සමන්ත මුණසිංහ මහතාගේ උපදෙස් මත පොලිස් පරීක්ෂක සුමිත්, තොස්තාපල් 64670 දිසානායක යන නිලධාරිහු පරීක්ෂණ සිදු කළහ.

■ ජායාරූප හා සටහන නිමල් වීරසේන - මතුගම මධ්‍යම

අශ්මරී රෝගය අද උණ හෙම්බිරිස්සාව මෙන් පවතිනවා

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. අරුණ නුවන්

මනුෂ්‍ය ශරීරයට අහිතකරව මූත්‍රාශය, පිත්තාශය හා වකුගඩු ආශ්‍රිත ප්‍රධාන ඉන්ද්‍රිය අවයවයන් තුළ ගල්හටගැනීමේ රෝග වර්ධනය අනුව එම රෝගී තත්ත්වය නිට්ටාවට සුවකරන වෛද්‍ය ක්‍රමය හඳුන්වා දෙමින් පී.බී. සමරසේන වෛද්‍යරත්න ගුරු වෙදඋරු මහතාගෙන් පසුව කටයුතු කරගෙන යන වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. අරුණ නුවන් මහතාගෙන් දිනමිණ කළ විමසුමකදී සියතතු පැහැදිලි කර සිටියේ මෙසේය.

ආයුර්වේදයේ පවතින අෂ්ඨමහා රෝගයන් අතුරින් එක් ප්‍රධාන රෝගයක් වන අශ්මරී (ගල්) රෝගය පිළිබඳ අවධානය යොමු කිරීමේදී නූතන සමාජයේ උණ හෙම්බිරිස්සාවට සමානව පවතින රෝගයක් ලෙස මෙය අද දැකිය හැකි බවත් කළුතර පුරවරය කේන්ද්‍රකොට ගනිමින් කළුතර දිස්ත්‍රික්කය පමණක් නොව දිවයිනේ නන්දෙස ප්‍රචලිත මෙම වෛද්‍ය ක්‍රමවේදය පිළිබඳව දේශීය හා විදේශීය වශයෙන් කීර්තියට පත්ව කළුතර සුප්‍රසිද්ධ ගල් වෙදකම යන නාමය ප්‍රසිද්ධියට පත්ව ඇති බවද හෙතෙම වැඩිදුරටත් පැවසීය.

වකුගඩු ආශ්‍රිත රෝග ගණනාවක් සඳහා ද ඉතා සාර්ථක ප්‍රතිකාර ක්‍රමවේදයන් ශල්‍යකර්ම භාවිතයෙන් තොරව ගල් දියකිරීමේ තත්ත්වයට පත්කරලීමට සමත්වෙයි. එවැනි ගල් වෙදකමේ වෙද මහතා යන නාමය අද බොහෝ දෙනාගේ මුවගින් ඇසෙන නාමයක් බවට පත්ව තිබෙන කළුතර දකුණ සෙනෙවිරත්න පෙදෙස වෙද අසපුව ප්‍රසිද්ධියට ලක්වී පවතී. අද බොහෝ සෙයින් පවත්නා තරගකාරී ජීවන රටාව මත ශරීරයට අහිතකර ආහාරපාන, උදාහරණයක් වශයෙන් ලුණු සහ, සොසේජස් වර්ග, සෝස් වර්ග, පැණි බීම රසකාරක අඩංගු ක්ෂණික කෑම, තෙල් බැදුම්, කෘතීම කෑමද නූතනයේ මෙම ගල් රෝගය ව්‍යාප්තවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව වෙදඋරු මහතා අවධාරණය කර සිටී.

■ මාවරල සමූහ පී.මද්දුමගේ

ඉන්දුනීසියා තානාපති දකුණු පළාත් ආණ්ඩුකාර මුණගැසෙයි

දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතා සමග ශ්‍රී ලංකාවේ ඉන්දුනීසියා තානාපතිවරයා ගාල්ල ලබුදූව දක්ෂිණපාය පළාත් අමාත්‍යාංශ සංකීර්ණයේදී මුණ ගැසී සාකච්ඡාවක් පැවැත්විය.

එහිදී කොවිඩ් 19 වසංගත තත්ත්වය මැඩ පැවැත්වීමට ශ්‍රී ලංකාව ගෙන ගිය වැඩ පිළිවෙළ අතිශයින්ම අගය කරන බව පවසා ඒ සඳහා තමන්ගේ සතුට ප්‍රකාශ කරන බවද සඳහන් කර තිබේ.

ලංකාවේ බතික් කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහායත්, රබර් වගාවේ ප්‍රවර්ධනයට ඉවහල් වන සහාය සඳහාත්, ඉන්දුනීසියාවේ සහයෝගය ලබාදීමට පියවර ගන්නා බවද පවසා තිබේ.

ආණ්ඩුකාරවරයා විසින් සමරු තිළිණයක්ද මෙම අවස්ථාවේදී තානාපතිවරයාට පිළිගන්වනු ලැබීය.

ඉද්දමල්පාන විහාරයේ සරු මිරිස් වගා බිම්කඩක්

ගාමිණී රම්‍යපාල - සබරගමුව සමූහ

කොරෝනා සමයත් සමග ආරම්භ වූ ගෙවතු වගා වැඩසටහන් දැන් දැන් පලදාව ලබමින් පවතියි.

කෑගල්ල - ගලිගමුව ප්‍රදේශයේ ගෙවතු අස්වනුවලට වෙළෙඳ පොළක් සකසා දෙන්නේ නම් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය සරුසාර පිළිවතකට ගෙනයා හැකියි. ගලිගමුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමිත් රම්‍යකුමාර මහතා පවසයි.

ඒ මහතා මෙසේ පැවසුවේ මේ වන විට අස්වනු නෙළමින් පවතින ඉද්දමල්පාන විහාරයේ භූමිභාගයක වගා කර ඇති මිරිස් වගාවන් පිළිබඳ දැක ගැනීමට ගිය අවස්ථාවේදීය.

මෙහිදී අපට හමුවූ ඉද්දමල්පාන රජමහා විහාර අධිකාරී හරිගල සුමනරතන හිමියෝ මෙසේ පැවසුහ.

විහාරස්ථානයට අයත් අක්කරයක පමණ වන මෙම භූමිය කැලෑ රොදක් ලෙසයි තිබුණේ. පසුගිය මාර්තු මාසයේ මේක එළිපෙහෙලි කළාට පසුව ගලිගමුව යටතෝගොඩ ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක තිලක් නවරත්න මහතා යෝජනා කළා. අලුත් මිරිස් වර්ගයක් තිබෙනවා. මේ භූමිභාගයත් ඊට ගැළැපෙනවා. වගාව ආරම්භ කරමුද කියල. ගමේ අයටත් ඒ කාලයේ කොරෝනා නිසා රැකියාවල් ඇහිරිලා තිබුණා.

අපි මිරිස් පැළ හයදාහක් පමණ හිටෙව්වා. දැන් අපිට ඵලදාව ලැබෙමින් පවතිනවා. එහෙත් වෙළෙඳ පොළක් නැති වීම අපිට පමණක් නොවෙයි මේ ප්‍රදේශයේ බොහෝ වගා කටයුතුවල යෙදෙන්නන් අධෛර්යවත් කරනවා.

ගලිගමුව - යටතෝගොඩ ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක තිලක් නවරත්න මහතා,

මෙහි වගා කර තිබෙන්නේ අපේ රටේ ජාතික කෘෂි බිජ නිෂ්පාදන ආයතනයක් වූ මහඉලුප්පල්ලම පරියේෂණායතනයේ නවතම නිෂ්පාදන බීජයක් වූ එම්. අයි.සී.එච් .-1 නම් වූ හයිබ්ඩ් වර්ගයේ මිරිස් වර්ගයක් මෙහි පලදාව හොඳයි.

මෙම වැඩසටහනට කෑගල්ල දිස්ත්‍රික් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ චම්පික වෙලගෙදර, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ නිර්මලා රාජපක්ෂ, අතිරේක පළාත් අධ්‍යක්ෂ ධනන්ජනි බණ්ඩාර යන මහත්ම මහත්මීන් ගෙන් ලැබුණු උපදෙස් හා මගපෙන්වීම යටතේ සිදු කළා. එම සහයෝගය මේ ප්‍රදේශයේ වගාවන් ඉහළ නංවා ගැනීමට මහත් උපකාර වන බවද ප්‍රදේශවාසීහු පැවසුහ.

■ අජිත් කුමාර - මාකඳුර සමූහ

දැලු මිල ඉහළයි තේ වගාවට උනන්දුවක්

අමු තේ දලු මිල ඉහළ මට්ටමක පැවතීම නිසා දෙයියන්දර කොට්ඨාසයේ ඉඩම් හිමියන් තේ වගා කිරීමට දැඩි උනන්දුවක් දක්වන බව එම කොට්ඨාසය භාර තේ පරීක්ෂක නිලධාරී ප්‍රියංග විජේසිංහ මහතා සඳහන් කරයි.

පසුගියදා තේ වගාකරුවන් හා තේ සම්තිවල නියෝජිතයන් හමුවේ ඒ මහතා සඳහන් කර සිටියේ 2020 වර්ෂය සඳහා තේ නැවත වගාව වෙනුවෙන් මේ වන විටත් අයදුම් පත්‍ර 65 ක් සහ අලුතෙන් තේ වගා කිරීම සඳහා අයදුම්පත්‍ර 38ක් ලැබී ඇති බවයි. අයදුම්පත්‍ර ලැබී ඇති ඉඩම් පිළිබඳ දැනටමත් සමීක්ෂණ කටයුතු සිදුකරගෙන යන බවත්, දැනට පවතින තේ වගාවන්හි පාළු සිටුවීම සඳහා අයදුම්පත්‍ර 72ක් ලැබී ඇති බැවින්, ඒ සඳහා තේ පැළ 21600ක් පමණ ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

■ ඒ.පී. දයාචන්ද්‍ර - උහරුබොක්ක විශේෂ

පස්ගොඩ සංවර්ධන නිලධාරිනියක්

සීට්ටු දමා මුදල් අරන් අන්තරස්ථාන වෙලා

පස්ගොඩ, බෙංගමුව, මාවරල, පොත්දෙණිය ඇතුළු අවට ප්‍රදේශවල පුද්ගලයන්ගෙන් මුදල් සීට්ටු දැමූ කාන්තාවක අදාළ පුද්ගලයන්ට සීට්ටු මුදල් නොදී ප්‍රදේශයෙනුත් පලාගොස් ඇති බවට සීට්ටු සඳහා මුදල් යෙදවූ පුද්ගලයෝ පවසති.

සීට්ටු සඳහා මුදල් ලබාගත් ආකාරයටම පොලියට මුදල් ලබා ගැනීම්, අතමාරුවට මුදල් ලබා ගැනීම ද සිදුකර ඇත. මේ වනවිට ලක්ෂ සීයයකට අධික මුදලක් වංචා කර ඇති බවට ප්‍රදේශයේ ජනතාව පවසන අතරම පසුගිය 20 දිනෙන් පසුව සිට මෙම කාන්තාව පිළිබඳ තොරතුරක් නොමැති බවට මුදල් ලබාදුන් පුද්ගලයෝ පවසති.

මුදල් වංචාවට සම්බන්ධ කාන්තාව පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින පස්ගොඩ තුත්තිරිපිටියහේන ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 40ක ආර්ථික සංවර්ධන නිලධාරිනියක වන අතරම මෙම නිලධාරිනිය සේවය කළ වසම්වල පුද්ගලයන්ගෙන්ද මුදල් ලබාගෙන ඇති බවටත් පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින ආර්ථික සංවර්ධන නිලධාරීන්ගෙන්ද සීට්ටු වලට,පොලියට යනාදී වශයෙන් මුදල් ලබාගෙන ඇති බවත් ඇතැම් පුද්ගලයන්ට මුදල් ලබාගත් බවට ලිපි ලේඛන පවා ලබාදී ඇති බවත් ප්‍රදේශයේ ජනතාව පවසති.

රුපියල් ලක්ෂ දෙකක මුදලක් අතමාරුවක් වශයෙන් ලබාගෙන එම මුදල් නොදී එම කාන්තාව අතුරුදහන්ව ඇති බවත් එම කාන්තාවගෙන් තමාගෙන් ලබාගත් මුදල අයකරදෙන ලෙසට පවසමින් රොටුඹ පොලිසියට පස්ගොඩ ප්‍රදේශයේ පුද්ගලයකු පැමිණිල්ලක් දමා තිබෙන බවත් රුපියල් ලක්ෂ දෙකක මුදලක් ලබාගත් බවට දෙන ලද ලිපියක්ද පොලිසියට ඉදිරිපත් කර ඇත.

රුපියල් ලක්ෂ දෙකක මුදල් වංචාවක් පිළිබඳ පොලිසියට පැමිණිල්ලක් ලැබී ඇති බවත් එම මුදල් ලබාගත් බවට පවසන කාන්තාව පදිංචි ලිපිනයේ නොමැති බවත් අදාළ කාන්තාව සොයා පොලිස් පරික්ෂණ ආරම්භ කර ඇති බවට රොටුඹ පොලිස් ස්ථානාධිපති ප්‍ර.පොෝ.ප. සනත් කුමාර මහතා අප කළ විමසීමකදී පැවසීය.

පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන අදාළ ආර්ථික සංවර්ධන නිලධාරිනිය පිළිබඳ තොරතුරක් නොමැති බවට මුදල් දුන් පුද්ගලයන් පවසන බැවින් ඒ පිළිබඳ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් රේණුකා රාජපක්ෂ මහත්මියගෙන් කළ විමසීමකදී කියා සිටියේ සිද්ධියට සම්බන්ධ ආර්ථික සංවර්ධන නිලධාරිනිය පස්ගොඩ නාපත්ඇල්ල වසමේ රාජකාරි කළ බවත් පසුගිය අගෝස්තු මාසයේ 26 දින හදිසි කරදරයක් නිවාඩු ලබා දෙන්න කියා දන්වා ටෙලිඉෆ්ම් එකක් තමා වෙත එවා ඇති බවත් ඉන් පසුව මෙතෙක් සේවය වාර්තා කර නැති බවටයි.

■ සේන වේරගම - කලවාන සමූහ

රත්නපුර-කෑගල්ල ළමා නිවාසවල නිපුණතා නංවන්න විශේෂ ව්‍යාපෘතියක්

රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ ළමා නිවාස වල දරු දැරියන් සඳහා ජීවන නිපුනතා නංවාලීමට විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇතැයි සබරගමුව පළාත් ආණ්ඩුකාර විකිරි කොබ්බෑකඩුව මහතා සඳහන් කළේය.

ඒ මහතා මේ බව සඳහන් කළේ කෑගල්ල බුද්ධ ජයන්ති ළමා නිවාසයේ දරු දැරියන් හමුවීමකට එක් වෙමිනි.

මෙම ව්‍යාපෘතිය යටතේ එම ළමා නිවාසවල දරු දැරියන් සඳහා ආත්මාරක්ෂක සටන් ක්‍රම, ගායනය, සංගීතය, පරිගණක, ගෙවතු වගාව, ගෘහස්ථ ක්‍රීඩා, ඉංග්‍රීසි, දෙමළ ඇතුළු භාෂා පුහුණුව වැනි විෂය ක්ෂේත්‍ර රැසක් යටතේ පුහුණුව ලබා දීමට කටයුතු කර ඇත. ඒ සඳහා සබරගමුව පළාත් සභාව, විවිධ ආයතන සහ විෂය ප්‍රවීණයන් එක්ව කටයුතු කර ඇත.

මෙම ළමා නිවාසයේ දරු දැරියන් විසින් ඉදිරිපත් කළ ටයිකොන්ඩෝ, සංගීත සහ ගායන ප්‍රසංගයක්ද එදින ඉදිරිපත් කරනු ලැබූ අතර දරුවන්ගේ සංගීත හැකියාව ප්‍රගුණ කිරීමට සංගීත උපකරණ පරිත්‍යාග කිරීමක්ද සිදුවිය.

එම ළමා නිවාසයේ සිටින දැරියකගේ උපන් දින සැමරුමක්ද සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් එදින සිදුවිය.

රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ ළමා නිවාස 17 තුළ 375 පමණ දරු දැරියන් ප්‍රමාණයක් රැක බලාගැනීම සිදුවේ. මෙහි වෙසෙන දරුදැරියන් රැකබලා ගැනීම, අවුරුදු 18 සම්පූර්ණ වූ පසු උසස් අධ්‍යාපනයට යොමු කිරීමද ඔවුන් සඳහා ආවාහ විවාහ සිදුකිරීමද සබරගමු පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කරයි.

මෙම අවස්ථාවට කෑගල්ල නගරාධිපති ජී.කේ. සමරසිංහ, පළාත් පරිවාස කොමසාරිස් සුසිලා රාජපක්ෂ, ආණ්ඩුකාර පෞද්ගලික ලේකම් මංජුලා ඉදිගහවෙල, කෑගල්ල බුද්ධජයන්ති ළමා නිවාසයේ සභාපති ජොෂ්ඨ පොලිස් අධිකාරී ශ්‍රියන්ත පීරිස්, හිටපු සභාපතිනි ඉන්ද්‍රා උදලාගම, ගායන ශිල්පී රාජු බණ්ඩාර, ටයිකොන්ඩෝ පුහුණුකරු ජනක හේවාපතිරණ යන මහත්ම මහත්මීහු පිරිසක් එක්ව සිටියහ.

■ නිමල් විජයතුංග - ඇහැලියගොඩ විශේෂ

ඇහැළියගොඩ ගොවි බිම්වලට මොනරුන්ගෙන් දැඩි හානි

ඇහැළියගොඩ සහ තදාසන්න ප්‍රදේශවල ගොවි බිම් සහ ගෙවතු-කොරටු යනාදියට හානි පමුණුවන වල් ඌරන්, රිළවුන්, වඳුරන්, දඬු ලේනුන් සහ කැඳැත්තන්ට අමතරව අලුත්ම 'ආක්‍රමණිකයා' බවට පත්වී සිටිනුයේ මොනරයා.

ඇතැම් ගම්බද ලඳු කැලෑවල මැතක සිට බහුල වශයෙන් බෝ වෙමින් සිටින මොනර පැටවුන් ද සමග එළවළු කොරටු-ගෙවතු මෙන්ම කුඹුරු යනාදිය ද දිවා කාලයේදී ආක්‍රමණය කරමින් පනුවන් සහ වෙනත් කෘමීන් සොයා ආහාරයට ගැනීමට උන්ගේ තියුණු නිය වලින් එළවළු පාත්ති යනාදිය පහුරුගෑමෙන්

බටු, බණ්ඩක්කා, මිරිස් සහ මෑ ආදී භෝග වර්ග මුළුමනින් ම විනාශවී යන්නේයැයි ගොවීහු පවසති.

මීට අමතරව දඬු ලේනුන් සහ දිගු හොටැති කැඳැත්තන්ගෙන් 'දූරියන්' පලදාව රැක ගැනීම අසීරු කටයුත්තක් විණැයිද ගම්වාසීහු පවසති.

■ ඒ.පී. දයාචන්ද්‍ර - උහරුබොක්ක විශේෂ

උහරුබොක්ක දූෂණ වැටලීම්වලින් හොඳ ආදායමක්

උහරුබොක්ක පොලීසියේ දූෂණ වැටලීම් වලින් පමණක් 2020 අගෝස්තු 01 දින සිට අගෝස්තු 31 දින දක්වා මාසයක කාලය තුළ රුපියල් එක්ලක්ෂ තිස්දහස් පන්සීයක (130500.00) ආදායමක් ලබාගෙන ඇති අතර එම ආදායම ලබාගෙන ඇත්තේ නීති විරෝධී සීනි කරිඇඳුං ළඟ තබාගෙන සිටි පුද්ගලයන් 17 දෙනකු ළඟ තිබී කරිඇඳුං මිලිලීටර් 54750 ක ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇති අතර ඒ සඳහා රුපියල් අසූ එක්දහසක (81000.00) දඩ මුදලක් අධිකරණය මඟින් අයකරගෙන ඇත.

රජයේ අරක්කු ළඟ තබාගෙන සිටි එක් පුද්ගලයකු අත්අඩංගුවට ගෙන තිබූ අතර ඒ අරක්කු මිලිලීටර් 290 සඳහා රුපියල් 6000.00 දඩ මුදලක් අය කරගෙන තිබූ අතර බලපත්‍රයක් නොමැතිව ගංජා ළඟ තබාගෙන සිටි පුද්ගලයන් 08 දෙනකු අගෝස්තු මාසය තුළ පමණක් පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබූ අතර ඔවුන් සන්තකයේ තිබී ගංජා මිලිග්‍රෑම් 12800 ක ප්‍රමාණයක් සොයාගෙන ඇත. ඒ සඳහා දඩ මුදල් වශයෙන් රුපියල් 43500.00 ක මුදලක් අය කරගෙන ඇති අතර එම ආදායම ලබාගෙන ඇත්තේ අගෝස්තු 01 දින සිට 31 දින දක්වා මාසයක කාලය තුළ සිදුකළ දූෂණ වැටලීම් වලදීය.

උහරුබොක්ක පොලීසියේ දූෂණ වැටලීම් වලින් පමණක් මෙම ආදායම ලබාගෙන ඇති අතර ඒ ආදායම ලබා ගැනීමට පුද්ගලයන් 26 දෙනකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබූ අතර ඔවුන්ගෙන් මෙම ආදායම දඩ වශයෙන් අය කරගෙන තිබිණි.

උහරුබොක්ක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක සමරවික්‍රම මහතාගේ උපදෙස් අනුව අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පොෝ.ප.අබේවික්‍රම මහතා ඇතුළු නිලධාරීන් විසින් වැටලීම් සිදුකර මෙම පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබූ අතර නීති විරෝධී සීනි කරිඇඳුං ළඟ තබා ගැනීම වෙනුවෙන් වැඩිම දඩ මුදලක් අයකරගෙන ඇත.

■ එල්.ඩබ්ලව්. ආරියරත්න - උඩුගම්පොල සමූහ

දේශීය කහ වගාව මියැදෙන හැඩ

කහ වගාවක්

ඉන්දීය කහවලට වඩා දේශීය කහ පෝෂණ ගුණයෙන් ඉහළයි. පාට නැහැ. කහ පැහැය ලබා ගැනීම සඳහා පිටි කලවම් කරන්න පුරුදු වී සිටිනවා. කහ කිලෝවකට රුපියල් දහසක (රු. 1000) ස්ථාවර මිලක් ලැබෙනව නම් ගොවියාටත් පාරිභෝගිකයාටත් සාධාරණත්වයක් ඉටුවෙන බව මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වටිනාපහ ප්‍රධාන පෙළේ කහ වගාකරුවකු වන ඒ.ඒ. කරුණාරත්න මහතා පැවසීය.

දේශීය කහ වගාව හා කහ මිල ගණන් ඉහළයාම පිළිබඳ කරුණු විමසීමේදී ඒ මහතා මෙසේ පැවසීය.

දේශීය කහ වගාව හා කහ මිල ගණන් පිළිබඳව කරුණු පැහැදිලි කරමින් ඒ මහතා මෙසේ පැවසීය.

ආහාර පිස ගැනීමේදී දේශීය කුළුබඩු විශේෂයක් වශයෙන් කහ ප්‍රයෝජනයට ගන්නවා. ඒ වගේම තමයි දේශීය වෛද්‍ය ක්‍රමයේදී කහ ඖෂධයක් වශයෙන් ගන්නවා. මේ අවශ්‍යතා දෙකටම නැතිවම බැරි දෙයක් තමයි කහ කියන්නේ.

කහ වගාව අද ඊයේ ආරම්භ වුණ දෙයක් නොවෙයි. ඈත කාලයේ සිටම මේ අවශ්‍යතාවයන් දෙක සඳහා කහ වගාව අප රටේ දේශීය වශයෙන් සිදු කළා. මේ දෙකට අමතරව වර්ණ සංයෝජකයක් වශයෙන්ද භාවිතා කරනවා. ඇතැම් ව්‍යාපාරිකයෝ තම ව්‍යාපාර ස්ථානවල දෛනිකව ව්‍යාපාර ආරම්භ කරන්නෙ ස්ථානය හොඳට අතුපතු ගා කහ දියර ඉසල. එහෙම කරන්නෙ විෂබීජ නාශකයක් මෙන්ම එදිනෙදා ව්‍යාපාර කටයුතු සාර්ථකව කර ගෙනයාමට ආශිර්වාද ප්‍රාර්ථනා කිරීමක් වශයෙන් විය හැකියි.

ලංකාවේ දේශගුණය අනුව බොහෝ පළාත්වල කහ වගා කරන්න පුළුවන්. මෙතෙක් කාලයක් කහ වගාවට ගොවියාට නිෂ්පාදකයාට විකුණාගැනීම මිල උච්චාවචනය වීම පිටරටින් ගෙන්වීම කියන ප්‍රශ්න තුනට විසඳුම් ලැබෙනව නම් කහ වගාව අතින් ස්වයංපෝෂිත වන්න පුළුවන්. එය රටට විදේශ විනිමය ඉතිරි කර ගැනීමේ මාර්ගයක්ද වෙනව.

ඉන්දියාවෙන් ගෙන්වන කහ වලට වඩා දේශීය කහ පෝෂණ ගුණය ඖෂධ ගුණය අතින් ඉහළයි. හැබැයි ඉන්දීය කහ තරම් පාට නැහැ. අපේ පාරිභෝගිකයා පුරුදු වී සිටින්නේ පෝෂණ ගුණය පැත්තකට දමල පාට ගැන අවධානය යොමු කරන්න.

පාරිභෝගික ඉල්ලීම සපුරාලීමට සමහර නිෂ්පාදකයෝ පෙලඹී සිටිනව. කහ කිලෝ දහයකට කැකුළු හාල් කිලෝ එකක් යන අනුපාතයට මිශ්‍ර කිරීමෙන් ඉන්දීය කහවල දකින්න ලැබෙන කහ වර්ණය ගන්න පුළුවන්. එය ශරීරයට අහිතකරත් නැහැ. නමුත් මේ වන විට බොහෝ දෙනා

වගාකරුවන්ට ලබාදී ඇති කහ වියළන යන්ත්‍රයක්

පුරුදු වී සිටින්නේ කහ කිලෝ දහයකට කැකුළු හාල් කිලෝ දහයක් යන අනුපාතයට කලවම් කර වර්ණ ගන්වා අලෙවි කිරීමටයි. එය ශරීරයට හිතකර නොවන්න පුළුවන්. මේ වන විට කහ කිලෝවක් රුපියල් පන්දහසක් වෙනව. නිෂ්පාදකයාගේ පැත්තෙන් එය හොඳ වුවත් පාරිභෝගිකයාට එය දරාගන්න බැහැ.

වැටුණු සංචාරක කර්මාන්තයට ක්‍රීඩාවෙන් පණ දිය හැකියි

අන්තර්ජාතික ක්‍රීඩා ඉසව් සංවිධානයත් වැදගත්

ඇමැති ප්‍රසන්න රණතුංග

ෆවුස් මොහොමඩ්

කොවිඩ් වසංගතය හේතුවෙන් අඩපණ වූ මෙරට සංචාරක කර්මාන්තය යළි නඟා සිටුවීමට ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් විශාල පිටුවහලක් ලැබෙනු ඇතැයි සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.

සංචාරක ක්ෂේත්‍රය යනු විදේශ විනිමය උපයා ගත හැකි හොඳම විෂයයක් බව කී අමාත්‍යවරයා, යම් යම් තරගාවලි සංවිධානය කිරීමෙන් ක්‍රීඩාව තුළින් සංචාරක කර්මාන්තයටත් රටේ ආර්ථිකයටත් සැලකිය යුතු දායකත්වයක් ලැබෙනු ඇතැයි තමන් විශ්වාසය පළ කරන බවද කියා සිටියේය. මේ මස අග භාගයේදී ආරුගම්බේ මුහුදු තීරයේ පැවැත්වීමට නියමිත රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) තරගාවලිය පිළිබඳ පසුගියදා ක්‍රීඩා අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමින් ඒ මහතා මෙම අදහස් පළ කළේය.

ක්‍රීඩා හා තරුණ කටයුතු පිළිබඳ අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම මාධ්‍ය හමුවට විශේෂ ආරාධිතයකු ලෙස එක්වූ ප්‍රසන්න රණතුංග මහතා, ක්‍රීඩාව ඔස්සේ යම් යම් තරගාවලි සංවිධානය කරමින් ක්‍රම ක්‍රමයෙන් මෙරට සංචාරක ක්ෂේත්‍රය නැවත පණ ගැන්වීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට කටයුතු යොදන බවද සඳහන් කළේය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීය.

"නාමල් රාජපක්ෂ ඇමැතිතුමා සහ මම පසුගිය දවස්වල ජනාධිපතිතුමා හමු වී ශ්‍රී ලංකාවට කණ්ඩායම් වශයෙන් සංචාරකයන් නැවත ගෙන්වීමේ වැඩපිළිවෙළ දියත් කළ යුතු ආකාරය ගැන සාකච්ඡා කළා. ඊට ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබුණා. එක් එක් තරග ඉසව් සඳහා සංචාරකයන් ගෙන්වන්නේ කොහොමද, සෞඛ්‍ය අංශවල උපදෙස් පරිදි කටයුතු කරමින් සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නේ කොහොමද කියා වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කළ යුතුයි. ඒ වගේම පෞද්ගලික ව්‍යවසායකයන්ගේ සහයෝගය නැතිව, රාජ්‍ය අනුග්‍රාහකත්වය යටතේ පමණක් ක්‍රීඩාවත් සංචාරක ක්ෂේත්‍රයත් පවත්වාගෙන යන්න බෑ කියලා මම විශ්වාස කරනවා. ඉතිහාසය පුරාම අපේ ක්‍රීඩකයන් ජාත්‍යන්තරයට යද්දී රාජ්‍ය අනුග්‍රාහකත්වයට අමතරව පෞද්ගලික ව්‍යවසායකයන්ගේ සහයෝගය විශාල වශයෙන් ලැබුණා. නමුත් පසුගිය මාස අටක, නවයක කාල සීමාව තුළ මේ කොවිඩ් වසංගතය නිසාත් පසුගිය වසරේ පාස්කු ප්‍රහාරය නිසාත් අපේ රටේ සංචාරක කර්මාන්තය විශාල වශයෙන් පසුබෑමකට ලක් වුණා. මං හිතන්නේ මේ වසංගතයත් එක්ක පසුගිය පෙබරවාරි මාසයේ සිට කිසිම සංචාරකයෙක් අපේ රටට ඇවිත් නෑ.

"නමුත් රටේ ආරක්ෂාවත් සෞඛ්‍ය ආරක්ෂාවත් වැදගත් නිසා රජය ගත් යම් යම් සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග හේතුවෙන් අපි අනෙක් රටවලට සාපේක්ෂව කොවිඩ් වසංගතය මැඩලීම අතින් ඉදිරියෙන් සිටිනවා. ඒත් රටේ ආර්ථිකය ගොඩනඟන්න යම් යම් ක්‍රියාමාර්ග ගන්න සිදු වෙලා තිබෙනවා. අන්තර්ජාතික ක්‍රීඩාවලදී සංචාරක ව්‍යාපාරයත් සම්බන්ධ වෙන නිසා මං හිතන්නේ නාමල් රාජපක්ෂ ඇමැතිතුමාට ලොකු වගකීමක් තිබෙනවා දේශීය ක්‍රීඩාව නඟා සිටුවනවා වගේම මේ ක්ෂේත්‍ර දෙකම සම්බන්ධ වෙන අන්තර්ජාතික ක්‍රීඩා ඉසව් සංවිධාන කරන්න. මං හිතන්නේ ඒක රටටත් රටේ අනාගතයටත් වටිනාකමක් ඇතිවෙන කාර්යයක්. ඒ නිසා සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ මෙවැනි ක්‍රීඩා දියුණු කරන්න අප සංචාරක අමාත්‍යාංශය විදිහට පුළුවන් උපරිම සහයෝගය ලබා දෙනවා. කොවිඩ් වසංගත තත්ත්වයත් එක්ක මේ වගේ ක්‍රීඩා ඉසව් පවත්වලා රටක් හැටියට ජාත්‍යන්තරයට පණිවිඩයක් ලබා දෙන්න පුළුවන් වුණොත් ඉදිරියේදී අපේ රටට සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය කරගන්න පුළුවන්."

සහරාන් නොවේ නම් කවුද?

පාස්කු ප්‍රහාරය පිටුපස සිටින අදිසි බලවේගය හකීම් හෙළි කළ යුතුයි

හිටපු මන්ත්‍රී පාලිත රංගේ බණ්ඩාර

ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ

ජීවිත රැසක් විනාශ කළ පාස්කු ප්‍රහාරය පිටුපස සිටින අදිසි බලවේගය කුමක්දැයි රවුල් හකීම් මහතා දන්නේ නම් වහාම එය රටට හෙළි කළ යුතු බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත රංගේ බණ්ඩාර මහතා පැවසීය.

පාස්කු ප්‍රහාරය පිටුපස අදිසි බලවේගයක් සිටින බවත් ඒ පිළිබඳව මාධ්‍ය හමුවේ පැවසිය නොහැකි බවත් රවුල් හකීම් මහතා ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ ප්‍රකාශ කර තිබීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් රංගේ බණ්ඩාර මහතා මේ බව ප්‍රකාශ කළේ පසුගියදා (10) නුවරඑළියේ දී පැවැති මාධ්‍ය හමුවක් අමතමිනි. ඒ මහතාඑහිදී මෙසේද කීය.

"සමගි ජන බලවේගයේ පක්ෂ නායකයකු වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී රවුල් හකීම් මහතා පාස්කු ප්‍රහාරය පිළිබඳව විමර්ශන කොමිෂන් සභාවේ සාක්ෂි ලබා දීමෙන් පසු මාධ්‍ය වෙත ප්‍රකාශයක් කරමින් පාස්කු බෝම්බ ප්‍රහාරයට අදිසි බලවේගයක් ක්‍රියාත්මක වූ බව ප්‍රකාශ කළා. සහරාන් ඇතුළු කණ්ඩායම අයි.එස්.අයි.එස්. සමඟ සම්බන්ධයක් නොමැති බවත් හකීම් මහතා එහිදී ප්‍රකාශ කර සිටියා. අයි.එස්.අයි.එස්. සමඟ සහරාන්ගේ සම්බන්ධයක් නොමැති බව ඔහු පැහැදිලිව දැන සිට තිබෙනවා. එසේ නොදන්නවා නම් පැහැදිලි ප්‍රකාශයක් කිරීමට ඔහුට හැකියාවක් නැහැ. එසේම ප්‍රහාරයට ක්‍රියාත්මක වූ අදිසි බලවේගය කුමක්දැයි ප්‍රසිද්ධියේ කිව නොහැකි බවත් මාධ්‍ය ඉවත් කර කිව යුතු බවත් ඔහු කොමිසමට පැවසුවා. මෙයින් අපට පෙනී යන්නේ පාස්කු ප්‍රහාරයට ක්‍රියාත්මක වූ අදිසි බලවේගය කුමක්දැයි සමඟි ජන බලවේගය දන්නා බවයි. එහි නායක විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාත් රවුල් හකීම් මහතාත් මේ මිලේච්ඡ ක්‍රියාවට වගකිව යුත්තේ කවුරුන්ද යන වග රටට හෙළි කළ යුතුයි. එසේම ජනාධිපති විමර්ශන කොමිසම් සභාවටද මේ පිළිබඳව පැවසිය යුතුයි. පාස්කු ප්‍රහාරය පිටුපස සිටින අදිසි බලවේගය කුමක්දැයි වහාම රටට හෙළි කරන ලෙස අප රවුල් හකීම් මහතාගෙන් ඉල්ලා සිටිනවා."

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

රත්මලාන ඉංජිනේරු පීඨයේ පවිත්‍රතා සහ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව සඳහා

ටෙන්ඩර් කැඳවීම

කොන්ත්‍රාත් අංකය : USJP/EIS/CL/FOE/2020/2021

01. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රත්මලාන ඉංජිනේරු පීඨය සඳහා පවිත්‍රතා හා ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා යෝග්‍ය හා සුදුසුකම් සහිත සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.
02. ඉහත සේවා දින 365 ක කාලයකට අදාළ වේ.
03. මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය ජාතික තරගකාරී මිල ගණන් කැඳවීමේ පටිපාටිය අනුව සිදු කරනු ලැබේ.
04. සෑම සේවා සැපයුම්කරුවෙකු විසින්ම රජය විසින් අනුමත 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත, 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, පාරිතෝෂික ගෙවීම් පනත, පඩිපාලක සභා ආඥා පනත, සාප්පු හා කාර්යාල සේවක පනත, කම්කරු වන්දි ආඥා පනත, ආදී පනත් වලට අනුකූලව වැටුප් හා දීමනා ගෙවිය යුතු වේ.
05. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට දුරකථන අංක 011-2802856 ඔස්සේ සහකාර ලේඛකාධිකාරී / ආයතන (තොරතුරු හා සේවා) ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර, 2020.09.14 දින සිට 2020.10.05 දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා සතියේ දිනවල පහත ලිපිනයේ දී ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කර බැලිය හැකිය.
06. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට 2020 සැප්තැම්බර් 14 වන දින සිට 2020 ඔක්තෝබර් 05 වන දින දක්වා කාලය තුළ දී පහත ලිපිනයට ලිඛිතව අයදුම් කිරීමෙන් හා රුපියල් දෙදහස් පන්සීයක (රු. 2,500.00) ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අදාළ ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය. මෙම මුදල ගෙවිය යුත්තේ සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත මුදලින් පමණි.
07. පූර්ව ප්‍රසම්පාදන පැහැදිලි කිරීම් රැස්වීමක් 2020.09.25 වන දින ප.ව. 01.30 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන අතර, ඒ සඳහා සහභාගි වීම අනිවාර්ය වන අතර, මෙයට අයදුම් කළ හැක්කේ මෙම රැස්වීමට සහභාගි වන අයදුම්කරුවන්ට පමණි.
08. 2020 ඔක්තෝබර් 06 වන දින ප.ව. 01.30 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී මිල ගණන් වසා තබනු ලැබේ.
09. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ටෙන්ඩරයේ නම හා ටෙන්ඩරය විවෘත කරන දිනය සඳහන් කළ යුතුය. මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 2020.10.06 දින ප.ව. 01.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි නුගේගොඩ, ගංගොඩවිල පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී / ආයතන (තොරතුරු හා සේවා) වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම හෝ නැතහොත් ඉහත කී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම සිදුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කර ඒවා විවෘත නොකරම ආපසු ලංසුකරුවන් වෙත යවනු ලැබේ. ප්‍රමාදයත් සම්බන්ධයෙන් තැපැල් කිරීම සත්‍යාථ කිරීමේ සාක්ෂි නොපිළිගනු ඇත. මුද්‍රා තබන ලද මිල ගණන් භාර ගැනීම සඳහා නියමිත වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ බලයලත් නියෝජිතයන්ට (එක් ලංසුකරුවෙකුට එක් නියෝජිතයෙකු බැගින්) මුද්‍රා තබන ලද මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට හැකියාව ඇත.
10. මේ සම්බන්ධව ගනු ලබන තීරණ ප්‍රසම්පාදන අස්ථිතය සතුවේ.
11. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසන් දින සිට 2021 ජනවාරි 26 දින දක්වා මෙම ටෙන්ඩරය වලංගු වේ.
12. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක්ම ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද කරුණු සඳහා අදාළ ලිපිනයත් පහත දැක්වේ

ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කිරීම අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම, සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා භාර දීම.

සහකාර ලේඛකාධිකාරී,
ආයතන (තොරතුරු හා සේවා),
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

ටෙන්ඩර් පත්‍රිකා විවෘත කිරීම

පරිපාලන ගොඩනැගිල්ලේ මාණ්ඩලික රැස්වීම් ශාලාව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

සභාපති / ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

2020.09.04

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ටෙන්ඩර් සඳහා ඇරයුම

හොරණ අපනයන සැකසුම් කලාපීය භූමියේ ගොඩ ගසා ඇති විශාල ප්‍රමාණයේ කළුගල් (Boulders) විකිණීම

01. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් හොරණ අපනයන සැකසුම් කලාපීය භූමියේ ලොට් 1 හා ලොට් 2 වශයෙන් ගෙඩ ගසා ඇති විශාල ප්‍රමාණයේ කළුගල් (Boulders) විකිණීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් අයදුම්පත් කැඳවනු ලැබේ.

විස්තරය	ප්‍රමාණය
ලොට් 1 හා ලොට් 2 හි ගොඩ ගසා ඇති විශාල ප්‍රමාණයේ කළුගල් (Boulders)	5000m^3 පමණ (දළ වශයෙන්)

02. ජාතික තරගකාරී ටෙන්ඩර් ක්‍රියාවලිය (NCB) යටතේ ටෙන්ඩර් කැඳවනු ලැබේ.
03. ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අසාධුගත නොකළ පුද්ගලයන් සහ පාර්ශ්වයන් පමණි.
04. අදාළ ටෙන්ඩර් ඉල්ලුම්පත් සහ විස්තර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, හොරණ අපනයන සැකසුම් කලාපය, බොරළුගොඩ, පෝරුවදණ්ඩ යන ලිපිනයේ ඇති කලාප කාර්යාලයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 08.30 ත් ප.ව. 03.00 ත් අතර කාලයේදී එක් අයදුම්පතකට ආපසු නොගෙවන රු. 1,000/- ක් සහ 8% වැට් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර් අයදුම්පත් 2020.09.14 දින සිට 2020.09.28 දක්වා ලබාගත හැක.
05. ටෙන්ඩර් ඉල්ලුම්පත සහිත මුද්‍රා තැබූ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශාල ප්‍රමාණයේ කළුගල් විකිණීම සඳහා මිල ගණන්"** යන්න පැහැදිලිව සඳහන් කර සභාපති, ටෙන්ඩර් මණ්ඩලය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කලාප) බාරේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, හොරණ අපනයන සැකසුම් කලාපය, බොරළුගෙඩ, පෝරුවදණ්ඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ යුතුය.
06. ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීම 2020.09.29 දින පෙ.ව. 10.00 ට අවසන් වන අතර, එයින් අනතුරුව ටෙන්ඩර්පත් විවෘත කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, හොරණ අපනයන සැකසුම් කලාපයේ, කලාප කාර්යාලයේදී සිදු කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ. ටෙන්ඩර් අයදුම්පත් විවෘත කිරීම සඳහා ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පැවරූ නියෝජිතයින්ට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.
07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දුරකථන අංක 034-2269752 / 0777-286751 සහ ෆැක්ස් අංක 034-2255687 මගින් පෝරුවදණ්ඩ බොරළුගොඩ පිහිටි හොරණ අපනයන සැකසුම් කලාපයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැක.
08. ටෙන්ඩරයේ වලංගුභාවය 2020.12.27 දක්වා විය යුතුය.
09. සියලුම ටෙන්ඩර්පත් සමඟ රු. 10,000/- ක වටිනාකමකට ඇප බැඳුම්කරයක් (Bid Security) ඉදිරිපත් කළ යුතුය. ඇපකරය 2021.01.25 දින දක්වා වලංගු විය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

2020 සැප්තැම්බර් 16 වැනි දින රුපියල් මිලියන 40,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය
භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

පරිණත කාලය	දින 91	දින 182	දින 364	එකතුව
සු.හ.ජා.අංකය (ISIN)*	LKA09120L184	LKA18221C196	LKA364211171	
වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු. මිලි.)	8,000	14,000	18,000	40,000
පිළිගනු ලබන උපරිම ඵලදු අනුපාතිකය (%)**	4.52	4.65	4.88	

වෙන්දේසි කරන දිනය : 2020 සැප්තැම්බර් 16 වැනි දින
ගෙවීම් කළ යුතු දිනය : 2020 සැප්තැම්බර් 18 වැනි දින
නිකුතුවේ දිනය : 2020 සැප්තැම්බර් 18 වැනි දින
ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව : 2020 සැප්තැම්බර් 16 වැනි බදාදා පෙ.ව. 11.00
ලංසුවක් සඳහා අවම මුදල : රුපියල් මිලියන පහක් (5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000/-) ගුණිතයන්ගෙනි.

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මඟින් පමණකි. වෙළෙඳ පොළ තත්ත්වයන් මත මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලැබිය හැකිය.

පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නා ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්	2206297	මහජන බැංකුව	2206783
ලංකා බැංකුව	2541938	සම්පත් බැන්ක් පී.එල්.සී.	2305842
කැපිටල් එලයන්ස් ලිමිටඩ්	2317777	සෙලාන් බැන්ක් පී.එල්.සී.	2456340
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී	2332319	වෙල්න්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්	2675096
එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	2425010	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී.	2639883

* **සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය**

** **මෙම අනුපාතිකයන්, ප්‍රතිපත්ති තීරණයන්ට අනුකූලව වෙනස් විය හැකි අතර, එම වෙනස්වීම් ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවි දැන්වීමේ නිවේදනය කරනු ලැබේ.**

නිකුත් කරන කාර්යාලය
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව, 30,
ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : +94 11 2477011, ෆැක්ස් : +94 11 2477687
www.cbsl.gov.lk

එම්. ඉසෙඩ්. එම්. ආසිම්,
රාජ්‍ය ණය අධිකාරී / ලේඛකාධිකාරී.

ලුහුඬු දැන්වීම්

රථවාහන

129

ටයර් සහ ටියුබ්

සේවා

ටයර් ටියුබ් එකම වහලක් යටදී. සියලුම ටයර් වර්ග ෆෝක්ලිෆ්ට හුලං සහ ගල් ටයර් 600x9, 700x12, 650x10, 28x9x15 700x15 සියලුම ක්‍රෙඩිට් කාඩ් භාරගනිමු. විශේෂ මිලට. 1000x20ARP Dag Tyres, 155, ක්‍රව්න් ටයර් කොළඹ 14. 0773134060, 0759889881. *053165*

විවිධ

431

විවිධ දේ

විකිණීම

බේකරි පාන් තැටි හා පාන් ට්‍රේ විකිණීමට ඇත. සැන්විච් තැටි හා බේකරි ට්‍රේ අමතන්න. 0770555291 *052473*

ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ශ්‍රී ලංකාවට විශේෂ සම්මාන දෙකක්

ශක්තිමත් රාජ්‍ය නායකත්වයෙන් සෞඛ්‍යසම්පන්න ජාතියක්

දූරදර්ශී නව නායකත්වය කොවිඩ් පාලනය කළා

මේ වනවිට ලෝකයේ අවධානය ශ්‍රී ලංකාව දෙසට යොමු වී තිබේ. එය සංසිද්ධියක් මුල්කොටගෙනය. පළමුවැන්න ලෙස අප රට දෙස අවධානය යොමු වන්නේ දියමන්ති මෙහෙයුම නිසාය. දෙවැන්න ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු ආසියාතික කලාපයේ රටවල 73 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහා ඉහළින් ඇගයීමට ලක්කොට ජගත් සම්මාන දෙකක් මෙරටට පිරිනැමීම නිසාය.

දියමන්ති මෙහෙයුම යනු නැඟෙනහිර මුහුදේ දී අනතුරට පත් 'නිවි ඩයමන්ඩ්' නම් තෙල් නෞකාව බේරා ගැනීම සඳහා අපේ ආරක්ෂක අංශ ක්‍රියාවට නැංවූ බරපතළ මුහුදු ක්‍රියාන්විතයය. එම තෙල් නෞකාවේ ගබඩා කර ඇති මුළු තෙල් සංචිතය මෙ.ටො.2,70,000ට වැඩිය. නෞකාව පුපුරා ගියේ නම්; තෙල්තොගය සාගරයට මුසු වනු ඇත. ගින්න මේ වන විට පාලනය කර ඇති අතර නැවේ සේවක මණ්ඩලය බේරාගෙන ඇත. එකම එක මරණයක් ද වාර්තා වී නිබේ. මෙහෙයුමේ ප්‍රධානීන් පෙන්වා දෙන අන්දමට විනාශයකින් තොරව සියල්ල සාධනීය ලෙස නිමාවීමට කටයුතු යෙදී ඇත.

මේ අන්දමට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය ඉතා උත්කෘෂ්ට සේවාවක් සපයන බවට ජාත්‍යන්තරය ඇගයීමට ලක්වී තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මවගෙන් දරුවාට HIV ආසාධනය වීම මුළුමනින්ම වැළැක්වූ රටක් ලෙස ශ්‍රී ලංකාව පිළිගෙන ඇත. දෙවැන්න රුබෙල්ලා වෛරසය මේ බිමෙන් තුරන් කර ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව නම් කිරීමය. මෙලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය අගය කරමින් සම්මාන පිරිනැමීම තායිලන්තයේ බැංකොක් නගරය කේන්ද්‍ර කර ගනිමින් ඉකුත් 09 වැනිදා ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු ආසියානු කලාපීය රටවල 73 වැනි සැසිවාරයේ දෙවැනි දිනයේදී අන්තර්ජාල වීඩියෝ තාක්ෂණය භාවිතා කරමින් කොළඹ පිහිටි ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලයේදී එම විශේෂ සම්මාන දෙක ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය වෙත ප්‍රදානය කෙරිණි.

කොවිඩ් 19 ගෝලීය වසංගතය හමුවේ ලෝකයේ ආර්ථික අතින් ප්‍රබලම හා ශක්තිමත්ම රාජ්‍යයන් දැඩි පීඩනයන්ට පත්ව බිඳවැටී තිබෙන මොහොතක ශ්‍රී ලංකාවේ එම තත්ත්වය ඉතා හොඳින් පාලනය කරමින් ලෝකයට ආදර්ශයක් ගත හැකි මට්ටමකට සෞඛ්‍ය අංශය ඉදිරියෙන් සිටියි. මෙලෙස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවා වඩාත් ප්‍රබලව ජනතාවට ලබාදෙමින් නිරෝගී සෞඛ්‍යසම්පන්න ජාතියක් බිහිකිරීම සඳහා රාජ්‍ය නායකත්වය ලැබෙන අතීත තින්දු ඉවහල් වන බව කිව යුතුය. අප පෙර කිව්වා මෙන් ලෝකයේ බොහෝ ප්‍රබල රටවල රාජ්‍ය නායකයින් කොරෝනා වයිරසය හමුවේ තම රටවල ජනතාව පීඩාවට පත්වීම වැළැක්වීමට අපොහොසත් වෙද්දී ශ්‍රී ලංකාවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ශක්තිමත් රාජ්‍ය නායකයකු ලෙස කටයුතු කොට තිබේ. මෙලෙස කොවිඩ් 19 වසංගතයෙන් පීඩා අවම කර ගත් රාජ්‍යයක් ලෙස අප රට ඉදිරියට ගෙන ඒමටත් සෙසු සෞඛ්‍ය අංශ වඩාත් ශක්තිමත් ලෙස ඉදිරියට ගෙන යෑමටත් දැඩි තීන්දු තීරණ ගනිමින් අතීත නව නායකත්වයක් රටට සපයමින් ගෝඨාභය රාජපක්ෂ මහතා සුවිසල් කාර්යභාරයක් ඉටුකරයි. මෙලෙස ක්‍රියාකරන අතරම සංවර්ධනයේ මූලික කුලුනුවලින් එකක් වන්නේ නිරෝගිමත් ජාතියක් නඩත්තු කිරීම බවත් ඒ සඳහා නිශ්චිත වූ මහජන සෞඛ්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම තම රජයේ ප්‍රධාන වගකීම බවත් ජනාධිපතිවරයා පෙන්වා දෙන කරුණකි.

ශ්‍රී ලංකාව බොහෝ දුරට මේ වසංගතයෙන් ආරක්ෂා වී ඇත්තේ මූලික වශයෙන් රජයේ විවිධ අංශ ගන්නා ලද තීරණාත්මක හා කඩිනම් පියවර සහ අපගේ සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කැපීපෙනෙන ප්‍රයත්න නිසාය. මෙරට රෝහල්, රසායනාගාර, නිරෝධායන මධ්‍යස්ථාන සහ ප්‍රජා මට්ටමෙන් සේවයේ නියුතු වෛද්‍යවරු, හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, තාක්ෂණ ශිල්පීන් හා වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයින් අපගේ හමුදාවල ක්‍රියාකාරී සහයෝගය ඇතිව කටයුතු කිරීම නිසා කොවිඩ් 19 වසංගතය පැතිරයෑම පාලනය කිරීමට හැකියාව ලැබී තිබේ.

මේ ප්‍රයත්නයේදී ශ්‍රී ලංකාව කැපීපෙනෙන සාර්ථකත්වයක් අත්කර ගත්තේ ලෝකයේ ඇතැම් සංවර්ධිත රටවල් පවා වසංගතයට ප්‍රමාණවත් පරිදි ප්‍රතිචාර දැක්වීමට අසමත් වූ අවස්ථාවකදීය. ප්‍රමාදවී ප්‍රතිචාර දැක්වීමේ සිට සර්වජන සෞඛ්‍ය රක්ෂණයක් නොතිබීම, එම රටවල සෞඛ්‍ය සේවා ආයතනවල පෙර සූදානමක් නොවීම, ප්‍රමාණවත් තරම් පරීක්ෂණ නොකිරීම, කළමනාකරණ පද්ධති ප්‍රමාණවත් නොවීම ආදී විවිධාකාරී හේතු නිසා වයිරසය පැතිරීම පාලනය කිරීමට බොහෝ සංවර්ධිත රටවල් පවා අසමත් වී තිබේ.

අමෙරිකාවේ මේ වනවිට කොවිඩ් ආසාධිතයින් සංඛ්‍යාව ලක්ෂ 64 ඉක්මවා ඇත. ඉන්දියාවේ එම සංඛ්‍යාව ලක්ෂ 42 ඉක්මවා ඇත. මෙය කොවිඩ් ආසාධිත රෝගීන් වැඩිම සංඛ්‍යාවක් සිටින රටවල් ලේඛනයේ පළමු සහ දෙවන ස්ථාන සඳහන් කිරීමක් වේ. මේ අන්දමට එම රටවල් කොවිඩ් 19 හමුවේ දරුණු ඛේදනීය තත්ත්වයකට මුහුණ පා ඇත. එමෙන්ම දියුණු යුරෝපීය රටවල් ගණනාවක්, බලවත් රුසියාවේ පවා එම තත්ත්වය එසේම බව ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තා මඟින් හෙළි වේ.

කොවිඩ් 19 වසංගතය පාලනය කිරීමේදී ශ්‍රී ලංකාව ලැබූ සාර්ථකත්වය ලෝක සෞඛ්‍ය සංවිධානය සහ යුනිසෙෆ් ආයතනය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන මෙන්ම බොහෝ විදෙස් රටවල්, විචාරකයින් සහ පුද්ගලයින් ප්‍රශංසාවට ලක්කර ඇත.

මේ අන්දමට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව වඩාත් ඉදිරියට ගෙන යාමට තමන්ගේ ධුර කාලයේදී **"ආරෝග්‍යා පරමා ලාභා"** නිරෝගී බව උතුම්ම සැපතයි යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි ගෙන යෑමට ක්‍රියාකරන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇත. ඒ අනුව වඩාත් නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න ජාතියක් ලෙස ශ්‍රී ලංකාව, එහි ජනතාව පත්වනු නොඅනුමානයි. එහි ගෞරවය නිතැතින්ම හිමිවිය යුත්තේ ශක්තිමත් රාජ්‍ය නායකත්වයක් සපයන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාටයි.

ස්විට්සර්ලන්තයේ නිහාල් ලියනගේ

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සබරගමුව පළාත

නිවිතිගල සහ ඇඹිලිපිටිය කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති දැනට පුරප්පාඩු වී පවතින නිවිතිගල හා ඇඹිලිපිටිය කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විය යුතුය. (I ශ්‍රේණියේ අයදුම්කරුවන් නොමැති වුවහොත් පමණක් II ශ්‍රේණිය ද සලකා බලන බැවින්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධරීන්ට ද මේ සඳහා අයදුම් කළ හැකිය).

බඳවා ගන්නා ක්‍රමය :

- විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලකුණු ලබාදීම මගින් (ලකුණු ලබාදීමේ ආකෘතිය www.moe.sg.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය)
- අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව 2020 **ඔක්තෝබර්** 12 දිනට පෙර **"ලේකම්, අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"නිවිතිගල / ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- අයදුම් කරනු ලබන යම් අයදුම්කරුවෙකු ඉහත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පුරප්පාඩු 02 සඳහාම අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, කලාප දෙක සඳහා වෙන වෙනම අයදුම්පත් දෙකක් ඉදිරිපත් කළ යුතු වේ.

ඒ.ඩබ්. රුක්මණී ආරියරත්න,
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර.

2020.09.14

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2020.09.30 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

පරිගණක හා තාක්ෂණ පීඨය

01 ව්‍යවහාරික පරිගණන අධ්‍යයන අංශය

- ඉංජිනේරු ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

- විද්‍යු ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

02 මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය

- පරිගණක ඉංජිනේරු ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

- පරිගණක විද්‍යු ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

03 පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය

- ඉංජිනේරු ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

- පරිගණක විද්‍යු/තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

- ගණිතය ක්ෂේත්‍රය

කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

අයදුම් කරන පිළිවෙල

මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී/ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ www.news.kln.ac.lk විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍යනම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ.මී 23X10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය.

අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු අතර අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග 2020.09.30 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුවේ. අවශ්‍ය නම් යෝග්‍යතාවයට අනුව තෝරා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට කටයුතු කළ හැකිය.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය
2020.09.11

දකුණු පළාත් සභාව

අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

තනතුරු ඇබෑර්තු

01. සේවා ගණය - ආශ්‍රිත නිලධාරී - (MA - 3)

1:1 **සේවා ගණය තුළ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව -**
වැඩසටහන් සහකාර තනතුරු - 02

1:2 **වැටුප් ක්‍රමය -** (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි)
32,200 - 10x445 - 11x660 - 10x730 - 5x750 - 54,960/-

1:3 **වයස -** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 22-45 අතර විය යුතුය.

1:4 **බඳවාගැනීමට අවශ්‍ය සුදුසුකම් -**

1:4.1 **අධ්‍යාපන සුදුසුකම් -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / ආර්ථික විද්‍යාව / සංඛ්‍යානය / වාණිජ විද්‍යාව / ගණිතය / විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

02. සේවා ගණය - කළමනාකරණ සහකාර - (තාක්ෂණික නොවන) (MA 1-2)

2:1 **සේවා ගණය තුළ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව -**
කළමනාකරණ සහකාර - (තාක්ෂණික නොවන) - තනතුරු - 15

2:2 **වැටුප් ක්‍රමය -** (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි)
27,910 - 10x300 - 7x350 - 12x600 - 12x710 - 49,080/-

2:3 **වයස -** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18-45 අතර විය යුතුය.

2:4 **බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් -**

2:4.1 **අධ්‍යාපන සුදුසුකම් -**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

I. සිංහල / දෙමළ

II. ගණිතය
යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව සහ ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පහත සඳහන් විෂය සංරචකයන්ගෙන් සමන්විත මාස හයක (06) කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

1. පරිගණක භාවිතයෙන් සම්මත මෙහෙයුම් පද්ධති යටතේ ලිපිගොනු කළමනාකරණය.
2. පරිගණක වදන් සැකසුම.
3. පැතුරුම් පත් සකස් කිරීම හා භාවිත කිරීම.
4. පරිගණකය භාවිතයෙන් ඉදිරිපත් කිරීම.
5. දත්ත සමුදාය තිර්මාණය හා භාවිතය.
6. අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපෑල භාවිත කිරීම.

❖ **සේවා කොන්දේසි :**

I. බඳවා ගැනීම කරනු ලබන්නේ ස්ථිර තනතුරක් සඳහා වේ.

II. බඳවාගනු ලබන අය සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලැබිය යුතුය.

III. තෝරාගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

IV. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර තනතුරු දරන්නන් සඳහා උපරිම වයස් සීමාව ගණන් ගනු නොලැබේ.

❖ **සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

සියලු විස්තර ඇතුළත් ජීව දත්ත සටහන්, අධ්‍යාපනික සහතික සහ අනිකුත් සුදුසුකම් සහිත සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමග 2020.09.29 දිනට පෙර **"සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

❖ අයදුම්පත් එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ ඉල්ලුම් කරන තනතුර සඳහන් කොට එවිය යුතුය.

❖ දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතුය.

සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.
2020.09.08

මරණීය දණ්ඩනයට යටත් වූ තැනැත්තකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න බැහැ

› එජාප මහලේකම් අකිල විරාජ්

ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 හා 91 වැනි ව්‍යවස්ථාවන් අනුව මරණීය දණ්ඩනයට යටත්ව සිටි තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේදී ඡන්දය දීමට හෝ සුදුසුකමක් නොවන බවද එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් අකිල විරාජ් කාරියවසම් මහතා සඳහන් කරයි.

මරණීය දණ්ඩනයෙන් දඬුවම් ලැබූ අපරාධකරුවකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අසුන් ගත හැකි බවට වන කිසිදු පූර්වගාමී තීන්දුවක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසය තුළ දක්නට නොමැති බවත්, ඒ අනුව ප්‍රේමලාල් ජයසේකර සම්බන්ධයෙන් කතානායකවරයා ගත් අනීතික තීරණය යළි සළකා බැලීම අත්‍යාවශ්‍ය වන අතර, එසේ නොමැතිව පූර්වගාමී නියෝග හා පාර්ලිමේන්තුවේ උසස් සම්ප්‍රදායන් ඉවත ලා කටයුතු කිරීම අනාගතයේදී ත්‍රස්තවාදීන් පවා පාර්ලිමේන්තුවට පත් වීමේ මඟ සකස් කිරීමක් වනු ඇති බවත්, ඒ මහතා නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

එම නිවේදනයේ මෙසේද සඳහන් වේ.

ප්‍රේමලාල් ජයසේකර එරෙහිව බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් නඩුකරය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේමලාල් ජයසේකර පාර්ලිමේන්තු රැගෙන යාමට අවශ්‍ය නියෝග ලබා ගැනීමට ගොනු කළ නඩුකරයකි.

මෙම නඩුවේදී අභියාචනාධිකරණ විනිසුරු නවාස් මහතා ප්‍රකාශ කර ඇත්තේ **"**මෙම අධිකරණය කිසි ලෙසකින්වත් අදාළ පත්වීමේ වලංගු භාවය හෝ අවලංගු භාවය, ඔහුගේ පත්වීමේ හෝ වෙනත් නුසුදු භාවයක් සම්බන්ධව විමසීමක් නොකරන අතර, බන්ධනාගාර කොමසාරිස්වරයාගේ ප්‍රශ්න ගත ලිපිය මත අභියෝග කොට ඇති පරිපාලන නීති කෙරෙහි පමණක් අවධානය යොමු කරයි. තීන්දුවේ වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ **"**පාර්ලිමේන්තු සභා ගර්භයේ අසුන් ගැනීම, ඡන්දය ප්‍රකාශ කිරීම යන කරුණු මෙම අධිකරණය හමුවේ ප්‍රශ්න ගත කරුණු නොවන අතර ඊට අදාළ ක්‍රියාමාර්ගය ලෙස ඉතා පැහැදිලිව දක්වා ඇත්තේ **"**එම ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ කථානායකවරයා හෝ වෙනත් නිසි අධිකාරයක් විසින් තීරණය කළ යුත්තක් **"** බවයි.

ඒ අනුව අභියාචනාධිකරණ නියෝගයේ ප්‍රේමලාල් ජයසේකර යන අයට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දැරිය හැකි බවට වන නියෝගයක් කිසි ලෙසකින්වත් ප්‍රකාශ කර නැති අතර, ශ්‍රේෂ්ඨාධිකරණය සරත් ෆොන්සේකා එරෙහිව පාර්ලිමේන්තු මහ ලේකම් නඩුවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව සරත් ෆොන්සේකා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දැරීමට නුසුදුස්සකු වන බවට කතානායකවරයා ලබා දී තිබූ නියෝගය ස්ථිර කරමින් ලබා දුන් නියෝගයට එරෙහි නියෝගයක් ලබා දීමේ නෛතික හැකියාක් අභියාචනාධිකරණයට කිසිසේත්ම නොමැත.

ශ්‍රේෂ්ඨාධිකරණය යුද්ධාදිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වැනි ව්‍යවස්ථාවේ දක්වන ක්ෂේත්‍රය මත වන නිසි අධිකරණයක් බවට තීරණය කරන ලද අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඈ) හා 91 (1) (අ) ව්‍යවස්ථාවන් පහත දක්වා ඇත්තේය.

89 (ඈ) ව්‍යවස්ථාව- **"**යම් කිසි තැනැත්තෙක් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට කවර වූ හෝ අධිකරණයක් විසින් වරදකරු කරණු ලැබීමෙන් පසුව නියම කරන ලද හය මාසයකට නොඅඩු කාලයකට කවර වූ හෝ ආකාරයක බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම්, නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන්ම විඳ සිටියේ නම්, නැතහොත් මරණීය දණ්ඩනයට යටත්ව සිටී නම් නැතහොත් එවැනි දණ්ඩන නියමයන් ක්‍රියාවේ යෙදවීම වෙනුවට හය මාසයකට නොඅඩු කාලයකට බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම්, නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් විඳ සිටියේ නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමකදී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකුවීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සකු නොවන්නේය.

91 (1) (අ) ව්‍යවස්ථාව- **"**යම් කිසි තැනැත්තෙකු 89 ව්‍යවස්ථාවේ දක්වා ඇති කවර වූ හෝ නුසුදුසුකමකට යටත් වේ නම් නැතහොත් එවැනි නුසුදුසුකමකට භාජනය වුවහොත් ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේදී ඡන්දය දීමට හෝ සුදුස්සකු නොවන්නේය. **"**

ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දැරීමේ නුසුදුසු භාවය සම්බන්ධ නියෝගයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 හා 91 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ලබා දිය යුත්තේ කථානායකවරයා විසින් බව අතිශයින් පැහැදිලි වේ.

සරත් ෆොන්සේකා මහතාගේ නුසුදුසු භාවය සම්බන්ධ කථානායකවරයාගේ නියෝගයට අමතරව මෙම කාරණයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු ලබා දී ඇති පූර්වගාමී තීන්දු කිහිපයක් පහත දැක්වේ.

එක්සත් රාජධානියේ පහළ මන්ත්‍රී මණ්ඩලය මඟින් මන්ත්‍රීවරුන් දෙදෙනකු ධුරයෙන් නෙරපනු ලැබුවේ ඔවුන් සිර දඬුවම් ලැබීම නිසාය.

වර්ෂ 1922 දී හොරේෂියෝ බොටම්ලි මන්ත්‍රීවරයා ධුරයෙන් පහකිරීමට හේතු වූයේ වංචනික ක්‍රියාවක් හේතුවෙන් වසර 7ක සිර දඬුවම් නියම වූ නිසාය. එමෙන්ම වර්ෂ 1954 දී පීටර් බේකර් මන්ත්‍රීවරයා කුඩ ලේඛන සැකසීමේ චෝදනාව යටතේ වසර 7ක සිර දඬුවම් නියම වීම හේතුවෙන් මන්ත්‍රී ධුරයෙන් නෙරපා හරින ලදී.

කැනඩා පාර්ලිමේන්තු මන්ත්‍රී ෆෙඩ් රෝස් හට වසර 6ක සිර දඬුවම් නියම වීම යන කාරණය මත මහජන මන්ත්‍රී මණ්ඩලයේ කතානායකවරයා ඔහුගේ ධුරය හිස් වූ බවට නියෝග කරන ලදී.

කැනඩා ශ්‍රේෂ්ඨාධිකරණය හාවි එදිරිව නිවි බ්‍රන්ස්වික් නඩුවේදී විනිසුරු මැක්ලේඩ් ප්‍රකාශ කර සිටි **"**ප්‍රජාතන්ත්‍රවාදයන් සුරක්ෂිත වීමට නම් ඒ විසින් නියෝජනය ලැබීමට සිටින හෝ ධුරයන් දරමින් සිටින අයගේ වැදගත්කම සහතික කළ යුතුය**"** යන ප්‍රකාශය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ උද්ගතව ඇති කාරණයට අතිශයින් අදාළ බව කිව යුතුයි.

කතානායකවරයා ඔහුගේ අනීතික තීරණය යළි සළකා බැලීම අත්‍යාවශ්‍ය වන අතර එසේ නොමැතිව පූර්වගාමී නියෝග හා පාර්ලිමේන්තුවේ උසස් සම්ප්‍රදායන් ඉවත ලා කටයුතු කිරීම අනාගතයේදී ත්‍රස්තවාදීන් පවා පාර්ලිමේන්තුවට පත් වීමේ මඟ සකස් කිරීමක් වනු ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

කාර්ය මණ්ඩල පුරප්පාඩු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, හොඳින් ස්ථාපිත නියාමන රාමුවක් යටතේ වූ උපක්‍රමශීලී සැලසුම්කරණය, වෘත්තීමය මගපෙන්වීම සහ දැඩි සුපරීක්ෂාව මගින් ආරක්ෂාව සහිත කාර්යක්ෂම ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික ව්‍යවස්ථාදායක අවශ්‍යතාවයන් සහ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශ කරන ලද පරිචයන්ට අනුකූල වන ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් තහවුරු කරයි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පහත තනතුරු සඳහා ඇති පුරප්පාඩු පිරවීම සඳහා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ හොඳ සුදුසුකම් හා විස්තීර්ණ පළපුරුද්දක් සහිත උද්යෝගීමත් අධික උනන්දුවක් සහ ස්වයංගාමක පුද්ගලයන් අපේක්ෂා කරයි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

තනතුරු කේතය HM-2-2ADG - තනතුරු ගණන 01

වැටුප :

- මූලික වැටුප රු. 93,020/- ක් බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි වැටුප් පරිමාණය 93,020 - 12X2,700 - 125,420 කි)
- අනෙකුත් දීමනා - ජීවන වියදම් දීමනාව රු. 7,800/- + ඉන්ධන දීමනාව - ලීටර් 140 + ප්‍රවාහන දීමනාව රු. 50,000/- (තමන්ගේ වාහනය භාවිතා කරන්නේ නම්) + විශේෂ තාක්ෂණික දීමනාව (කරුණාකර ශ්‍රීලසිගුසේඅ. වෙබ් අඩවියට යොමු වන්න) - රු. 280,000/-
- අනෙකුත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණ කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අපේක්ෂකයන් :

01. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර තුනකට (03) නොඅඩු කාල සීමාවක ප්‍රථම උපාධියක්

සහ

02. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ ගුවන් සේවාවට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පවත්වනු ලබන සති අටක (08) නොඅඩු (කළමනාකාර මට්ටමේ) ගුවන් ආරක්ෂණ, ගුවන් සංතරණ සේවා, ගගන යාත්‍රාංගන, පිරිස් බලපත්‍ර තිකුත් කිරීම, ගුවන් යානා මෙහෙයුම්, ගුවන් යෝග්‍යතාව සම්බන්ධයෙන් පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කර තිබීම

සහ

03. සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ගුවන් සේවා ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද.

රැකියා විස්තරය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිසෙන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගගන නාවික සේවා රෙගුලාසි)

තනතුරු කේතය HM-2-1-DDG1 - තනතුරු ගණන 01

වැටුප :

- මූලික වැටුප රු. 91,645/- ක් බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි වැටුප් පරිමාණය 91,645 - 12X2,700 - 124,045 කි)
- අනෙකුත් දීමනා - ජීවන වියදම් දීමනාව රු. 7,800/- + ඉන්ධන දීමනාව - ලීටර් 140 + ප්‍රවාහන දීමනාව රු. 50,000/- (තමන්ගේ වාහනය භාවිතා කරන්නේ නම්) + විශේෂ තාක්ෂණික දීමනාව (කරුණාකර ශ්‍රීලසිගුසේඅ. වෙබ් අඩවියට යොමු වන්න) - රු. 285,000/-
- අනෙකුත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණ කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අපේක්ෂකයන් :

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර තුනකට (03) නොඅඩු කාල සීමාවක ප්‍රථම උපාධිය

සහ

02. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ ගුවන් සේවාවට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පවත්වනු ලබන සති අටක (08) නොඅඩු (කළමනාකාර මට්ටමේ) ගුවන් සංතරණ සේවාවන් හෝ ගගන යාත්‍රාංගන පිළිබඳ පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කර තිබීම

සහ

03. සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ගුවන් සංතරණ කිරීමේ සේවාව හෝ ගගන යාත්‍රාංගන ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමක අවම වශයෙන් වසර දහ අටක (18) සේවා පළපුරුද්දක්

රැකියා විස්තරය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිසෙන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් මෙහෙයුම් නිරූපදනතා රෙගුලාසි)

තනතුරු කේතය HM-2-1-DDG2 - තනතුරු ගණන 01

වැටුප :

- මූලික වැටුප රු. 91,645/- ක් බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි වැටුප් පරිමාණය 91,645 - 12X2,700 - 124,045 කි)
- අනෙකුත් දීමනා - ජීවන වියදම් දීමනාව රු. 7,800/- + ඉන්ධන දීමනාව - ලීටර් 140 + ප්‍රවාහන දීමනාව රු. 50,000/- (තමන්ගේ වාහනය භාවිතා කරන්නේ නම්) + විශේෂ තාක්ෂණික දීමනාව (කරුණාකර ශ්‍රීලසිගුසේඅ. වෙබ් අඩවියට යොමු වන්න) - රු. 285,000/-
- අනෙකුත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණ කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අපේක්ෂකයන් :

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර තුනකට (03) නොඅඩු කාල සීමාවක ප්‍රථම උපාධියක්

සහ

02. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ ගුවන් සේවාවට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පවත්වනු ලබන සති අටක (08) නොඅඩු (කළමනාකාර මට්ටමේ) පිරිස් බලපත්‍ර තිකුත් කිරීම, ගුවන් යානා මෙහෙයුම්, ගුවන් යෝග්‍යතාවය පිළිබඳ පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කර තිබීම

සහ

03. සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක පිරිස් බලපත්‍ර තිකුත් කිරීම, ගුවන් යානා මෙහෙයුම්, ගුවන් යෝග්‍යතාව පිළිබඳ කළමනාකාර මට්ටමක අවම වශයෙන් වසර දහ අටක (18) සේවා පළපුරුද්දක්

රැකියා විස්තරය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිසෙන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කළමනාකරණ)

තනතුරු කේතය HM-2-1-DDG3 - තනතුරු ගණන 01

වැටුප :

- මූලික වැටුප රු. 91,645/- ක් බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි වැටුප් පරිමාණය 91,645 - 12X2,700 - 124,045 කි)
- අනෙකුත් දීමනා - ජීවන වියදම් දීමනාව රු. 7,800/- + ඉන්ධන දීමනාව - ලීටර් 140 + වෘත්තීය දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2017 පරිදි
- අනෙකුත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණ කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අපේක්ෂකයන් :

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර තුනකට (03) නොඅඩු කාල සීමාවක ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ හෝ පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

සහ

02. ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ, පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ මූල්‍ය කළමනාකරන, හෝ පරිපාලනය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

03. සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක මූල්‍ය කළමනාකරණය, පරිපාලනය හෝ විගණණය පිළිබඳ කළමනාකරණ ර මට්ටමක අවම වශයෙන් වසර දහ අටක (18) සේවා පළපුරුද්ද

රැකියා විස්තරය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිසෙන්න.

අධ්‍යක්ෂ (ගුවන් ආරක්ෂණ)

තනතුරු කේතය HM-1-1-D1 - තනතුරු ගණන 01

වැටුප :

- මූලික වැටුප රු. 80,295/- ක් බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි වැටුප් පරිමාණය 80,295 - 15X2,270 - 114,345 කි)
- අනෙකුත් දීමනා - ජීවන වියදම් දීමනාව රු. 7,800/- + ඉන්ධන දීමනාව - ලීටර් 120 + ප්‍රවාහන දීමනාව රු. 50,000/- (තම වාහනය භාවිතා කරන්නේ නම්) + විශේෂ තාක්ෂණික දීමනාව (කරුණාකර ශ්‍රීලසිගුසේඅ. වෙබ් අඩවියට යොමු වන්න) - රු. 185,000/-
- අනෙකුත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණ කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අපේක්ෂකයන් :

විකල්පය - 1

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර තුනකට (03) නොඅඩු කාල සීමාවක ප්‍රථම උපාධියක්

සමග

02. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ ගුවන් සේවාවට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන සති හයකට (06) නොඅඩු පාඨමාලා (කළමනාකරණ මට්ටමේ) හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් ලබන ඕනෑම සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

සහ

03. සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ගුවන් සේවා ආරක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

විකල්පය - 2

01. පශ්තාත් උපාධි සුදුසුකම් (ගුවන් සේවා ක්ෂේත්‍රයේ Masters) හෝ ගුවන් සේවා ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන සති හයකට (06) නොඅඩු පාඨමාලා (කළමනාකරණ මට්ටමේ) හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් ලබන ඕනෑම සමාන සුදුසුකමක් සාර්තකව සම්පූර්ණ කර තිබීම

සහ

02. සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ගුවන් ආරක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්දක්

රැකියා විස්තරය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිසෙන්න.

අධ්‍යක්ෂ (ගුවන් යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා)

තනතුරු කේතය HM-1-1-D7 - තනතුරු ගණන 01

වැටුප :

- මූලික වැටුප රු. 80,295/- ක් බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 වැටුප් පරිමාණය 80,295 - 15X2,270 - 114,345 කි)
- අනෙකුත් දීමනා - ජීවන වියදම් දීමනාව රු. 7,800/- + ඉන්ධන දීමනාව - ලීටර් 120 + ප්‍රවාහන දීමනාව රු. 50,000/- (තම වාහනය භාවිතා කරන්නේ නම්) + විශේෂ තාක්ෂණික දීමනාව (කරුණාකර ශ්‍රීලසිගුසේඅ. වෙබ් අඩවියට යොමු වන්න) - රු. 305,000/-
- අනෙකුත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණ කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අපේක්ෂකයන් :

විකල්පය - 1

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර තුනකට (03) නොඅඩු කාල සීමාවක ගගන නාවික ඉංජිනේරු හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

02. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ ගුවන් ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන සති හයකට (06) නොඅඩු ගුවන් මෙහෙයුම් නිරූපදනා / යෝග්‍යතාව පිළිබඳ පූහුණු පාඨමාලා (කළමනාකාර මට්ටමේ) හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් ලබන ඕනෑම සාමාන්‍ය සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

සහ

03. සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ ගුවන් යානා තඩත්තු ඉංජිනේරුවරයෙකු ලෙස අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

විකල්පය - 2

01. ගුවන් සේවාවට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන සති හයකට (06) නොඅඩු ගුවන් යෝග්‍යතාව (කළමනාකාර මට්ටම) පිළිබඳ රජයේ සුරක්ෂිතතා පරීක්ෂක පාඨමාලාව ඇතුළු ගුවන් යානා තඩත්තුව පිළිබඳ පූහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගනු ලබන ඕනෑම සමාන සුදුසුකමක් සාර්ථකම සම්පූර්ණ කර තිබීම

සහ

02. ගුවන් යානා තඩත්තු ඉංජිනේරුවරයෙකු ලෙස අවම වශයෙන් වසර විස්සක (20) සේවාව

රැකියා විස්තරය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිසෙන්න.

- අපේක්ෂකයන් වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, සී/ස. ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, දේශීය ගුවන් සේවා සමාගමක හෝ පියාසර පාසලක සේවය කල අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- සම්මත අයදුම්පත ඇතුලු ඉහත සඳහන් තනතුරු පිළිබඳ වැඩිදුර තොරතුරු, විශේෂ තාක්ෂණ දීමනාව සඳහා වන අවශ්‍යතා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය. (www.caa.lk)
- අයදුම් කළ තනතුර / තනතුරු සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට සුදුසුකම් සහ පළපුරුද්ද සඳහා ලේඛනගත සාක්ෂිවල පිටපත් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.
- නියමිත අයදුම්පත් ආකෘති මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රජයේ ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2020.09.28 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාදිංචි තැපැල් මගින් හෝ employment@caa.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ඊමේල් මගින් ඉදිරිපත් කළ හැකිය. ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් ලැබුනු බවට දන්වනු ලැබේ.
- අයදුම්පත් ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කොට කටුනායක මිනුවන්ගොඩ පාර, නො. 152/1, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී තමට එවිය යුතුය.
- තනතුරු එකකට වැඩි ගණනකට ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.
- යෝග්‍යතා උපමාන සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ / පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය,
නො. 152/1, රේඩාර් කුළුණ ඉදිරිපිට,
මිනුවන්ගොඩ පාර,
කටුනායක.

2020.09.14

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
වෙළඳ අමාත්‍යාංශය

පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සහකාර අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) තනතුර - MM 1-1 (තනතුරු 02 යි)

රැකියා විස්තරය : පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හා ඒවා දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම, පනතේ විධිවිධාන පරිදි පරීක්ෂණ පැවැත්වීම, පනතේ විධිවිධාන පරිදි අධිකරණයේ පනවන ලද නඩු වලට අදාළ පැමිණිලි, චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීම, නඩු විභාග ස්වාධීනව පැවැත්වීම ඇතුළුව අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම, වෙනත් නියාමන මණ්ඩල සමග අවශ්‍ය පරිදි හා අවශ්‍ය වූ විටදී සම්බන්ධීකරණය, පනතේ විධිවිධාන පරිදි අධිකාරිය මගින් එළැඹෙන ගිවිසුම්, කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ/ හෝ බලාත්මක කිරීම, අධිකාරියට එරෙහිව අධිකරණයේ පනවන ලද නඩු විභාග වලට අදාළව අවශ්‍ය ලිපිලේඛන සකස් කිරීම, නෛතික කරුණු පිළිබඳව අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් හා සම්බන්ධීකරණය, දැනුවත්වීමේ වැඩ සටහන් සැලැසුම් කිරීම සහ මෙහෙයවීම සහ අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) විසින් පවරනු ලබන වෙනත් රාජකාරී කටයුතු සිදුකිරීම.

සුදුසුකම් :

බාහිර : සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සහිත නීතිඥවරයකු වීම.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 : රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛන අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

02. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර - MM 1-1- (තනතුරු 01 යි)

රැකියා විස්තරය : මානව සම්පත් සැළසුම් කිරීම, සේවකයින් බඳවාගැනීම් හා තෝරා ගැනීම්, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය අධීක්ෂණය කිරීම, මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සහායවීම, විධායක මට්ටමේ නොවන සේවකයින්ගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම, විධායක මට්ටමේ නොවන සේවකයින්ගේ විනය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, සහකාර අධ්‍යක්ෂ මට්ටමට අඩු පෞද්ගලික ලිපිගොනු භාරව කටයුතු කිරීම, කාර්යාලීය ප්‍රවාහන කටයුතු පරිපාලනය කිරීම, මුද්‍රණ කටයුතු, ගබඩාව හා ඉන්වෙන්ට්‍රි වල නිරතවීම, පැමිණීම, නිවාඩු සහ ආයතනික කරුණු අධීක්ෂණය කිරීම හා උපදේශනය, අදාළ රජයේ චක්‍රලේඛණ සමග යාවත්කාලීනව සිටීම, කාර්ය මණ්ඩල ස්ථාන මාරු යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, පුහුණු කිරීමේ අවශ්‍යතා විශ්ලේෂණය සහ පුහුණු සැළසුම් සහ ක්‍රියාත්මක කිරීම් සංවර්ධනය, සේවක වරප්‍රසාද ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, සේවා සපයන්නන්ගේ සියලු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම, අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) විසින් පවරන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, පිරිස් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හා රාජ්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය සමග මානව සම්පත් කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 : රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛන අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

03. සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කටයුතු) තනතුර - MM 1-1 (තනතුරු 06)

රැකියා විස්තරය : දිස්ත්‍රික් මට්ටමේ සියලු ක්‍රියාකාරකම් වගකීම, ක්‍රියාකාරී සැලසුම් හා අයවැය සකස් කොට අධීක්ෂණය කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන් හා දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රධාන නිලධාරීන් හා සමග සම්බන්ධීකරණය වීම, පවරන ලද කාර්ය සාධන ඉලක්කයන් සපුරා ගැනීම් සඳහා ඒකකයන්ට සම්බන්ධිත සියලුම නිලධාරී සමග සම්බන්ධීකරණය, දිස්ත්‍රික් ඒකකයන්හි කාර්ය සාධනය ඉහළ නැංවීමට යෝජනා හඳුනාගෙන ඉදිරිපත් කිරීම, ප්‍රගති වාර්තා සකස් කොට ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණ, වැටලීම් සහ පාරිභෝගික දැනුවත් කිරීම් වැඩසටහන් සැලසුම් කිරීම හා අධීක්ෂණය, පාරිභෝගික සමිති ස්ථාපනය සම්බන්ධීකරණය කිරීම, දිස්ත්‍රික් ඒකකයන්හි දත්ත ගබඩා නඩත්තු කිරීම, වෙළඳපල සමීක්ෂණ සැළසුම් කොට අධීක්ෂණය කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය, අලෙවිකරණය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හෝ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 : රු. (53,175-10X1,375-15X1,910-95,575), ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

04. සහකාර අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු) තනතුර MM 1-1 (තනතුරු 02 යි)

රැකියා විස්තරය : අදාළ ව්‍යාපෘති පිළිබඳ ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය සකස් කිරීම හා අධීක්ෂණය, පාරිභෝගික අයිතීන්, වගකීම් සහ පාරිභෝගික කටයුතු පිළිබඳ මහජන දැනුවත්වීමේ වැඩසටහන් සංවර්ධනය කිරීම, පාරිභෝගික කටයුතු පිළිබඳව වාර්ෂික උත්සවාංග, වැඩ මුළු, ප්‍රදර්ශන සහ සල්පිල් සංවිධානය කිරීම, පාරිභෝගික සංවිධාන ස්ථාපනය කිරීම, මහජන දැනුවත් කිරීමේ වැඩ සටහන් වල ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සහ අධීක්ෂණය, කාර්ය සාධන වාර්තා, මාධ්‍ය වාර්තා/ නිවේදන සකස් කොට ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු) විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය, අලෙවි කරණය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හෝ විද්‍යාව පිළිබද ප්‍රථම උපාධියක් සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

05. සහකාර අධ්‍යක්ෂ (තරගකාරීත්ව ප්‍රවර්ධන) තනතුර MM 1-1 (තනතුරු 01 යි)

රැකියා විස්තරය : භාණ්ඩ හා සේවා සඳහා වෙළඳපල පාලනයේ ඒකාග්‍රතාව විභාගකර බැලීම, වෙළඳපල පාලනයේ අනිසි යෙදවීම් පිළිබඳව සෝදිසි කිරීම හා අවශ්‍ය තැන්හිදී පර්යේෂණ පැවැත්වීම, තරගකාරී නොවන/ අයුතු වෙළඳ ව්‍යවහාරයන්ට අදාළව සෝදිසි කර බැලීම, පර්යේෂණ ව්‍යාපෘති සැලැසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා ඇගයීමේ කටයුතු වලට සහාය වීම, පර්යේෂණ වාර්තා සකස් කිරීම, තරගකාරී නොවන ව්‍යවහාරයන් සහ වෙළඳ වගකීම් පිළිබඳ පක්ෂපාතීත්වය පිළිබඳ දැනුවත්වීමේ වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම, තරගකාරී ප්‍රතිපත්තියෙහි වත්මන් ආර්ථික කටයුතු පිළිබඳ දැනුම හා සම්බන්ධ ගෝලීය ප්‍රභවයන් සමග සම්බන්ධතා පවත්වාගෙන යාම, දත්ත ගබඩා පවත්වාගෙනයාම, අධ්‍යක්ෂ (තරගකාරීත්ව ප්‍රවර්ධන) විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ අලෙවිකරණය පිළිබඳ උපාධියක් සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

06. සහකාර අධ්‍යක්ෂ (මිලකිරීම් හා කළමනාකරණ) තනතුර MM 1-1 (තනතුරු 01 යි)

රැකියා විස්තරය : භාණ්ඩ හා සේවා මිල කිරීම කළමනාකරණය කිරීම සඳහා සහායවීම, භාණ්ඩ හා සේවාවන්හි පිරිවැය ව්‍යුහයන් සකස් කිරීම, විශේෂිත භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් පරීක්ෂාකර බැලීම, පිරිවැය ඇගැයීම සහ නියාමනය, මිලකිරීමේ පරීක්ෂණ පැවැත්වීමට සහායවීම, මිලකිරීමේ සූත්‍රයන් පිළිබඳ සාමායික සමාලෝචනයන්ට සහායවීම, වෙළඳපල තත්වයන් පිළිබඳ දත්ත ගබඩා අධීක්ෂණය හා නඩත්තු කිරීම, ජාත්‍යන්තර/ දේශීය මිලගණන් සහ අත්‍යවශ්‍ය වෙළඳ භාණ්ඩ පිළිබඳ නිෂ්පාදන රටාවන් මිල කිරීමේ කරුණු පිළිබඳ වෙනත් අංශ සම්බන්ධීකරණය කිරීම හා සහාය වීම, කාර්යක්ෂම අධ්‍යයනයන් සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහායවීම, පනතේ විධිවිධානයන් ප්‍රකාරව උපදේශාත්මක යොමුකිරීම් පිළිබඳව විභාග කිරීම හා වාර්තා කිරීම සඳහා සහායවීම, අධ්‍යක්ෂ (මිල හා කළමනාකරණ) විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය, වාණිජ්‍යය හෝ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

හෝ

ICASL, CIMA, ACCA හි අන්තර්/මධ්‍ය මට්ටමේ සහතිකයක්, සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් ප්‍රකාරව වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

07. පද්ධති පරිපාලක (II ශ්‍රේණිය) තනතුර JM 1-1 (තනතුරු 01 යි)

රැකියා විස්තරය : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හි තොරතුරු පද්ධති කළමනාකරණය භාරව කටයුතු කිරීම, තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සියලු කරුණු හැසිරවීම, අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක පද්ධති/ තොරතුරු තාක්ෂණ පරිපාලක/ නිලධාරී හෝ සමාන තනතුරක අවම වශයෙන් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : බලාත්මක කිරීම්/ මෙහෙයුම්/ ව්‍යාප්ත කාණ්ඩයේ (MA5-2) තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : JM 1-1 2016 රු. (42,600-10X755-18X1,135-70,580) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

08. දත්ත සම්බන්ධීකාරක (II ශ්‍රේණිය) - MA 5-2 තනතුර (තනතුරු 01 යි)

රැකියා විස්තරය : දත්ත සමුදායන්හි දත්ත ඇතුළත් කිරීම, නඩත්තුව හා යාවත්කාලීන කිරීම, යෙදවුම් මෘදුකාංගය භාවිත කරමින්, දත්ත වින්‍යාසය හා වාර්තා නිරුක්තිය, වෙබ් අඩවි, දත්ත ඇතුළත් කිරීම යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම සහ අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය/ තොරතුරු පද්ධති හෝ පරිගණක කරණය පිළිබඳ ප්‍රථම උපාධියක්.

අමතර සුදුසුකම් : අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

වැටුප් පරිමාණය : MA 5-2 2016 රු. (36,850-10X755-15X930-5X1,135-64,025) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදිය.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

පොදු කොන්දේසි :

වෙනත් දීමනා : වැටුපට අමතරව අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සහ වෙනත් අදාළ දීමනාද ගෙවනු ඇත.

පත්කිරීමේ ස්වභාවය : සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා සහ අදාළ රජයේ චක්‍රලේඛ පරිදි ලැබීම් සඳහා හිමිකම් සහිත ස්ථිර තනතුරකි.

බඳවාගැනීමේ දී වැටුප : බාහිරව බඳවා ගනු ලබන පිරිස් වැටුප් පරිමාණයේ මූලික පියවරෙහි තබනු ඇත.

අභ්‍යන්තරව බඳවාගනු ලබන අය ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි නිර්ණය කෙරේ

ස්ථිර කිරීම : පත්කරනු ලබන අයදුම්කරුවන් වසර 3 ක පරිවාස කාලයකට යටත්වේ. ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය හා හැසිරීම පරිවාස කාලය තුළ සතුටුදායක වේ නම් ඔහු/ ඇය සේවයේ ස්ථිර කරනු ඇත. අභ්‍යන්තරව තෝරා ගන්නා අයදුම්කරුවන් දැනටමත් දරන තනතුරෙහි ස්ථිර කර ඇත්නම් ඔවුන් එක් වසරක වැඩ බලන කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය : අධිකාරිය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙහෙයවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වෙනත් : ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

තනතුරෙහි රාජකාරී මනාව ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුසුකම්ලත් අයැදුම්කරුවන්හට තම අයදුම්පත් මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත පහත සඳහන් ලිපිනය වෙත 2020-09-28 වන දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සුදුසුකම් සනාථ කෙරෙන අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන, අසම්පූර්ණ හා අවසාන දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයථා බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සළකනු ලැබේ. ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. කරුණාකර පහත ලිපිනය වෙත ඔබගේ අයදුම්පත් යොමු කරන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
2 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
නො. 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

දිනමිණ The Dinamina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

වාරිමාර්ග අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
ටෙන්ඩර් දැන්වීම

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය
(CRIP)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (International Development Association) වෙතින් දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ඉල්ලුම් කර ඇති අතර, එම ණය මුදලින් කොටසක් පහත වගුවේ දැක්වෙන ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයන් සඳහා යෙදවීමට අදහස් කර ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාති වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10, ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 09 වන මහලේදී **2020-10-06 දින පෙ.ව. 11.00** දක්වා එම කාර්යය සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා මුදු, තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	පළපුරුද්ද / ඉක්ටැඩ් ලියාපදිංචි ශ්‍රේණිය	ලංසු බැඳුම්කරය / ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව
CRIPAF/WORKS/ MASL/NCB/131	බෝවතැන්න කාර්යය භාර ඉංජිනේරු කාර්යාලය යටතේ ඇති සුදු ගඟ හරහා කෝට්ටේගොඩ පාලම ඉදිකිරීම. (ඇස්තමේන්තු මුදල : රු. මි. 16.85 වැට් රහිතව සහ කොන්ත්‍රාත් කාලය : දින 60)	ශ්‍රේණිය : C6 හෝ ඉහළ ප්‍රවිණතාවය : පාලම් ඉදිකිරීම	ලංසු බැඳුම්කර මුදල : රු. 230,000.00 වලංගු කාල සීමාව : 2021.01.19 දින දක්වා ටෙන්ඩර් ගාස්තුව : රු. 5,000.00

අදාළ සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවන් සමාගම් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර එක් එක් කාර්යය සඳහා මුදලින් ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ගෙවා කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ගේ කාර්යාලයෙන් මෙම කාර්යයන් සඳහා වූ ටෙන්ඩර්පත් ලබා ගත හැක. ටෙන්ඩර්පත් නිකුත් කරනුයේ 2020-09-14 දින සිට 2020-10-05 දින දක්වා පෙ.ව. 09.30 සිට ප.ව. 03.00 දක්වා පමණි.

ටෙන්ඩර් පත් කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ගේ කාර්යාලයෙන් 2020-09-14 දින සිට 2020-10-05 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව. 09.30 සිට ප.ව. 04.00 දක්වා කිසිදු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැක.

කවරයේ ඉහළ වම් කෙළවර ටෙන්ඩරයේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර, මුල් පිටපත හා තවත් පිටපතකින් යුතුව කවරයේ බහා මුදු, තබන ලද ටෙන්ඩර්පත් 2020-10-06 දින පෙ.ව. 11.00 ට පෙර ලැබෙන සේ **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ අධ්‍යක්ෂ ජනරාල්** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ පසුව ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර්පත් විවෘත කරන අතර, ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුද ඔහුගේ නියෝජිතයින්ද ඇතුළුව දෙදෙනෙකුට නොවැඩි වන සංඛ්‍යාවකට එම අවස්ථාවට සහභාගි විය හැක.

මෙම කාර්යයන් පිළිබඳ වැඩි විස්තර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, තාක්ෂණ සේවා අංශය වෙතින් ලබාගත හැක. **දුරකථන අංක 011-2673264, 011-2689651.**

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

ප්‍රසම්පාදන දැන්වීම
ජා ඇල නගර සභාව
කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමයි

ජා ඇල නගර සභාවේ නිලධාරීන්ගේ රාජකාරී ගමන් සඳහා යොදවා ගැනීමට ඩීසල්වලින් ක්‍රියා කරනු ලබන 12 කට පමණ ගමන් කළ හැකි වායුසමනය සහිත මනා ධාවන තත්වයේ පවතින වෑන් රථයක් කුලී පදනම මත රියදුරු රහිතව ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

කුලී පදනම මත වාහනය සැපයීමේ දී එම වාහනයේ නඩත්තු වියදම, වාර්ෂික පූර්ණ රක්ෂණය සඳහා වියදම, වාර්ෂික වායු විමෝචන සහතිකය සහ ආදායම් බලපත්‍රය සඳහා වන වියදම වාහන හිමිකරු විසින් දැරිය යුතු අතර, ඉන්ධන සඳහා වන වියදම සහ රියදුරෙකු යෙදවීම ජා ඇල නගර සභාව මඟින් සිදු කරනු ලැබේ.

පහත ආකෘතියට අනුව මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර, එම අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පළමු පිටපත හා දෙවන පිටපත යනුවෙන් පිටපත් දෙකකින් සකස් කර එම පිටපත් වෙන වෙනම කවර දෙකක බහාලීම කළ යුතු අතර, බහාලන කවරවල වම් පස ඉහළ කෙළවරේ **"කුලී පදනම මත වෑන් රථයක් සපයා දීම සඳහා මිළ ගණන්"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඉන් පසුව කවර වල බහාලන ලද පළමු පිටපත සහ දෙවන පිටපත යන දෙකම වෙනත් ලිපි කවරයක දමා මුදු, තබා ජා ඇල නගර සභාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2020.09.28 දින ප.ව 2.00 වන විට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සභාපති, නගර සභාව, ජා ඇල යන ලිපිනයට ලැබෙන සේ එවීම හෝ ජා ඇල නගර සභාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. නියමිත වේලාවෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු පිළිබඳ අවසාන තීරණය ජා ඇල නගර සභාව සතුය. (දුරකථන අංකය - 011-2236822)

ආකෘතිය

කුලී පදනම මත වෑන් රථයක් සපයාදීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීම,
ජා ඇල නගර සභාව

01. වාහනය අයිතිකරුගේ නම : .....
02. ලිපිනය : .....
03. දුරකථන අංකය : .....
04. වාහන අංකය හා වර්ෂය : .....
05. වාර්ෂික පූර්ණ රක්ෂණය : .....
06. වෑන් රථයේ ආසන ගණන : .....
07. වාර්ෂික ආදායම් බලපත්‍රය : .....
08. ධාවනයට යොදන ඉන්ධන වර්ගය : .....
09. මසකට අය කරනු ලබන මුදල : .....
10. වාහනයේ අලුත්වැඩියා කටයුතු අයිතිකරු විසින් සිදු කරනු ලබන බවට සහතිකයක් : .....
11. වාහනය යම්කිසි කටයුත්තකට පිටතට රැගෙන ගියහොත් ඒ සඳහා අමතර වාහනයක් යොදවන බවට සහතිකයක් : .....
12. ද්විත්ව වායු සමීකරණය කර ඇති බව : .....

.....
වාහනය අයිතිකරුගේ අත්සන/ දිනය
..... දින

එම්. ශම්මික විරංග ඩයස්,
සභාපති,
ජා ඇල නගර සභාව.

ජා ඇල නගර සභාවේදීය.

ප්‍රසම්පාදන දැන්වීමයි
මූලික රෝහල, කන්තලේ

ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් කන්තලේ මූලික රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් රෝහල සඳහා, වෛද්‍ය වායු සැපයීම්, ප්‍රවාහනය, රෝහල වෙත භාරදීම සඳහා ජාතික තරගකාරී ලංසු යටතේ සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීම සිදුකරනු ලබයි.

අයිතම අංකය	විස්තරය	ප්‍රමාණය	ප්‍රසම්පාදන අංකය	ආපසු නොගෙවන මුදල	ලංසු බැඳුම්කර වටිනාකම	සුදුසුකම්
01	Supply Delivery, Unloading of Medical Air and Providing Maintenance, Services for the Storages of Gas & Gases in Liquefide form	In table 01	BHK/ AB/07/ 2020/28	3000.00	200.000.00	Company Registration & NMRA

Table 01

Item No	Material Description	Unit Specification	Qty required
1	Medical Breathing air	47L	650
2	Nitrous Oxide	3.2kg	60
		1.6 Kg	50
4	Co2 (Carbon Dioxide)	3Kg	14
5	Liquid Nitrogen	10L	14
6	Medical Oxygen	47L	5000
		14L	4000
		10.53 L	2000
		4.2L	7000

- 2020.09.14 වැනි දින සිට සෑම කාර්යාල දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ කන්තලේ මූලික රෝහලේ කාර්යාලය වෙත පැමිණ නියමිත ඉල්ලීම් ලිපිය, ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන්, ආපසු නොගෙවනු ලබන මුදල ගෙවීමෙන් පසුව අදාළ ප්‍රසම්පාදන ලියවිලි ලබාගත හැක. පෙර ලංසු රැස්වීම් 2020.09.28 දින පෙ.ව. 10.00 ට රෝහල් කාර්යාලයේදී පැවැත්වේ.
- ප්‍රසම්පාදන ලියවිලි බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ ප්‍රසම්පාදන අංකය හා අදාළ ප්‍රසම්පාදනයේ නම ඉතා පැහැදිලිව සඳහන් කළ යුතුය.

දු.ක. 0262234261 දිගුව 212 / 026-2234945/ 071-7033790

- ලංසු භාරගන්නා අවසන් දිනය 2020.10.05 වන දින පෙ.ව. 10.00 වේ. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ 2020.10.05 වන දින පෙ.ව. 10.00 ට ලංසු ලේඛන විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගි විය හැකිය.
- සියලු ලංසු සඳහා ඉහත විස්තර පරිදි ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු අතර, එය පිළිගත් බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයකින් හෝ බැංකු අණකරයකින් ඉදිරිපත් කළ හැකිය.
- ඕනෑම ලංසු ලේඛනයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රෝහලේ ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
මූලික රෝහල, කන්තලේ.

කාන්තා කටයුතු, පුනරුත්ථාපන, සමාජ සේවා, සමුපකාර, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන සහ වෙළඳ හා වාණිජ්‍ය අමාත්‍යාංශය
උතුරු පළාත

ප්‍රසම්පාදන දැන්වීමයි
2020/2021 වසර සඳහා ආරක්ෂක සේවා සැපයීම
ලංසු සඳහා ආරාධනයයි

පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් උතුරු පළාතේ දිස්ත්‍රික් පහේ හි කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියලුම කාර්යාල සඳහා ආරක්ෂක සේවා වසරක කාලයකට ලබාදීම සඳහා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	දිස්ත්‍රික් සඳහා අවශ්‍ය සේවා මුර සංඛ්‍යාව
01	යාපනය	14
02	කිලිනොච්චිය	03
03	මුලතිව්	02
04	වවුනියාව	04
05	මන්නාරම	03
	එකතුව	**26**

1. ලංසුකරුවන් ආරක්ෂක සේවා සැපයීම සඳහා තනි පුද්ගල හෝ ආයතන වශයෙන් වලංගු ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, එකී ව්‍යාපාරයෙහි **වසර තුනක පළපුරුද්ද** සහිත විය යුතුය. තවද, ආරක්ෂක සේවා සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා තිබිය යුතුය.
2. එකී ලංසුකරුගේ ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය හෝ **ලියාපදිංචි ශාඛා කාර්යාලයක්** උතුරු පළාතේ පිහිටා තිබිය යුතු අතර, උතුරු පළාතේ දිස්ත්‍රික් පහටම එකී සේවය ලබාදිය යුතුය.
3. ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් වන ලංසු ලිපිලේඛන 2020.09.14 දින සිට 2020.10.07 දින දක්වා කාර්යාල දිනයන්හි 09.00 පැය සිට 15.00 පැය තෙක් නිකුත් කෙරෙන අතර, ලිපිලේඛන සඳහා ආපසු නොගෙවන **රු. 1,000.00 ක** ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව ලබාගත හැකිය.
4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවුවකු විය යුතුය.
5. **යාපනය, අරියාලයි, බුරුඩි විදිය, නො. 04, කාන්තා කටයුතු අමාත්‍යාංශයේ, පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති** නමට යොමු කළ මුදු, තැබූ ලංසු 2020.10.08 **දින පෙ.ව. 11.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ඉහත කී ලිපිනයේ ලේකම්වරයාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.
6. එම ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරෙන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අවසරය ලැබේ.
7. සියලුම ලංසු සමග රුපියල් 150,000.00 ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වේ.
8. ලංසු සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ අලුතින් ලංසු කැඳවීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ.

රුබිනි වරදලිංගම් මිය,
පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
කාන්තා කටයුතු අමාත්‍යාංශය, උතුරු පළාත,
04, බුරුඩි විදිය, අරියාලයි, යාපනය.
දිනය 2020.09.14

ඉන්දියන් ඕවර්සීස් බැංකුව කොළඹ අත්හල දේපළ පිළිබඳව ගනුදෙනුකරුවන් වෙත නිකුත් කරනු ලබන නිවේදනය

බැංකු පනතේ 72 වන කාණ්ඩය ප්‍රකාරව, බැංකු සමග වූ ගනුදෙනුකරුවන්ගෙන් අත්හල දේපළ/ ගිණුම් අයිතම පහත දැක්වෙන දෙවර්ගයට අයත් වේ.

- බැංකු ගිණුම්වල වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් තැන්පතු හෝ වෙනත් මුදල් කිසිදු ක්‍රියාකාරිත්වයකට ලක් නොකොට තිබෙන විට
- බැංකුවේ සේප්පුවල අන්තර්ගතයන් සම්බන්ධයෙන් බදු කාලසීමාව ඉක්ම ගිය බවට බැංකුව විසින් නිවේදනයක් යැවීමෙන් පසු වසර තුනක් තුළ ප්‍රතිචාර දැක්වීමට ගනුදෙනුකරුවා අපොහොසත් වන විට
- බැංකු පනතේ 73 (i) කාණ්ඩයේ නියමය පරිදි බැංකුව විසින් ගනුදෙනුකරුවන් අත්හල දේපළ වශයෙන් වර්ග කරනු ලැබූ ගිණුම් / අයිතම පිළිබඳ තොරතුරු අපි පහත සඳහන් කරන්නෙමු. එසේම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කොට තිබේ.
- ලිපිනය වෙනස් කළ බව දන්වීම අවශ්‍ය නම් ඒ බව දන්වා තැන්පතුවක් තැබීමෙන් ඉවත් කර ගැනීමෙන් මෙවැනි දේපළක් යළි සක්‍රිය කර ගැනීමට ගනුදෙනුකරුවාට හැකි වන අතර, පාස් පොත ඉදිරිපත් කරමින් ලිපියක් වැනි ලිඛිත සන්නිවේදන මාධ්‍යයක් ඔස්සේ ගිණුම සක්‍රිය කරන ලෙස බැංකුවට ඉල්ලීමක් කිරීමෙන්ද එවැනි දේපළක් සක්‍රිය කරගත හැකිය. සේප්පු සම්බන්ධයෙන් නම් ගෙවීමට නියමිත සේප්පු ගාස්තු සම්පූර්ණ කළ යුතුවේ.
- දේපළවල අයිතිය සඳහා අනපේක්ෂිත පුද්ගලයන් ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ පිළිබඳ අවධානය යොමු කොට අත්හල දේපළේ ආරක්ෂාව පිණිස බැංකුව මගින් ගනුදෙනුකරුවන්ගේ අත්හල දේපළ වශයෙන් වර්ග කෙරුණු තනි ගිණුම්/ අයිතම සම්බන්ධයෙන් තොරතුරු ප්‍රසිද්ධ නොකෙරේ.
- සිය දේපළ අත්හල තත්ත්වයට පත්කොට ඇති බවද එම දේපළවල තොරතුරු ද දන්වමින් ගනුදෙනුකරුවන්ගේ අවසන් වරට දන්නා ලිපිනය වෙත බැංකුව විසින් කල්තබා වෙනම නිවේදනයක් යවා තිබේ.

ගිණුම් පිළිබඳ විස්තර ඉතිරි කිරීමේ ගිණුම්

2703 - T. ශ්‍රී ස්කන්ධරාජා, 10070 - N. හජිබාවා මයා, 11227 - M.N.M කාදර් මයා, 11296 - කන්දයියා මයා, 11594 A. V. T. ජයදේව මයා, 13436 - M.T.M. නූර් මෙනවිය, 13964 - J.D. රත්නම් මයා, 16132 සිවප්‍රගාසම් මයා, 16228 - M. P. P. ලෙච්චිමන් මයා, 17076 - තම්බයියා මහාලිංගම් මයා, 17295 - A. ලක්ෂ්මන් මයා, 17323- සෝමසුන්දරම් සුප්පයියා, 17562 - T. පෙරියතම්බි මයා, 17703 - සෙල්ලයියා සිවනාද, 18415 - S.T. සෙන්තිල් මෝහන් මයා සහ T. රවි මෝහන් මයා සහ C. රාජයෝගන් මිය, 18501 - A. සත්කුණානාදන් මයා සහ ජමුනා සත්කුණානාදන් මිය, 18754 - V. චන්ද්‍රසේකර, V. ශ්‍රීකාන්තන්, 18986 - A. අරුන් චෙල්ලයියා, 18990 - මංගෙයිටිකරසි තවරත්නම් මිය, 18995 - R. විජයලෙච්චුමි, 50040 J. D. ලෝෂිනි මෙනවිය, 50074 - R. P. චිත්‍රා රණසිංහ මිය, 50077 සුදත් සමරසේකර මයා, 50078 - W. ජයසූරිය මයා, 50091 - N. M. දිසානායක මිය, 50117 - මාත්තප්පෙරුමගේ ප්‍රේමතිලක මයා, 50155 U. S. S. කුමාර 8000300046 - සුබ්‍රමනියම් සුන්දරලිංගම්, 8000300055 - වේදනායක් සූරියකුමාරන් මිය, 300121- ගයත්‍රි තර්මරාජා මෙනවිය, 8000300162 - රත්නරාජකුමාරි සිතම්බරප්පිල් මෙනවිය, 80003001163 - තංගරාසා තර්ෂනී මෙනවිය 300197 සිවතේසයකි බාලසිංහම් මිය, 8000300198 - R.A.D. රංගන රණසිංහ මයා, 8000300200 - සුගත්යා සෙල්වකුමාරන් මිය, 8000300240 - H. Y. රත්නපාල මයා, 300242 සීතිතම්බි සතාසිවම් මයා, 300243 යූත්ලීග් ෆොසනාතන ධාර්මික් පර්සෙප්ෂන්, 300255 - මාස්ටර් ලිදුර්ෂන්

ජංගම ගිණුම්

08. මුද්‍ර, තබන ලද ලංසු 2020/10/06 වෙනි දින ප.ව 14.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, අංක 67, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමෙන් හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම සිදුකළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරන අතර, ලංසු භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.
09. මේ සම්බන්ධ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වන අතර, කිසිදු දැනුම් දීමකින් තොරව ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය අධිකාරිය සතුය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
අංක 67, ලේබාන් වීදිය, ගාල්ල.
2020/09/14

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

01. පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල, වතු සහ තවාන්වලට අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා 2021 වසරට ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධිත ආයතන වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.
02. එක් එක් අයිතමය සඳහා ආපසු නොගෙවන රුපියල් 2,000/- ක් මුදලින් හෝ එම වටිනාකමට **"සාමාන්‍යාධිකාරී, පොල් වගාකිරීමේ මණ්ඩලය"** නමින් නිකුත් කළ චෙක්පතක් සමග පහත ආදර්ශයට අනුව තමන් විසින් සකස් කළ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.
03. ලියාපදිංචි වීමට අපේක්ෂිත කාණ්ඩයට අනුරූපී වන සේ අදාළ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය තිබිය යුතු අතර, එහි පිටතක් සමග පහත ආදර්ශයට අනුව සකසා සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021"** යනුවෙන් සඳහන් කර 2020.10.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවීම හෝ **පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** ලිපිනයේ පිහිටි පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය.
04. භාණ්ඩ / සේවාවන් එකකට වැඩි ගණනක් සැපයීම සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සැපයුම්කරුවන් එක් එක් සැපයීම හෝ සේවාව සඳහා ආපසු නොගෙවන රුපියල් 2,000/- බැගින් තැන්පතුවක් ගෙවිය යුතුය. ඉල්ලුම්පත්‍රයේ අදාළ කාණ්ඩ අංක (අනු අංක ඇත්නම් ඒවාද ඇතුළත්ව) පැහැදිලිව සඳහන් කළ යුතු වන අතර, ඉල්ලුම්කරනු ලබන කාණ්ඩයට අදාළව ව්‍යාපාර ලියාපදිංචි කර ඇති බව ව්‍යාපාරයේ ස්වභාවය සහතික කරන ලේඛනය අනුව සනාථ කළ යුතුය.
05. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් සිය බැංකු ශාඛාවේ නම අයදුම්පතේ සඳහන් කළ යුතුය.
06. ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, වෙනත් සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවීම හෝ මිලට ගැනීමේ අයිතිවාසිකම් පොල් වගාකිරීමේ මණ්ඩලය සතුය.
07. ඉල්ලුම් කළ විට මිල ගණන් ඉදිරිපත් නොකරන්නා වූද, ඇණවුම් කළ විට කලට වේලාවට භාණ්ඩ භාර නොදෙන්නා වූද, ඉදිරිපත් කරන ලද සාම්පල් අනුව භාණ්ඩ නොසපයන්නා වූද, සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ නම් පූර්ව දැනුම්දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් කපා හරිනු ලැබේ.

(01) භාණ්ඩ සැපයීම :

01. කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය (සියලුම වර්ගයේ)
02. කාර්යාලයීය වානේ ගෘහ භාණ්ඩ
03. කාර්යාලයීය දැව ගෘහ භාණ්ඩ
04. විදුලි පංකා, ශීතකරණ හා විදුලි උපකරණ හා උපාංග
05. කාර්යාලයීය උපකරණ (යතුරුලියන, පරිගණක, ගණක යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර)
06. පරිගණක උපාංග
07. සම්භාණ්ඩ (බැග්, වැහිකබා, ගම්බූට්ස්)
08. ප්‍රදර්ශන හා ප්‍රචාරක කටයුතු (නාම පුවරු, බැනර්, දැන්වීම්, ප්‍රචාරක කුටි, පෝස්ටර්)
09. ගොඩනැගිලි ද්‍රව්‍ය හා ගොඩනැගිලි උපකරණ
10. නිමි ඇඳුම් හා තිර රෙදි
11. සියලුම වර්ගයේ වාහන අමතර කොටස්
12. සියලුම ගොඩනැගිලි නඩත්තු හා අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපාංග සැපයීම (විදුලි බල්බ්, ජලනළ, පී.වී.සී. ගැල්වනයිස් ආදී උපාංග)
13. සියලුම වර්ගවල කෘෂි උපකරණ හා ආම්පන්න
14. කෘෂි රසායනික ද්‍රව්‍ය හා පශු ඖෂධ
15. ශිලාමය සමරු ඵලක හා සිහිවටන නිෂ්පාදකයින්
16. ගොම පොහොර, කොහුබත් සහ මතුපිට පස් සැපයුම්කරුවන්
17. පොලිතීන් සැපයුම්කරුවන්
18. කාබනික පොහොර සැපයුම්කරුවන්
19. සියලුම වර්ගයේ වාහනවල ටයර්, ටියුබ් හා බැටරි / උපාංග සැපයුම්කරුවන්
20. සියලුම වර්ගවල මුද්‍රණ කටයුතු
21. සියලුම වර්ගයේ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම හා සවිකිරීම

(02) සේවාවන් :

01. ගොඩනැගිලි ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම හා නඩත්තු.
02. සියලුම වර්ගයේ වතුර මෝටර් අලුත්වැඩියා කිරීම හා නඩත්තුව.
03. සියලුම වර්ගයේ කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව.
04. පරිගණක අලුත්වැඩියාව හා නඩත්තුව.
05. සියලුම වර්ගයේ විද්‍යුත් මාධ්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම.
06. සියලුම වර්ගයේ වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාවන් හා නඩත්තුව.
07. සියලුම වර්ගයේ වාහන අලුත්වැඩියාව. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පැහැදිලිව ව්‍යාපාරයේ ස්වභාවය සටහන්ව තිබිය යුතුය. උදා : කාර්මික, කුෂන් වැඩ, විදුලි පද්ධති කාර්මික සේවාව, වායු සමීකරණ යන වග)

I. එන්ජින් අලුත්වැඩියාවන්
II. ටින්කර් පේන්ට් කිරීම
III. වාහන විදුලි පද්ධති කාර්මික සේවාව
IV. රථවාහන වායුසමීකරණ සේවාව
V. සයිලන්සර් අලුත්වැඩියාවන්
VI. වාහන දුනු කාර්මික සේවාව
VII. ෆයිබර් වැඩ (රථාවාහන සඳහා)
VIII. යතුරුපැදි නඩත්තුව හා උපකරණ සැපයීම
IX. ට්‍රැක්ටර් ට්‍රේලර් අලුත්වැඩියාව
X. ට්‍රැක්ටර් අලුත්වැඩියාව (රෝද 2, රෝද 4)
XI. ටයර් නැවත පිරවීම හා වීල් එලයිමන්ට් කිරීම
XII. ලොරි බොඩි තැනීම අලුත්වැඩියාව හා නඩත්තුව
XIII. සියලුම වර්ගයේ වාහන වාර සේවා කිරීම
XIV. වතුර බවුසර්, ට්‍රැක්ටර්, අත්ට්‍රැක්ටර් හා ට්‍රැක්ටර් ට්‍රේලර්වලට අදාළ සේවාවන්
XV. සියලුම වර්ගයේ වාහන කුෂන් කිරීම

08. බැකෝ හා ඩෝසර් යන්ත්‍ර කුලී පදනමට සැපයීම
09. වායු සමීකරණ සහිත වෑන් රථ කුලී පදනම මත සැපයීම
10. බීජ පොල් සහ පැළ ප්‍රවාහනය සඳහා කුලී පදනමට ලොරි රථ සැපයීම
11. පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවා කටයුතු සඳහා
12. නීති උපදේශක සේවාව
13. අපනයන භෝග ගැනුම්කරුවන්
14. සියලුම වර්ගවල ඇලුමිනියම් හා යකඩ ඉදිකිරීම්, අලුත්වැඩියාවන් හා නඩත්තු
15. පරිගණක ආශ්‍රිත යෙදුම් මෘදුකාංග නිර්මාණය කිරීම (වෙබ් අඩවි හා අනෙකුත් යෙදුම් මෘදුකාංග)

(03) 01. පොල් ආශ්‍රිත නිෂ්පාදන ගැනුම්කරුවන්

I. පොල් / පොල් තෙල් / කොප්පරා ගැනුම්කරුවන්
II. පොල් ලෙලි / පොල් කටු / කොහු, කොහුබත් ගැනුම්කරුවන්
III. පොල් ගස් ගැනුම්කරුවන්

02. අතුරු භෝග ගැනුම්කරුවන් (අන්නාසි, ගස්ලබු, රඹුටන්, දෙඩම්, දෙහි, දූරියන්, ඩ්‍රැගන් ෆෘට් හා බතල, රටකජු ආදිය)

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය	01	භාණ්ඩ සැපයීම					
	02	සේවා සැපයීම					
	03	පොල් ආශ්‍රිත නිෂ්පාදන ගැනුම්කරුවන්					

(පැහැදිලිව අදාළ කාණ්ඩයේ අංකය, අනු අංක ඇත්නම් ඒවාද සමග කොටුව තුළ සඳහන් කරන්න)

02. ව්‍යාපාරයේ / ආයතනයේ නම : .....
03. ලිපිනය : .....
04. ව්‍යාපාර ලියාපදිංචි අංකය : .....
(ව්‍යාපාරයේ ස්වභාවය ඇතුළත් ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
05. දුරකථන අංකය : ..... ෆැක්ස් අංකය : .....
06. බැංකු ශාඛාව : .....
07. ණය පහසුකම් සැපයීමේ කාලය : ..... වටිනාකම : .....
08. භාණ්ඩ ගෙනවිත් භාර දෙන්නේ ද යන වග : .....

ඉහත (සේවා සැපයීම්) අංක 02-01 යටතේ ලියාපදිංචිවීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ඉක්ටැඩ්) ලියාපදිංචිය සමග ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ වලංගු සාමාජිකත්වය ලබා තිබෙන්නේද යන වග හා ලියාපදිංචි අංකය සඳහන් කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ කාර්යයන් කිරීමේ හැකියාව ලිඛිතව සනාථ කිරීමට අයදුම්කරු එකඟ වේ.

....
අයදුම්කරුගේ අත්සන සහ ආයතනික නිල මුද්‍රාව දිනය

විශේෂිත ප්‍රසම්පාදන දැන්වීම

ලංසු සඳහා ඉල්ලීමයි (RFB)

භාණ්ඩ

එක් කවර ලංසුකරණ ක්‍රියාපටිපාටිය

රට : **ශ්‍රී ලංකාව**

ව්‍යාපෘතියේ නම : **ශ්‍රී ලංකා කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් ව්‍යාපෘතිය**

කොන්ත්‍රාත්තුවේ ශීර්ෂය : **සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MOH) වෛද්‍ය සැපයුම් අංශය වෙත කොවිඩ් - 19 අණුක පරීක්ෂණ කට්ටල සහ රසායනාගාර පරිභෝජ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය**

ණය අංක/බැර අංක/ප්‍රදාන අංක : **Cr65950-lk**

RFB යොමු අංකය : **LK-MOH-186237-GO-RFB**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් ශ්‍රී ලංකා COVID-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් ව්‍යාපෘතියේ පිරිවැය අරභයා මූල්‍ය සහාය ලැබී ඇති අතර එහි ලාභාංශවලින් කොටසක් පහත සඳහන් පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය වෙත අණුක රෝග නිශ්චය පරීක්ෂණ කට්ටල සහ රසායනාගාර පරිභෝජ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සඳහා යෙදෙ ගැනීමට බලාපොරොත්තු වේ.

Lot	Item SR No.	Item	Qty	Bid Security (LKR or equal amount in a freely convertible currency)
01	41590103	Covid-19 Real Time PCR kit	200,000 reactions	5,000,000.00
02	41502303	Nucleic acid extraction kit	200,000 reactions	1,560,000.00
03	41501203	Absolute Ethanol analytical grade (2.5 L) bottle	200,000 mL	15,920.00
04	41220802	Viral transport media & swabs	240,000 Nos	964,560.00
05	50201402	Micro centrifuge tubes, Virgin polypropylene, safe lock, (DNase & RNase free), sterile, colourless, Vol. 1.5mL	400,000 Nos	17,240.00
06	50230304	Cryovial, vial stands without holder, externally threaded screw capped, autoclavable, can be frozen at 80°C bulk packed, volume 1.8mL	400,000 Nos	56,000.00
07	50240105	PCR tubes: Optical grade, 0.2 mL (DNase & RNase free), clear tubes in strips (8 tubes) with 8 strip caps for real time PCR machine, lid should be flat shape	15,000 strips	56,000.00
	50240106	PCR tubes: Optical grade, 0.1 mL (DNase & RNase free), clear tubes in strips (4 tubes) with 4 strip caps for real time PCR	25,000 strips	
	50240302	Individual PCR tubes: Optical grade, flat shaped lid, size 0.2 mL individual tubes, sterile, (DNase & RNase free)	20,000 Nos	
08	50710503	Micro pipette tips with filter, rack packed (DNase & RNase free) volume 2-20 µL	400,000 Nos	439,280.00
	50710504	Micro pipette tips with filter, rack packed (DNase & RNase free) volume 0.5-10 µL	400,000 Nos	
	50710802	Micro pipette tips with filter, rack packed (DNase & RNase free) volume 100-1000 µL	1,600,000 Nos	
	50711002	Micro pipette tips with filter, rack packed (DNase & RNase free) volume 20-200 µL	800,000 Nos	
09	50750003	Disposable plastic Pasteur pipette, 3mL (with bulb) individually wrapped, sterile (for molecular grade work)	200,000 Nos	10,140.00

ලංසු සඳහා ඉල්ලීම් ලිපිලේඛනයේ තවදුරටත් නිර්ණය කර ඇති පරිදි ලංසුකරුවන්ට එක් තොගයකට හෝ තොග කීපයකට හෝ ලංසු ඉදිරිපත් කළ හැකිය. එක් තොගයකට වැඩි සංඛ්‍යාවක් තමන්ට ප්‍රදානය කළ විටදී ලංසුකරුවන් වට්ටම් පිරිනැමීමට කැමැත්තේ නම්, එම වට්ටම් ලංසු සඳහා ඉල්ලීමේ ලිපියේ ඇතුළත් කර ඇත්නම් ඒ සඳහා අවසරය හිමිවේ.

02. ශ්‍රී ලංකා COVID -19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින්, COVID -19 අණුක රෝග නිශ්චය පරීක්ෂණ කට්ටල සහ රසායනාගාර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ ලංසු කරුවන්ගෙන් දැන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

03. ලෝක බැංකුවේ, 2016 ජූලි දෘතම දරන 2017 නොවැම්බර් හා 2018 අගෝස්තු සංශෝධිත "IPF ණය ගැනුම්කරුවන් සඳහා ප්‍රසම්පාදන රෙගුලාසි "(ප්‍රසම්පාදන රෙගුලාසි)" වල විස්තර කොට ඇති පරිදි, ලංසු සඳහා ඉල්ලීමක් (RFB) භාවිත කරමින් ජාත්‍යන්තර තරගකාරී ප්‍රසම්පාදනය මගින් ලංසුකරණය මෙහෙයවනු අතර, "ප්‍රසම්පාදන රෙගුලාසි" වල නිර්ණය කොට ඇති පරිදි යෝග්‍යතාපූර්ණ සියලුම ලංසුකරුවුන්ට ලංසුකරණය විවෘතය.

04. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට, ශ්‍රී ලංකා කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් වැඩිමනත් තොරතුරු ලබා ගත හැකි අතර කාර්යාල වේලාවන් එනම් : 0900 පැය සිට 1500 පැය දක්වා පහත ලිපිනයේදී ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීම සඳහා පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (www.health.gov.lk) ප්‍රදර්ශනය කොට ඇත.

05. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලං රු. 20,000.00 ක් හෝ පහසුවෙන් පරිවර්ත්‍ය කර ගත හැකි මුදල් වර්ගයකින් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන අභිලාෂී ලංසුකරුවන්ට මිලදී ගත හැකිය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් ව්‍යාපෘතියේ ලේකම්ගේ ලංකා බැංකු (රිජන්ට් වීදි ශාඛාව) ගිණුම් අංක 7040305 ට සෘජුව තැන්පත් කිරීම මගින් ගෙවීම් කළ යුතුය. ගෙවීම් සඳහා ලබන ලදුපතෙහි ස්කෑන් කළ පිටපතක් ඊමේල් කළ යුතුය. ලිපිලේඛන පැමිණ ලබා ගැනීම හෝ ඊමේල් මගින් ලබා ගැනීමට පිළිවන. ලදුපතෙහි මුල් පිටපතෙහි පිටපතක් ලංසුවට අමුණා එවිය යුතුය.

06. ලංසු 2020 ඔක්තෝබර් 05 දින 14.00 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතුය. විද්‍යුත් ලංසුකරණයට අවසර නොලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. 2020 ඔක්තෝබර් 05 දින 14.00 පැයට පහත සඳහන් ලිපිනයේදී ලංසුකරුවන් විසින් පත්කළ නියෝජිතයින් හෝ එම අවස්ථාවට සහභාගී වීමට බලාපොරොත්තු වන ඕනෑම අයකු ඉදිරිපිටදී ප්‍රසිද්ධියේ ලංසු විවෘත කරනු ලැබේ.

07. සියලුම ලංසු සමග ඉහත 1 වන ඡේදයේ දක්වා ඇති පරිදි එක් එක් තොගයට ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

08. ඉහත සඳහන් කළ ලිපිනය :

වෛද්‍ය. ජේ. එම්. ඩබ්ලිව්. ජයසුන්දර බණ්ඩාර,
ව්‍යාපෘති අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් ව්‍යාපෘතිය,
3 වන මහල, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය,
191, ධර්මපාල මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.

දුරකථන : +94112680549 **ෆැක්ස් : +94112680490**
ඊමේල් : srilankacovid@gmail.com **වෙබ් අඩවිය :** www.health.gov.lk

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

AVAILABLE AT



Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!

LAKE HOUSE

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය

ප්‍රවාහන සහසබඳතා වත්කම් හා කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP)

පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (PRDP) සංරචකය

ණය අරමුදල් අංක - Cr. 5788LK

අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි (REOI)

උපදේශකයන්ගේ සේවය ලබා ගැනීම

TCAMP පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP- PRDP) පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය (SMPCLGA) යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ (IDA) හා ලෝක බැංකුවේ (WB) සහයෙන්, පළාත් නවයෙහි පළාත් මාර්ග ජාලයෙන් කොටසක් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබයි.

එක් එක් පළාත් මට්ටමින් ධාරිතා ගොඩනැගීම හා ආසන්න අයිතිය සහතික කිරීම අපේක්ෂා කෙරේ. "කොන්ත්‍රාත්තුවට අදාළ ඉංජිනේරු වරයාගේ" කාර්යභාරය එක් එක් පළාතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක (PIC) වන ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරයා (CRE) විසින් දරනු ලබන අතර, ඔහු/ ඇය, අදාළ පළාත්වල පළාත් මාර්ග නියෝජිතායතනය විසින් පත් කෙරෙනු ඇත.

ඒ අනුව පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියෙහි (TCAMP- PRDP), TCAMP හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කිරීම සඳහා කෙටි/ දීර්ඝ කාලීන පදනම්වත් පහත සඳහන් තනතුරු සඳහා පෞද්ගලික උපදේශකයන්ගේ සේවය ලබා ගැනීමට අපේක්ෂා කරයි. අදාළ පෞද්ගලික උපදේශකයන් විසින්, ව්‍යාපෘතියෙහි ප්‍රතිඵලවලට අනුකූලව යොමු කිරීමේ අනුදේශ (TOR) ප්‍රකාරව ඉලක්ක සපුරාලීම හා සාක්ෂාත් කර ගනු පිණිස ප්‍රධාන වශයෙන් වගකීම දරයි.

එක් එක් උපදේශකයන් විසින් පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරාලිය යුතුය.

1. නේවාසික ඉංජිනේරු / කොන්ත්‍රාත් කළමනාකරණ උපදේශක

තනතුරු 01 - (උතුරු පළාත) මාස 24

- මෙම තනතුරෙහි කාර්ය වනුයේ, ව්‍යාපෘතියෙහි අරමුණුගත ඉලක්ක සපුරා ගැනීම සඳහා සේවා යෝජක සමග ඇති කර ගත් අදාළ කොන්ත්‍රාත් කොන්දේසි හා උපදේශක කොන්ත්‍රාත්තුව ප්‍රකාරව පළාතේ ඉදිකිරීම් කොන්ත්‍රාතුව අධීක්ෂණය / පවත්වා ගැනීම වේ.
- උපදේශක සතුව FIDIC කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධව පෘථුල දැනුමක් තිබිය යුතුය.
- හිමිකම් සඳහා වන සම්මත ආකෘතිය හා විචලනය ඇගැයුම් කොට නිරවුල් කළ යුතුය.
- විභාග්‍ය හිමිකම් පිළිබඳව CRE වෙත උපදෙස් ලබාදිය යුතුය.
- හිමිකම් ඇගයුම් කිරීමට හා විභාග්‍යයන් සඳහා ARE/ AQS හට සහය විය යුතුය.
- කොන්ත්‍රාත්තුමය කටයුතුවලදී කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රතිචාර දැක්වීමට CRE / ARE වෙත සහාය විය යුතුය.
- හිමිකම් විසඳීමේ කටයුතුවලදී කොන්ත්‍රාත්කරු හා ඇති වන ගැටලු නිරාකරණය කිරීමට සේවා යෝජකහට මග පෙන්විය යුතුය.
- ගැටලු යෝජනා මණ්ඩලයක් ස්ථාපිත කිරීමට සේවා යෝජකහට සහාය විය යුතුය.
- දෛනික ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු, වැඩසටහන අධීක්ෂණය, මාසික සහතිකපත් පිළියෙළ කිරීම, Shop Drawings හා as - Built - drawings ඇගයුම් කොට අනුමත කිරීම සඳහා CRE වෙත සහාය වීම.
- CRE සමග උපදේශකත්වයෙන් වැඩ බිම් උපදෙස් නිතුත් කිරීම.
- වැඩ පිළිබඳ තත්ත්වයන්, වැඩවල ප්‍රගතිය හා වෙනත් ඕනෑම කාර්යයන්ට බලපෑ හැකි නිෂේධකයන් සම්බන්ධව ගැටලු පිළිබඳව අවස්ථානුකූලව CRE දැනුවත් කිරීම.
- කාර්ය අවධිය සහ තාවකාලික වැඩ, ඉදිකිරීම් සැලසුම් උපලේඛන, ඉදිකිරීම් ක්‍රමවේද, උපකරණ හා පිරිස් පැවරුම් පරීක්ෂණ හා පිරික්සුම් හා ඇදීම් ආදී ඉදිකිරීම් ක්‍රමවේද ඇතුළත් නිර්මාණ හා ඉදිකිරීම් (FIDIC) සඳහා වන විවිධ වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳව හුරුපුරුදුකාවය තිබිය යුතුය.
- ව්‍යාපෘතියට අදාළ ආරක්ෂක ආකාර සම්බන්ධව සහතික විය යුතුය.
- කොන්ත්‍රාත්තුව යටතේ වන පිරිවිතරයන් සපුරාලන බවටත්, තත්ත්වයන් පවත්වා ගනු ලබන බවටත් සහතික විය යුතුය.

සුදුසුකම් හා පළපුරුද්ද

මූලික සුදුසුකම් හා පළපුරුද්ද

- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විය යුතුය.
- සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක් සමග පිළිගත් ඉංජිනේරු ආයතනයක ආයතනික සාමාජිකත්වය සමග වසර 20 ක පළපුරුද්ද.

අමතර සුදුසුකම් හා පළපුරුද්ද

- සිවිල් ඉංජිනේරු මාස්ටර්ස් උපාධියක් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්
- වසර 15 ක මාර්ග වැඩ පළපුරුද්ද.
- විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල වසර 10 ක මාර්ග වැඩ පළපුරුද්ද.
- FIDIC කොන්ත්‍රාත් පරිපාලනය ඇතුළත්ව කොන්ත්‍රාත් පරිපාලනය හා කොන්ත්‍රාත් ඉංජිනේරුවරයකු ලෙසට වසර 08 ක පළපුරුද්ද.
- පාරිසරික / ගිණුම්කරණ/ සමාජ ආරක්ෂණ විෂයයන් පිළිබඳ සුදුසුකම් තිබීම අමතර වාසිදායක වනු ඇත.

2. ද්‍රව්‍ය ඉංජිනේරු (තනතුරු 02) මාස 24 - අනුරාධපුර හා බදුල්ල

- මෙම තනතුරෙහි කාර්යභාරය වනුයේ, කොන්ත්‍රාත්තුවේ පිරිවිතරයන් හා කොන්දේසි ප්‍රකාරව තත්ත්ව සහතික පද්ධතියට අනුගාමීව ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක වීම සහතික කිරීමයි.
- දෛනිකව ද්‍රව්‍ය පිරිවිතරයන් හා පරීක්ෂණ පිළිබඳ අනුකූලතාව, සුපරීක්ෂණ කටයුතු, කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ අධීක්ෂණය හා ද්‍රව්‍ය පිළිබඳ තත්ත්වයන් අනුමත කිරීම, ප්‍රභව සැපයුම් අනුමත කිරීම හා ද්‍රව්‍ය පරීක්ෂණ ක්‍රමවේද ඇතුළත්ව වූ කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව ඉදිකිරීම් සිදු කිරීම සහතික කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

මූලික සුදුසුකම් හා පළපුරුද්ද

- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විය යුතුය.
- සිවිල් / අදාළ ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග වසර 10 ක ක පළපුරුද්ද හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT)/ සමාන සුදුසුකම් සමග වසර 20 ක පළපුරුද්ද.

අමතර සුදුසුකම් හා පළපුරුද්ද

- අදාළ ක්ෂේත්‍රයේ මාස්ටර්ස් / පශ්චාස් උපාධි ඩිප්ලෝමාවක් තිබීම අපේක්ෂා කෙරේ.
- වසර 10 ක ප්‍රධාන මාර්ග ඉදිකිරීම් වැඩ පළපුරුද්ද
- විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතියක ද්‍රව්‍ය ඉංජිනේරු ලෙස මාර්ග ඉදිකිරීම් කාර්ය පිළිබඳ වසර 08 ක පළපුරුද්ද.
- ප්‍රමිති සහතික පද්ධති පිළිබඳ දැනුම තිබීම අමතර වාසිදායක වනු ඇත.

3. සහකාර ප්‍රමාණ සම්ක්ෂක - තනතුරු 10 (එක් එක් පළාතකට එක් අයකු හා PMU ඒකකය සඳහා එක් අයකු ලෙස මාස 24)

මෙම තනතුරේ කාර්ය වනුයේ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අන්තර් ගෙවුම් අයදුම්පත් පරීක්ෂා කිරීම හා කොන්ත්‍රාත් කොන්දේසි හා පිරිවිතරයන් හා අනුකූලව ද යන්න සත්‍යාපනය කොට, නිදේශ කොට, ගෙවීම් සඳහා PMU වෙත ඉදිරිපත් කිරීම වේ.

සහකාර ප්‍රමාණ සම්ක්ෂක වෙත, වැඩ බිම් ක්‍රියාපටිපාටියන්හි කෙරෙමින් පවත්නා කළමනාකරණ කටයුතු සිදු කිරීම හා කොන්ත්‍රාත්තුමය කරුණු පිළිබඳව කලට වේලාවට තක්සේරු කිරීමද වේ.

ප්‍රමුඛතාව ලැබෙන සුදුසුකම් හා පළපුරුද්ද

මූලික සුදුසුකම් හා පළපුරුද්ද

ප්‍රමාණ සම්ක්ෂණ විෂයය සඳහා ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකම් සමග වසර 04 ක පළපුරුද්ද හෝ වසර 15 ක පළපුරුද්ද සමග NVQ5 තලය.

අමතර සුදුසුකම් හා පළපුරුද්ද

විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතියක වසර 03 ක මාර්ග වැඩ පළපුරුද්ද FIDIC කොන්ත්‍රාත් කොන්දේසි සමග මාර්ග ව්‍යාපෘතිවල වසර 03 ක මාර්ග වැඩ පළපුරුද්ද

වැටුප් ගෙවීම :

සුදුසුකම් පළපුරුද්ද හා උපදේශක විසින් ඉදිරිපත් කරනු ලබන මිල සටහන මත පදනම්ව සාකච්ඡා කළ හැක.

තෝරා ගැනීමේ ක්‍රමවේද :

උපදේශකයාගේ යෝජනා පහත සඳහන් සංරචකයන්ගෙන් යුක්ත විය යුතුය :

අ) උපදේශක විසින් සියලු අවශ්‍යතා සපුරා ඇති බවට ප්‍රදර්ශනය කෙරෙන ලේඛන ඇතුළත්ව යෝජනාවේ මෙහෙයුම් හා තාක්ෂණ කොටස;

ආ) යොමු කිරීමේ අනුදේශ (TOR) වල ගෙවුම් නියමයන් ප්‍රකාරව මිල සටහන සම්පූර්ණ කොට තිබීම.

තම තාක්ෂණ යෝජනාව සඳහා ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු ඔහුගේ/ ඇයගේ මිල යෝජනාව සඳහා සම්මුඛ පරීක්ෂණයකට හා සාකච්ඡාවකට කැඳවනු ලබයි. පළමු කැඳවුම්කරු සතුටුදායක නොවුනහොත් ඊළඟ වැඩිම ලකුණුලාභියා කැඳවනු ලැබේ. කෙසේ වෙතත්, ලකුණු 350 කට සමානව හෝ ඉන් වැඩි ප්‍රමාණයක් නොලබන අයදුම්කරුවන් සළකා බලනු නොලැබේ.

අදාළ අයදුම්කරු, තනි පුද්ගල උපදේශකයන්, උපදේශන සේවා සඳහා තෝරා ගැනීම සඳහා වන තෝරා ගැනීමේ ක්‍රමවේද මත 2018 අගෝස්තු සංශෝධනය කළ, 2016 ජූලි ලෝක බැංකු මාර්ගෝපදේශ ආයෝජන ව්‍යාපෘති හාණ්ඩ වැඩ, උපදේශන නොවන හා උපදේශක සේවා ප්‍රසම්පාදනයන්හි නියමිත ක්‍රියාපටිපාටීන් ප්‍රකාරව සුදුසුකම් හා පළපුරුද්ද පදනම්ව තෝරා ගනු ලබයි.

වඩාත් විස්තරාත්මක යොමු කිරීමේ අනුදේශ (TOR) ලේඛන හා අනෙකුත් අදාළ උපදේශක සේවා ලේඛන, පහත සඳහන් ලිපිනයෙන් හෝ ඊමේල් tcamp.prdp@pclg.gov.lk වෙතින් ලබා ගත හැක.

අයදුම් කිරීමේ ක්‍රමවේදය :

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, මෙම තනතුරු සඳහා වන යොමු කිරීමේ අනුදේශ ප්‍රකාරව අදාළ සේවා ඉටු කිරීම සඳහා (එනම්, සමාන පැවරුම්වල විස්තර, සමාන තත්ත්වයන් තුළ පළපුරුද්ද, අදාළ වන නිපුණතා ලබාදිය හැකි වීම, ආදිය) තම හැකියාවන් ඇති බවට ප්‍රදර්ශනය කිරීම පිණිස අවශ්‍ය ලේඛනද ඇතුළත්ව ජීවදත්ත හා මිල සටහනක් ඉදිරිපත් කළ යුතුය. රජයේ/ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුයි.

උනන්දුවක් දක්වන අයදුම්කරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර හා විමසීම් සඳහා, රජයේ රාජකාරී දිනවල, 2020 සැප්තැම්බර් 14 වන දින සිට 2020 ඔක්තෝබර් 05 වන දින දක්වා 09.30 පැය හා 15.30 පැය අතර, කාලය තුළ පහත සඳහන් ලිපිනය වෙතින් ලබාගත හැක. සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් යොමු කළයුතු අතර, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන එක් එක් තනතුරු පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පත් 2020 ඔක්තෝබර් 06 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

සභාපති, අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව,
පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ගොඩනැගිල්ල,
"M" මහල, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

දුරකථනය - 0112674037
ෆැක්ස් - 0112674037

2020 සැප්තැම්බර් 13 දින

සී/ස බණ්ඩාරවෙල වි.සේ. සමිතියේ මෝටර්ස් ආයතනයේ 12X8 කඩ කාමර බදු දීම සඳහා මිල ගණන් කැඳවීම

මෙම කඩ බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. අප විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝරමය පුරවා ලියාපදිංචි තැපෑලෙන් **"කඩ කාමර බදුදීම යනුවෙන්"** සඳහන් කළ ටෙන්ඩර්පත් අතින් භාරදීමට කැමති අය තම ටෙන්ඩර් අයදුම්පත මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත් ගරු සභාපති, සී/ස. බණ්ඩාරවෙල වි.සේ.ස. සමිතිය, අංක 04, පෙරේරා මාවත, යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

මෙම බදු කාලය අවුරුදු 05 ක් වන අතර, තැම්පත් මුදල වශයෙන් රු. 200,000 ක් තැම්පත් කළ යුතුය.

මෙහි පෝරම ගාස්තු වශයෙන් රු. 1500 ක් ද නැවත ගෙවන ගාස්තු වශයෙන් රු. 1000 ක මුදලක් ද අයකරනු ලැබේ. මේ සඳහා වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ දී පැමිණ හෝ පහත සඳහන් දුරකථන අංකවලින් විමසා ලබාගත හැකිය. 072-2853124, 071-8427332, 071-8427383, ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් දිනය 2020-09-30 හෝ (2020 - සැප්තැම්බර් 30)

මෙයට,
ගරු සභාපති,
සී/ස බණ්ඩාරවෙල,
වි.සේ. සමුපකාර සමිතිය.

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත 9(2) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගමේ නාමය වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය :
ගෝර්ඩන් ග්‍රේසර් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්

සමාගමේ නව නාමය :
ගෝර්ඩන් ග්‍රේසර් බොසන්කියුට් ඇන්ඩ් ස්ත්‍රයින් ලිමිටඩ්

ලියාපදිංචි අංකය : PB 1192

ලියාපදිංචි කාර්යාල ලිපිනය :
අංක 60, ධර්මපාල මාවත, කොළඹ 03.

නාමය වෙනස් කිරීමේ සහතිකයේ දිනය :
2020 ජූලි 06

ඉහත සමාගම වෙනුවෙන්,
බිස්නස් ඉන්ටෙලිජන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
අංක 08, විකල් පාර,
කොළඹ 08.

මිල ගණන් කැඳවීමේ දැන්වීම

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමාත්‍යාංශය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

2020 වර්ෂය සඳහා සංස්ථා වැඩබිම් වලට (කොළඹ සහ කොළඹ අවට) අවශ්‍ය බෆලෝ වර්ගයේ තණ පිඩලි, ගොඩනැගිලි ද්‍රව්‍ය, READY MIX CONCRETE, බොරළු පස් සහ තිරුවාන පස් සැපයීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා සංස්ථා වැඩබිම් වලට අවශ්‍ය බෆලෝ වර්ගයේ තණ පිඩලි, ගොඩනැගිලි ද්‍රව්‍ය, බොරළු පස් සහ තිරුවාන පස් ලබා ගැනීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

ප්‍රසම්පාදන අංක	විස්තරය	ලංසු විවෘත කරනු ලබන දිනය	ඇප බැඳුම්කරය	ආපසු නොගෙවන මුදල
S/229/20	2020 වර්ෂය සඳහා කොළඹ සහ කොළඹ අවට සංස්ථා වැඩබිම් වලට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය	2020 ඔක්තෝම්බර් මස 08 පෙ.ව.10.30	රු. 130,000.00.	රු. 3,500.00
S/218/20	2020 වර්ෂය සඳහා කොළඹ සහ කොළඹ අවට සංස්ථා වැඩබිම් වලට අවශ්‍ය බොරළු පස් සහ තිරුවාන පස්		රු. 510,000.00.	රු. 5,000.00
S/274/20	2020 වර්ෂය සඳහා කොළඹ සහ කොළඹ අවට සංස්ථා වැඩබිම් වලට අවශ්‍ය Ready Mix Concrete		රු. 185,000.00.	රු. 2000.00
S/292/20	2020 වර්ෂය සඳහා කොළඹ සහ කොළඹ අවට සංස්ථා වැඩබිම් වලට අවශ්‍ය බෆලෝ වර්ගයේ තණ පිඩලි සැපයීම, ඇල්ලීම හා නඩත්තුව		රු. 23,000.00.	රු. 1000.00.

1. අදාල ලංසු ලියවිලි සතියේ වැඩකරන දිනවල 2020 සැප්තැම්බර් 15 දින සිට 2020 ඔක්තෝම්බර් මස 07 වන දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව. 3.30 අතර කාලය තුල රාජගිරියේ පිහිටි ප්‍රධාන කාර්යාලයට පැමිණ පරීක්ෂා කල හැකි අතර, මිලදී ගැනීමට මුදල් අයකැමි වෙන ඉහත දක්වා ඇති පරිදි ආපසු නොගෙවන ලබන මුදල ගෙවා අදාල රිසිට්පත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) වෙන ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු ලියවිලි හා ඊට අදාල විස්තර ලබාගත හැකිය.
2. මුද්‍රා තබන ලද ලංසුපත් ලියුම් කවරයක බහා වම්පස ඉහල කෙලවරේ ප්‍රසම්පාදනයේ නම හා අංකය සඳහන් කොට 2020 ඔක්තෝම්බර් මස 08 දින ප.ව. 10.30 ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ සැපයුම් අංශයේ තබා ඇති නියමිත ලංසු බහාලනයට දැමීමට කටයුතු කල යුතුයි.
3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර විස්තර දුරකථන අංක 011-2866832 මගින් ලබා ගත හැක.

සභාපති,
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
වෙබ් අඩවිය: www.landdevelopment.lk

ලංසු සඳහා ආරාධනයයි (IFB)

කොළඹ විශ්වවිද්‍යාලය

කලා පීඨයේ සුහුරු පංති කාමර 3.3, කාමර අංක 223, ප්‍රතිනව්‍යකරණ කටයුතු
(AHEAD/RA2/ELTAELSE/FOA/WORKS/04/i)

කලා පීඨයේ සුහුරු පංති කාමර 3.3, කාමර අංක 128, ප්‍රතිනව්‍යකරණ කටයුතු
(AHEAD/RA2/ELTAELSE/FOA/WORKS/04/ii)

කළමනාකරණ හා මූල්‍ය පීඨය, පුහුණු කාමර - 1 ප්‍රතිනව්‍යකරණ කටයුතු
(AHEAD/RA2/ELTAELSE/FMF/WORKS/01)

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය වෙතින්, AHEAD ව්‍යාපෘතියෙහි පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක්, කොළඹ විශ්වවිද්‍යාලයෙහි කලාපීඨයේ සුහුරු පංති කාමර 3.3. කාමර අංක 223, ප්‍රතිනව්‍යකරණය කටයුතු, කලාපීඨයේ සුහුරු පංති කාමර 3.3 කාමර අංක 128 ප්‍රතිනව්‍යකරණ කටයුතු හා කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පුහුණු කාමර 1 ප්‍රතිනව්‍යකරණ කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.

ඒ අනුව, කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන්, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, කලා පීඨයේ සුහුරු පංති කාමර 3.3 (කාමර අංක 128), (AHEAD/RA2/ELRAELSE/FOA/WOTKS/04/i), ප්‍රතිනව්‍යකරණය, සහුරු පංති කාමර (3.3) කාමර අංක 223 (AHEAD/RA2/ELTAELSE/FOA/WORKS/04/ii) ප්‍රතිනව්‍යකරණය හා කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පුහුණු කාමරය -1 (AHEAD/RA2/ELTAELSE/FMF/WORKS/01) ප්‍රතිනව්‍යකරණ කටයුතු ඉටු කිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය (වැට් රහිතව) පහත වගුවේ සඳහන්ව ඇති අතර, ලංසු භාර ගැනීම 2020 ඔක්තෝබර් 08 වන දින පස්වරු 2.30 ට අවසන් කෙරේ.

03. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, නියෝජ්‍ය අධ්‍යක්ෂ / ඉංජිනේරු - AHEAD ව්‍යාපෘතිය (දුරකථනය - 0112586445) වෙතින් ලබාගත හැකි අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ (කොළේජ් හවුස් පරිශ්‍රයේ) OTS කාර්යාලයේදී, රාජකාරී දිනවල, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ අදාළ ලංසුලේඛන තොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

05. ආපසු ගෙවනු නොලබන ගාස්තු පහත වගුවේ සඳහන් වටිනාකමට, මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට, ගිණුම් අංක 505170600013 වෙත ගෙවා ලබාගත් ලදුපත සමග AHEAD ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2020 සැප්තැම්බර් 14 වන දින සිට 2020 ඔක්තෝබර් 07 වන දින දක්වා, රාජකාරී වේලාවන් තුළදී, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ඉහත සඳහන් ලේඛන ඉදිරිපත් කරනු ලබන ලංසුකරුවන්හට පමණක් ලංසු ලේඛන නිකුත් කරනු ලැබේ.

06. ලංසු, 2021 ජනවාරි 08 වන දින දක්වා වලංගු විය යුතුය.

07. සියලුම ලංසු සමග පහත වගුවේ නියමිත පරිදි කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති නමට ගත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ඕනෑම වාණිජ බැංකුවක් මගින් නිකුත් කළ 2021 පෙබරවාරි 05 දින දක්වා වලංගු කොන්දේසි විරහිත හා ඒක්ෂණ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

පැකේජ අංකය	විස්තරය	ලංසු ඇපකරය -රුපියල්-	ආපසු නොගෙවන ගාස්තු -රුපියල්-	පිරිවැය ඇස්තමේන්තුව -රුපියල්-
01	කලා පීඨය - සුහුරු පංති කාමර 3.3, කාමර අංක 223 - ප්‍රතිනව්‍යකරණ කටයුතු (AHEAD/RA2/ELTAELSE/FOA/WORKS/04/i)	50,000.00	3,000.00	5,000,000.00
02	කලා පීඨය - සුහුරු පංති කාමර 3.3, කාමර අංක 128 - ප්‍රතිනව්‍යකරණ කටයුතු (AHEAD/RA2/ELTAELSE/FOA/WORKS/04/ii)	50,000.00	3,000.00	5,000,000.00
03	කළමනාකරණ හා මූල්‍ය පීඨය, පුහුණු කාමර - 1 ප්‍රතිනව්‍යකරණ කටයුතු (AHEAD/RA2/ELTAELSE/FMF/WORKS/01)	50,000.00	2,500.00	4,100,000.00
ලංසු ලේඛන පරීක්ෂා කොට බැලීම සඳහා විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන http://www.cmb.ac.lk වෙත පිවිසෙන්න.				

08. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, කොළඹ විශ්වවිද්‍යාලයේ, කොලෙජ් හවුස්හි, අධ්‍යක්ෂ මණ්ඩල කාමර 1 හිදී, 2020 සැප්තැම්බර් 23 වන දින පැවැත්වීමට නියමිතය.

09. මුද්‍රා තැබූ ලංසු, ලංසු ලේඛන සමග ලබා දෙනු ලබන ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කළ යුතුය. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු පිටපතක් සහිතව, අදාළ ලංසු ඇපකරය සමග මුද්‍රා තැබූ කවරයක හෝ පැකට්ටුවක බහා එහි වම් ඉහළ කෙළවරේ ටෙන්ඩරයේ නාමය සඳහන් කොට ඉදිරිපත් කළ යුතුය. (අදාළ ලංසු ඇපකරය, ලංසුවේ මුල් පිටපත සමග ඉදිරිපත් කළ යුතුය)

10. මුද්‍රා තැබූ ලංසු, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ලේඛකාධිකාරී කාර්යාලය අසල කොලේජ් හවුස් හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන්, 2020 ඔක්තෝබර් 08 වන දින 2.30 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අවසාන දිනයට හා වේලාවට පසු ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

11. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, අධ්‍යක්ෂ මණ්ඩල කාමර අංක 1, කොලේජ් හවුස් හිදී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

12. ලැබී ඇති ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ඕනෑම හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ ඇති අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත පවතින අතර, එහි තීරණය අවසාන හා සමාප්ති තීරණය වේ.

සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
කොළඹ විශ්වවිද්‍යාලය,
අංක 94, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

මහජන බැංකුව

ටෙන්ඩර් දැන්වීමයි

Dual Interface Debit Cards in Master Card form 600,000 ක් මිලදී ගැනීම (Personalization සහිතව හෝ රහිතව මිල ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය) සඳහා පිළිගත් නිෂ්පාදකයන් හෝ ඔවුන්ගේ බලයලත් දේශීය නියෝජිතයන්ගෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් විස්තර පහත පරිදි වේ.

ටෙන්ඩර් අංකය	අයිතම පිළිබඳ විස්තර	අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය	ටෙන්ඩරය වසනු ලබන දිනය
P-073/2020	Dual interface Debit Cards (in Master Card form) Quantity - 600,000 Nos.	2020.10.05	2020.10.06

01. ටෙන්ඩර් අයදුම්පත් 2020.09.14 දින සිට 2020.10.05 දින දක්වා බැංකු වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කොළඹ 02, කිව් පාර, 30/101, පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම් පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 1,500/- ක ගාස්තුවක් සැපයුම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 204100120011913 ට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකදී තැන්පත් කොට එහි අනුපිටපත, අදාළ ආයතනයේ අයදුම් ලිපියක්ද සමග මහජන බැංකුව සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

02. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත් සමග රු. 500,000/- ක් වටිනා ලංසු ඇපකරයක් පිළිගත් වාණිජ බැංකුවකින් (මහජන බැංකුව හැර) ලබාගෙන ඉදිරිපත් කළ යුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා බැංකු ගෙවීම් ඇණවුම් හෝ අණකර (මහජන බැංකුව හැර - දින 180 කට වලංගු) ඉදිරිපත් කළ හැකි අතර, පුද්ගලික චෙක්පත් භාරගනු නොලැබේ.

03. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව, 30/101, කිව් පාර, කොළඹ 02 ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. 2020.10.06 දින ප.ව. 2.00 ට ටෙන්ඩරය වසනු ලබන අතර, එදින ප.ව. 2.00 න් පසු ලැබෙන ටෙන්ඩර් පත් විවෘත නොකරම ආපසු බාරදෙනු ලැබේ.

04. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතම මහජන බැංකුව සතුය. අවම මිල පිළිගැනීමට බැංකුව බැඳී නොමැත.

මේ පිළිබඳ වැඩි විස්තර ප්‍රධාන කළමනාකාර (සැපයීම්) වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ද ලබාගත හැකිය.

ප්‍රධාන කළමනාකාර (සැපයීම්)
මහජන බැංකුව,
සැපයීම් දෙපාර්තමේන්තුව,
30/101, කිව් පාර,
කොළඹ 02.

දුරකථන අංක : 2439577/8
ෆැක්ස් : 2439576 / 2433048

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina | Daily News | Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT App Store | Google play | Windows Store
LAKE HOUSE

ලංසු කැඳවීමේ ආරාධනයයි

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ප්‍රශ්න පත්‍ර හා අදාළ ලිපි ද්‍රව්‍ය මුද්‍රණය සහ බෙදාහැරීම සඳහා ලංසු කැඳවීම

වර්ෂ අවසාන ඇගයීම - 2020

පළමු කාණ්ඩය (10-11 ශ්‍රේණි) හා දෙවන කාණ්ඩය (6-9 ශ්‍රේණි)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ප්‍රසම්පාදන කමිටුව විසින් බස්නාහිර පළාත තුළ පිහිටි ලියාපදිංචි මුද්‍රණ ආයතන වලින් ඉහත සඳහන් කාර්යය වෙනුවෙන් මුදු, තබන ලද ලංසු **2020 සැප්තැම්බර් මස 14 වන දින සිට 2020 ඔක්තොම්බර් මස 05 වන දින ප.ව. 02.00** දක්වා භාර ගනු ලැබේ.

ප්‍රසම්පාදන ආකෘති පත්‍ර ආපසු නොගෙවනු ලබන රුපියල් 2500/- ක ගාස්තුවක් බත්තරමුල්ල, රන්මගපායෙහි පිහිටි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ගෙවීම්) වෙත ගෙවා 2020 සැප්තැම්බර් මස 14 වන දින සිට 2020 ඔක්තෝම්බර් මස 02 වන දින ප.ව. 3.00 දක්වා එම කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක.

ලංසු සුරක්ෂණයක් වශයෙන් රු. 50000/- ක මුදලක් බත්තරමුල්ල, රන්මගපායෙහි පිහිටි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ගෙවීම්) වෙත ගෙවා ලබාගත් රිසිට්පතක් (මුල් පිටපත) හෝ පිළිගත් බැංකුවකින්/ මූල්‍ය ආයතනයකින් ලබාගත්, ලංසු විවෘත කරන දින සිට දින 91 ක් සඳහා වලංගු, කොන්දේසි විරහිත රු. 100,000/- ක ලංසු බැඳුම්කරයක් සමඟ ලංසු ඉදිරිපත් කළ යුතු වේ. එසේ ඉදිරිපත් කරනු නොලබන ලංසු ලියවිලි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු මුල් පිටපත හා අනුපිටපත වශයෙන් පිටපත් දෙකකින් යුතුව පිළියෙළ කර ඒවා වෙන වෙනම කවරවල බහා මුදු, තබා **"බස්නාහිර පළාතේ පාසල් සඳහා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය හා බෙදා හැරීම සඳහා ලංසු - 2020 (පළමු කාණ්ඩය)/ (දෙවන කාණ්ඩය)"** යනුවෙන් කවරයේ වම්පස ඉහළ කෙළවර සඳහන් කර 2020 ඔක්තෝබර් මස 05 වන දින ප. ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ප්‍රසම්පාදන කමිටුව, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 89, රන්මගපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීගේ නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම කළ හැක. ලංසු කැඳවීම් අවසන් කළ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැක.

පී. ශ්‍රී ලාල් නෝනිස්
සභාපති,
බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ප්‍රසම්පාදන කමිටුව,
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
රන්මගපාය, බත්තරමුල්ල.
2020.09.11

ප්‍රසම්පාදන දැන්වීමයි

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

01. කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කොට ඇති ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත්තුවේ නම (ඉදිකිරීම් කාලය)	CIDA ලියාපදිංචිය	ලංසු සුරක්ෂණය (රු.)	ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව (රු.)	අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද	
				මූල්‍යමය	තාක්ෂණික
කොහිලවත්ත සුසාන භූමියේ ආදාහනාගාර ගොඩනැගිල්ල හා චිමිනිය ඉදිකිරීම, Down Draught මාදිලියේ එල්පී ගෑස් මගින් ක්‍රියා කරන ද්විත්ව ආදාහනාගාර කුටීර ඉදිකිරීම, අවමංගලාගාරය හා අවශ්‍ය පරිදි භූමි අලංකරණය (මාස 10)	C5 හෝ ඉහළ ශ්‍රේණිය	500,000/= සභාපති, කොටිකාවත්ත මුල්ලේරියාව, ප්‍රාදේශීය සභාව තමට	10,000/= VAT එකතු විය යුතුය.	අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රු. මිලියන 38 ආසන්නතම පසුගිය වසර 3 තුළ	සාමාන්‍ය පළපුරුද්ද - වසර 08 විශේෂ පළපුරුද්ද - ආසන්නතම පසුගිය වසර 5 තුළ අවම වශයෙන් මේ හා සමාන කොන්ත්‍රාත් 2 ක් සාර්ථකව නිම කර තිබීම.

02. ජාතික තරගකාරී ලංසු කැඳවීම මගින් ලංසු කැඳවනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන් වැඩිදුර තොරතුරු සතියේ දිනවල රාජකාරී වේලාවන් තුළදී දුරකථන අංක 011-2410288, 0112410770, 0112410594 මගින් කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ කර්මාන්ත අංශයේ වැඩ අධිකාරී ඇමතීමෙන් ලබා ගත හැකි අතර, 2020.09.14 වෙනි දින සිට 2020.10.13 වෙනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව.9.00 සහ ප.ව.3.00 අතර, එම ලිපිනයේදී ලංසු ලිපිලේඛන සහ අදාළ වැඩ බිම පරීක්ෂා කර බැලිය හැකිය.

04. ටෙන්ඩර් පත්‍රිකා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙන් ආපසු නොගෙවන ලංසු ගාස්තුව රු.10,000/- ක් (VAT එකතු විය යුතුය) ගෙවීමෙන් අනතුරුව 2020.09.14 වෙනි දින සිට 2020.10.13 වෙනි දින දක්වා රාජකාරී දිනයක පෙ.ව.9.00 සහ ප.ව. 3.00 අතර කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මිලදී ගත හැකිය. ටෙන්ඩර්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි සඳහා 5 හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලබා තිබිය යුතු අතර, ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමේදී CIDA ලියාපදිංචිය ඉදිරිපත් කළ යුතුය.

05. ටෙන්ඩර්කරුවන් හට ඉහත සඳහන් මාදිලියේ අදාහනාගාර ඉදිකිරීම සම්බන්ධයෙන් වසර 08 ක අවම පළපුරුද්දක් තිබිය යුතු අතර, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ (NERD) ආදාහනාගාර ඉදිකිරීම් තාක්ෂණ සහතිකය ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

06. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී ඉහත වගුවේ සඳහන් වටිනාකමින් යුතු ලංසු සුරක්ෂණයක් සභාපති, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව තමට ලබා දිය යුතු අතර, එය මුදලින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද බැංකු ඇපකරයක් හෝ විය යුතුය. බැංකු ඇපකරය ටෙන්ඩර් විවෘත කරන දිනයේ සිට දින 30 ක වලංගු කාලයක් සඳහා ඉදිරිපත් කළ යුතුය.

07. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පිටපත් 02කින් යුතුව "මුල් පිටපත" සහ "අනුපිටපත" ලෙස සඳහන් කර ලිපි කවර දෙකක බහා එම ලිපි කවර දෙක තැවත තනි කවරයක බහා එම **කවරයේ වම්පස ඉහළ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කර 2020.10.14 වෙනි දින පෙ.ව. 10.00ට හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභාපති"** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ සභාවේ ප්‍රධාන කාර්යාලයේ ලේකම් නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ නියමිත දින නියමිත වේලාවට ප්‍රථම තැන්පත් කිරීම හෝ කළ හැක. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම 2020.10.14 වෙනි දින පෙ.ව. 10.15ට එම ලිපිනයේදී ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

08. යම් ලංසුවක් පිළිගැනීම හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව,
ගොතටුව නව නගරය.
2020.09.14

මහජන බැංකුව

ටෙන්ඩර් දැන්වීමයි

2020.09.11 දින Personal Computers, Thin Client Machines, Wide Carriage Printers Pass Book Printers සහ Note Book Computers සම්බන්ධයෙන් පළ වූ ටෙන්ඩර් දැන්වීම මින් අවලංගු කරන අතර. එම දැන්වීමේ සඳහන් අයිතම සඳහා පහත දැක්වෙන අයුරින් නැවත ටෙන්ඩර් කැඳවනු ලැබේ.

පහත සඳහන් අයිතම මිලට ගැනීම සඳහා ඒවා සැපයීම, බෙදාහැරීම, සවි කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳව පිළිගත් නිෂ්පාදකයින්ගේ, සැපයුම්කරුවන්ගෙන් හා ඔවුන්ගේ බලයලත් දේශීය නියෝජිතයින්ගෙන් පහත සඳහන් මුදු, තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	ටෙන්ඩර් පිළිබඳ විස්තරය	ඒකක ගණන	ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල	ටෙන්ඩර්පත් නිකුත් කරන අවසාන දිනය හා වේලාව	ටෙන්ඩරය වසනු ලබන දිනය හා වේලාව
P/074/2020	Personal Computers	500 (250 කොටස් 02 කින්)	රු. 500,000/=	29.09.2020 දින ප.ව. 2.00	30.09.2020 දින ප.ව. 2.00
P/075/2020	Thin Client Machines	200 (100 කොටස් 02 කින්)	රු. 300,000/=	29.09.2020 දින ප.ව. 2.00	30.09.2020 දින ප.ව. 2.00
P/076/2020	Wide Carriage Printers	300	රු. 500,000/=	30.09.2020 දින ප.ව. 2.00	02.10.2020 දින ප.ව. 2.00
P/077/2020	Pass Book Printers	250	රු. 300,000/=	30.09.2020 දින ප.ව. 2.00	02.10.2020 දින ප.ව. 2.00
P/078/2020	Note Book Computers	20	රු. 100,000/=	30.09.2020 දින ප.ව. 2.00	02.10.2020 දින ප.ව. 2.00

1. ටෙන්ඩර් අයදුම්පත් 2020.09.15 දින සිට 2020.09.29 දින දක්වා (Personal Computers, Thin Client Machines) සහ 2020.09.15 දින සිට 2020.09.30 දින (Wide Carriage Printers, Pass Book Printers සහ Note Book Computers) දක්වා බැංකු වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කොළඹ 02, කිව් පාර, 30/101, පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම්පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 1,500/= ක ගාස්තුවක් සැපයුම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යන මහජන බැංකු ගිණුම් අංක 204100120011913 ට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවක තැන්පත් කොට එහි අනුපිටපත, අදාළ ආයතනයේ අයදුම් ලිපියක් සමඟ සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.
2. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර්පත් සමඟ ඉහත සඳහන් වටිනාකම් වලට අදාළව පිළිගත් වාණිජ බැංකුවකින් (මහජන බැංකුව හැර) ලබාගත් බැංකු අණකරයක්/ බැඳුම්කරයක් ඉදිරිපත් කළයුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා බැංකු ගෙවීම් ඇණවුම් හෝ බැංකු අණකර ඉදිරිපත් කළ හැකි අතර, එයද ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. ටෙන්ඩර්කරුවන්ගේ චෙක්පත් භාරගනු නොලැබේ.
3. ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතු අවසන් දින පස්වරු 2.00 ට ටෙන්ඩරය විවෘත කරනු ලබන අතර, ඊට පෙර ලැබෙන සේ ටෙන්ඩර්පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු අතර, නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ටෙන්ඩරය ඉදිරිපත් කළයුතු අවසන් දින ප.ව. 2.00 ත් පසුව ලැබෙන ටෙන්ඩර්පත් විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදන්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය මහජන බැංකුව සතුය.
5. මේ පිළිබඳ වැඩි විස්තර මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන කළමනාකාර (සැපයීම්) වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ලබාගත හැකිය.

ප්‍රධාන කළමනාකාර (සැපයීම්)
මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව,
30/101, කිව් පාර,
කොළඹ 02

දුරකථන අංක : 2439577 /8, 2307326
ෆැක්ස් අංක : 2439576.
වෙබ් අඩවිය : www.peoplesbank.lk

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

නරඹන්

කාලීන දැනුම | මැහුම් | ගෙතුම් | අත්කම් | අතිරේක

දශක පහක් පුරා - කාන්තා නැණ පහන් දැල්වූ
කාන්තා පුවත්පත

ප්‍රසම්පාදන දැන්වීමයි

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

අනුරාධපුර

උපකරණ මිලට ගැනීම - 2020

අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාසයට අයත් රෝහල් සඳහා පහත සඳහන් භාණ්ඩ සැපයීම වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් 2020.10.06 වන දින පෙ.ව. 11.00 දක්වා සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් මුදු, තබන ලද ලංසු භාරගනු ලැබේ.

අනු අංකය	ලංසු කැඳවීමේ අංකය	අයිතමය	ප්‍රමාණය	ආපසු නොගෙවන ටෙන්ඩර්පත් ගාස්තුව (රු.)	ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතු මහ බැංකුව පිළිගත් දින 91 ක් වලංගු ලංසු ඇපකර වටිනාකම (රු.)
01.	RDHS/F8/2020/20-PSSP	Laptop Computers	29	3,000.00	36,000.00
02.	RDHS/F8/2020/21-PSSP	Desktop Computers	20	3,000.00	20,000.00
03.	RDHS/F8/2020/22-PSSP	Barcode Printers	14	3,000.00	14,000.00
		Barcode Readers	14		
		Laser Printers	15		
		WiFi Adapters	20		

02. පිළිගත් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් හිමි දේශීය නියෝජිත ආයතන මෙම ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබයි. මෙම මිලදී ගැනීමට බලාපොරොත්තු වන උපකරණ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර හා පිරිවිතරයන් අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක. (දුරකථන අංක : 025-2222579)

03. ආපසු නොගෙවන ටෙන්ඩර්පත් ගාස්තුව ගෙවීමෙන් හා ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදනපත් අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් 2020.09.15 දින සිට 2020.10.05 දින දක්වා කාර්යාල වේලාවන් (පෙ.ව. 9.00 සිට ප.ව. 3.00) තුළදී ලබාගත හැකි අතර, එහිදී ගාස්තු ගෙවීමකින් තොරව අදාළ ප්‍රසම්පාදනපත් පරීක්ෂා කර බැලිය හැක.

04. ලංසු කොන්දේසිවලට අනුකූලව විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදනපත් 2020.10.06 දින පෙ.ව. 11.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවීම හෝ අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලීම හෝ සිදුකළ යුතුයි.

05. ලංසු පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතු අතර, "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස වෙන් වෙන් වශයෙන් වෙන වෙනම ලිපි කවරවල බහා එම ලිපි කවර දෙක තැවත එක් කවරයක බහාලීම කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "ලංසු කැඳවීමේ අංකය" වෙන් වෙන්ව සටහන් කර ඉදිරිපත් කළ යුතුය.

06. 2020.10.06 දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ වහාම ඒවා විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්පත්කරුවන්ට හෝ ලිඛිත අවසරයක් ලත් ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ සහභාගි විය හැක.

07. ලංසු ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බැංකුවක් මගින් පමණක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අනුරාධපුර නමට ලබාගත් බැංකු ඇපකරයක් හෝ අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අදාළ මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පත් මගින් ඉදිරිපත් කළ යුතුයි.

08. මෙම ටෙන්ඩරය පිළිබඳව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

වෛද්‍ය එන්.සී.ඩී. ආරියරත්න,
සභාපති / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
අනුරාධපුර.
දු.ක. 025-2222579
2020.09.09

2020 සැප්තැම්බර් 14 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.